ඒ පිළිබඳව තමුන්නාන්සේගේ තර්කය මුවහත් කරන්නට පෙර මම සුළු සංශෝධනයක් කරන්න කැමතියි. තමුන්නාන්සේ ප්‍රකාශ කළ පරිදිම එයට කියන්නේ නඩත්තු ගාස්තුව කියලයි. එහි ලොකු වෙනසක් තිබෙනවා. මේ එකතු කරන මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයට යන්නේ නැහැ. එම මුදල ආණ්ඩුවේ ආදායමට එකතු නොකර, එම ප්‍රදේශයේ දිසාපතිතුමාගේ පාලනය යටතේ ඒ ප්‍රදේශයේම තැන්පත් කරනවා. එසේ තැන්පත් කළ පසුව, ඒ එකතුවෙන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයෙන් දෙනවා. රුපියල් ලක්ෂ තුනක් එකතු කළොත් තවත් ලක්ෂ තුනක් භාණ්ඩාගාරයෙන් දෙනවා. එවිට එය ලක්ෂ හයක් වෙනවා. රුපියල් ලක්ෂ දහයක් එකතු කළොත් භාණ්ඩාගාරයෙනුත් රුපියල් ලක්ෂ දහයක් දෙනවා. එවිට එය රුපියල් ලක්ෂ විස්සක් වෙනවා. එය සදකාලිකවම ඒ ප්‍රදේශයේ වාරිමාර්ග ජාලයේ නඩත්තුව සඳහා පාවිච්චි කරනවා. මොකද, විශාල මුදලක් වියදම් කරල තිර්මාණ කටයුතු කරල වාරිමාර්ග කටයුතු ඉදි කළාම, අවුරුදු පහක් හයක් යන විට නඩත්තු නොකිරීම නිසා ඒවා ගරා වැටෙනවා. අපේ සමාජයේ තිබෙන දුර්වලකමක් තමයි, වාරිමාර්ග පමණක් නොව, පොදු ගොඩනැගිලි, පොදු වස්තු හරියාකාරව නඩත්තු නොකිරීම. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේදී සිදුවූ සිද්ධියක් මම කියන්නම්. (ලක්ෂ්මන් ජයකොඩි මහතා) අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා නියෝජ්‍ය විදේශ ඇමතිතුමා හැටියට කටයුතු කරන කාලයේදී, බටහිර ජර්මනියේ බොන් නගරයේ අපේ තානාපතිතුමාගේ තිල නිවස නඩත්තු කිරීමේ කටයුතු සඳහා අවුරුද්දෙන් අවුරුද්ද අවශ්‍ය කරන මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලලාය නොලැබුණ නිසා ඒ අවට ගෙවල්වල ජීවත්වන අය මුදල් එකතු කර ඒ නිවස රෙපෙයාර් කළා. ඒවාගේ තත්ත්වයකට මුහුණ දෙන්නේ නැතිව —

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Why would you not ask whether it is true or not from the Hon. Minister of Foreign Affairs ?

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

තමුන්නාන්සේගේ දක්ෂ කථිකත්වයෙන් මේ තර්කය තියුණු කරන විට පොඩ්ඩක් මතක තබා ගන්න, මෙය ගොවි ජනතාවගේ සුභසිද්ධිය සඳහා කරන දෙයක් බව. සියයට 85කට වැඩි පිරිසකගෙන් කිසිම ප්‍රශ්නයක් නැතිව ඒ මුදල එකතු කරනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

ගරු සභාපතිතුමනි, ඇමතිතුමා අම්පාර ප්‍රදේශයට ගිහින් පැවැත්වූ සාකච්ඡාව පත්‍රවල පළ වුණා. එතුමා කළ ප්‍රකාශය 1984.10.12 "දිවයින" පුවත්පතේ මේ විධියට සඳහන් වෙනවා.

"ලෝක බැංකුවේ ආසියානු සංවර්ධන බැංකුවේ කථිවියක් අපට කියනවා, අපි ඔය ගොල්ලන්ට මුදල් දෙන්නම්, නමුත් නඩත්තුව අපට කරන්න බැහැ, නිසියෙන් නඩත්තු කරන්න. ඒකෙන් ප්‍රතිඵල ගන්න ගොවි සමූහයත් සම්බන්ධ කර ගන්න ඕකැ."

ලෝක බැංකුවේ උපදෙස් අනුව අක්කරයකින් රුපියල් 100 ක බද්දක් එහෙම නැත්නම් ගාස්තුවක් කොහාමහරි ගොවීන්ගෙන් අය කර ගන්නවා. තමුන්නාන්සේ දන්නවා, කොයි විධියට මේක විහිඟ කළත් මේ රටේ ගොවීන් අතර විශාල ආත්දෝලනයක් මේ සම්බන්ධයෙන් තිබෙන බව. නොයෙක් උසාවිවල මේ සම්බන්ධයෙන් ගොවීන්ට විරුද්ධව නඩු කිහිපයක් පවරා තිබෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

තමුන්නාන්සේලාගේ සංවිධායකයින් ගිහින් කියලා තිබෙනවා, මෙය ගෙවන්න උපාය කියලා.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

අපේ සංවිධායකයින් යනවද කියාල කියන්න මා දන්නේ නැහැ. නමුත් ගොවි ජනතාවට විශාල පීඩනයක් මේ නිසා ඇති වී තිබෙනවා. මෙය මොන තමකින් හැඳින්වුවත් තම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. මෙය ගොවි ජනතාවගේ කර පිට පැටවෙන බද්දක් නිසා, ඒ වේදනාව ගොවීන් විසින් විඳ ගත යුතු නිසා කරුණාකර මේ බද්ද අස් කර දමන ලෙස පළමුවෙන්ම මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි. ඒ සම්බන්ධයෙන් ඊට වඩා දීර්ඝ ලෙස කථා කරන්නට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ බද්ද සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ මේ රටේ විශාල ආත්දෝලනයක් ඇති වුණාය කියන එක කවුරුත් දන්නා කාරණයක්.

ඊළඟට මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නේ ස්වර්ණභූමි ඔප්පු සම්බන්ධයයි. මේ ඔප්පු බෙදා දීමේ විශාල ප්‍රමාදයක් තිබෙනවා. හැම දිස්ත්‍රික්කයකම ඉඩම් ලබා ගත් ජනතාව මේ ඔප්පු ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටිනවා. උදාහරණයක් හැටියට ගත්තොත් ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් ලබා ගත් දුප්පත් ජනතාවගෙන් විශාල සංඛ්‍යාවකට මේ ඔප්පු ලැබී නැති නිසා විශාල කරදරයක් සිදු වී තිබෙනවා. පසුගිය වතාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රූවඩ් පතිරණ මහතා]

අයවැය විවාදය අවස්ථාවේදීත් අපි මේ ගැන සඳහන් කළා. මෙය ගරු ජනාධිපතිතුමාගේ අත්සන සහිතව තිකුත් කරන්නට ඕනෑ ඔප්පුවක් තියා මෙහි ප්‍රමාදයක් තිබෙනවාය කියා ඔබතුමා සඳහන් කළා මට මතකයි. තමුත් ඒ පිළිබඳව කල්පනා කර බලන්න. මේ ප්‍රමාදය මේ කාලයේ පමණක් සිදු වූ දෙයක්ය කියා මම කියන්නේ නැහැ. 1960 ගණන්වල බෙදූ ඉඩම්වලට තවමත් ඔප්පු නැතිව සිටින අය ගාලු දිස්ත්‍රික්කයේ ඉන්නවා. එම නිසා සාමාන්‍ය දුප්පත් ජනතාවට විශාල ප්‍රශ්න ඇති වී තිබෙනවා. ඉතා ඉක්මනින් මේ ඔප්පු බෙදා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. මේ ඔප්පු නැතිකම නිසා සාමාන්‍ය ජනතාවට විශාල ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදුවී තිබෙනවා. උදාහරණයක් හැටියටයි මම මෙය කියන්නේ. නිවාස හැදීම සඳහා නිවාස සංවර්ධන අධිකාරියෙන් ග්‍රාමෝදය මණ්ඩල ආධාරයක් දෙනවා. ඔප්පු නැත්නම් මේ ආධාර ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. එම ආධාරය ලබාගන්න ඔප්පුව ඉදිරිපත් කරන්නට ඕනෑ. එම නිසා ඒ උදව්යට මේ ඔප්පු නැතිව නිවාස හදාගන්නට ණයක්වත් ගන්නට බැරි වී තිබෙනවා.

එක්තරා අවස්ථාවක මගේ ආසනයේ දුණුවිලවත්ත කියන ගම්මානයේ නිවාස තැනීම සඳහා නිවාස ණය 50 ක් අරගෙන දෙන්නට වැඩපිළිවෙළක් සකස් කර එය අනුමත වුණා. නමුත් මේ ඔප්පුවල ප්‍රමාදය නිසා ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගෙන් වැඩි දෙනෙකුට ඒ ණය ලබාගන්නට බැරි වුණා. ඒ ඉඩම් ලබා ගත් ජනතාවට ඉතා ඉක්මනින් ස්වර්ණභූමි ඔප්පු ලබාදීමට කටයුතු කරන ලෙස මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්න කැමතියි.

ඊළඟට ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන කැලෑ දෙපාර්තමේන්තුව හොරෙන් කැලෑ කැපීම වැලැක්වීම සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන නමුත් ඒ තත්ත්වය තවමත් එහෙමම පවතින බව සඳහන් කළ යුතුව තිබෙනවා. හොරෙන් කැලෑ කැපීම, කැලෑ එළි කිරීම, හොරෙන් දව කපා ගැනීම දිගටම සිදු වෙනවා. බොහෝ තැන්වල මේවා කෙරෙන්නේ ඉහළ නිලධාරී මහත්වරුන්ගේත් අනුදැනුම ඇතිවයි. එහෙම නැහැයි කියන්නට පුළුවන්කමක් නැහැ. එම නිසා මේ කාර්යය නතර කරන්නට දැඩි ක්‍රියාමාර්ග ගත්න ඕනෑ. සිටුවනවා වගේ තුන් හතර ගුණයක් ගස් කපනවා නම් කොයි තරම් ගස් සිටෙව්වත් වැඩක් නැහැ. විශේෂයෙන් හොරෙන් දව කැපීම කැලෑ තිබෙන සෑම ප්‍රදේශයකම දැඩි ලෙස සිදු වෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් දැඩි තීරණ පනවන්න ඕනෑ. වරදකරුවන් අල්ලන්න ඕනෑ. නිලධාරීන් මේවාට සම්බන්ධ නම් ඒ අයටත් දැඩි දඩුවම් ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ කැලෑ හොරෙන් කැපීම නවත්වන්න පුළුවන් වෙන්නේ නැහැ. විශේෂයෙන් ඉහළ මට්ටම්වල බලය යොදා මේ කැලෑ හොරෙන් කැපීම කෙරෙන අවස්ථා තිබෙනවා. බොහෝවිට බලය යොදලයි මේ කාර්යය කෙරෙන්නේ. ඒ නිසා පොලිසියටත් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත්නට බැරි අවස්ථා ඇති වෙනවා.

මේ රටේ වන සම්පත විනාශ කළොත් අනාගතයේදී මේ රටට විශාල ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදු වෙන බව මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. වර්ෂාව අඩුවීම, ස්වභාවික සම්පත් නැතිවීම, සෞන්දර්යය නැතිවීම, පරිසරය දූෂණය වීම, ඒ නිසා නොයෙක් ලෙඩරෝග පැතිරීම වගේ විවිධාකාර ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒ වගේම ජලධාරා නැති වී යනවා. ඒවා සිදෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් දැඩි ක්‍රියා මාර්ගයක් ගත්නා ලෙස මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටින්න කැමතියි.

මෙම අමාත්‍යාංශය යටතේ තිබෙන මිනිත්දෝරු දෙපාර්තමේන්තුව ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මේ දෙපාර්තමේන්තුවේ මිනිත්දෝරු මහත්වරුන්ගේ හිඟය නිසා ප්‍රශ්න රාශියක් ඇති වී තිබෙනවා. ඉඩම් බෙදීමේ කටයුත්ත, නිරවුල් කිරීමේ කටයුත්ත කරන්න බැරි වී තිබෙන්නේ මේ මිනිත්දෝරු නිලධාරීන්ගේ හිඟය නිසයි. විශේෂයෙන් මේ මිනිත්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරු අඩු වුණාම ඉඩම්වල කටයුතු ප්‍රමාද වෙනවා. සෑම දිස්ත්‍රික්කයේම මේ තත්ත්වය තිබෙනවා. විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ මේ නිලධාරී සංඛ්‍යාව බොහොම අඩු බව මා පෞද්ගලිකව දන්නවා. එතකොට මේ ඉඩම් බෙදීමේ කටයුත්ත නිවැරදිව කරගෙන යන්න, නිරවුල් කර ඉඩම් කවිටි බෙරා දෙන්න බොහොම අමාරු වෙනවා. එමනිසා මිනිත්දෝරු දෙපාර්තමේන්තුවේ මිනිත්දෝරු නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කර මේ කාර්යය ඉක්මන් කරන්න කටයුතු කරන ලෙස මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි.

මේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා නොවුනත්, මහවැලි ඉඩම් බෙදීම ගැන මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. පසුගිය කාලයේදී ප්‍රාදේශීය මට්ටමෙන් මහවැලි ඉඩම් බෙදීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමෙන් අයදුම්පත් කැඳවනු ලැබුවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

ගරු මන්ත්‍රීතුමා ලබන සිකුරාද මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරනවිට එය සඳහන් කරනවාද ?

රූවඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

මම මේ තමුන්නාන්සේට මේ ගැන සඳහන් කරන්න යන්නේ, කව්වේරිවල ඉඩම් අංශවලින් මෙය සිදු වූ නිසයි. මේ කටයුත්ත සාධාරණ විධියට ඉෂ්ට වී නැහැයි කියා මම තමුන්නාන්සේට කියන්න ඕනෑ. මම ඔබතුමාට කිසිම චෝදනාවක් කරනවා නොවෙයි. නමුත් මේ කාර්යය සාධාරණව ඉෂ්ට නොවුණු බව පැහැදිලිව ඔප්පු කරන්න සාක්ෂි මා ළඟ තිබෙනවා. මහවැලියට යවන්න කියා තෝරා ගන්න මගේ ආසනයේ ඉඩම් නැති අය සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ සඳහා තෝරා ගත් අයගේ ලැයිස්තුව පසුව මම කව්වේරියෙන් ගෙන්වා ගත්තා. ගරු ඇමතිතුමනි, ඒ ලැයිස්තුව දැක්කා නම් තමුන්නාන්සේ පුදුම වෙයි. ඒ ගම්වල ඉඩම් අක්කර පහළොව, විස්ස තිබෙන අය තමයි, මහවැලියට යවන්න කියා තෝරාගෙන තිබෙන්නේ. ඉඩම් නැති සාමාන්‍ය දුප්පත් මිනිස්සු මේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුණා. ඒ අයගේ නම් තෝරා ගත් ලැයිස්තුවේ නැහැ. එමනිසා මේ අසාධාරණය සිදු වෙන්න ඉඩ තබන්න එපා කියා මම තමුන්නාන්සේගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලන්න කැමතියි. ඉඩම් නැති, ඉඩම් වගා කරන්න පුළුවන් ජනතාවයි මහවැලියට යවන්න ඕනෑ. ඉඩම් අක්කර විස්ස, විසිපහ තිබෙන ඉඩම් හිමියන්ට මහවැලියෙන් ඉඩම් ලබා දෙනවා නම් එහි සාධාරණත්වයක් නැහැ. මේ ලැයිස්තු ගෙනවිත් සමහර නිලධාරී මහත්වරු ඒවා කව්වේරිවල තබාගෙන ඒ ගොල්ලන්ට ඕනෑ කට්ටියගේ නම් ඇතුළත් කර තිබෙන බව මම කියන්න කැමතියි. ඒ කාරණය මට පැහැදිලිව ඔප්පු කරන්න පුළුවන්. මහවැලි ඉඩම් දෙන්න තමන්ට ඕනෑ අයගේ නම් නිලධාරී මහත්වරු ඇතුල් කර තිබෙනවා. එය සාධාරණද කියා මම තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි. මෙන්න මේ විධියේ වැඩ කටයුතු කෙරෙනවා.

දැන් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර ලක්ෂයක් පමණ විදේශීය සමාගම් කිහිපයකට දී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ රටේ ජනතාවගේ පාරම්පරික උරුමයන් තැති කරමින් ඒ අයට විශාල කරදරයක් වන ආකාරයට බුකර් සමාගම, හොංකොං ෂැංහයි බැංකුව, නෙදර්ලන්ත ඉන්ටර්නැෂනල් සමාගම, මේද, ඉන්ටර්නැෂනල් සමාගම වාගේ නොයෙක් සමාගම්වලට මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර ලක්ෂයක් පමණ බෙදා දී තිබෙනවා. මෙය තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් කළාය කියා මම කියන්නේ නැහැ. මේ විධියේ ඉඩම් බෙදා දීමේ ප්‍රතිපත්තියක් ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා හැටියට තමුන්නාන්සේ අනුමත කරනවාද කියායි, මම අහන්නේ. තමුන්නාන්සේට මෙය අනුමත කරන්න පුළුවන්ද ? මේ රටේ පාරම්පරික ගොවි ජනතාවගේ සියළු අයිතිවාසිකම් විනාශයට පත් කරමින්, බුකර් සමාගම වැනි බහු ජාතික ධනේශ්වර කොම්පැනිකාරයින්ට මේ රටේ ශ්‍රමයත්, සාරයත් සූරා ගැනීම සඳහා මේ ඉඩම් දීම තමුන්නාන්සේට අනුමත කරන්න පුළුවන්ද කියා මම අහන්න කැමතියි.

ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනියම් සහ තාවකාලික කම්කරුවන් සම්බන්ධයෙන් කරුණක් සඳහන් කරන්න මම කැමතියි. සාමාන්‍යයෙන් තිබෙන ප්‍රතිපත්තිය අනුව අනියම් කම්කරුවෙක් දවස් 2,750ක් වැඩ කළාම තාවකාලික තත්ත්වයට පත් කරනවා. ඊට පසුව අවුරුදු පහක් ඒගොල්ලෝ සේවය කළාම ස්ථිර තත්ත්වයට පත් කරනවා. මේ තමයි, සාමාන්‍ය සිරිත. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මොකක්ද කර තිබෙන්නේ. ඒ විධියට ඒ කාර්ය්‍ය කරන්න කියා අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂතුමා කලින් වක්‍රලේඛයක් යැවිවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා) ප්‍රශ්නයක් ඇහුවාමත් තියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරක් දී තිබෙනවා, එහෙම තමයි වැඩ කරන්නේ කියා. මෙයේ කියා තිබෙන්නේ 83 මාර්තු මාසෙ 10 වැනිද. ගාල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇසූ 112/83 දරන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්. තියෝජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, ඒ අනුව ස්ථිර කරනවා කියා. නමුත් ඊට පස්සේ අතිරේක වාරි මාර්ග අධ්‍යක්ෂතුමා තවත් වක්‍ර ලේඛයක් යවා තිබෙනවා. එහි මගේ අංකය ජී.4/එක්ස්/37. දිනය 85.11.13. මොකක්ද ඒකෙන් කියන්නේ : "ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත තඩත්තු කම්කරුවන් සහ තාවකාලික තඩත්තු කම්කරුවන්ට විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය පිරි නැමීම හා අනියම් තඩත්තු කම්කරුවන්ට —

ජ්. එම්. එස්. අධිකාරී මහතා (තියෝජ්‍ය ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා)
(திரு. ஏ. எம். எஸ். அதிகாரி — காணி, காணி அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(Mr. A. M. S. Adikari – Deputy Minister of Lands & Land Development)

මත්ත්‍රීතුමනි, මම ස්ථිර කරනවා කිව්වේ, රජයේ තිබෙන කාඩර් එක අනුව. තිසි පරිදි ඉල්ලුම් පතක් ඇත්නම් ඔය ඉන්න ඔක්කොම ස්ථිර කරනවා කියා මම කිව්වේ නැහැ. ස්ථිර කරනවා. ස්ථිර කරන්න අපි බලාපොරොත්තු වෙනවා. නමුත් රජයෙන් වෙන් කරලා තිබෙන කාඩර් එක අනුව පුරප්පාඩු තිබෙනවා නම් තමයි, අවුරුදු පහා සුදුසුකම් තිබෙන අය ස්ථිර කරන්නේ. ඔක්කොම ස්ථිර කරනවා කියා මම කිව්වේ නැහැ. ස්ථිර කරන්න අපි බලාපොරොත්තු වෙනවා. නමුත් රජයෙන් ලැබිල තිබෙන පහසුකම් හා සේවා තත්ත්වය අනුවයි.

ඒ. රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

වෙනත් දෙපාර්තමේන්තු මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් අනුගමනය කරනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලබුවුව රජයේ ගොවිපොළේ, යම් ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා. ඒකෙ තියමයක් තිබෙනවා, මෙන්න මේ විධියයි කරන්න ඕනෑ කියා. මේ දෙපාර්තමේන්තුවේ විතරක් ඒ ක්‍රමය වෙනස් කරනවා නම් එහි සේවය කරන කම්කරුවන්ට විශාල හානියක් සිදු වෙනවා. ගරු ඇමතිතුමා මේ ගැන සොයා බලන්න. වෙන දෙපාර්තමේන්තුවල කෙරෙන ආකාරයට මෙම දෙපාර්තමේන්තුවෙත් වැඩ කෙරෙන්න ඕන.

කාඩර් එක ගැන තමුන්නාන්සේ කතා කරනවා. මම පිළිගන්නවා ඒ අනුව වැඩිපුර සේවකයෝ ගන්න බැහැ කියා. නමුත් එතනදී කල්පනා කර බලන්න, මේ සේවකයින්ට කවදාවත් ස්ථිර වෙන්න ලැබෙන්නේ නැහැ. එතකොට ඒ සේවකයින්ගේ අනාගතය මොකක්ද ? ඒකයි මම කියන්නේ, වෙන දෙපාර්තමේන්තු අනුගමනය කරන ක්‍රියා මාර්ගය වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත් අනුගමනය කරන්න උපදෙස් දෙන්නය කියා. මෙහි තිබෙනවා, "උක්ත මැයෙන් මා ඔබ අමතන්නට යෙදුණු මගේ යමාංක හා 83.01.27. දින ලිපිය හා බැඳේ. යොමුගත ලිපිය 2 වැනි ඡේදයේ 2 වැනි වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. තාවකාලික මාසික වැටුප් සහිත තඩත්තු කම්කරුවන්ට ඔවුන්ගේ තාවකාලිකත්ත්වයට පත් කර අවුරුදු 10ක්" යනාදී වශයෙන්. අවුරුදු 10ක් යන්න ඕන. අවුරුදු 10ක් එතන සේවය කර තාවකාලික තත්ත්වයට පත් වෙනවා. තව අවුරුදු 10ක් යන්න ඕන ස්ථිර කරන්න. මේක කරන දෙයක්ද ? මේක අසාධාරණයි. මෙහෙම වුණොත් කිසි කෙනෙකුට ස්ථිර වෙන්න ලැබෙන්නේ නැහැ. එහි ඊළඟට "තඩත්තු කම්කරුවන්ට ඔවුන්ගේ තාවකාලිකත්ත්වයට පත් කර අවුරුදු 10ක් සම්පූර්ණ වූ දින සිට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තත්ත්වයට පත් විය හැක." කියා සඳහන් වෙනවා.

කල්පනා කර බලන්න. දවස් 2,750ක්, එහෙම නැත්නම් අවුරුදු 10ක් සේවය කළාම තාවකාලික තත්ත්වයට පත් වෙනවා. තව අවුරුදු 10ක් සේවය කරන්න ඕන ස්ථිර වෙන්න. ගරු ඇමතිතුමාටත් තේරෙනවා ඇති මේක අසාධාරණ බව. කෙනෙක් සේවයට ඇවිල්ලා අවුරුදු 20ක් යනකොට ස්ථිර කිරීමෙන් සාධාරණත්වයක් ඉෂ්ට වෙනවාද ? ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර වෙන දෙපාර්තමේන්තුවල කෙරෙන අන්දමටම මෙම දෙපාර්තමේන්තුවෙත් මේ කටයුත්ත කරන්නය කියා. මොකද, විශාල සංඛ්‍යාවක් තාවකාලික කම්කරුවෝ ඉන්නවා, ස්ථිර තත්ත්වයට පත් වුණේ නැතිව. ඒ අයට විශ්‍රාම වැටුප් හිමිකම නැහැ. ඒ අය සේවයෙන් අස් වී ගියාම, ඒ අයට අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. ඒක අසාධාරණයි. ගරු ඇමතිතුමනි, එම නිසා මේ ගැන අනුකම්පාවෙන් සලකා බලා මේ අයගේ අයිතිවාසිකම් ලබා දෙන හැටියට මම ඉල්ලා සිටින්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 9.30

දීර්ඝ ලෙස මම කතා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නැවත වතාවක් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි, ගිංගඟ ව්‍යාපාරය සඳහා ලබාගත් ඉඩම්වලට ඒවායේ අයිතිකරුවන්ට මෙතෙක් වන්දි ලැබී නැත කියන කාරණයට. ගරු ඇමතිතුමා විදේශ සංචාරයක යෙදී සිටිද්දී මම ගරු තියෝජ්‍ය ඇමතිතුමාටත් මේ ගැන කිව්වා. මේ අයට වන්දි ගෙවීමට කටයුතු කරන්න.

වක්‍රලේඛයක අකුරක් එහෙම වැරදිලා තිබුණොත් සමහර නිලධාරි මහත්තුරු ඒ අකුර ගැන තර්ක කරලා ඉඩම්වලට වන්දි ගෙවීම ප්‍රමාද කරනවා. මට අමාත්‍යාංශයෙන් දැනගන්නට ලැබුණා, ඉඩම්වලට වන්දි ගෙවන්නය කියා ගාල්ල දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයට දන්වා යවා තිබෙන බව. එහෙත් කියන්නේ මොකක්ද, වක්‍රලේඛයේ පොඩි වරදක් තිබෙනවා කියායි. අමාත්‍යාංශයෙන් අහන්න බැරිද ? වක්‍රලේඛය හරි ගස්සා ගෙන්වා ගන්න බැරිද ? මේවා පවරාගෙන දැන් අවුරුදු කීපයක් වෙනවා. එම නිසා ගරු ඇමතිතුමා කරුණාකර මේ කාරණයට මැදිහත් වී ගිං ගඟ ව්‍යාපාරයට ලබාගත් ඉඩම්වලට නොපමාව වන්දි මුදල් ලබා දෙන්නට කටයුතු කරන හැටියට මම ඉල්ලනවා.

ගිං ගඟ ව්‍යාපාරය බොහොම හොඳ ව්‍යාපාරයක්. මෙම ව්‍යාපාරය නිසා දැන් අක්මීමන බද්දේගම ආසන්නවල කුඹුරු අක්කර දහස් ගණනක් වගා කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ගංවතුරෙන් හානි වෙන්නෙ නැහැ. නමුත් මේ ව්‍යාපාරයේ එක් වැඩ පිළිවෙලක් තිබුණා, මම දන්න විධියට වතුර නැති කාලෙට වතුර පොම්ප කරන්න. නමුත් ඒ කාර්‍යය දැන් කෙරෙන්නේ නැහැ. ඒ නිසා වතුර ඉතා ඉක්මනින් බැහැලා යනවා. සමහර අවස්ථාවලදී ජලය හිඟකම නිසා කුඹුරු අස්වද්දන්න බැරි වෙනවා. මේ ගැන යම්කිසි සාධාරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන හැටියට මම ඉල්ලනවා.

ඊළඟට ගරු ඇමතිතුමා දන්නවා අක්මීමන ආසනයේ කදුරුදුවු බම්බගල යෝජනා ක්‍රමය කියා යෝජනා ක්‍රමයක් තිබෙන බව. මට දැනගන්න ලැබුණු හැටියට ඒ සඳහා රුපියල් ලක්ෂ 50ක් පමණ වියදම් වී තිබෙනවා. ගරු ඇමතිතුමාම ගිහිල්ලයි ඒ යෝජනා ක්‍රමය විවෘත කෙළේ. නමුත් දැන් මාස දෙකකට පමණ කලින් විශාල වර්ෂාවක් වැහැලා ඒ පැත්තේ සියලුම ගෙවල් යට වුණා. පැල්පත් ගෙවල් එහි තිබෙන්නෙ. ඒ පැල්පත් සියල්ලම යට වුණා. මට සිද්ධ වුණා ඒ වෙලාවෙ ඒ ප්‍රදේශයට ගිහින් පරීක්ෂා කර බලන්න. දැන් මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වී තිබෙන තත්ත්වය තමි පනාගමුව කලහේ යනාදී ප්‍රදේශවලට කරදිය ගලන්න පටන්ගෙන තිබෙනවා. කලින් කරදිය නොගැලූ ප්‍රදේශවලට දැන් කරදිය ගලන්න පටන්ගෙන තිබෙනවා. ඒ කුඹුරුවලට දැන් මේ තත්ත්වය බලපානවා.

දැනගන්න තිබෙන විධියට මේ යෝජනා ක්‍රමයෙන් වගා කරන්න බලාපොරොත්තු වූ ඉඩම් ප්‍රමාණය තව අවුරුදු විස්සකටවත් වගා කරන්න බැහැ. දැන් රුපියල් ලක්ෂ පහක් වියදම්කර තිබෙනවා. තවම එහි වැඩ කෙරෙනවා. නමුත් මේකෙන් ශත පහක ප්‍රයෝජනයක් ලැබී නැහැ. තමුන්නාන්සේ සොයා බලන්න. මේ ගැන සම්පූර්ණ වාර්තාවක් ඔබතුමා ලබාගන්න. ඇත්තවශයෙන්ම අක්මීමන ආසනයේ ලක්ෂ 50ක් වියදම් කළා නම් සැහෙන වාරි මාර්ග ව්‍යාපාරයක් කරන්න තිබුණා. මේ කදුරුදුවු බම්බගල ව්‍යාපාරයට මම විරුද්ධ නැහැ. නමුත් ගරු ඇමතිතුමාට කියන්න ඕනෑ ඒ සඳහා අද එතැන විශාල මුදලක් වළලා දමා තිබෙනවා කියා. හැම අවුරුද්දකම මේ සඳහා විශාල මුදලක් අමාත්‍යාංශයෙන් වියදම් කරනවා. නමුත් මෙයින් කිසිම ප්‍රතිඵලයක් නැහැ. එම නිසා කරුණාකර මේ ගැන සොයා බලා මේකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් නම් ගන්නය කියා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

මීට කලින් අවස්ථාවක ගරු ඇමතිතුමාගේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ අවස්ථාවකදී ගාල්ලේ කීච්චේරියේ ඉඩම් අංශය ගැන කරුණු කීපයක් ඉදිරිපත් කළා. ඒ කරුණු නැවත මම මේ සභාවේදී කියන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මට ආරංචියි ඇමතිතුමා වාර්තාවක් ගෙන්වා ගන්නාය කියා. මම කිසිම නිලධාරියෙකුට චෝදනා කරන්නෙ නැහැ පාර්ලිමේන්තුවේදී කරුණු නැතිව. මම නමක් ගමක් කියන්නෙත් නැහැ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

මම ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමතියි ඒ ගැන මම සොයා බැලූ බව. තමුන්නාන්සේ කී කරුණු සම්බන්ධයෙන් සැහෙන සාධාරණත්වයක් තිබෙන බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

මම අසාධාරණ විධියට තිලධාරීන්ට චෝදනා කරන්නෙ නැහැ. ඉඩම් බෙදීමේ නාම ලේඛනවල වෙනස් කළ ඒවායේ ඡායාරූප පිටපත් මා ළඟ තිබෙනවා. සම්පූර්ණයෙන්ම අයථා ක්‍රමයටයි ඒ වෙනස් කිරීම් කර තිබෙන්නෙ. එම නිසා මේ සම්බන්ධයෙන් සාධාරණය ඉෂ්ට වන විධියට ඔබතුමා ක්‍රියා කරන්නය කියා මම ඉල්ලනවා.

විශේෂයෙන් අක්මීමන ආසනයේ පමණක් නොව ඒ දිස්ත්‍රික්කයේ ආසන රාශියකම මේ ප්‍රශ්නය තිබෙනවා. මගේ ආසනයේ දුප්පත් අහිංසක මිනිසුන් සුමාන දෙක තුනකට වරක් රුපියල් 15ක් 20ක් වියදම් කරගෙන මාව හමුවෙන්න ඇවිත් කියන්නෙ කව්වේරියේ ඉඩම් අංශයේ ඇතිවෙන අසාධාරණකම් ගැනයි. දුප්පත් මනුෂ්‍යයෙකුට පර්චස් 20ක් දුන්නාම, පර්චස් 40ක් දුන්නාම එය තිරවුල් කර ඒ මනුෂ්‍යයාට ජීවත් වෙන්න සාධාරණ අයිතියක් ලබා දෙන්නෙ නැතිව නොයෙක් අසාධාරණ වැඩ කර තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමාට කියන්න කැමතියි මේ ගැන සම්පූර්ණයෙන් පරීක්ෂා කර බලා මේ අංශයේ තිබෙන මේ තත්ත්වය නැති කරන්නට ක්‍රියා කරන්නය කියා. එසේ ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මෛත්‍රිපාල සේනානායක මහතා (මැදවච්චිය)
(திரு. மைத்திரிபால சேனநாயக்க — மதவாச்சி)
(Mr. Maithripala Senanayeke–Medawachchiya)

ගරු සභාපතිතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වවන ස්වල්පයක් කථාකිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මම ඇත්ත වශයෙන්ම එක කාරණයක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. මම අයවැය ලේඛනය දෙවැනි වර කියවීමේ අවස්ථාවේදීත් මේ කාරණය ඉදිරිපත් කළා. නැවතත් මම එය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමතියි. එනම් මේ අසාධාරණ ජලබද්ද ගැනයි. එය ජල බද්දක් නොවෙයි, මෙහෙයුම් බද්ද සහ තඩත්තු බද්දය කියා ගරු ඇමතිතුමා කියනවා. නමුත් අපි කියන්නෙ ජල බද්ද කියලයි. කොයි විධියකින් ප්‍රකාශ කළත් ගොවි ජනතාවට—

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

අක්මීමන ගරු මන්ත්‍රීතුමාට ඔය කාරණය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා පිළිතුරක් දුන්නා. නමුත්නාත්සේ හැමදෙනත් කියන්නෙ ඔය කාරණයමයි. රැස්වීම්වලට ගොස් කියන්නෙත් ඔය කාරණයමයි.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

ඒත් නමුත්නාත්සේලාට මෙහි බරපතලකම තේරෙන්නෙ නැහැ. තව දුරටත් එය කරගෙන යනවා.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

දේශපාලන රැස්වීම්වලට ගිහින් කියන්නෙත් ඔය කාරණයමයි. මෙතැනදී කියන්නෙත් ඔය කාරණයමයි. නමුත්නාත්සේගේ නමින්ම හැන්සාඩ් වාර්තාවේ කීප තැනකම එය සඳහන් වී තිබෙනවා.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

නමුත් නමුත්නාත්සේලා නවදුරටත් එය කරගෙන යනවා. හරියට බිරි අලියන්ට විනා ගානා කරන්නා වාගේ අපිත් හැමදම මේ ගැන කියනවා. මන්ද? මෙයින් විශේෂයෙන්ම ගොවි ජනතාවට මොන විධියේ ආසාධාරණයක් සිදුවෙනවාද කියන එක මෙහි ඉතිහාසය ටිකක් සොයල බැලුවොත් නමුත්නාත්සේලාට පෙනෙනවා ඇති. පළමුවෙන්ම ලෝක බැංකුවේ ඉල්ලීම පරිදි 1969 දී එවකට සිටි ඉඩම් ඇමතිතුමා රු. 40ක ජල බද්දක් අය කිරීමට එකඟ වුණා. එද අපි එට නරයේම විරුද්ධ වුණා. 1970 මහ මැතිවරණයේදී ඔක විශේෂ කාරණයක් වුණා. එහි ඉතිහාසය මොකක්ද? අන්න ඒ විධියට ජල බද්දක් පනවා ජල බද්දක් ලබා ගැනීමට ප්‍රතිඥ දී නමුත්නාත්සේලාගේ ආණ්ඩුව ණය ලබා ගත්තා. ඊටපසුව 1970 දී බලයට පත් වුණු අපේ ආණ්ඩුවේ ඉඩම් ඇමති වශයෙන් මම කටයුතු කරද්දී මේ ජල බද්ද අස් කිරීම සඳහා ඉඩම් ප්‍රවර්ධන ගාස්තු පනත කියා පනතක් ඉදිරිපත් කළා. එම පනත අපි ඉදිරිපත් කළේ 1972 දීයි. ගොවි ජනතාවට පමණක් නොව සාධාරණව පොදුවේ බෙදී යන අන්දමට ඒ ගාස්තු අය කර ගැනීම සඳහායි අපි ඒ පනත ඉදිරිපත් කළේ. එහි මූලික විධි විධාන යටතේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

"(ඉ) මේ පනතෙහි 3 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයකින් ප්‍රවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ප්‍රදේශයක් තුළ පිහිටි සෑම ඉඩමක් වෙනුවෙන්; සහ"

ඒ කියන්නෙ එක් ප්‍රදේශයක් ප්‍රවර්ධන ප්‍රදේශය කියා ප්‍රකාශ කර—

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
අක්කර බදු.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
අක්කර බද්දෙත් මේකෙත් කිසිම සම්බන්ධයක් නැහැ.

"(ආ) මේ පනතෙහි 17 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයකින් ප්‍රතිලාභ ලත් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ප්‍රදේශයක් තුළ පිහිටි සෑම කෘෂිකාර්මික ඉඩමක් වෙනුවෙන්

ඉඩම් ප්‍රවර්ධන ගාස්තුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය."

ඒ කියන්නේ මොනම විධියක ප්‍රවර්ධනයක් ඒ ප්‍රදේශයේ ඇති වුණත් ගොවියන්ගෙන් පමණක් නොව සාධාරණව අනික් අයගෙනුත් ඒ ගාස්තුව අය කිරීමේ වැඩපිළිවෙලක් තමයි ඒ පනතින් ඉදිරිපත් වුණේ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ගොවියන් පමණක් ඉන්න ප්‍රදේශයක නම් කොහොමද?

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
ගොවියන් පමණක් හිටියත් එය මුළු ලංකාවෙන්ම අය වන විධියටයි තියෙන්නෙ. දන් මෙතැන වුණත් නමුත්නාත්සේගේ ප්‍රතිපත්තිය මොකක්ද? මම ඒකට එන්නම්.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ඔය බද්දටත් ලෝක බැංකුව කොහොම සතුටු වුණා.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
ඔව්, සාධාරණ එකක්. මුළු රටෙම ප්‍රයෝජනයට ණයක් ගත්තාම එය සීමිත ප්‍රමාණයකින් පමණක් අය කර ගන්නට පියවර ගන්නෙ ඇයි? අපේ තර්කය එයයි.

ඊළඟට ප්‍රවර්ධන ප්‍රදේශ ගැන මෙන්න මේ විධියට කියා තිබෙනවා.

"3. (1) යම් ප්‍රදේශයක ඉඩම්වල වටිනාකම ඒ ප්‍රදේශයේ සංවර්ධන යෝජනා ක්‍රමයක් ඇති කිරීමේ හෝ පිහිටුවීමේ හෝ වැඩි දියුණු කිරීමේ හෝ ප්‍රතිඵලයක් වශයෙන් වැඩි වී ඇති හෝ වැඩිවීමට ඉඩ ඇති අවස්ථාවක සහ ඒ ඇති කිරීමෙහි, පිහිටුවීමෙහි හෝ වැඩි දියුණු කිරීමෙහි ලා දරන ලද වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඒ වියදමෙන් කොටසක් හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් සපයන ලද අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, නියමයකින්, ඒ ප්‍රදේශය "ප්‍රවර්ධන ප්‍රදේශයක්" වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය;"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ විධියට ප්‍රවර්ධන ප්‍රදේශයක් යනු මේ යයි තියම කළාම ඒ ප්‍රවර්ධන ගාස්තු අය කිරීමට — ඇමතිතුමා කිව්වා වාගේ ලෝක බැංකු අනුමැතියත් ඇතිව — අපි කටයුතු කළා. එය සාධාරණයයි අපි කල්පනා කළා. ලංකාවේ මොනම ප්‍රදේශයක වුණත් වාරිමාර්ග හෝ වේවා, මහා මාර්ග හෝ වේවා විදුලි බල හෝ වේවා කුමන අංශයකින් වුවත් ප්‍රවර්ධන වැඩ පිළිවෙළක් ඇති වුණාම ඒ සඳහා සාධාරණව ඒ ප්‍රදේශවල අයගෙන් බද්දක් අය කිරීමට අප ඉදිරිපත් කළ පනතෙන් ඉඩ තිබෙනවා. තමුන්නාන්සේලා ඒ පනත අයින් කර දුන් නැවත වරක් ඒ අදහසම ඒ කියන්නේ ජල බද්ද පිළිබඳ දහයම වෙනත් විදියකට මෙහෙයුම් හා නඩත්තු බද්දක් වශයෙන් අයකරගෙන යනවා. මේ අයකරගෙන යන බද්ද තියාම.—

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

අක්මීමන ගරු මන්ත්‍රීතුමාගේ (රිවඩ් පතිරණ මහතා) කතාව ආරම්භයේදී එතුමා ඉදිරිපත් කළ අදහසකට මම පිළිතුරු දුන්නා. ඒ වේලාවේ තමුන්නාන්සේ සිටියේ නැහැ. බද්දක් සහ අපි මේ එකතු කරන නඩත්තු ගාස්තු අතර ලොකු වෙනසක් තිබෙනවා.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
වචනයෙන්.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

නැහැ, නැහැ. වචනයෙන් නොවෙයි. මේ එකතු කරන මුදල භාණ්ඩාගාරයට යවන්නේ නැහැ. ඒක ඒ ප්‍රදේශයේ දිසාපතිතුමාගේ පාලකය යටතේ — ලක්ෂ තුනක් එකතු කළොත් තවත් ලක්ෂ තුනක් භාණ්ඩාගාරය දෙනවා — පදාඝාලිකව ඒ වාරිමාර්ග ඒකකයේ නඩත්තු සඳහා අපි එය පාවිච්චි කරනවා. කිසිමදාක මෙය භාණ්ඩාගාරයට යන්නේ නැහැ. That is a fact. එය පාලනය කරන්නේ ගොවි මහත්වරු. එහි වැඩ කොන්ත්‍රාත්කරුවන්ට දෙන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගොවි සභා විසින් ඒ වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මෙය පැහැදිලි වුණාට පසු ගොවි ජනතාව සියයට අසූ නවයක් අනුවක් පමණ මේකට යහපාගී වෙනවා.

Even when you take over the Ministry it will be good for you.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

I do not need it. We will change it, definitely. We will not have this sort of water tax ever again.

කොයි විධියක ඕක කරන්න යනවාය කියා ඇමතිතුමා ප්‍රකාශ කළත් මෙය දඩයක් වශයෙන් — මම මේක හඳුන්වන්නේ බද්දක් වශයෙන් නොව දඩයක් වශයෙන් — ක්‍රියාත්මක කරන්නේ ඇයි ? මේ රට ස්වයංපෝෂිත කිරීමට ගොවි ජනතාව ඒ අයගේ යම් වැඩ පිළිවෙලක්, ක්‍රියා මාර්ගයක් ගත්තවා නම් තමුන්නාන්සේලා ඒ ජනතාවට මේ විධියේ දඩ තියම් කරන්නේ ඇයි කියන ප්‍රශ්නයයි මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නේ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

තමුන්නාන්සේලා මිත්තේරිය, මහියංගනය අතුරු මැතිවරණවලට ගිහින් ඔය තර්කය ඉදිරිපත් කළා.

We had a 16,000 majority, and a 29,000 majority in another place.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

ඒවා ගැන දැන් කතා කරලා වැඩක් නැහැනේ ? ඒවා කොයි විධියට ජය ගුහණය කළාද කියා මහජනතා දන්නවා. ඒවා මෙතෙන්ට තර්ක වශයෙන් ඉදිරිපත් කරලා ගොවි ජනතාව සතුටු වෙයයි මම හිතන්නේ නැහැ. මොකක්ද අද.—

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

මහියංගනය, මිත්තේරිය අතුරු මැතිවරණ දෙක ඉතාම සාමකාමී මැතිවරණ දෙකක්.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
බොහෝම සමාකාමියි.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

You can ask the hon. Member for Matugama, the hon. Member for Maharagama, there was no problem at all.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මහියංගනය අපි තරග කළෙත් නැහැනේ ? මහියංගනය මේකට එකතු කළාට වැඩක් නැහැ නේ ?

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

තමුන්නාන්සේලාගේ සහයෝගය ඇති විරුද්ධ පක්ෂයෙන් තරග කළා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
සාමකාමීකම තිබුණා තමයි, කුණ්ඩසාලේ !

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මම මේ බද්ද දඩයක් වශයෙන් හඳුන්වා දෙන්නේ වෙත කරුණක් නිසා නොවෙයි. බලන්න සාමාන්‍ය ගොවියාට අද විඳින්න සිදු වී තිබෙන කරදර. අද ට්‍රැක්ටර් කුලිය කීයද ? රුපියල් පන්සියයේ සිට හත් සියය දක්වා වැඩි වෙලා තිබෙනවා. බිත්තර වී සොයා ගැනීමේ අමාරුකමක් තිබෙනවා. කෘෂි-රසායන බෙහෙත් වර්ග මිල නැග තිබෙනවා.

ආර්. පී. විජේසිරි මහතා (කුණ්ඩසාලේ)
(திரு. ஆர். பீ. விஜேசிறி — குண்டசாலே)
(Mr. R. P. Wijesiri – Kundasale)
වී මිලත් වැඩි කර තිබෙනවා.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

ඔව්, වී මිල වැඩි කර තිබෙනවා. තමුත් තමුන්නාන්සේලාගේ වී අලෙවි මණ්ඩලය වී ගන්නේ නැහැ. [බාධා කිරීම්] මැදවච්චියේ හා උතුරු ප්‍රදේශවල වී ගන්නවාද කියා ඇවිත් බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)
තමුන්නාන්සේ මැදවච්චියට යන්නෙත් නැහැ නේ? ඒකනෙ වෙලා තියෙන්නේ?

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanaveke)
යන්නෙ නැත එක නොවෙයි.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)
ඒ පැත්තට යන්නේම නැහැ. බොරුවට මෙහෙ—පාර්ලිමේන්තුවෙ—ඉඳන් කෑ ගහනවා.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
අද වල් පැළෑටි නාශක බෙහෙත් මිල රුපියල් සිය ගණන් දක්වා වැඩි වී තිබෙනවා. ඒ විධියට අද නොයෙක් දේවල් වැඩි වී තිබෙන මිල දිහා බැලුවාම රු. 4,000ක් පමණ වැය කරලයි, අක්කරයක් වගා කර ගැනීමට හැකියාව ලැබෙන්නේ. ඒ විධියට වැඩ කර ගොවියකුට ලබා ගන්න පුළුවන් ආදායම වැඩිම වුණොත් රු. 5,000 – 6,000ක් වෙයි. අන්න ඒ විධියට වැඩ කරන ගොවි ජනතාවගෙන් තමයි, මෙහෙයුම් බද්දක් එහෙම නැත්නම් නඩත්තු බද්දක්ය කියා එකක් රු. 100 සිට 200 දක්වා වැඩි කර ගැනීමේ ක්‍රමය යටතේ අද පනවා තිබෙන්නේ. මේක අසාධාරණයක්, තමුන්නාන්සේලාට මේවා තේරෙන්නේ නැති වුණාට.

පදවිය ජනපද ව්‍යාපාරය වගේ ව්‍යාපාර දිහා බලන්න. සමහර විට පදවිය ව්‍යාපාරයට දෙකත්තයට වර්ෂාව ලැබෙන්නේ නැහැ. ඒ විධියේ ගොවි ජනතාවකගෙනුත්, මේ විධියේ අය කිරීමක් කරනවා නම් මොන විධියේ සාධාරණයක්ද ඉටු වෙන්නේ කියන එකයි, මේ අවස්ථාවේදී අපි මතු කරන ප්‍රශ්නය. ඒ, එක පැත්තක්.

අනෙක් පැත්තෙන් තේ, පොල්, රබර් තිෂ්පාදකයන්ට දෙන සහන ගැනත් බලන්න. මම කවදාවත් ඊර්ෂ්‍යා කළේ නැහැ; තේ, පොල්, රබර් යනාදී වගාවන් සඳහා සාධාරණ සහන ලබා දී ඒවා වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම ගැන. අපි ඒකට විරුද්ධ වන්නේ නැහැ, අනුමත කරනවා. නමුත් ඒ අයට සහනයන් සලසා දෙන අතරම මේ ගොවියන්ට දඩයක් ගහන්නේ ඇයි කියන ප්‍රශ්නයයි, අපි අහන්නේ. තමන්ගේ වගාවන් දියුණු කොට ඒ මඟින් මේ රටට විදේශ විනිමය ලබා ගැනීම සඳහා හැකියාව ලැබෙන විධියට ඒ අයට සහන දෙනවා නම් මේ රට, සහලින් ස්වයම්පෝෂණය කිරීම සඳහා වූ ව්‍යාපාරයක යෙදී සිටින ගොවියාට දඩ ගහන්නේ ඇයි කියන එකයි, අපි අහන්නේ.

තේ සහනාධාරය 1978 දී රු. 4,750 සිට 6,000 දක්වා වැඩි කළා. රබර් සහනාධාරය රු. 2,000 සිට 3,000 දක්වා වැඩි කළා. 1979 දී රබර් සහනාධාරය රු. 3,000 සිට 4,000 දක්වා වැඩි කළා. 1980 දී රබර් සහනාධාරය රු. 4,000 සිට 5,000 දක්වා වැඩි කළා. [බාධා කිරීම්] එක නරකයි කියනවා නොවෙයි. එක හොඳයි, සාධාරණයි. නමුත් ඇයි මේ රට, සහලින් ස්වයම්පෝෂණය කිරීම සඳහා මහන්සි වී වැඩ කරන ගොවියාට දඩ ගහන්නේ කියන එකයි, අපි අහන්නේ.

ඒ මදිවාට, ඒ දඩය අය කර ගැනීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද? ගරු ඇමතිතුමා කීවා, ඒ අය කර ගත්තා මුදල් ඒ ඒ ප්‍රදේශයේ දිසාපති කාර්යාලයේ තැන්පත් වෙනවාය, ඒ හා සමාන මුදලක් ආණ්ඩුවෙනුත් දෙනවාය, ඒ මුදල් වියදම් කොට ප්‍රදේශයේ වාරිමාර්ග නඩත්තුව ගෙන යෑමට ප්‍රදේශයේ ගොවීන්ට හැකියාවක් ලැබෙනවාය කියා. නමුත් මොන ප්‍රතිපත්තියක් යටතේද, තමුන්නාන්සේලා ඒ මුදල් අය කරන්නේ? ඒ අයගේ ආදායම උඩද? එහෙම නැත්නම් කන්න සරු වෙලා, ඒ අයගේ වියදම් කැපිලා ඉතුරු වන මුදල් ප්‍රමාණය අනුවද? එහෙම කිසිම ප්‍රතිපත්තියක් නැතිව සෑම දෙනාගෙන්ම අක්කරයකට රු. 100 ගණන් අය කිරීම ඇත්ත වශයෙන්ම මේ රට, සහලින් ස්වයම්පෝෂණය කිරීමට මහන්සි ගන්නා ගොවියාට ගහන දඩයක් හැටියටයි, අපට සලකන්න සිදු වී තිබෙන්නේ. ඒ නිසයි, අපි ඒකට විරුද්ධ වන්නේ. මේ රට, සහලින් ස්වයම්පෝෂණය කිරීම තමුන්නාන්සේලාගේ අරමුණ නම් ඒ විධියට ගොවියාට රු. 100ක දඩයක් ගහනවා වෙනුවට කළ යුතුව තිබෙන්නේ, තව-තවත් සහන ලබා දීමයි. තමුන්නාන්සේලා එහෙම නොකර, අද තිබෙන අධික වියහියදම් මධ්‍යයේ, නොයෙකුත් අපහසුතා මධ්‍යයේ මේ රට, සහලින් ස්වයම්පෝෂණය කිරීමට මහන්සි ගන්නා ගොවියා පිට තවත් අතිරේක බරක් පැටවීමකුයි, මේ බද්ද පැනවීම මගින් කර තිබෙන්නේ.

මගේ හිතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඒ ගොවීන්ට තවු දමා තිබෙනවා. ඔය යෑම තැනම සිටින ගොවි මහතුන් අද උසාවියට පමුණුවන්න කටයුතු කර තිබෙනවා. මම ඇමතිතුමාගෙත් ඉල්ලා සිටිනවා සාධාරණව කල්පනා කර බලා, රට ස්වයංපෝෂිත කිරීම තමුන්නාන්සේලාගේ අරමුණ නම්, ගොවියාට දිරි දීමක් වශයෙන් මේ තවු වික අස් කර දමා, මේ ප්‍රතිපත්තිය වෙනස් කරන්නය කියා. මම එය නැවත වරක් ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙත් ඉල්ලා සිටිනවා.

වී වලට සහතික මිල වැඩි කළාය කියා තමුන්නාන්සේලා කියනවා. ඒක ඇත්ත. රුපියල් 62.50 සිට රුපියල් 70 දක්වා එය වැඩිකර තිබෙනවා. නමුත් ඒ සහතික මිලට වී ගැනීමට මොකක්ද යොදා තිබෙන වැඩ පිළිවෙල? මම දන්නවා මැදවච්චියේ, ඒ උතුරු ප්‍රදේශයේ, සිටින ගොවි ජනතාව එක කාලයක වැඩි මිලට වී වික්කා යාපනෙන් ඇවිත් වී මිලදී ගත් කිසා. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නෙ? අද තිබෙන ත්‍රස්තවාදී කරදර කිසා කවුරුවත් එක්කෙ නැහැ වී ටික ගන්න. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව ගන්නෙත් නැහැ. අද ඉතාමත්ම දුඃඛිත තත්ත්වයකයි ඒ ප්‍රදේශවල ගොවි ජනතාව ජීවත් වෙන්නේ.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)
වී අලෙවි මණ්ඩලයේ මිලට වඩා වැඩි මිලකට පුද්ගලික වෙළෙන්දො ගන්නවා.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
එහෙම ගන්න අය සිටියා. නමුත් අද නැහැ කියන එකයි මම කියන්නෙ.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා
(திரு. கே. டீ. எம். சீ. பண்டார)
(Mr. K. D. M. C. Bandara)
අද වී බුසල රුපියල් සීයයි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
එහෙ බැහැ එහෙම විකුණන්න.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
තිකම් මේ බොරු කියන්න එපා.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා
(திரு. கே. டீ. எம். சீ. பண்டார)
(Mr. K. D. M. C. Bandara)
තමුන්නාන්සේලා පොලු දලා, ඔක්කොම දලා කන්න කැතුව මිනිස්සු දුක් විත්ද. [බාධා කිරීම්]

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
Order, please! We have 42 speakers in the Government list.?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

Sir, if they only allow me to finish my speech–

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

එහෙ යන්න බැහැ කොටි ගහනවා.

ආර්. පී. විජේසිරි මහතා
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

ඔතැ තරම් වී විකුණන්න පුළුවන්.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

ඒ දවස්වල තමි අපේ කුණ්ඩසාලේ මන්ත්‍රීතුමාගේ මෝලක් තිබුණා මිත්තේරිය පැත්තෙ. දන් ඒකත් වහලා වෙන්න ඇති.

ආර්. පී. විජේසිරි මහතා
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

කැහැ, කැහැ, ඔතැ තරම් වී විකුණන්න පුළුවන්. තමුන්නාන්සේට වී තිබෙනවා තමි කියන්න.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මේකයි. [බාධා කිරීම්]

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

ගරු සභාපතිතුමනි, මට පේනවා මේ වැය ශීර්ෂය සාකච්ඡා කිරීමේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ගොවියාට තිබෙන ආදරය එන්න එන්නම වැඩිවෙනවා. තමුත් මේ පක්ෂය තමයි පාර හරහා පොල්ල දමා වී විකත් ප්‍රවාහනය කිරීම තහනම් කළේ. මේ පක්ෂයම තමයි ඉඩම් විකිණීමේ පනත යටතේ ගොවියකුගෙන් අක්කරයකට රුපියල් 25,000ක් 35,000ක් ආදී වශයෙන් ගන්න තීන්දුවෙන් තියම කළේ. එද කෝ මේ ආදරය ?

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

තීන්දුවෙන් තිබෙනවා වැඩි මිලට –

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

රුපියල් 25,000ට 35,000ට අක්කරයක් !

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

වී මිළ සම්බන්ධයෙන් ඒ ක්‍රියා මාර්ගය ක්‍රියාත්මක වෙන්නෙ නැත්නම් මොකක්ද කරන්නෙ ? තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මොකක්ද ? "අපි සහතික මිළ වැඩි කරනවා, කවුරු හරි ගිහිල්ලා ගහිල්ලා, වුවමනා නම් ඊට වඩා වැඩි මිළකට වෙන කෙනෙක් ගිහිල්ලා ගහිල්ලා, අපි ගන්නෙ නැහැ" කියනවා නම් මේ මිළ වැඩි කිරීමෙන් ඇති ප්‍රතිඵලය මොකක්ද ? පොතේ පතේ තිබෙනවා තියම මිළ රුපියල් 62.50 සිට 70 දක්වා වැඩි කළා කියා.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා
(திரு. கே. டீ. எம். சீ. பண்டார)
(Mr. K. D. M. C. Bandara)

ඉතින් ඒකෙත් හානියක් වුණේ නැහැ නේ. රු. 70ටත් වැඩියෙන් ගත්තා නේ.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

වැඩි කළ ගණනට වී මිලදී ගත්තෙ නැත්නම් මොකක්ද ඒකෙ තේරුම ? රුපියල් 70ට ගැනීමේ ක්‍රමයක් රජයෙන් යොදා නැත්නම් මොකක්ද ඒකෙ තේරුම ?

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake – District Minister, Kandy)

අපි කතා කරත්තෙ ඉඩම් අමාත්‍යාංශය ගැන. මේ මන්ත්‍රීතුමා කතා කරන්නෙ කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන. කරුණාකර ඉඩම් අමාත්‍යාංශය ගැන කතා කරන්න.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මම කියන්නෙ ඒකෙ ප්‍රතිඵලයක් වශයෙන් අද ගොවියාට සහනයක් ලැබෙන්නේ නැහැ කියන එකයි.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! Hon. Member for Medawachchiya, please wind up now.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

අන්න ඒ නිසා මේ විදියේ අසාධාරණ රාශියක් මධ්‍යයේ අද ගොවියා අසරණ වී තිබෙනවා. ඇමතිතුමාට තේරෙනවා මම කියන දේ. අනෙක බෝග වගා කිරීමේදී ඒවා දියුණු කිරීමට සහනයක් දීම රජය ප්‍රතිපත්තියක් වශයෙන් හාර අරගෙන තිබෙනවා තමි ඇයි මේකත් හාර නොගත්තේ, ඇයි මේකට දඩයක් තියම කරත්තේ කියන එකයි මගේ තර්කය. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න – පස්සේ උත්තර දෙන්න ඔතැ තමි. මම දන්නවා මේ නිසා තමුන්නාන්සේලාට –

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා
(திரு. கே. டீ. எம். சீ. பண்டார)
(Mr. K. D. M. C. Bandara)

තේ, රබර්, පොල්වලට සහනාධාර දෙන්නේ අලුතෙන් වගා කරනවා තමි හෝ පරණ වගාව අස්කර නැවත වගා කරනවා තමි පමණයි. කරුණාකර ඒක අවබෝධ කර ගන්න.

මෛත්‍රිපාල සේනානායක මහතා
(திரு. மைத்ரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

කොයි විධියට දුන්නත් ඒ බෝග වගා කරන අය සහනාධාර ගන්නවා. අපි කියන්නේ වී ගොවිතැන ගැන වෙහෙස මහන්සි වෙන ගොවියාටත් ඒ විධියේ සහනයක් දෙන්නය කියලයි. මේ දඩය ඉවත් කරන ලෙසත්, ගොවීන්ට විරුද්ධව පවරා තිබෙන නඩු ඉවත් කරන ලෙසත් මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

දයානන්ද වික්‍රමසිංහ මහතා (අකුරැස්ස)
(திரு. தயானந்த விக்ரமசிங்ஹ — அக்குரஸ்ஸ)
(Mr. Dayananda Wickremasinghe – Akuressa)

ගරු සභාපතිතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දයානන්ද වික්‍රමසිංහ මහතා]

අපේ තිස් අවුරුදු සිහිනය සැබෑ කරමින්, තිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට මේ රජයට පුළුවන් කමක් ඇති වුණා. තමුන්නාන්සේ දැන් මාස දෙකකට ප්‍රථම ඒ ප්‍රදේශයට පැමිණ තිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ පළමුවන පියවර බලා බොහොම සන්තෝෂ වුණා. ඒ වැඩ සම්බන්ධව විශේෂයෙන්ම ඒ ඉංජිනේරු මහත්වරුන්ටත් උසස් තිලධාරී මහත්වරුන්ටත් තමුන්නාන්සේ ස්තුති කළා. නමුත් මේ යෝජනා ක්‍රමය තුළින් යම්කිසි පළාතකට පොඩි අලාභහානියක් සිදු වන බවත් තමුන්නාන්සේ දන්නවා. අද තිල්වලා ගඟ යෝජනා ක්‍රමය තුළින් එක පැත්තකින් සැර්ථකව වැඩකටයුතු කරගෙන යන විට තවත් පැත්තකට අසාධාරණයක් වී තිබෙන බව තමුන්නාන්සේත්, තමුන්නාන්සේගේ ඉංජිනේරු මහත්වරුත් දන්නවා. තමුන්නාන්සේ එද සාකච්ඡාවේදීත් මතක් කර දුන්නා, කෙසේ හෝ ඒ අසාධාරණය සිදුවුණු ප්‍රදේශවලට සාධාරණය ඉෂ්ට කර දෙනවාය කියා. මෙම යෝජනා ක්‍රමයේ පළමුවන පියවර අවසානයි. දැන් දෙවන පියවර පටන් ගන්න ඉංජිනේරු මහත්වරු ලැහැස්ති වී ඉන්නවා. මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ, අපේ කොට්ඨාශයේ මාලිම්බඩ උප දිසාපති කොට්ඨාශයේ, මාලිම්බඩ, කද්දුව, ඉලිත්දුවෙල යන ප්‍රදේශ ජලයෙන් යට වී තිබෙන බව. බෑම් බෑදීම නිසා, ගොවි ජනතාවට හරියාකාරව ඒ වතුර වැක තිල්වලා ගඟට බස්සවා ගන්න බැරිව ඒ අයගේ කුඹුරු අක්කර හාර දහක් පමණ ජලයෙන් යට වී තිබෙනවා. දැන් කන්න තුනක් තුළ ඒ ජනතාවට තමන්ගේ වගාවන් හරියාකාරව කර ගෙන යන්නට පුළුවන් කමක් නැතිව නොයෙක් ප්‍රශ්න මතු වී තිබෙනවා. එම නිසා මම ගරු ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරනවා, මේ තිල්වලා ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ප්‍රංශ ඉංජිනේරු මහත්වරුන් සමඟ ඒවාගේම තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තිලධාරී මහත්වරුන් සමඟ මේ ගැන සාකච්ඡා කර, මාලිම්බඩ උප දිසාපති කොට්ඨාශය තුළ ජීවත්වන ගොවි මහත්වරුන්ට මුහුණපාන්නට සිදු වී ඇති මේ විශාල ප්‍රශ්නය නිරාකරණය කර දෙන්නට පුළුවන් ආකාරයට කටයුතු කරන්නටය කියා. මත්ද, මේ ප්‍රශ්නය විශේෂයෙන් බලපා තිබෙන්නේ අහිංසක ගොවි ජනතාවටයි. ඒ පළාත්වල ජීවත් වන අහිංසක ගොවි ජනතාවටයි. සමාජ සේවා අමාත්‍යාංශය මගින් සහනාධාර දෙනවා. ඒ සහනාධාර යටතේ හෝ මේ කන්න තුනක්ම පාදු වුණු ගොවි ජනතාවට ඔවුන්ගේ කුඹුරු හරියාකාර අස්වද්දගන්න පුළුවන් වතුරු සහනාධාර ක්‍රමයක් යටතේ යම්කිසි මුදලක් හෝ වී හෝ ලබා දෙන්නටය කියා මම තමුන්නාන්සේගෙන් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

පූ. හා. 10

ඒවාගේම තිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ දෙවන පියවර පටන් ගන්න තීරණය කළ නිසා මම තමුන්නාන්සේට එක් කාරණයක් කියන්න කැමතියි. අකුරැස්සෙන් දෙවන පියවර පටන් නොගෙන, දෙවැනි පියවර හැටියට දැනට ජලයෙන් යට වී තිබෙන මාලිම්බඩ උප දිසාපති කොට්ඨාශයට අයිති ගම්මානවල ජලය බැස්සවීමට ඒ මුදල් යොදවා ක්ටයුතු කළොත් තවත් කුඹුරු අක්කර පන් දහක් පමණ ලබන අවුරුද්දේ වී වගාව සඳහා යොදවා ගන්නට පුළුවන් වෙනවා. තිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ දෙවන පියවර පටන් ගන්න බලාපොරොත්තු වන්නේ අකුරැස්ස උප දිසාපති කොට්ඨාශයෙන්. මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා, දෙවැනි පියවර හැටියට ඉංජිනේරු මහත්වරුන් සමඟ සාකච්ඡා කර දැනට ජලයෙන් යටවී තිබෙන මාලිම්බඩ, කද්දුව, ඉලිත්දුවෙල ගම්මානවල ජලය අස්කිරීමට කටයුතු තරන්නටය කියා. මම ගරු ඇමතිතුමාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, තිස් අවුරුදු සිහිනයක් සැබෑ කරමින් එද 1977දී මේ රජය ජනතාවට දුන් පොරොන්දුවන් තමුන්නාන්සේට ඉෂ්ට කරන්නට පුළුවන් වීම ගැන.

අවුරුදු ගණනාවක් තිස්සේ වාමාංශික ව්‍යාපාරය මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළේ තිල්වලා ගඟ යෝජනා ක්‍රමය තුළින් රට ස්වයම්පෝෂණය කරනවාය කියන ප්‍රචාරය මතයි. එම කියමන් නිසා, මාතර දිස්ත්‍රික්කයේ ජනතාව වාමාංශික පක්ෂයකට නැතිනම් කොමියුනිස්ට් පක්ෂයට ජන්දය දීමෙන් අවුරුදු ගණනාවක්ම එම පක්ෂයේ මන්ත්‍රීවරුන් පත් කර ගත්තා. නමුත් අද මාතර දිස්ත්‍රික්කයේ පදිංචි මුළු මහත් ජනතාව පිළිගන අවසානයි, එද වාමාංශික දේශපාලනඥයන් වේදිකාවට පමණක් සීමා වූ එම තිල්වලා ගඟ යෝජනා ක්‍රමය අද ක්‍රියාත්මක කරන්නට පුළුවන් වුණේ මේ රජය තුළින් බව. එම නිසා අවුරුදු තිහක සිහිනයක් සැබෑ කරවමින්, මෙම සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර ගන්නට ලැබුණොත්, වතුර බැස්සවීමේ කටයුතුකර ගන්නට පුළුවන් වුණොත්, මාතර දිස්ත්‍රික්කයේ ජනතාව පමණක් නොවෙයි, මුළු මහත් රුහුණු ජනතාවම අපේ රජයටත්, තමුන්නාන්සේටත් ස්තුතිය පුද කරන බව මතක් කරමින් මෙම අවස්ථාව ලබා දීම ගැන සභාපතිතුමාටද ස්තුති වන්න වෙමින් මගේ කථාව අවසන් කරනවා.

දිනේෂ ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene – Maharagama)

ගරු සභාපතිතුමනි, මා බලාපොරොත්තු වුණේ කරුණු කීපයක් මතු කරන්නටයි. මා නතගාටු වෙනවා, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්නට සිදු වීම ගැන. ඇත්තෙන්ම මේ රටේ ගොවි ජනතාවගේත්, දුගී ජනතාවගේත් සිහිනයන් සැබෑ කර වීම සඳහා දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මැතිතුමා එද ගෙන ගිය උද්ඝෝෂණවල ක්‍රියාත්මක භාවයක් ඇති කර ගත්තට, එතුමන්ලාට තීක්ෂ්ණකරම ආණ්ඩු බලයක් කවදවත් ලැබුණේ නැහැ. නමුත් මේ රටේ ගොවි ජනතාවගේ ඉඩම් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්, මා දන්නා හැටියට රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ සිට කරුණු ඉදිරිපත් කළ, ජනතාව අවදි කළ ශ්‍රේෂ්ඨ නායකයකු තමයි, දොස්තර වික්‍රමසිංහ මැතිතුමා. එවැනි ජන නායකයන් පිළිබඳව මේ අන්දමින් අර්ථ නිරූපනය කිරීම කනගාටුවට කාරණයක්.

දයානන්ද වික්‍රමසිංහ මහතා
(திரு. தயானந்த விக்ரமசிங்ஹ)
(Mr. Dayananda Wickremasinghe)
මේක වේදිකාවල විතරයි කිව්වේ.

දිනේෂ ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
එතුමා වේදිකාවල පමණක් කොවෙයි, ගංගා තීරීම සංවර්ධනය පිළිබඳව සැලසුම් සහගත කරුණු ඉදිරිපත් කළ ආකාරය, එතුමා කළ පරිත්‍යාගයන් අප අමතක කළ යුතු නැහැ. මේ රටේ වාමාංශික ව්‍යාපාරයෙන් බිහි වුණු ආණ්ඩු තමයි, ගොවි ජනතාවට ප්‍රධාන සේවාවන් ඉෂ්ට කළේ. මේ රටේ කෘෂිකර්ම ව්‍යාපාරයත්, ගොවි ජනතාවට සහනය සලසා දුන් කුඹුරු පනත ආවේත්, වාමාංශික ව්‍යාපාරය තුළින් මිස ප්‍රතිගාමී නායකයන් තුළින් නොවෙයි. එම නිසා එතුමාගේ ඒ ප්‍රකාශය ගැන මම කැවතත් කතගාටු වෙනවා. එක් එක් යුගවලදී අප කවුරුත් යම් යම් වැඩ කොටස් ඉටු කර තිබෙනවා. එවකට වාමාංශික නායකයන්ගෙන් ලැබුණු යම් යම් සහයෝගයන් මතයි, එවකට තිබුණු රජයන්ට එක් එක් වැඩකටයුතුවලට ප්‍රමුඛත්වය දෙන්නට සිදු වුණේ. [බාධා කිරීමක්] මම කොමියුනිස්ට් පක්ෂය ගැන කථා කරන්නට යන්නේ නැහැ.

ඊළඟට, ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි, මිතිත්දෝරු දෙපාර්තමේන්තුව කර ඇති විශාල අසාධාරණයක් ගැන. කෝවිටේ පාර්ලිමේන්තු සංකීර්ණය ඇති කරන විට, පවරා ගත්තා ලද ඉඩම්වලට වන්දි ගෙවීමේදී අනුගමනය කරන සම්ප්‍රදායික ප්‍රතිපත්තිය මිතිත්දෝරු දෙපාර්තමේන්තුව වෙතස් කරමින් ක්‍රියා කර තිබෙනවා. ඉඩම් කට්ටියෙන් කට්ටිය කැබලි වශයෙන් ගෙන තක්සේරු වාර්තා දිය යුතු නමුත්, කැබලි ගණනාවක්ම එකට ගෙන තක්සේරු කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබෙනවා. මෙය පිළිගත් සම්ප්‍රදායට වඩා වෙනස්. මේ නිසා සමහර ඉඩම්වලට, තියරේ වම් පැත්තට අක්කරයකට රු. 1,400කුත්, තියරේ දකුණු පැත්තට රු. 400කුත් ගෙවීමේ ඛේදවාචකයකට මේ ප්‍රදේශයේ ජනතාවට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
තක්සේරු කරන්නේ මිතිත්දෝරු දෙපාර්තමේන්තුව නොවෙයි, තක්සේරු දෙපාර්තමේන්තුව.

දිනේෂ ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
හරි. ඇමතිතුමා කියන කාරණය මම පිළිගන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
වෙනත් අමාත්‍යාංශයක් යටතේ කෙරෙන කටයුතු සම්බන්ධයෙන් –

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
Listen to me. I will explain.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
තමුත්තාත්තේ ඒ ගැන විස්තර කලාට පස්සේ මම ඒ ගැන යොයා බලන්නම්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
ඇමතිතුමා කියන කාරණය මම පිළිගන්නවා. මම කියවන විස්තරයට ඇමතිතුමා සවන් දෙනවා නම් හොඳයි. මම පිළිගන්නවා, මිතිත්දෝරු දෙපාර්තමේන්තුව මේ ඉඩම් තක්සේරු කොකරත බව. නමුත් මේ ප්‍රශ්නය විසඳා ගන්නට ප්‍රදේශයේ ජනතාව තක්සේරු දෙපාර්තමේන්තුවට ගියාම, ඒ අය කියනවා, ඒ අයට අනුගමනය කරන්නට සිදු වී තිබෙන්නේ මිතිත්දෝරු දෙපාර්තමේන්තුවෙන් දෙන කැබලි සැලැස්මය කියා. ඉඩම් 'කැබලිවල සැලැස්ම වෙන් වෙන් වශයෙන් දීමේ ප්‍රතිපත්තිය වෙනුවට කැබලි ගණනාවක් එකම සැලැස්මට ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම නිසා යම් යම් ස්ථානවල ඉඩම් සම්බන්ධයෙන් කරන ගෙවීම්වල මහ පරිමාණයේ වෙනස්කම් ඇති වී තිබෙනවා. මෙහි මූලික වරද කළේ මිතිත්දෝරු දෙපාර්තමේන්තුව යයි. ඒක අද තිවැරදි කරන්නට බැරි වීමෙන් විශාල සංඛ්‍යාවකට අසාධාරණයක් සිද්ධ වී තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ඔමුවන්නට ගිය නියෝජිත පිරිසට මමත් එකතු වුණා. ඇත්තෙන්ම මේ වරද නිවැරදි කර ගන්නට අවස්ථාව සලසා දෙන්නට ඕනෑ. ඒ සමගම මිතිත්දෝරු දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් පැවති එම ප්‍රතිපත්තිය වෙනස් කිරීමට තීරණය කළේ මන්ද කියා පැහැදිලි කිරීමකුත් ඇමතිතුමා කරන්නට ඕනෑ.

තියරේ වම් පැත්තේ පර්චි එකකට රුපියල් 1,400 බැගින්නුත් දකුණු පැත්තේ පර්චි එකකට රුපියල් 400 බැගින්නුත් ගෙවීම සාධාරණය කියා ඇමතිතුමා වුණත් පිළිගනිවිය කියා මම හිතන්නේ නැහැ. මම මෙය කියන්නේ මේක මිතිත්දෝරු දෙපාර්තමේන්තුවෙන් සිදු වූ ප්‍රධාන වරදක් නිසයි. මේ පාර්ලිමේන්තු සංකීර්ණය අවට මෙය විශාල වශයෙන් සිදු වී තිබෙනවා. ඒ මූලික වරද පිළිබඳව යම්කිසි වගකීමක් ගත්තොත්–ඒ වැරැද්ද දන් වෙනස් කරන්නට බැරි වුණත්–ඒ වන්දි ගෙවීමේ පැත්තෙන් යම්කිසි සහනයක් ඒ ප්‍රදේශවාසීන්ට ලබා දීමට ගරු ඇමතිතුමාට පුළුවන් වෙයි කියා මම හිතනවා.

ඊළඟ ප්‍රශ්නය මම ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙන්නේ ඉඩම් පිළිබඳ ප්‍රතිපත්තිය සම්බන්ධවයි. ඉඩම් ප්‍රතිපත්තියට යන්නට මත්තෙන් ලංකාවේ වන සම්පතට උදවෙමින් පවතින තත්ත්වය පිළිබඳව ගරු ඇමතිතුමා දන්නවා. එතුමාත් මෙය පිළිගන්නවා ඇති. මෙය 'භයානක තත්ත්වයක්. මම හිතන හැටියට අපේ රටේ දැව සම්පතින් කියුබික් අඩි කෝටි බාගයක තරම ප්‍රමාණයක් වාර්ෂිකව ප්‍රයෝජනයට ගන්නවා. ඒ නිසාම පමණක් නොවෙයි, තවත් හේතූන් නිසා අපේ රටේ දැව සම්පත නැත්නම් වන සම්පත 1962 දී අක්කර මිලියන 7.1 ක් ව තිබුණු ප්‍රමාණය එහෙම නැත්නම් ලංකාවේ හැම ප්‍රමාණයෙන් සියයට 44 ක් තිබුණු ප්‍රමාණය 1970 වන විට අක්කර මිලියන 6.1 ට අඩු වී මේ වන විට අක්කර මිලියන 4 කට පමණ අඩු වී තිබෙනවා. මෙය එක ආණ්ඩුවක වැරැද්දක් නිසා ඇති වූ දෙයක්ය කියා මම කියන්නේ නැහැ. නමුත් මෙය භයානක තත්ත්වයක්. අද එය සියයට 22 දක්වා පහත වැටී තිබෙනවා. මෙය ඉතා උග්‍ර ප්‍රශ්නයක් හැටියට කල්පනා කරන්නට අපට කාලය ඇවිදින් තිබෙනවා. මම හිතන විධියට යම්කිසි අවධානයක් යොමුකර තිබෙන බව කියැවෙනවා. නමුත් මීට වඩා බරපතල ලෙස අපි මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන්නට ඕනෑ. මොකද ? ඉදිරියේදී ඒ වටා තමයි, ලංකාවේ මුළු මහත් කෘෂිකර්මය වේවා, අපේ මුළු ජීවන රටාවම පවතින්නේ. ජලය නැතිව මනුෂ්‍යයෙකුට ජීවත් වෙන්න බැහැ. කෘමීන් කීප දෙනෙකුට හැරෙන්නට ජලය නැතිව කිසිම ජීවියෙකුට ජීවත් වෙන්න බැහැ. ඒ නිසා ජල සම්පත නැතිවීම, අපේ දේශගුණික තත්ත්වයේ වෙනස්වීම, ඒ තුළින් මතු විය හැකි සෝදපාලුව සහ පස සේදියාමේ වෙනත් දරුණු තත්ත්වයක් නිසා අපේ ගංගාවක් පිරියාම වැනි ප්‍රශ්න රාශියක් මේ වටා ගෙතී තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය මීට ඉහතදීත්–1983 දීත්–අපි ගරු ඇමතිතුමාගේ අවධානයට ගෙනවා. මෙය ජාතික සම්පතක් පිළිබඳ ඉදිරිය තීරණය කිරීමේ ප්‍රශ්නයක්. මෙය පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ මතය සහ සන්තෝෂය සපුරන්නට පුළුවන් ජාතික වස්තුවක් නොවෙයි. මෙය අඩු වෙන්න, අඩුවෙන්න එහී ඵලවිපාකවලට මුළු මහත් ජාතියම මුහුණ දෙනවා. ඒ නිසා මේ පිළිබඳව නීති ක්‍රියාත්මක කිරීමේදී මීට වඩා සැලසුම් සහගතව, වගකීමකින් යුක්තව පැහැදිලි තද ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නය කියන එකයි මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලන්නේ. එසේ නොකළොත් මේ දශකය අවසන් වන විට අපි මුහුණ දෙන්නේ ඉතාම කණගාටුදායක තත්ත්වයකටයි.

ඊට අතිරේකව තමුත්තාත්තේගේ අමාත්‍යාංශය යටතේ විදේශිකයන්ට ඉඩම් දීගෙන යන බව ගරු ඇමතිතුමා දන්නවා. මේ රටේ ජනතාවට අයිති ඉඩම් අක්කර දහස් ගණනින් විදේශික සමාගම්වලට පවරාගෙන යන බව මට පෙර කථා කළ අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිවඩ් පතිරණ මහතා) කිව්වා. ඒ අය විසින් පාරම්පරික ගම්මානවලින් එම ජනතාව ඉවත් කරනවා විතරක් නොවෙයි, වස්තු සම්භාරයක් ඇති ඝණ වනාන්තරත් ඉවත් කරනවා. එහෙම කැත්තම් දැව සම්පත ඉවත් කිරීමත් සිදු කරනවා. එක පැත්තකින් එසේ සිදු වන අතර අනික් පැත්තෙන් ඉඩම් අයිතිය විදේශිකයන් සතුවීමක් කරගෙන යාමේ ප්‍රතිපත්තිය මේ රටේ යහපතට සිදු වන දෙයක් නොවෙයි කියා මම හිතනවා. අපේ රට විදේශිකයන්ගේ ග්‍රහණයට ගොදුරු කිරීම සඳහා වූ අනුමැතියක්–[බාධා කිරීමක්]

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
කොහේද මේක වෙන්නේ ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
මේක මොණරාගල සිදු වී තිබෙනවා. මොණරාගල විතරක් නොවෙයි, ඇමෙරිකන් හඬ 'ගුවන් විදුලි ආයතනයේ අවශ්‍යතාව සඳහා ගම්වලින් ඉඩම් කට්ටි හිමියන් ගණනාවක් ඉවත් කර තිබෙනවා. සැම තැනකම විදේශික සමාගම්වලට මේ ප්‍රමුඛත්වය දීගෙන එනවා. මම කියන්නේ මේකයි. මේ ප්‍රතිපත්ති 'ඇමතිතුමා වෙනස් කළ යුතුයි. මේක දෙවදරුම් ප්‍රතිපත්තියක්. ඔවුන් ඇවිදින් මේ රටේ වෘක්ෂලතා සහ දැව සම්පත විනාශ කර ගියාට පසුව ඇතිවන භයංකාර තත්ත්වය මේ රටේ දේශගුණයට බලපානවා. අනික් පැත්තෙන් අපේ රටේ සම්පතක් පිළිබඳව විදේශිකයන්ට වරමක් දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඇමතිතුමා අලුත් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට පටන් ගෙන තිබෙනවා. මම හිතන විධියට මෙය ගරු ඇමතිතුමාගේ තනි තීරණයක් නොවෙයි. ඇමතිතුමාගේ නමින් මේක පිටවෙන්නේ, මොකක්ද ? එක්සත් ජාතික පක්ෂයේ සංවිධානවලට මේ රටේ භූමිය පවරා දීම සඳහා වෙනමම ගැසට් නිවේදන මඟින් කටයුතු කරගෙන යනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
මෙය ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ඒ කොහේද ඒක ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
මොණරාගල. I will read it. 1985 නොවැම්බර් 15 වැනි දින ගැසට් පත්‍රයේ 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

අයත් අංක 145 ඒ මාලිගාවිල ග්‍රාමසේවා වසමේ දඹේපිටිය ගමේ පිහිටි අක්කර පහහක් පමණ වූ ඉඩම් කැබැල්ල ඉල්ලා ඇති අයගේ විස්තර දක්වා තිබෙනවා. ඒ නම් මේවායි :

කරුණා කටුගම්පල මහත්මිය,
බී/ 49/ජී 1, ජාතික මහල් නිවාස, මාළිගාවත්ත, කොළඹ 10.

සෝමා තලගල මහත්මිය
අංක 5, පැහිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

සුනන්ද ශ්‍රීමාලි කුරේ මහත්මිය,
123, ඩබ්. ඒ. සිල්වා මාවත, වැල්ලවත්ත, කොළඹ 6

ඒ. එම්. ප්‍රේමාවති මහත්මිය,
" සුසිල් ", පහලගම, වේවැල්දෙණිය.

එච්. එස්. ක්‍රියට්‍රිස් මහත්මිය,
287/1, තලවතුහේන්පිට උතුර, කැළණිය.

මේ නිවේදනයේ කනගාටුදායක වගන්තිය මෙසේ පවතිනවා :

" අක්කර 50 (පණහක්) පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල කෘෂිකර්ම බෝග වගාව සඳහා සමස්ත ලංකා එක්සත් ජාතික පක්ෂ කාන්තා පෙරමුණේ පහත විස්තර දක්වෙන අය විසින් බදු ඉල්ලා ඇති බව මෙයිනී නිවේදනය කෙරේ. "

මම මේ කියන්නේ මේ රටේ කිසි කෙනෙකුට දෙන්න එපා කියන එක නොවෙයි.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

That is for objection.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඔව්. ඔව්. ඒක ඇත්ත. මෙය විරුද්ධත්වය පළ කිරීම සඳහා වූ නිවේදනයක් කියා තමුන්නාන්සේ කියයි. තමුත් මේ ගැසට නිවේදනයේ එක්සත් ජාතික පක්ෂය කියන කැල්ලවත් අඩු වශයෙන් අයින්කර කරන දේ හරියට කළාම ඉවරයිනේ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
හංගන්න දෙයක් නැහැනේ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
හංගන්න දෙයක් තිබෙනවා. හංගන්න දෙයක් තිබෙන්නේ වෙන අයට තමුන්නාන්සේලා ඉඩම් දෙන්නේ නැති නිසයි. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ඒකයි. මේ රටේ ජනපද ගොවීන්ගේ තුන්වැනි පරම්පරාව ජීවත්වීම සඳහා ඉඩම් ඉල්ලනවා. ඒ අයට ඉඩම් දෙන්නේ නැහැ. අහිංසක හේත් ගොවියෝ ඒ අයට ස්ථිර ඉඩම් ඉල්ලනවා. ඒ අයට ඉඩම් දෙන්නේ නැහැ. දේශපාලන වශයෙන් විරුද්ධව සිටින අය යම් යම් ඉඩම්වලින් එළවනවා. මේ රටේ ඒක ඕනෑතරම් සිදු වෙලා තිබෙනවා. අන්න ඒ තිසයි මම මේ කියන්නේ. මෙය දේශපාලන පක්ෂයකට සම්බන්ධ කරගන්න එපා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
තමුන්නාන්සේ ඔපමණ කෑ ගහන්නේ නැතුව, මගේ අමාත්‍යාංශයේ පැය හාගයක් ඇවිත් කාලය ගත කලොත් විරුද්ධ පක්ෂයේ කී දෙනෙකුට ඉඩම් දී තිබෙනවාද කියා මම පෙන්වන්නම්. ඉඩම් බෙදීමේදී විරුද්ධ පක්ෂයක්, ආණ්ඩු පක්ෂයක් කියා භේදයක් නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
විරුද්ධ පක්ෂයක්, ආණ්ඩු පක්ෂයක් කියා සමහර තැන්වල තිබෙනවා. ගරු ඇමතිතුමාට මම ඕතැතරම් උදාහරණ දෙන්නම්. මේ ආණ්ඩු පක්ෂයට විරුද්ධව වැඩ කරන ගම්මානවල කැලෑ ඉඩම්වල — පහත ඉඩම්වල — පදිංචි වූ අය දේශපාලන හේතුව නිසා වෙගයෙන් ඉවත් කර තිබෙනවා. මේ ගැන මම ගරු ඇමතිතුමාට පුද්ගලිකව දෝෂාරෝපණය කරන්න යන්නේ නැහැ. තමුත් මේ වාගේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවලට මේ රටේ ඉඩම් බෙදදීම හරි කියා තර්ක කරනවා නම් ඉත් ප්‍රදර්ශනය වෙන්නේ තමුන්නාන්සේලා වැටී තිබෙන දුක්ඛිත තත්ත්වය පමණයි. මේ රටේ සැබැවින්ම ගොවිතැන් කරන්න උනන්දුවක් දක්වන මේ තෝතලා — මේ කොළඹ ඉන්න තෝනලා — එහි ගොස් ගොවිතැන් කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් මේ තෝනා මහත්මයලාට ගොවිතැන් කරන්න ඉඩම් බෙදදීමට ඉස්සෙල්ලා සැබෑ ගොවියන්ගේ දරුවන්ට ඉඩම් ලබාදීමට මේ ඉඩම් බෙදදීමේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න. මම කරන ඉල්ලීම එයයි. ඊට වඩා දෙයක් මා ඉල්ලා සිටින්නේ නැහැ. හෘද සාක්ෂියට අනුව ඔබතුමා සැබැවින්ම මෙය පිළිගන්න කෙනෙක් කියා මම හිතනවා. තමුත් මේ වාගේ දේවල් කරන්න එපා. මේ ඉඩම් ප්‍රතිපත්තිය තුළ එක පැත්තකින් විදේශිකයන්ට ප්‍රමුඛතාවය දී මේ රටේ ඉඩම් පවරාගෙන යනවා. අනික් පැත්තෙන් මේ වාගේ ප්‍රතිපත්ති තමුන්නාන්සේ අනුගමනය කළාට පසුව මේ ප්‍රතිපත්ති අනුව මේ රටේ සෑම එක්සත් ජාතික පක්ෂ ශාඛාවකටම — සංවිධායකයකුටම — ඉඩම් ලබා දෙන්න අනිවාර්ය සම්ප්‍රදායික යොමු වීමක් තමයි වෙන්නේ. මෙය ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. යූ.එන්.පී. වේවා, මොන පක්ෂයක වේවා පක්ෂ පදනමකින් මෙය කරන්න යන්න එපා කියන ඉල්ලීමයි මම ඉතා ඕනෑකමින් තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ. මේ ඉල්ලීම අත්හිටුවා දමන්න. ඕට වඩා ගොවි කටයුතු සඳහා උනන්දුව දක්වන යෞවන සමාජ, ගොවි සමාජ මේ ඉල්ලීම කර තිබෙනවා. ඒ සංවිධාන කිසිවකට ඉඩම් දී නැහැ.

පූ. හා. 10.15

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
නැහැ. නැහැ. එහෙම කියන්න එපා. කරන හැම ඉල්ලීමකට ඒ ඉල්ලීමේ අඩංගු කරුණු අනුව පරීක්ෂා කර බලා සුදුසු නම් තිබෙන හැටියට ඉඩම් දී තිබෙනවා. තමුන්නාන්සේ යොයා බලන්න. තමුන්නාන්සේගේ පක්ෂයේ වුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වුණත්, සමසමාජ පක්ෂයේ වුණත් මොන පක්ෂයට අයිසිද කියා අපි පක්ෂ කාඩ් එක පරීක්ෂා කර බලන්නේ නැහැ. ඒක කියන්න එන්න එපා. ඒ වාගේ දේවල්. මහරගම ආසනය දිනා ගැනීමට තමුන්නාන්සේට සහයෝගය දුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුව පිහිටුවා තිබුණු කාලයේදී වුණා. ඉඩම් ඇමතිතුමාගේ කාර්යාලයට ගිය කට්ටිය කාර්යාලයෙන් පත්නාගෙන තිබෙනවා. සාක්කි ඕනෑ නම් සාක්කි දෙන්නම්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
ගරු ඇමතිතුමා කියන කථාවේම අනික් පැත්ත අපිට කියන්න පුළුවන්. ඔය ගැන නිකම් අපි තර්ක කරන්න ඕනෑ නැහැ. තමුත් මේ යථාර්ථික උදාහරණයක් මම මේ පෙන්වන්නේ. එහි පවතින තත්ත්වයේ විශේෂත්වයක් අනිවාර්යයෙන් තිබෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ඒ යථාර්ථය තමුන්නාන්සේගේ අදහස. මගේ අදහස ඊට වැඩිය වෙනස්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
තමුන්නාන්සේගේ අදහස නම් මෙය, අඩු වශයෙන් මේ තත්ත්වයටවත් ගේන්න තිබුණේ නැහැ. තමුන්නාන්සේගේ අදහස නොවෙයි නම් අඩු වශයෙන් මේ ගැසට නිවේදනයකටවත් ගෙනෙන්නේ ඇයි ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ඒක මගේ අදහස.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
ඒක තමයි තමුන්නාන්සේගේ අදහස. ඒක තමයි මම කියන්නේ. එක්සත් ජාතික පක්ෂයේ කාන්තා පෙරමුණට ඉඩම් දීම සඳහා වූ මේ තිවේදනය ඉතාමත්ම කණගාටුදායක තිවේදනයක්. මොකද, මේ රටේ පොදු ජනතාවට අයිති දේවල් දේශපාලන පදනම් තුළ බෙදන්නට යාමේ ආරම්භය තමයි, මේ, මේක තමයි, ඉදිරි කාලයේදී මේ රටේ දේශපාලන පදනම් තුළ, මේ රටේ ගම් නියමිගම්වල පොදු ජනතාවට අයිති ඉඩම් බෙදීමට අනුගමනය කරන්නට බලාපොරොත්තු වන ප්‍රතිපත්තිය.

ඊට අමතරව විදේශිකයින්ට ඉඩම් බෙද දී ගෙන යනවා. ඉඩම් බෙද දීමේදී විදේශිකයින්ට ප්‍රමුඛතාවය දී ගෙන යනවා. දේශීය සමාගම්වලට දෙනවා නම් ඊට වඩා හොඳයි. විදේශික සමාගම්වලට දීමයි, මේකෙ කණගාටුදායක තත්ත්වය. ඔවුන් මේ රටේ සාරයයි, පිට රටට ගෙන යන්නේ. මේ රටේ අපට ඉතුරු වෙන්නේ විනාශ වෙච්ච මහ පොළව පමණයි.

තවත් මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, මේ ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය – International Irrigation Management Institute – පිළිබඳව. මේ ගැන අපට විවාදයක් ඇති කරන්න හම්බවුනේ නැහැ. මම හිතන්නේ මේක බොහොම හදිසියේ, පහුගිය අවුරුදු ලේඛන විවාද වෙලාවේදී ඒ වැය ශීර්ෂයත් සමඟම අනුමත වෙච්ච පනතක්. නමුත් මේකෙ ඉතාමත්ම භයානක පැත්තක් තිබෙනවා කියන එකයි, අපේ විශ්වාසය. ලංකාවේ වාරිමාර්ග පද්ධතියම, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයක් කියන එකක් මඟින් – ප්‍රධාන වශයෙන් ෆෝඩ් ආයතනය මඟින් – සහ වෙනත් බහු ජාතික ආයතන මඟින් පාලනය කිරීමේ පූර්ණ අයිතියක් තමයි මේ පනත මඟින් ඇති කරන්නේ. මේකයි, මෙහි භයානකත්වය. මීට පෙර මැදවච්චිය ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රිපාල සේනානායක මහතා) කිව්වා, ලෝක බැංකුව මඟින් ජලය සඳහා වන ගාස්තු අය කිරීම ගැන වූ ප්‍රතිපත්තිය පිළිබඳව. ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනතේ 2 වන වගන්තියේ සඳහන් වෙනවා එම ආයතනය "ජාත්‍යන්තර ස්වභාවය වූ ස්වෛරී සංවිධානයක් වශයෙන් ක්‍රියා කරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය" යනුවෙන් හැඳින්වෙන බව. ප්‍රධාන වශයෙන් ආධාර කණ්ඩායම ගැන එහි පූර්තිකාවේ මෙසේ සඳහන් වෙනවා : "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන ආධාර කණ්ඩායම වෙනුවෙන් ක්‍රියා කරන ෆෝඩ් පදනම අතර එකඟ වීමකට එළඹෙන ලද හෙයින්ද : " මොකක්ද, මේ එකඟවීම ? මේ විදේශික බහු ජාතික ආයතනයට මේ කොටස් පැවරීමේදී, ලංකාවේ මුළු මහත් වාරිමාර්ග රටාව සහ එය වටා ජීවත් වන ජනතාවගේ සෞඛ්‍යය සහ පරිසරය පිළිබඳවත් සමාජ පැවැත්ම පිළිබඳවත් වගන්ති ගණනාවක් අන්තර්ගත කර තිබෙනවා. එසේ නැත්නම් මේ කොටස් පිළිබඳ තීරණ තීර්දේශ කිරීමට බලය ලබාදී තිබෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
If you will permit me a minute, I will explain it to you before you develop your argument.

ගරු සභාපතිතුමනි, බහු ජාතික ආයතන සහ සමාගම් පිළිබඳව මහරගම ගරු මන්ත්‍රීතුමාගේ හිතේ තිබෙන සමහර අදහස් හරි. මෙහිදී මේ ආයතන ගැන පමණක් මම අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්න කැමතියි. මන්ද, එතුමා දෙන්න යන්නේ වැරදි අවබෝධයක් නිසා. මේක ෆෝඩ් පදනම විසින් ඇති කරන ආයතනයක් නොවෙයි.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
මම කතා කළායින් පස්සේ ඇමතිතුමා පිළිතුරු දෙනවා නම් වඩා හොඳයි.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
Shall I tell you මේක ෆෝඩ් පදනම විසින් ඇති කරන ආයතනයක් නොවෙයි. ෆෝඩ් පදනම භාරකාර මණ්ඩලයක්. It is a trust අපේ ආණ්ඩුවත්, වෙනත් ආණ්ඩුත් මේකට සම්බන්ධයි. ඉන්දියාව, පකිස්ථානය මේකට අත්සන් කර තිබෙනවා. ආසියාතික රටවල් මේකට සම්බන්ධයි. මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ මක්නිසාද, ලංකාවට වාරිමාර්ග ඉතිහාසයක් තිබෙන නිසා. අද ලංකාවේ මහවැලි ව්‍යාපාරය, කිරිඳිඔය ව්‍යාපාරය, ඉහතිම්බිය ව්‍යාපාරය ආදී විශාල වාරිමාර්ග ක්‍රමයන් ක්‍රියාත්මක වන නිසා. වර්තමානයේ ඉදි කරන සුළු වාරිමාර්ග, මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග සහ අතීතයේ ඉදි කළ වාරිමාර්ග ක්‍රමත් සමසමව පවතින නිසා. නමුත් මෙයට අධ්‍යක්ෂවරුන් තෝරන්නේ ඒ ඒ ආණ්ඩුවල ඇමතිවරුන්ගේ අදහස් අනුවයි. මෙය පාලනය වන්නේ ස්වාධීන මණ්ඩලයක් විසිනුයි. නමුත් මෙයට වුවමනා කරන මුදල් සහ ආධාර එක එක ආයතනවලින් ලැබෙනවා. ෆෝඩ් පදනම එක ආයතනයක්. මේ ආයතනය විශාල දියුණුවක් ඇති කරනවා, කෘෂිකර්ම පර්යේෂණ සම්බන්ධයෙන්. මම කියන්න කැමතියි, මහරගම ගරු මන්ත්‍රීතුමාට (දිනේෂ් ගුණවර්ධන මහතා) යම්කිසි අවස්ථාවක මේ ක්‍රමය අපේ ස්වෛරී භාවයට, එහෙම නැත්නම් අපේ රටේ තිබෙන අයිතිවාසිකම්වලට පටහැනිව කටයුතු කරනවා නම් අපි ඒවාට ඉඩ දෙන්නේ නැති බව ඒක මම ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමතියි. බහුජාතික සමාගම් සහ ආයතන පිළිබඳව තමුන්නාන්සේ තුළ තිබෙන අදහස් මේකට සම්බන්ධ කරගන්න එපා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
අතිවාර්යයෙන්ම සම්බන්ධ වෙනවා. ඇමතිතුමා කථා කරන්නේ ෆෝඩ් පදනමයි මේ ආයතනයි මේ බහු ජාතික සමාගම්වලින් කිසඳස් වෙච්ච අමුතු විධියේ මානුසිකත්වයක් හා දර්ශනයක් ඇති ආයතන හැටියටයි. නමුත් ඒක එසේ නොවෙයි. මේ සංවිධාන තුන්වෙනි ලෝකයේ රටවල සාරය උරා බීම සඳහා සකස් වී ක්‍රියා කරන බව ඔවුන් විසින් මේ රටවල ස්වාභාවික සම්පත් විනාශයට පතුරුවන දේවල් සහ ඔවුන්ගේ ගණන් හිලව් සහ වාර්තා අරගෙන බැලුවොත් පෙනේවි.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
මේ මධ්‍යස්ථානය පිහිටුවා ගන්න ඉන්දියාවෙ ආණ්ඩුවත්, පකිස්තානයේ ආණ්ඩුවත්, නේපාලයේ ආණ්ඩුවත් ඉල්ලුවා. නමුත් ඒ ගොල්ලන් තීරණය කෙළේ ලංකාවට එන්නයි. [බාධාකිරීම්]

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
ඔව්. මේ රට බොහොම හොඳට දියුණු කරන්නයි. බොහොම හොඳ ප්‍රකාශයක් ඇමතිතුමා කෙළේ. මෙම ජාත්‍යන්තර මධ්‍යස්ථානය මේ රටේ ඇති කිරීම තුළින් මේ රටේ අභ්‍යන්තරයේ තීරණ ගැනීමක් මෙහි ප්‍රධාන වශයෙන් පවතිනවා. මුළු ලෝකයම පිළිබඳ තත්ත්වයන් හා සම්බන්ධ ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් කරන පර්යේෂණයක් ගැන තොවෙයි, මම කථා කරන්නෙ. ලංකාවෙ තොරතුරු පිළිබඳ වගන්ති ගණනාවක් මේකෙ ඇති කර තිබෙනවා. ඒකයි, මේකෙ භයානක පැත්ත.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
These are for our advantage. We want those things done.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඇමතිතුමා එහෙම කියයි. මම ඇමතිතුමාගෙන් දැනගත්ත කැමතියි, ඒ අයාතනය හා සම්බන්ධ ගිවිසුම කුමක්ද කියා. අඩු වශයෙන් එය මේ සභාවට ඉදිරිපත් කරන්නය කියා මම එතුමාගෙන් ඉල්ලනවා. ඒ මොකද මෙම පනතේ 33 වෙනි වගන්තියේ මෙන්න මේ විධියට තිබෙනවා :

" වාරිමාර්ග කළමනාකරණය සම්බන්ධයෙන් පර්යේෂණ සහ ප්‍රහුණු කිරීම පිණිස ජාත්‍යන්තර ආයතනයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාණ්ඩුව ද ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය ආධාර කණ්ඩායම වෙනුවෙන් ක්‍රියා කරන පෝඩි පදනම ද අතර, ඇති කරගන්නා ලද 1983 සැප්තැම්බර් 01 දින අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රයෙන් ආයතනයට සහ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, උපදේශකවරයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට පිරි නැමීමට රාණ්ඩුව විසින් එකඟ වන ලද සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද සහ පරිහාර —..... "

මොකක්ද මේ ගිවිසුම් පත්‍රය ? මෙන්න මේ කියන ගිවිසුම් පත්‍රය පුළුවන්ද සභාගත කරන්න ? මෙය ලංකාවේ ඇති කළ ගිවිසුමක් නොවෙයි. ජාත්‍යන්තර වෙනත් ස්ථානයක ඇති කළ ගිවිසුමක්. ඇමතිතුමා කියනවා මේකට සම්බන්ධ කොටස් කාරයෝ වශයෙන් මෙන්න මේ පාර්ශ්වයන් කටයුතු කරනවාය කියා :

අගා ඛාන් පදනම, ආසියානු සංවර්ධන බැංකුව, ඔස්ට්‍රේලියාව, ප්‍රංශය, ෆෝඩ් පදනම, අයි. එෆ්. ඒ. ඩී. —

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

That is one of the biggest aid donors in the region – The International Fund for Agricultural Development.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ ළඟට තෙදර්ලන්තය, රොක්ෆෙලර් සහෝදර අමුදල, රොක්ෆෙලර් පදනම, එක්සත් රාජධානිය, එ. ජා. සං. ව්‍යා. (එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය), ඇමෙරිකා එක්සත් ජනපදය, ලෝක බැංකුව, අයි. ඩී. ආර්. සී. යන කණ්ඩායමයි.

ඒ ළඟට මේකට සහභාගි වන ඒකක මූලස්ථාන වශයෙන් පෙන්වනවා, ඉන්දියාව, පකිස්තානය, පිලිපීනය සහ ශ්‍රී ලංකාව. ඒ අයට අනික් අයට තරම් කිසිම බලයක් නැහැ. ඇමතිතුමා ඉන්දියාව සම්බන්ධ කරගන්න යන්න එපා. එවිවර බලයක් ඒ රටවලට නැහැ. නමුත් එය සම්පූර්ණයෙන්ම මේ රටේ අනාගතය පිළිබඳව, අපි ණය වී ඉදි කරන ජල යෝජනා ක්‍රම තුළින් ඇති වන භූමිවල සම්පත් පිළිබඳව තීන්දු කිරීමේ ආයතනයක් බවට පත් වීමයි, මෙහි ඇති භයානක කම.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

If your father was the Minister he would have signed this, he would have supported this – (*Interruption.*)

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

මම කථා කළාට පස්සෙ දිසා ඇමතිතුමා මින්නේරිය ගැන කථා කරන්න. තමුන්නාන්සේට කථා කරන්න අවස්ථාව තිබෙනවා. තමුන්නාන්සේලා මේ පදනමේ ගිවිසුමවත් ඇස් දෙකට දකලා නැහැ. එක ජාත්‍යන්තර ආයතනයකට සම්පූර්ණයෙන්ම ලංකාවේ වාරි මාර්ග පද්ධතිය පාවා දීමයි, මේ ගිවිසුමෙන් කරන්නෙ. අන්න ඒ ගිවිසුම සභාගත කරන්නයි, මම ඇමතිතුමාගෙන් ඉල්ලන්නෙ. [බාධාකිරීම්]

එච්. ජී. පී. නෙල්සන් මහතා (திரிகுணமலය දිසා ඇමතිතුමා)
(திரு. எச். ஜீ. பீ. நெல்சன் — திருகோணமலை மாவட்ட அமைச்சர்)
(Mr. H. G. P. Nelson – District Minister, Trincomalee)

එදත් ඔය වගේ කෑ ගැහැව්වා දොස්තර වික්‍රමසිංහලා එන්. එම්. පෙරේරලා වැනි අය. කාක්කො තරම් මදුරුවො ඉත්තවාය කිව්වා, ඒ පැත්තෙ යන්න එපාය කිව්වා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ ඔය තත්ත්වයට ආවෙ ඒ ගොල්ලන්ගේ ක්‍රියා දමයන් නිසයි. [බාධාකිරීම්]

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

තමුන්නාන්සේගේ පියා උනත්දුවෙන් මේ රටේ වැඩ කළා. තමුන්නාන්සේ ඒ පියාවවත් අනුගමනය කරන්න.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේ ඒ ව්‍යාපාරයේ ඉඳලයි දේශපාලන කරලියට්ටු නැග්ගෙ. වෙන දිහාවකින් නොවෙයි. ඔය තමුන්නාන්සේ කථා කරන ප්‍රතිගාමී කඳවුර සාමාන්‍ය ජනයාට සැලකුවේ නැහැ, වමේ ව්‍යාපාර විසින් දේශපාලන භූමියේ වෙනසක් කරන තුරු.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! How much longer will you take ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

මම ඇමතිතුමාගෙන් එක ප්‍රකාශයයි ඉල්ලන්නෙ. ඊට පස්සෙ නව එක කරුණක් ගැන පමණයි මට කථා කරන්න තිබෙන්නෙ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

ගරු සභාපතිතුමනි, දේශපාලන ක්ෂේත්‍රයේ මේ විග්‍රහය කළාට පසු මම ප්‍රකාශ කරන්න කැමතියි, ඒ ගිවිසුම මේ සභාවට ඉදිරිපත් කරන්න සූදානම්ය කියා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ වාගේම මම ඉල්ලනවා ඇමතිතුමාගෙන් එසේ සභාගත කළාට පස්සෙ අපට මේ ගැන සාකච්ඡා කරන්නටත් අවස්ථාවක් ලබා දෙන්නය කියා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

You can discuss it in Committee.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ නිසා මේ ගිවිසුම 1983 දී පැරිසියේදී පැමිණි එකඟතාව පිළිබඳ ගිවිසුම — ලබා දෙනවා නම් හොඳයි. ඒක ඉතාම වැදගත්. මොකද, එහි පවතින ඉදිරි බලපෑම් පිළිබඳව එවිට අපේ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන් වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට මම දැව සංස්ථාව ගැන වචන කීපයක් කථා කරන්න කැමතියි. මේ දැව සංස්ථාවේ විවිධ ආයෝජනයන් පවතිනවා, වෙනත් හවුල් සමාගම් හැටියට. අන්න ඒවා පිළිබඳව ඇමතිතුමා මීට වැඩියෙන් සොයා බලනවා නම් හොඳයි. ඇති කරන්න තීරණය කළ එකක් තමයි, අමෙරිකන් සමාගමක් සමග – Enterprise Development Incorporated, Washington. මූලස්ථානයේ ඇති සමාගම සමග – Chalanka Investment කියන ව්‍යාපෘතිය. විශාල වශයෙන් තොරතුරු සෙවීමකින් පසුව ඇති කළ ඒ ව්‍යාපෘතියට සිදුධ වුණේ මොකක්ද ? මොකක්ද මෙහි පසුබිම ? මෙහි මිළඟ ප්‍රතිඵලය මොකක්ද ?

ඒ වගේම දැව සංස්ථාවේ මුදල් විදේශ බැංකුවල තැන්පත් කිරීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද ? මම හිතන විධියට විදේශ බැංකු ගණනාවක මුදල් තැන්පත් කර තිබෙනවා. Bank of America, Indo–Suez, Habib, Euro Asian Bank කියන මේ බැංකුවල විශාල මුදලක් තැන්පත් කර තිබෙනවා. මම හිතන විධියට ඒ සඳහා අනුගමනය කරන්නට තිබෙන මූලික මුදල් රෙගුලාසි, ප්‍රතිපත්ති අනුගමනය කර නැහැ. ඒ නිසා මේ ගැනත් සොයා බලන්න. මොකද ? ලංකාවේ බැංකුවලින් විදේශ බැංකුවලට ආයෝජනය කරන්නට යාමේදී ඒ සඳහා අවශ්‍ය වූ ආවරත ලබා ගෙන නැහැ. එවැනි දේවල්වලට මේ සංස්ථාව තිරත වී තිබෙන්නෙ ඇයි ? මම ඔවුන්ගේ දැව ප්‍රතිපත්තිය ගැන කථා කරන්න යන්නෙ නැහැ. මිල වැඩි කිරීම තුළින් දැව සංස්ථාව යම්කිසි ලාභයක් උපයනවා කියා ප්‍රකාශ වෙනවා නම් එය දැව සංස්ථාවේ සැබෑ දක්ෂතාවයක් හැටියට, කළමනාකාරිත්වයේ දක්ෂතාවයක් හැටියට සලකන්න බැහැ. මිල වැඩි කිරීමක් මගින් උපයන ලාභය ඒ විධියට සලකන්න බැහැ.

ඒ වගේම විවිධ ස්ථානවල තිබෙන දැව සංස්ථාවට අයිති වැඩ බිම් වසා දමන්නට සිදුවී තිබෙනවා. උතුරු නැගෙනහිර පළාත්වල ඇති ඒ වැඩ බිම්වල දේපොළ පිළිබඳ තිබෙන තත්ත්වය කුමක්ද කියන එක ගැන මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මම හිතන විධියට ත්‍රිකුණාමලය දිසා ඇමතිතුමාට ඒවා බලාගන්න පුළුවන්. මොකද ? ඒ පළාත්වල කිසිම කලබලයක් නැහැ. බොහොම හොඳින් තිබෙන තියා ඒතුමාට හාර දෙනවා නම් එතුමා බලා ගනීවි. දැව සංස්ථාවට බලා ගන්නට බැහැයි කියා තීරණය කර තිබෙන ආයතන එතුමාට හාර දුන්නා නම් එතුමා හොඳට බලා ගනීවි. මොකද ? මේ ආයතන සඳහා සංස්ථාවෙන් විශාල ආයෝජනයක් කර තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

Lord Nelson. That is why he is in charge of Trincomalee.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
Do you want a reply ?

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
You can reply afterwards.

ඊළඟට මම තව එක ප්‍රශ්නයක් නගන්න කැමතියි. ලොතරැයි විකිණීම සඳහා සංස්ථාවල මුදල් ආයෝජනය කිරීමක් කෙරෙනවා. මම හිතන විධියට මේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න ඕනෑ. සංස්ථා ගොඩනැගී තිබෙන්නේ ලොතරැයි විකිණීම සඳහා නොවෙයි. [බාධා කිරීමක්] රාජ්‍ය දැව සංස්ථාව ලොතරැයි විකුණලා තිබෙනවා. විශාල මුදලක් එයට ආයෝජනය කර තියෙනවා. ඇමතිතුමා ඒ ගැන සොයා බලන්න. මේවා ඇමතිතුමාගේ අනුමැතිය නැතිව කෙරෙන වැඩ වෙන්න ඇති. මෙම ආයතනවල ප්‍රමුඛස්ථානය දිය යුත්තේ මොනවාටද ? මේ සංස්ථාවල අරමුණු මොනවාද කියා කල්පනා කර බලන්න ඕනෑ. කාගෙ හරි ලොතරැයි අලෙවි කරන්න ඕනෑ නම් ඒවා කරන්නට වෙන මාර්ග තිබෙනවා. නමුත් සංස්ථාවල මූලික අයවැය තුළින් ඒවා කරන්ට යාම සාධාරණයි කියා මම හිතන්නේ නැහැ. [බාධා කිරීමක්] ඩිපෝවලට විකිණීම සඳහා සංස්ථාව විශාල සංඛ්‍යාවක් මිලදී අරගෙන තිබෙනවා. ඒවා ඒ විධියටම අලෙවි වුණෙත් නැහැ. මොකද, " මේ සූරත සෙල්ලම " දන් හුඟක් තිබෙන නිසා.

පූ. හා. 10.30

අවසාන වශයෙන් මම තව එක ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කැමතියි. එනම් කැළණි මිටියාවතේ ගංවතුර සහ ජල ප්‍රශ්නය පිළිබඳවයි. කැළණි ගඟ සංවර්ධනය කිරීම පිළිබඳව ඉදිරි කාලයේදී යම්කිසි වැඩපිළිවෙලක් ඇරැඹීමට බලාපොරොත්තු වෙනවා. මහා පරිමාණ වැඩ පිළිවෙලකට මත්තෙන් කෙටි කාලීන වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා වැඩ කටයුතු කරනවා. ඊට අතිරේකව මම ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමති කාරණයක් තිබෙනවා. ලංකාවේ පළාත් බෙදීම අනුව ඉඩම් පිළිබඳව තිබෙන ප්‍රශ්නය ගැන ගරු ඇමතිතුමා දන්නවා. නමුත් මම එක කාරණයක් පමණක් කියන්න කැමතියි. මොකද, ලංකාවේ සංවර්ධනය නොවුන භූමි ප්‍රදේශයන් තිබෙන්නෙ උතුරු සහ නැගෙනහිර පළාත්වලයි. උතුරු පළාතෙන් උතුරු මැද පළාතෙන් නැගෙනහිර පළාතෙන් තමයි, මේ රටේ ජන ශූන්‍ය ප්‍රදේශ තිබෙන්නෙ. ඉදිරියේදී ඉඩම් සංවර්ධනයට තිබුදු වන ප්‍රදේශ ඒවායි. ඉදිරි කාලයේදී මේ ප්‍රදේශ පිළිබඳව අනුගමනය කරන්නට බලාපොරොත්තු වන ප්‍රතිපත්ති මාලාව පිළිබඳව වගකීම ඔබතුමාට තිබෙනවා. මොකද ? අද විදේශිකයන්ට ඉඩම් දී ගෙන යනවා. ඒ තුළින් ලංකාවේ භූමි ප්‍රමාණයේ යම් යම් අයිතිවාසිකම් මේ රටේ ග්‍රාමීය ජනතාවට අහිමි වෙනවා. ඉදිරි කාලයේදී උතුරු නැගෙනහිර පළාත්වල මේ රටේ ජනගහනය ඉදිරියට පැනිරෙන්න තිබෙන ඒ ප්‍රදේශවල ඉඩම් අයිති වෙනත් ආකාරයකින් හාවිතා කරන්නට ඉඩ දෙනවාද නැද්ද කියන ප්‍රශ්නය තමයි, මම ගරු ඇමතිතුමාට විශේෂයෙන් ඉදිරිපත් කරන්නෙ. විශේෂයෙන් මත්තාරම, වව්නියාව, මුලතිව් ආදී ප්‍රදේශවල විශාල භූමි ප්‍රමාණයක් ඉදිරි සංවර්ධනය සඳහා යෙදෙනවා. ඒ නිසා මේ බිම් ආරක්ෂා කිරීමේ මහා වගකීම තිබෙන්නේ ඉඩම් ඇමතිවරයා වශයෙන් තමුන්නාන්සේටයි. මේ රටේ ජනතා සංවර්ධනය සඳහා තිබෙන මේ භූමි ප්‍රමාණත් ආකාරයේ තීරණ ගන්නා ආයතනවලට ජාතීන් අනුව පමණක් වෙන් කිරීමට තමුන්නාන්සේ ඉඩ දුන්නොත් ඉන් ඇතිවන ප්‍රතිඵල ඉතාම භයානකයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් අවසාන වශයෙන් එක කරුණක් දැනගන්න කැමතියි.

අද ප්‍රාදේශීය වශයෙන් පවතින ජන අනුපාතය අනුවම එය ඉදිරියේදීත් පවත්වාගෙන යන්නට ආණ්ඩුවේ තීරණයක් තිබෙනවාද ? එසේ නැත්නම් ඉදිරි ජනපද පිහිටුවීමේදී හෝ ඉඩම් සංවර්ධනයේදී හෝ අනුගමනය කරන ප්‍රතිපත්තිය ජාතික ජනානුපාතයද ? මොකද ? දිස්ත්‍රික්ක පදනමේ තිබෙන ජනානුපාතය එසේම පවත්වාගෙන යන්නට තමුන්නාන්සේලා එකඟ වී තිබෙන බවට විවිධ ජාත්‍යන්තර සාකච්ඡාවලදී තීරණවලට එළඹී තිබෙනවායයි අපට ආරංචි ලැබී තිබෙනවා. එසේ නම් ඒක ඉතාම භයානක දෙයක්. එසේ නැත්නම් ඉදිරියේදී උතුරු නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් තීරණය කරන්නේ ජාතික ජනානුපාතයද යන්න පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් ඇමතිතුමාගෙන් ලබා ගත යුතුව තිබෙනවා.

මම කතාව දීර්ඝ කරන්නෙ නැහැ. ජලබද්ද ඉල්ලා අස් කර ගන්න කියා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මොකද ? උසාවි තීන්දු කීපයක් මේ ජල බද්දට විරුද්ධව දී තිබෙනවා. මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ හත් වැනිද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුනකොළපැලැස්සේ ප්‍රාථමික උසාවියට ජල බද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තඩු ප්‍රතික්ෂේප කරල තිබෙනවා, තිෂ්ප්‍රභ කර තිබෙනවා. ඒ නිසා මේකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ගැටළුවකටත් තමුන්නාන්සේලා මුහුණ දෙනවා. මේ තඩු විසි කර තිබෙනවා. ජල බද්ද තඩන්නු ගාස්තු නමින් දැනටම අයකර ගැනීම නීත්‍යානුකූල කරන්න බැරි අර්බුදයට තමුන්නාන්සේලා මුහුණ දෙනවා. ඒ නිසා තවදුරටත් මේ බර ගොවි ජනතාවගේ කර පිට දමන්නේ නැතිව එය ඉල්ලා අස්කර ගන්නා ලෙස අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

අනිල් මුණසිංහ මහතා (මතුගම)
(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)
(Mr. Anil Moonesinghe – Matugama)

ගරු සභාපතිතුමනි, අපේ ගරු ඉඩම් ඇමතිතුමා ලංකාවේ භූමි පාවිච්චිය සැහෙන්න වෙනස් කර තිබෙනවායයි මම හිතනවා. ඒකෙන් හොඳ ප්‍රතිඵල ඇති වෙනවා. ඒ වාගේම ඒකෙන් නරක ප්‍රතිඵලත් ඇති වෙනවා. මම හිතන හැටියට ලංකාවේ පරිසරය ඉතාම භයානක අත්දමට අද වෙනස් වී තිබෙනවා. ඒ ගැන විදේශීය පර්යේෂණ මගින් පවා පෙන්නුම් කර තිබෙනවා මේ විධියට පරිසරය දූෂණ වුණොත් ලංකාවේ අනාගතය බොහෝම භයානක පැත්තට හැරෙන බව. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඉඩම් සංවර්ධනය වාගේම පරිසර සංරක්ෂණයත් ඇති කරන ලෙස.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මූණසිංහ මහතා]

දැන් පරිසර සංරක්ෂණය තිබෙන්නේ ගරු අගමැතිතුමා ගාවා. තමුත් ඒ ගැන මොකක්වත් ඔය පැත්තෙන් කෙරෙනවාය කියා මට පේන්නේ නැහැ. සිංහල රජ කාලයේ තිබුණු තත්ත්වය තමුන්නාන්සේලා දන්නවා; විශේෂයෙන් පොළොත්තරුවේ ගරු මන්ත්‍රීතුමා (එච්.ජී. පී. තෙල්සත් මහතා) දන්නවා ඒ දවස්වල තම් එතුමාට කිව්වේ තෙල්සත් සහෝදරයා කියා. දැන්නම් තෙල්සත් සාමි කියල තමයි ආමන්ත්‍රණය කරන්නේ. ඒකයි අද තිබෙන වෙනස. සිංහල රජ කාලයේ කඳුගැට උඩ තිබුණු ඉඩම්වල ගස්කොළන් වවා තිබුණු බව තමුන්නාන්සේලා දන්නවා. කඳු මුදුන්වල සිට එක් එක් පියවරවල් පහළට ඇවිත් පහළම තමයි කුඹුරු තිබුණේ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

අද ලොකු ප්‍රශ්නයක් වී තිබෙත්තේ ජනගහන ව්‍යාප්තියයි. 1948 දී තිබුණු දස ලක්ෂ හයේ සිට අද වන විට දස ලක්ෂ දහයය දක්වා ජනගහනය වැඩි වී තිබෙනවා. මේ පිරිසයි ගුහාක් දුරට වන රක්ෂණ හා පරිසරය සමග ගැටෙන්නේ. ජීවිකාව කර ගැනීම සඳහායි.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම පිළිගත්තවා. ඒ එක්කම අපි පිළිගත යුතු කරුණක් තිබෙනවා. ඒ දවස්වල තිබුණු දස ලක්ෂ හයේ සිට දස ලක්ෂ පහළොව දක්වා ජනගහනය වැඩි වී තිබෙනවායයි ඇමතිතුමා කියනවා. ඒ වාගේම ජපානයේත් වැඩි වී තිබෙනවා. තමුත් ඒ රටවල —

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

In Japan they all come into the cities.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඒක තමයි, මමත් කියන්නේ. ඒ රටවල් වෙනත් මාර්ග සොයාගෙන තිබෙනවා, මේ ප්‍රශ්නය විසඳන්න. තමුත් මේ ආණ්ඩුවෙන් කරන්නේ, තිබෙන කර්මාන්තත් නැති කරන එකයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දුප්පත් ජනතාවට සිදු වී තිබෙනවා, පරිසරයත් එක්ක ගැටෙන්න. ඒ නිසා ස්වාභාවික පරිසරය විනාශ වී යනවා. අර ප්‍රශ්නය විසඳන්න ස්වාභාවික පරිසරය විනාශ වී යන විධියට ක්‍රියා කරනවාද කියන එක ගැන තීරණයක් ගන්න ආණ්ඩුවට සිදුවී තිබෙනවා.

තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ සංකේතය වන අලියා පවා දැන් නැති වේගෙන යනවා. ඒ මොකද ? සිංහල රජ කාලේ ඉඳලා ඒ ප්‍රදේශවල තිබුණා, අලි යන පාරවල්. අද ඒවා වසා දමා තිබෙනවා. ඇතුන්ට පමණක් නොවෙයි, අද සියලුම වන සතුන්ට අනතුරක් ඇති වී තිබෙනවා. ගස් කොළං නැතිවී ගොස් තිබෙනවා [බාධා කිරීම්] කළුතර දිසා ඇමතිතුමාට හොඳට විහිළු කිරීමේ ශක්තියක් තිබෙන බව මම දන්නවා. තමුත් මේක විහිළු—තහළු කළ යුතු ප්‍රශ්නයක් නොවෙයි. මේක ලංකාවේ ස්වාභාවික පරිසරයට, අනාගත පරම්පරාවට බොහොම බලපාන ප්‍රශ්නයක්.

ඒ නිසා මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඉඩම් පාර්ලිමේන්තුව පිළිබඳව සොයා බැලීම සඳහා දැනටමත් කොමිසමක් පත් කර තිබෙනවා. එක්කෝ ඒ කොමිසම මගින් හෝ එහෙම නැත්නම් විශේෂ ජනාධිපති කොමිසමක් පත් කොට ඒ මගින් හෝ මේ ප්‍රශ්නයේ සැම පැත්තක් ගැනම සොයා බලා අවශ්‍ය කටයුතු කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

Can I tell the hon. Member who has always had a very deep concern for the environment that some of the evidence that is coming before the Land Commission is of a very parochial nature and about day to day problems does not refer to the larger question of future policy in regard to land use, shift of population, migratory patterans, wild life etc.,

I would be very happy if the hon. Member could place in an organized way some of the concerns that he is expressing about the environment and future land policy before the Land Commission because it consists of a very competent body of men. I shall be very grateful if you can do that.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඒ ප්‍රශ්නය ගැන මම ඊට වඩා කථා කරන්න අදහස් කරන්නේ නැහැ.

අපේ කළුතර දිස්ත්‍රික්කයේ තිබෙනවා, දිවංගත ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ ඇති කළ පැරණි ජනපද. ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට, පවුල්වලට දැන් ඒ ජනපද ඉඩම් ප්‍රමාණය බොහොම මදි. ඒ නිසා දැන් ඒ අය ඒ ඉඩම්වල ජීවත් වන්නේ තෙරපිලයි. එක ඉඩම් කැබැල්ලක ජීවත් වන පවුල් සංඛ්‍යාව පරම්පරාවෙන් පරම්පරාවට වැඩි වෙනවා. ඒ නිසා අපි ඒ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගන්න ඕනෑ.

ඒ හැරෙන්න, ඒ ජනපද ඇති කළ කාලයේ ඒවාට හරියාකාරව පාරවල් හැදුවේ නැහැ. සමහර විට පාරක් — දෙකක් හදන්න ඇති. නමුත් අතුරු පාරවල් නම් හැදුවේ නැහැ. හැදූ පාරවලට තාර දමා තිබුණේත් නැහැ. ඒ නිසා දැන් ඒ පාරවල ගමන් කිරීමත් බොහොම අමාරු වී තිබෙනවා.

මෙවැනි ජනපද ඇති කොට ඒවායේ පාරවල් පළාත් පාලන ආයතනවලට භාර දෙන්න ඕනෑයයි අමාත්‍යාංශය කියනවා. තමුත් පළාත් පාලන ආයතනවලට දැනට තිබෙන පාරවල් ටිකවත් නඩත්තු කරන්න මුදල් නැත්නම් අලුතින් දෙන්න යන ජනපද පාරවල් නඩත්තු කරන්නේ කොහොමද ? ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මතුගම ආසනයේ පමණක් නොව අගලවත්ත, හොරණ ආදී ඒ සියලුම ආසනවලට තිබෙන ජනපදවල මංමාවත් දියුණු කිරීම සඳහා යම්කිසි මුදලක් වෙන් කර දෙන්නය කියා.

ඒ වාගේම මේ ජනපදවල වැඩ කරන ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපට බොහොම පැමිණිලි ලැබී තිබෙනවා. මේ ක්ෂේත්‍ර නිලධාරීන් වැඩ කරන්නේ ඉඩම් කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුව යටතේයි. ඔවුන්ට උසස්වීමක් ලබා ගන්න බැරිලු. ඒ නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ උදවිය ජනපද නිලධාරීන් වශයෙන් තෝරා ගන්නය කියා. එතකොට ඒ අයට උසස්වීම් ලබා ගන්න පුළුවන් වෙයි. මේ ක්ෂේත්‍ර නිලධාරී තනතුරු ඇති වුණේ 1935 කාලයේදීයි. ඒ කාලයේ තිබුණේ වෙන තමක්. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් කටිටි ඕවර්සියර් කියායි ඒ දවස්වල කිව්වෙ. දැන් ක්ෂේත්‍ර නිලධාරීන් කියා කියනවා. මේ උදවියටත් උසස්වීම් දීමේ ක්‍රමයක් ඇති කරන්න ඕනෑ, ජනපද නිලධාරීන් වශයෙන්. ඒ වාගේම ඒ උදවියට ලැබෙන පඩිතඩිත් බොහොම අඩුයි. අනික් දෙපාර්තමේන්තුවල සිටින උවියගේ පඩි තඩි හා සමානව මොවුන්ගේ පඩි තඩි වැඩිවෙලා නැහැ. කාලාන්තරයක් තිස්සේ මේ අය තොයෙක් වැඩ කර තිබෙනවා. ජනපද ගැන, වගාව ගැන, මායිම් ගැන, ස්වර්ණ භූමි ඔප්පු ගැන, වැඩ කරන මේ අය තාක්ෂණික ග්‍රේඩ් එකට උසස් කරන්නය කියා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඔවුන්ට තොයෙක් පළාත්වල සේවය කිරීමේදී අද ගමනාගමනය පැත්තෙන් අමාරුකම් තිබෙනවා. එම නිසා ප්‍රවාහන කටයුතු සඳහා මෝටර් සයිකල් ඔවුන්ට ලබා දෙන්න. මේ අයගේ දුක්ගැනවිලි රාශියක් තිබෙනවා. ඒවා මම ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. ඒ ගැනත් තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කරන්න.

ඊළඟට අපේ ප්‍රදේශයේ වාරිමාර්ග ගැන කිව යුතුයි. තෙත් කලාපයෙ සාමාන්‍යයෙන් වාරිමාර්ග ගැන කතා කරන්නෙ නැහැ. මේ ප්‍රදේශයේ වැඩියෙන් තිබෙන්නේ වතුර බැස යාමට සැලැස්වීමේ ප්‍රශ්නයයි. වතුර ගලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යාම සඳහා තිබෙන වාරිමාර්ග පස්වලින් පිරී තිබෙනවා. ඒවා කපන්නේ නැතුව, ශුද්ධ කරන්නේ නැතුව ලොකු ගොවිතැන් ප්‍රමාණයක් පාඩුවෙලා තිබෙනවා. එම නිසා මම ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන්, ඒ ප්‍රදේශයටත් මුදල් වෙන් කර ඒවා ගැඹුරු කරන්න කියා, ඒ වාරිමාර්ග ක්‍රම පාවිච්චියට ගත හැකි වන ආකාරයෙන්. එවිට අපට සැහෙන ප්‍රමාණයක් කුඹුරු ගොවිතැන් කරන්නට පුළුවන් වෙයි.

තමුන්නාන්සේ පිළිගනිවි අද ප්‍රවාහන කටයුතු සඳහා යන කුලිය ඉතා අධික බව. ඒ නිසා අපට පුළුවන් තරම් අපේ ප්‍රදේශවලම නිෂ්පාදනය වැඩි කර ගන්න ඒක බොහොම ගොඳයි. අපේ ප්‍රදේශයේ තිබෙනවා මිගම-ලද්දුව කියා යායක්. සිංහල රජ කාලයේ අක්කර 3,000 ක, 4,000 ක වගාවක් එහි තිබුණා. තමුන් අද ඒක නැතිවෙලා තිබෙනවා. ඒකට නොයෙක් හේතු තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂි කර්ම දෙපාර්තමේන්තුව හා ධීවර දෙපාර්තමේන්තුව එකතුවෙලා පර්යේෂණයක් පවත්වා කියා තිබෙනවා සාමාන්‍යයෙන් මුහුදු මට්ටමට වඩා අඩියකින් පහළ තිබෙන භූමිවල ගොවිතැන් කරන්න බැහැ කියා. එහි නොයෙක් ඇසිඩ් වර්ග, තවත් අමතර දේවල් තිබෙන නිසා ඒවායේ වගා කරන්න බැරිය කියා, කියා තිබෙනවා. එම නිසා අපි පර්යේෂණයක් පවත්වා ගෙන යනවා ඒ මුහුදු මට්ටමට පල්ලෙහා භූමිවල මොනවා කරන්නද කියා. ඒ වාගේම ඒවායේ වැඩ කළ උදවිය සිටිනවා. ඔවුන් එතැන වතුර පොම්ප කළා. ඒ පොම්පාගාරවල සිටි උදවිය අනියම් සේවකයින් වශයෙන් අඩු වශයෙන් අවුරුදු 14 ක් වැඩ කළා. දැන් කියනවා ඒ අයට ගෙදර යන්නය කියා. මොකක් හරි ක්‍රමයක් යොදවන්න ඕනෑ මේ උදවියව වාරි මාර්ග දෙපාර්තමේන්තුවට ගන්න. එතැන බැරි නම් වෙනත් ඕනෑම තැනක ඔහොම් වැඩ කරන්න ඒ අය කැමතියි.

පූ. භා. 10.45

ඊළඟට කැලෑ දෙපාර්තමේන්තුව ගැන කියන්නට ඕනෑ. මේ පරිසර දූෂණය ඇතිවෙලා තිබෙන්නේ රජරට පමණක් නොවෙයි. අපේ ප්‍රදේශයේ සිංහ රාජ අඩවිය බොහොම පැරණි කැලයක්. ලංකාවට මනුෂ්‍යයෝ එන්නටත් පෙර සිට තිබුණු කැලයක්. ඒ කැලෑව ඔබතුමාත් දන්නවා. ඔබතුමා මේ පැත්ත ගැන, පස්දුන් කෝරළය ගැන හොඳහැටි දන්නවා. මම මන්ත්‍රී කෙනෙක් වුණාට පසුවත්—1956 ට පසුවත්—මේ කැලෑව සැහෙන්න කපා තිබෙනවා. අද බොහොම ටිකයි ඉතුරුවෙලා තිබෙන්නෙ. එම නිසා මම ඉල්ලනවා මේ කැලෑව යළින් වගා කරන්න කියා. ඒ පළාත්වල නොයෙක් කොන්ත්‍රාත්කාර මහත්වරු ඇවිත් කැලෑව කපා ගස් ගෙන යනවා. පොලිසියත් සම්බන්ධයි මේවාට. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලුවා යම්කිසි ජංගම පර්යේෂණ අංශයක් ඇති කරන්නටය කියා, එකපාරටම ගිහිල්ලා මේවා අල්ලන්න. රෑට තමයි මේ කදන් ගෙකියන්නේ. "කදතේරිස්ලා" කියා අපි ඒ උදවියට නම් කර තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන පරීක්ෂණයක් පවත්වන්නටය කියා. එසේ නැත්නම් මේ කැලෑ සම්පූර්ණයෙන්ම නැතිවෙලා යාවි.

අවසාන වශයෙන් අද තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයට ලොකු අනතුරක් ඇවිත් තිබෙන බව සඳහන් කරන්න ඕනෑ. මාදුරු ඔය වගේ ප්‍රදේශවල ඇති කරන්නට යෝජනා කළ යෝජනා ක්‍රම දැන් අත් හිටුවා තිබෙනවා. අද ඒ ප්‍රදේශවලට තුස්තවාදීන් ඇවිත් ඒ පළාත්වල උදවිය කරදරයට පත් වී තිබෙනවා. මම දැක්කා, අද අපේ ගරු මහා නායක ස්වාමීන් වහන්සේලා දෙනමම ප්‍රකාශ කර තිබෙනවා, "සිංහල උදවියට අද සිංහල ප්‍රදේශවලින් ඉවත්ව ගොස් අනාථ කඳවුරුවල ඉන්න සිද්ධවෙලා තිබෙනවාය" කියා. තමුන්නාන්සේලාගේ දර්ශනයක් වශයෙන් පවත්වාගෙන ගිය ඒ මාදුරු ඔය වගේ යෝජනා ක්‍රම ඇති ප්‍රදේශවල සිංහල ජනතාවට අද ඒ ප්‍රදේශවලින් ඉවත්ව යන්නට සිද්ධ වී තිබෙනවා. අපේ ගරු ඇමතිතුමා කිව්වා අද සිංහල ජනතාව දවසින් දවස වැඩි වෙගෙන යනවාය කියා. එහෙමනම් ඒ වැඩි වන ජනතාවට යන්න තැනක් තියෙන්න ඕනෑ. වැඩිය කැලෑ තිබෙන්නේ ඒ ප්‍රදේශවලයි. දෙමළ ප්‍රදේශය කියලා කිව්වට, එහෙම දෙමළ ප්‍රදේශය සිංහල ප්‍රදේශය කියලා වෙන් කරලා නැහැ. ඉඩ කඩම් තිබෙන ප්‍රදේශවලට ජනතාවට යවන්න ඕනෑ. ඒ යෑම අද තතර වෙලා තිබෙනවා. එම නිසා මේක ලොකු ප්‍රශ්නයක්. මම කියන්නේ නැහැ, ඔබතුමාට මේ ප්‍රශ්න සියල්ලම විසඳන්නට පුළුවන්ය කියා. වාරි මාර්ග අතින්, කෘෂිකර්මය අතින්, ජනපද පිහිටුවීම අතින් අද ලංකාවේ දියුණුව ඇති කරන්නට කල්පනා කරන තමුන්නාන්සේලා උතුරේ ඒ පැතිවල පමණක් නොවෙයි ඒ කොණේ පමණක් නොවෙයි—රජ රට මෙන්ම, රුහුණේත් යෝජනා ක්‍රම ඇති කර තිබෙනවා. මම දන්නා, තමුන්නාන්සේ ඔහින් ලුණුගම් වෙහෙර යෝජනා ක්‍රමය විවෘත කර තිබෙනවා. ඒ විධියට අපේ තෙත් කලාපයේ තිබෙන ප්‍රදේශවලටත් වාරිමාර්ග අතිතුත් කෘෂිකර්මය අතිතුත් අද තිබෙන ශක්තියට වඩා වැඩි ශක්තියක් දෙන්නය කියා මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. මම දීර්ඝ වශයෙන් කථා කරන්නට යන්නේ නැහැ. තමුන්නාන්සේට ස්තුතියි.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වෙන ස්වල්පයක් කථා කිරීමට ලැබීම උතුරු මැද පළාතේ මන්ත්‍රීවරයෙක් වසයෙන් මගේ ලොකු භාග්‍යයක් කොට මා සලකනවා. ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැඩකටයුතු වැඩියෙන් බලපාන්නේ පොළොන්නරුව ප්‍රදේශයටයි. උතුරු මැද පළාතයි. [බාධා කිරීම්]—ත්‍රිකුණාමලයත් අයිතියි.

ගරු සභාපතිතුමනි, එද සුදු අධිරාජ්‍යවාදීන්ගේ යුගයෙන් පසුව, මේ රටේ සිංහලයින්ට බිම් අහලක්වත් අයිති නැතිව තිබුණු අවස්ථාවක එවකට කෘෂිකර්ම ඉඩම් හා වාරිමාර්ග ඇමති ගෑටියට සිටි ගරු මහා මාත්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා, 1935 ඔක්තෝබර් මාසයේ 15 වනද මේ ඉඩම් අඥපනත රාජ්‍ය මන්ත්‍රණ සභාවට ගෙනැවිත් සම්මත කර ඒ තුළින් මේ රටේ සිංහල ජනතාවට පමණක් නොව, මේ රටේ ජීවත් වන හැම පුරවැසියෙකුටම ඒ අයිතිය ලබා දුන් බව මා මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) වේදිකාවේදී කථා කළා. [බාධා කිරීම්] වේදිකාවේදී නොවෙයි, මේ ගරු සභාවේදී කථා කළා. ඒවාගේම මතුගම මන්ත්‍රීතුමාත් (අනිල් මුණසිංහ මහතා) කථා කළා. ඒ කථාවලින් මට පෙනීගියේ, එතුමන්ලා මේ කොහේ ඉදගෙනද කථා කරන්නේ කියලයි. අපි ඉන්නේ උතුරු මැද ප්‍රදේශයේ. උතුරු මැද පළාතේ කෘෂිකර්මය කරන ප්‍රදේශවල ඉන්න මන්ත්‍රීවරුන් හැටියට අපි දන්නවා, මේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය තුළින් රටට වන සේවය කොපමණද කියා. තමුන්නාන්සේලාට ඒක තොපෙනීම ගැන අපි කණගාටුවෙනවා. විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලා කරන්නේ, කවුරුන් හෝ දෙන කඩදාසි කියව කියවා ඒවා සභාගත කිරීමයි. මා කතගාටුවනවා, තමුන්නාන්සේලා තුළ නියම තත්ත්වය ගැන මතා දැනුමක් නොතිබීම ගැන. වයස අවුරුදු දහයේ සිට, මම අධ්‍යාපනය ලැබුවේත් පොළොන්නරුව ප්‍රදේශයේ පාඨශාලාවලින්. එහි කුඩා කාලයේ සිට පදිංචිව සිටි නිසා, මා හොඳින් දන්නවා, මහාමාත්‍ය ඩී. එස්. සේනානායක, සී. පී. ද සිල්වා ආදී මැතිතුමන්ලා ඒ ප්‍රදේශයට කළ සේවය ගැන. මහාමාත්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා ගගක් යට සෙවණක සිටින විට, කුඩා කාලයේ මා එතුමා ළඟට ගිහින් කථා කළාම, එතුමා මගේ ඔළුව අතගා මා සමග කථා කළ හැටි මට තවමත් මතකයි. අන්න ඒ අත්දමට ඇත කාලයක සිට අපේ ප්‍රදේශවල ඉතිහාසය ගැන මා හොඳින් දන්නා නිසයි කථා කරන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
තංගල්ලෙදින් හම්බු වුණාද ?

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

තංගල්ලේ තියා කොහේ ඉපදුණත් මොකද ? ලංකාවේ ඉපදුණු මනුෂ්‍යයකු හැමු වන්නේ තැත්තේ කොහේදිද ? දුටුගැමුණු රජතුමා උපන්නේ කොහේද ? එතුමා කොත්මලයට ගිහින් එතැනින් අනුරාධපුරයට ගියා රට ආරක්ෂා කිරීමට. එම නිසා ඉපදුණු තැන් ගැන කථා කරන්නට අවශ්‍ය නැහැ. [බාධා කිරීමක්] කොත්මලේ ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑම දෙයකට මට පිළිතුරු දෙන්නට පුළුවනි, මගේ ඔතට එනකම්ම.

ගරු සභාපතිතුමනි, මේ රටේ ඉපදී සිටි පුරවැසියන්ට පොළොන්නරුවෙන් බිම් අහලක්වත් ලබා ගන්නට බැරිව තිබුණු අවස්ථාවක, එද, මේ රටේ නා නා ප්‍රදේශවලින්, කොත්මලෙන්, කැගල්ලෙන්, මාවතැල්ලෙන්, අත්තනගල්ලෙන්, ගාල්ලෙන්, මාතරින් මේ වාගේ හැම ප්‍රදේශයකම ඉඩම් තැතිව සිටි ගොවි ජනතාව පොළොන්නරුව ප්‍රදේශයට ගෙනැවිත්, එක් පවුලකට මඩින් අක්කර පහකුත්, ගොඩින් අක්කර තුනකුත් ලබා දී පදිංචි කරවීමට මහාමාත්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා එද ක්‍රියා කළ නිසා අද ඒ අය ඉතා සන්තෝෂයෙන් එම ප්‍රදේශවල ජීවත් වෙනවා. නමුත් ඒ අවස්ථාවේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. ජී. පී. නෙල්සන් මහතා]

විරුද්ධ පක්ෂයේ නායකයන් වශයෙන් ක්‍රියා කළ නැසීගිය ආචාර්ය එන්. එම්. පෙරේරා, දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ යන මහත්වරුන් ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහත්මයාත්—

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண்ட் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජලය නිකුත් කිරීම සම්බන්ධයෙන් විදේශ ඒජන්සිය සමඟ එකතු වී වැඩ කරනවාය කියා ඊට විරුද්ධව මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) අද කථා කරනවා ආගේ එදත් විරුද්ධ පක්ෂය, ඩී. එස්. සේනානායක මැතිතුමා ගෙන ගිය ව්‍යාපාරයට විරුද්ධව මේ ගරු සභාවේදී කථා කළ ආකාරය **හැන්සාඩ්** වාර්තාවලින් අපට බලා ගන්න පුළුවනි. එද, මේ ගොවි ජනතාව ගිහින් ඒ ප්‍රදේශවල පදිංචි කරන විට, "කැලෑ ජෝන් ලා මේ මිනිසුන් රැගෙන ගොස් කාක්කන් නරම් ලොකු මදුරුවන් ඉන්න ප්‍රදේශවල පදිංචි කරවනවා, මේ අයට හැදී තිබෙන පිස්සුව මොකක්ද ?" ආදී වශයෙන් ඒ අය කථා කළා. ඔන්න ඔය විධියට අපහාසාත්මක ලෙස කළ කථා මේ **හැන්සාඩ්** වාර්තාවල පළ වී තිබෙනවා. එවැනි බාධක මධ්‍යයේ තමයි අපේ ඒ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා ජනතාව ඒ ප්‍රදේශයට ගෙනිහින් පදිංචි කරවූයේ. 1974 මහා මැතිවරණයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබුණේ පොළොන්නරුව ආසනය පමණයි. ජන්ද දායකයන් සිටියේ පන් දහස් හත් සිය ගණනයි. එක්සත් ජාතික පක්ෂයෙන් ජයග්‍රහණය කළ එම ආසනයේ අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වී සිටියේ පී. එල්. බෞද්ධසාර මහත්මයායි. සමහර විට අපේ අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එතුමා ගැන දන්නවා ඇති. ඒ කාලයේ මින්නේරිය ආසනය හෝ මැදිරිගිරිය ආසනය තිබුණේ නැහැ. එද ඒ ප්‍රදේශයේ මුළු ජනගහනය තිස් හත් දහස් ගණනක්. නමුත් අද එම ප්‍රදේශයේ ජනගහනය ලක්ෂ දහය ඉක්මවා සිටිනවා. තව ත්වත් මේ ප්‍රදේශ දියුණු වෙනවා. එසේ දියුණු වන විට ජනගහනයත් වැඩි වෙනවා. ජන්ද දායකයන්ගේ සංඛ්‍යාව දැන් එක් ලක්ෂ පනස් දහස ඉක්මවා සිටිනවා. මාදුරුඔය ව්‍යාපාරය යටතේ අලුත් ජනපද ඇති වීමත් සමඟම මේ ජනගහනය තවත් වැඩි වෙනවා. කොත්මලේ, අරතායක, කැගල්ල ආදී ප්‍රදේශවලින් දැනටමත් පවුල් තුන් දහස් ගණනක් පදිංචි කරවා තිබෙනවා. තවත් පවුල් පනස් දහසක් අලුතෙන් පදිංචි කරවන්නට යනවා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අප ආරාධනා කරනවා, එම ප්‍රදේශයට පැමිණෙන හැටියට. දැනට ත්‍රිකුණාමලයේ පොඩි ප්‍රශ්නයක් තිබෙන බව ඇත්ත. අපි එය නැතැයි කියන්නේ නැහැ. මාදුරුඔය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පදිංචි කරවා ඇති ගොවි පවුල් කොයි ආකාරයෙන් ජීවත් වනවාද කියා බලා ගැනීමට එම ප්‍රදේශවලට පැමිණෙන ලෙස ආරාධනය කරන අතර ඒ අයගේ යම් යම් අඩුපාඩුකම් ඇත්නම් මේ ගරු සභාවට දන්වන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

ඒ අය ජීවත් වෙන්නේ කොහොමද කියා ඇවිදින් බලන්න. අන්න ඒ තිසයි මම කියන්නේ. එද 1947 දී සිටියේ පන් දහස් ගණනයි. අද අපේ ප්‍රදේශයේ විශාල ජනගහණයක් ජීවත් වෙනවා. කවුරු නිසාද ? මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ඉඩම් ආඥාපනත තුළින් මේ රටේ ඉඩම් සංවර්ධනය ක්‍රියාත්මක වූ නිසා එසේ වූවාය කියන එක මම මේ ගරු සභාවේදී සන්තෝෂයෙන් මතක් කරන්නට ඕනෑ.

මෛත්‍රීපාල සේනානායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා හැටියට ක්‍රියාකරන විට තමුන්නාන්සේලාත් මේ ගරු සභාවේ සිටියා. එදා ඉඩම් විකිණීමේ පනත සම්මත කර අපේ හැම අහිංසක ගොවියකුගේ ඉඩමක්ම ඒවායේ තිබෙන වැවිලි අනුව රුපියල් හැත්තෑ පන්දහසට, රුපියල් හැට දහසට, රුපියල් පණස් දහසට රුපියල් හතලිස් දහසට තක්සේරු කර ඒ අයට ඉඩම් අයිතිකර දීම සඳහා ඒ ඉඩම්වලට මුදල් ගෙවන්නටය කියා ඒ අයට නියෝග කළ බව තමුන්නාන්සේ දන්නවා. තමුන්නාන්සේලා තමයි ඒක සම්මත කළේ. වාසනාවට වගේ එදා විරුද්ධ පාර්ශ්වයේ නායකයා හැටියට අපේ වර්තමාන ගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාත් අපේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන සහ මහවැලි සංවර්ධන ඇමති ගාමිණී දිසානායක මැතිතුමාත් පොළොන්නරුවට ගිහින්, " ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඩම් විකිණීමේ පනත වෙනස් කර ස්වර්ණභූමි සංකල්පය යටත් ඔප්පුවක් දෙනවා " ය කියා ජනතාවට පොරොන්දුවක් දුන්නා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපේ රජය බලයට පත්වුණාට පස්සේ එදා ඒ කියපු වචනය ක්‍රියාත්මක කරන්නට අපට පුළුවන් වුණා. ඒ ආණ්ඩුව යටතේ මුදල් අය කර ගත් ගොවි මහත්වරුන් අද තවමත් ඉන්නවා. අද " අදකාරයා " එහෙම කැත්තම් " රිසවේෂන් කාරයා " කියන නම කපා දමා " ස්වර්ණභූමි " ඔප්පු යටතේ ඉඩම්හිමි වැවිලිකාරයා හැටියට ඒ නම වෙනස් කර පනත සම්මත කළේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තුළින් බව මම සන්තෝෂයෙන් තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. [බාධාකිරීමක්] වැවිලිකරුවෙක් තමයි. කැගල්ල, මාවතැල්ල, මාතලේ වැනි ප්‍රදේශවලින් ගොස් ඉඩම් අක්කර පහ, අක්කර තුන ආදී වශයෙන් ලබාගෙන සෑම හෝගයක්ම වගාකර ඉඩම්හිමි වැවිලිකරුවන් බවට පරිවර්තනය වූ විශාල පිරිසක් අපේ ප්‍රදේශයේ සිටින බව තමුන්නාන්සේ දන්නවා. හොඳ දක්ෂ ගොවීන් ඉන්නවා. එද තමුන්නාන්සේලා ක්‍රියාත්මක කළේ ඉඩම් විකිණීමයි. අද තමුන්නාන්සේලා අහිංසක ගොවියන්ගෙන් රුපියල් විසි පහ, රුපියල් පණහ ආදී වශයෙන් එකතු කරගෙන පෙරකදෝරුවන් මාර්ගයෙන් උසාවිවලට ගොස් නඩුදුගෙන යනවා. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැති එක ගැන මම කණගාටු වෙනවා. අද ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළට විරුද්ධව සංවිධානමය වැඩ පිළිවෙළක් ගෙන යනවා. ඒ අයට ඉඩම් ලැබෙනවාට වතුර ලැබෙනවාට තමුන්නාන්සේලා කැමති නැහැ. ඒ අයට වතුර ලැබෙනවාට කැමති නම් ඔය විධියට විරුද්ධ වන එක කණගාටුවට කරුණක්.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගොවියාගෙන් බද්දක් අය කරගන්න එපා. කන එකාගෙන් අය කරගත්ත.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

දියබද්දට විරුද්ධ වන තමුන්නාන්සේලා ඉඩම් විකිණීමේ පනත ගෙනාවා. දියබද්ද කියන්නේ ඒ අයගේ කුඹුරුවලට වතුර යන ඇලවල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එකතු කරන මුදල්. ඒ මුදල් අපේ භාණ්ඩාගාරයට යන්නේ නැහැ. ඒ මුදල් නැත්පත් වෙන්නේ දිසාපතිවරයාගේ කාර්යාලයේ බව මම තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. ඒ මුදල් අරගෙන ඒ ප්‍රදේශයේ ඉන්න ගොවි මහත්වරුන්ගේ දු දරුවන් සම්බන්ධ කරගෙනයි ඒ ඇලවේලි හදන්නේ. ඒ මුදල්වල පාලනය ගෙන යන්නේ අපි. දිසාපතිතුමා ළඟ වෙනම ගිණුමක වෙනම කොටසක ඒ මුදල් නැත්පත් කර තිබෙනවා.

පූ. හා. 11

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඔක රට බෙදීමේ කුමන්ත්‍රණයේ කැල්ලක් කියන එක හොඳට හිතේ තබාගන්න.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

රට බෙදීමට මේක සම්බන්ධ නැහැ. මේක කෘෂිකර්මයට සම්බන්ධ වූ දෙයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු දිසා ඇමතිතුමා මූලාසනයට කථා කරන්න.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
සමාවෙන්න නියෝජ්‍ය සභාපතිතුමනි, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්නයක් අහන විට ඒකට පිළිතුරු දෙන්න වුවමනා නිසයි මම ඒ පැත්තට හැරුණේ. නියෝජ්‍ය සභාපතිතුමාට මම ගරු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාරිමාර්ග යටතේ අය කරන දියබද්ද ගැන එතුමා සඳහන් කළා. අද අපේ ප්‍රදේශයේ දියබද්ද තුළින් සැහෙන වැඩ කොටසක් කෙරී තිබෙනවා. ගොවි මහත්වරුන් ඉතාමත් සන්තෝෂයෙන් ඒ මුදල් නැත්පත් කරනවා. අපේ ප්‍රදේශයේ ගොවි මහත්වරුන්ගෙන් සියයට 80ක් ඒ ජලබද්දට එකඟ වී මුදල් ගෙවා තිබෙනවා. ඒ මුදල් වෙනමම අංශයකින් තැන්පත් කර තිබෙනවා. ඒක ගාණ්ඩාගාරයට එන්නේ නැහැ. එද පසුගිය හැත්තෑව, හැත්තෑඅට දක්වා රජය කාලයේ ගොවි මහත්වරු අහස දිහා බලාගෙන හිටියා. ගරු මන්ත්‍රීතුමා අද එහෙම දෙයක් නැහැ. අද වුවමනා තරම් වතුර තිබෙනවා. ඉඩම් තිබෙනවා. යල මහ දෙක වැඩ කරනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
පොල්ගොල්ල ගදලා.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
තමුන්නාන්සේලාගේ කාලයේ හමුදාව දලා වතුර දුන්නේ කියා මම කියන්නට ඕනෑ. ඒවා වාර්තා වී තිබෙනවා. වතුර යන හැම "පෝල්" එකකම පොලිසියටයි, හමුදාවටයි තුවක්කු තබාගෙන ඉන්නට වුණා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
අද එහෙම තත්ත්වයක් නැහැ.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
අද ඒ තත්ත්වය නැහැ. අද ගොවියා හොඳට බුදියා ගත්තා. 1977 සුළි සුළිඝාත් පසු පරාක්‍රම සමුද්‍රය ප්‍රතිසංස්කරණය කර කිසිම ප්‍රශ්නයක් නැතුව අද තවත් අක්කර විසිදහකට වතුර දෙන්න සකස් කර තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
පොල්ගොල්ලට වදින්න ඒකට.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
පොල්ගොල්ල ක්‍රියාත්මක කළෙත් එක්සත් ජාතික පක්ෂය. මහවැලි යෝජනා ක්‍රමය ආරම්භ කළේ සී. පී. ද සිල්වා මැතිතුමා.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)
(Mr. Ananda Dassanayake – Kotmale)
බොරු කියන්න එපා.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
පරාක්‍රම සමුද්‍රයට වතුර ලැබෙන්නේ අඹන් ගඟෙනුයි. පොල්ගොල්ලෙන් නොවෙයි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
අඹන් ගඟට වතුර දෙන්නේ පොල්ගොල්ලෙන්.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එතුමාට ඒ පිළිතුරු දුන්නේ මේ ජල බද්ද ගැන කථා කළ නිසයි. එද මේ අය සම්පූර්ණයෙන්ම ඉඩම් විකිණීමේ ක්‍රමය ක්‍රියාත්මක කළා. මම කලින් සඳහන් කළාක් මෙන්, අද හැම කෙතෙකුටම වාගේ ස්වර්ණ හූමි ඔප්පු ලබාදී ගෙන යනවා. ඒ ස්වර්ණ හූමි ඔප්පු ලබාදීමෙන් ඒ ඉඩම්වල අයිතිය ඒ අයට තහවුරු වී තිබෙනවා. ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අපේ ගෞරවය පිරිතමන්නට ඕනෑ කියා මා ප්‍රකාශ කළේ ඒ නිසයි. අද කිසිම ප්‍රශ්නයක් නැහැ. ගරු ජනාධිපතිතුමාගේ අත්සන සහිතව ඒ අයට ඔප්පුවක් ලැබී තිබෙනවා. අද අදකාරයා, රෙසවේෂන්කාරයා කියන නම සම්පූර්ණයෙන්ම කපා ඉවත් කර තිබෙනවා.

මේ රටේ සංවර්ධනයක් වෙනවා නම් හැමදම විරුද්ධ පාර්ශ්වය විරුද්ධ වී තිබෙනවා. තමුන්නාන්සේලා කළ ජනපදය මොකක්ද කියා කියන ලෙස ගරු විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලාගෙන් මම අහන්න කැමතියි. කාටද ඉඩම් දී තිබෙන්නේ. කොයි ගොවි ජනපදයද තමුන්නාන්සේලා හැදුවේ. අද මේ ගරු සභාවේ මේ විධියට කථා කරනවා. අද මේ රටේ ඉඩම් දී තිබෙනවා නම් එසේ දී තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය තුළිනුයි. එද, ඩී. එස්. සේනානායක මැතිතුමා මිත්තේරිය ව්‍යාපාරය ආරම්භ කළා. ඒ වාගේම පොලොන්නරු, ගල්ඔය, පදවිය ඒ වාගේ තොයෙක් තොයෙක් ව්‍යාපාර ආරම්භ කර මේ රටේ වැඩි වන ජනතාවට ඉඩම් සොයන්නට එතුමා ගත් ක්‍රියාමාර්ගය නිසා අද ඒ ප්‍රශ්නය විසඳී තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
අද එහේ ගොවියෝ සේරම ආපසු එනවා.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
පොලොන්නරු ප්‍රදේශයේ එගෙම දෙයක් වෙලා නැහැ. තවමත් ඒ ප්‍රදේශයේ ගොවියෝ එතැනම ඉන්නවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக්ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ඇයි දෙහිවත්ත, වැලිකන්ද ?

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
අපි එය පිළිගන්නවා. අපි කැහැටි කියන්නේ නැහැ. ආරක්ෂා කටයුතු සඳහා අපි ඒ අයට තාවකාලිකව එන්න කියා තිබෙනවා. තවමත් ඒ ප්‍රශ්නය ගැන අපි තොඩියව ඉදිරියට යනවා. තවමත් ඒ සංවිධානමය කටයුතු අපි ඒ ප්‍රදේශයේ කරගෙන යනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
තමුන්නාන්සේ අනුරාධපුරයට යන්නෙත් නැහැ ; පොලොන්නරුවට යන්නෙත් නැහැ.

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)
කිලපොල, දෙහිවත්ත ආදී ඒ ප්‍රදේශවලින් ඒ අය ආවා කියා අපි පිළිගන්නවා. ඒ නිසා ඒ අයට ආහාරපාන දී කඳවුරුවල තවතා ගෙන ඉන්නවා. [බාධා කිරීමක්] ඒකයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ ව්‍යාපාරය තුළින් අද සැහෙන සංවර්ධනයක් වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order Please! ගරු දිසා ඇමතිතුමා තව කොපමණ වේලා කථා කරනවාද?

එච්. ජී. පී. නෙල්සන් මහතා
(திரு. எச். ஜீ. பீ. நெல்சன்)
(Mr. H. G. P. Nelson)

තව විනාඩි පහයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව එකක් මතක් කරන්නට ඕනෑ. මාදුරුඔය ව්‍යාපාරය ගැන මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) ප්‍රශ්නයක් මතු කළා. ඒ ප්‍රදේශයේ තව තවත් ආරක්ෂා සංවිධාන තර කර තිබෙනවා. ඒ ප්‍රදේශයෙන් තවම ගොවි මහත්වරු ඉවත් වී නැහැ. මහවැලි කලාපයේ මාදුරුඔය ජලාශය අවට ප්‍රදේශයේ ආරක්ෂා සංවිධාන අපි ඇති කර තිබෙනවා. ඒ නිසා කිසිම ගොවි මහත්මයෙක් තවම ඒ ප්‍රදේශයෙන් ඉවත් වෙලා නැහැ. ඒ සංවර්ධන කටයුතුවල වැඩ තවත්වත්තේ නැතිව කරගෙන යනවා.

ඒ වගේම මම කියන්න ඕනෑ තවත් කාරණයක්. එනම්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව තුළින් පසුගිය වකවානුවේදී, එදා සාමාන්‍ය රෙජවේෂන්වල හිටපු අයට බලපත්‍ර දීම වැනි දේ කරගෙන ගියත්, දැන් ඔවුන්ට ඉඩම් දීමේ වැඩ කටයුතු රාශියක් කරගෙන යාමට තිබෙන නිසා එම අමාත්‍යාංශයට සැහෙන වැඩ කටයුතු තිබෙන බව මම දන්නවා. ඒ නිසා ඔවුන් ගෙන් යම්යම් ප්‍රමාද වීම් ඇති වන බවත් මම දන්නවා. නමුත් සෑම කෙනෙකුටම ඉඩම් ලබාදීම සඳහා අපි දැනටමත් ඉතා ඉක්මණින් ක්‍රියා කරගෙන යනවා.

ස්වර්ණභූමි ඔප්පු හිමි අඩකට දැන් ඒවා දී තිබෙනවා. අනෙක් අයටත් එම ඔප්පු ලබාදීමට අපි ක්‍රියා කරගෙන යනවා. එම නිසා ඒ ගැනත් ඉක්මණින් කටයුතු කළොත් හොඳයි කියන එක මම ගරු ඇමතිතුමාට මතක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ ස්වර්ණභූමි ඉඩම් හිමියන් සැහෙන ප්‍රමාණයකට ඒ ඔප්පු ලබා දී තිබෙනවා. එම ස්වර්ණභූමි ඔප්පු ලබා ගැනීමෙන් අපේ ජනතාව බොහොම සන්තෝෂයට පත්වී සිටිනවා.

පිඹුරත්තැව ව්‍යාපාරයේ, මාදුරුඔය ව්‍යාපාරයේ දැනටමත් විශාල පිරිසක් පදිංචි කරවා ගෙන යනවා. ඒ අයට දැනට සාමාන්‍ය තත්ත්වයකින් ජලය ලබාදීම පිළිබඳව මහවැලි ව්‍යාපාරය තුළින් කටයුතු කරගෙන යනවා. තවත් කොටසකට ජලය ලබා දීමට කටයුතු කළොත් ඉතා ඉක්මණින් ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීමට අපට පුළුවන් වෙනවා. කතා කිරීමට මට මේ අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

චන්ද්‍රා කරුණාරත්න මහතා (නියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමා)
(திரு. சந்திரா கருணாரத்ன — இராஜாங்கப் பிரதி அமைச்சர்)
(Mr. Chandra Karunaratne – Deputy Minister of State)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ එක කාරණයක් ගැන වචන ස්වල්පයක් කතා කිරීමට බලාපොරොත්තු වෙනවා. මම හිතනවා මේ වැය ශීර්ෂය යටතේ කතා කිරීමට මන්ත්‍රීවරුන් 45 දෙනෙක් පමණ සිටිනවා කියා. ඒ නිසා මම ඒ තරම් කාලයක් ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) සහ මතුගම මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) ඉදිරිපත් කළ එක කරුණක් ගැන සඳහන් කිරීමට මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අද මේ රටින් තුරන් වී යන, විනාශ වී යන, වන සම්පත ගැනයි ඒ. සමහර විට අපේ ගරු ඇමතිතුමා අසාවී, ඇයි මේවා පාර්ලිමේන්තුවේ සඳහන් කරන්නේ කියා. නමුත් මින් ඉදිරියට උපදින දරුවන් අපට සාප කරාවී අඩු ගණනේ මේවා පාර්ලිමේන්තුවේවත් සඳහන් කොකලොත්. අපේ ගරු ඇමතිතුමා අපි කිව්වොත් වැඩ සම්බන්ධයෙන් ඕනෑම දෙයක් කර දෙනවා. මම හිතන්නේ අද ඇමතිතුමාවත් නොදැනුවත්වයි මේ රටින් වන සම්පත සම්පූර්ණයෙන්ම විනාශ වී යන්නේ. එමනිසා විශේෂයෙන්ම මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, පුලුවන් තරම් ඉක්මණින්, හොඳට මේ ගැන පරීක්ෂා කර බලා, කැලෑ විනාශ වන එක සම්පූර්ණයෙන්ම නතර කරන්නය කියා. මම පළමුවෙන්ම සඳහන් කරන්නට ඕන, මේ කාලය ඇතුළතදී තමුත්තාන්සේ විශාල වැඩ කොටසක් කරල තිබෙන බව. තමුත්තාන්සේ මහවැලි ව්‍යාපාරය සම්බන්ධයෙන් වැඩ රාශියක් කර තිබෙනවා. හොත්මලේ ජලාශයේ බැම්ම බැඳ තිබෙන්නේ තාවලපිටිය කොටඨාශයට කිට්ටුවමයි. මම ඒකේ වෙච්ච හැම දෙයක්ම දන්නවා. කෙරිච්ච වැඩ ගැන දන්නවා. නමුත් මේවායින් ඵලයක් ගන්න අපට සිද්ධ වෙන්නේ නැහැ, මේ වන සම්පත අපි ආරක්ෂා කර නොගත්තොත්. මම සඳහන් කරන්න ඕනෑ, තාවලපිටිය කොටඨාශය ඇතුළත හැතැප්ම 23ක් පමණ මහවැලි ගඟ ගලා යනවා, රඹුක්පිටියට ඉහළින්. මම හිතන්නේ කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආතත්ද දසනායක මහතා) දන්නවා ඇති, ගම්පොල නගරයට යනකම් තාවලපිටිය ආසනය මැදින් යන්නේ මහවැලි ගඟ. තමුත්තාන්සේලාට කෑලෑ දෙපාර්තමේන්තුවට, ඒවාගේම දැව සංස්ථාවට මම ආරාධනා කරනවා, ඇවිල්ල පරීක්ෂා කරන්නය කියා, පෙබරවාරි, මාර්තු මාස වෙන කොට මේ ගඟ මොන තත්ත්වයට පරිවර්ථනය වෙනවාද කියා. සාමාන්‍යයෙන් කුඩා ඇලක් තත්ත්වයට පරිවර්ථනය වෙනවා. මේකට ප්‍රධාන හේතුව ඒ පැත්තේ හුඟාක් ගස් කපා දමා තිබීමයි.

මම සන්තෝෂ වෙනවා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගිනිගත්හේන ප්‍රදේශයේ පයිනස් ගස්වත් සිටු වීම ගැන. අඩු ගණනේ සෝද පාළුවවත් නැති වෙනවා. නමුත් මම කරුණාවෙන් ඉල්ලනවා ඒ ගස් වවන ගමන්ම ලංකාවෙ හැදෙන සපු, කැන්ද, ටූනා ආදී ගස් වර්ගත් හදන්නය කියා. ඒවායින් අපට තොයෙක් ප්‍රයෝජන ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම එයින් කුරුළු සම්පත් හුඟාක් ඇති වෙනවා. පයිනස් ගස වැවීමෙන් ගහ ඇර වෙන ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. මම මේ චෝදනා කරනවා නොවෙයි. අඩු ගණනේ ඒකවත් කරගෙන යන එක ගැන අපි සන්තෝෂයි.

ගරු කොත්මලේ මන්ත්‍රීතුමා (ආතත්ද දසනායක මහතා) දන්නවා ඇති 1947දී තිස්පතේ කන්ද පළාත සම්පූර්ණයෙන් කාය ගොස් ගඟට ගිය බව. මගේ ගේ ළඟ ඉඳලා හැතැප්ම කාලයි ඒ කාය ගිය තැනට. ඒ 1947 ඉඳලම වැවුණු සපු ගස් ටූනා ගස් දෙස බැලුවාම කිසිම කෙනෙකුට සිතන්න බැහැ එය කාය ගිය ප්‍රදේශයක්ය කියා. ඒක නොදන මොකද කළේ? කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් මමත් අනන්ත කරුණු ඉදිරිපත් කළත් ඒ ප්‍රදේශය හරහා පාරක් කපන්න උපාය කියා විශාල පාරක් කැපුවා. දැන් ඒ ප්‍රදේශය කැවතත් කාය යාමකට යොමු වෙලා තිබෙනවා. මම හිතන්නේ හුඟාක් දෙනෙකුට එතනින් ඉවත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මටත් එතැනින් යන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන් කොත්මලේ ප්‍රදේශයේ හුඟාක් දෙනෙක් දැන් ගෙවල් අත්හැර ගිහින්.

අපි මේ කොත්මලේ ජලාශය ආරක්ෂා කරගන්න ඕනෑ. ඒ ප්‍රදේශයේ විශේෂයෙන්ම ගස් වවන ලෙස මම ඉල්ලනවා. ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ. මේ වන සම්පත නැති වීමට පළවෙනි දෝෂියා තමයි දැව සංස්ථාව. මම "දෝෂියා" කියලම කියනවා. මම කිසි කෙනෙකු සමඟ තරහකට නොවෙයි කියන්නෙ. මේ දැව සංස්ථාව ඇති කලේ, යම් කිසි ව්‍යාපාරයකට, එහෙම නැත්නම් ජනපදයකට යට වන ප්‍රදේශවල ගස් කපා අලෙවි කිරීමටයි. නමුත් දැන් ඒවාගේ යට නොවන තැන්වල — කොලනි නොවන තැන්වල — පවා ගස් කපනවා. විශේෂයෙන් සිංහරාජ අඩවියේ විශාල ගස් කපාගෙන යනවා. සිංහරාජ අඩවියේ ගිනිගත්හේන සිට කිතුල්ගල දක්වා පහළට ඇති ප්‍රදේශයේ හුඟාක් ගස් කපලා. හොඳ ගස් තිබෙන හරිය දැන් කපලා අවසන් කරලා. මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා දැව සංස්ථාවෙන් — මම තරහකට කියනවා නොවෙයි — ජල යෝජනා ව්‍යාපාරවලට හෝ ජනපද ව්‍යාපාරවලට යට වන ප්‍රදේශවල ගස් හැර අනික් ප්‍රදේශවල ගස් කපන්න උපාය කියා. ඒ නිසා මම යෝජනා කරනවා දැව සංස්ථාවෙ නියෝජිතයෙක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙ ඉන්න ඕනෑ නැත කියා. ඒ මොකද එහෙම ඉන්න විට දැව සංස්ථාවට පුළුවන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බල කරන්න අහවල් කැලේ අපට ඕනෑය කියා. ඒ නිසා මේ දෙක ඇත් කර තියන්න ඕනෑ, හරියට කොටියයි එළුවයි වාගේ.

ප. භා. 11.15

මම දකිනවා කිතුල්ගල පැත්තේ ඉඳලා එන විට — මම හැම සුමානෙකම වාගේ තාවලපිටි යන්නේ කිතුල්ගල පාරෙන් — ගස් කොටං පිරවූ ලොරි තවත්වා තිබෙන හැටි. මේවා සියල්ලම මුහුණලා තිබෙන්නේ කොළඹ පැත්තටයි. නමුත් ඇතුවාම කියන්නේ කිතුල්ගල දැව ඩිපෝවට ගෙන යන බවයි. ඒ නිසා මම දන්නෙ නැහැ මේ වෙන්නෙ මොකක්ද කියා. නමුත් අපේ ඉදිරි පරම්පරාව, අපේ දරුවො අපට ශාප නොකරන හැටියට වග බලා ගන්නයි මම මේ කරුණු ඉදිරිපත් කරන්නෙ. විශේෂයෙන් දැව සංස්ථාව කැලේ කපන්න ඕනෑ බොහෝම ප්‍රවේසමෙන්. මම මේ දැව සංස්ථාවට විරුද්ධව කථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරනවා නොවෙයි. කැපිය යුත්තේ කැපිය යුතු ස්ථානවල ගස් පමණයි. එ නිසා මම තැවතත් ඉල්ලනවා අපෙන් වෙන් වී යන වන සම්පත ආරක්ෂා කරගන්නය කියා.

ඊළඟට මගේ ආසනයට සම්බන්ධ කරුණක් තිබෙනවා. එහි තිබෙනවා දුන්හින්ද කියා සුළු වාරි මාර්ග යෝජනා ක්‍රමයක්. ගම්පොළවෙල කියන ස්ථානයේ තිබෙන්නෙ. මම හිතන්නෙ ගම්පොළ යුගයේ සිට ගම්පොළවෙල වතුර එන ජල පාරක්. ඒ ජලාශය බැන්දට පස්සෙ ඒකට එන වතුර දැන් එන්නෙ නැහැ. ඒ නිසා මේ බැම්ම තව පහළින් බැන්දොත් හොඳයි. කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් (ආනන්ද දසනායක මහතා) මේ ගැන දන්නවා. එය බැන්දොත් විශාල කොටසකට හුඟ කාලයක සිට — ගම්පොල යුගයේ සිට — ලැබුණා ඒ ජලය මේ ගොවීන්ට ලබා ගන්නට අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා ඒ කාරණය කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වී එය ඉටු කර දෙන්නය කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වන්නේ කොත්මලේ ප්‍රදේශය වෙනුවෙනුයි. අපේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික සැලැස්ම ඉදිරිපත් කර තිබෙනවා. මා ඒ ගැන සතුට ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද ? වෙන කිසිම අමාත්‍යාංශයකින් මේ තරම් පැහැදිලිව සැලැස්මක් සකස් කර නැහැ. මෙහි සුළු සුළු අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත් හැම අමාත්‍යාංශයකින්ම මේ විධියට පැහැදිලි සැලැස්ම ඉදිරිපත් කරනවා නම් මහජනතාවට ප්‍රශ්න විසඳා ගන්න පහසු වෙනවා. ඒ තරම් පැහැදිලිව මෙය ඉදිරිපත් කර තිබෙනවා. කළ වැඩ ගැන මෙහි තිබෙනවා. ඒවායේ අඩුපාඩුකම් කියා තිබෙනවා. ඉදිරි බලාපොරොත්තු ගැන කියා තිබෙනවා. අපි මේ හොඳ දේවල්වලට හොඳයි කියන්න ඕනෑ. [බාධා කිරීමක්] ගමේ කමට නොවෙයි. තමුන්නාන්සේට තේරෙන්නෙ නැතිකමයි තියෙන්නෙ. මේ සැලැස්ම පැහැදිළියි. ඕනෑම කෙනෙකුට පැහැදිලි අවබෝධයක් ලබා ගන්න පුළුවන් විධියට සකස් කර තිබෙනවා. සමහර විට අභ්‍යන්තර වශයෙන් බලන විට නොයෙක් අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. එක දවසකින් දෙකකින් මේ ගැන අවබෝධයක් කර ගන්න බැහැ. නමුත් මේ සැලැස්ම හොඳයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වෙන කිසිම ප්‍රශ්නයක් ගැන කථා කරන්න අවශ්‍යතාවයක් නැහැ. මට ඕනෑ කරන්නේ කොත්මලේ අද තිබෙන තත්ත්වය උඩ අපේ ප්‍රදේශවාසීන්ට ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කරවන්නටයි. මේ සම්බන්ධයෙන් අපි හුඟක් උත්සාහ ගත්තවා. ඒ වගේම අමාත්‍යාංශයෙනුත් සැහෙන වැඩ කොටසක් කර තිබෙනවා. දැනටත් කරගෙන යනවා. විශේෂයෙන්ම මම කියන්න කැමතියි—

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

මහවැලියට යටත් වුණ—මහවැලියට අත්පත් කර ගත්—ඉඩම් ගැනද ඔය කියන්නෙ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපට දැන් ඕනෑ කරන්නෙ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නයි.

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

මහවැලියට අයත් ප්‍රදේශ කථා කරනවා නම් සිකුරාදා කථා කරන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

සිකුරාදාටත් මම මේ කාරණය ඉදිරිපත් කරනවා. නමුත් දැන් මම එය කෝටියෙන් කියන්න ඕනෑ. සිකුරාදට මම මෙය සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරනවා. මහවැලි සංවර්ධන අමාත්‍යාංශයෙන් 14.01.85 දින ජනාධිපතිතුමාට යවන ලද ලිපියකින් කොටසක් මම කියවන්න කැමතියි. මොකද මේ ඉඩම් අමාත්‍යාංශයට වුවමනා වෙන තැනක්. ඉඩම් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් උදව් දිය යුතුයි කියන එකයි මම පෙන්නා දෙන්නෙ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

රීතියට අදාළව කථා කරන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ අලුත් වචන ටිකක් ඉගෙන ගෙන තිබෙනවා. රීතියට අදාළව තමයි කථා කරන්නෙ. හොඳ සිංහල වචන ටිකක්. මම ඒ ලිපිය කියවන්නම් :

"His Excellency J. R. Jayewardene,
President of Sri Lanka
Presidential Secretariat
Colombo 1.

Your Excellency,

Resettlement of families affected by landslides near the Kotmale Project.

.....

Sgd/Acting Minister of Mahaweli Development".

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

මන්ත්‍රීතුමා ඔය කාරණය ගැන අතිද්දට කතා කළොත් හොඳයි නේද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේට වැටහෙන්නෙ නැහැ. තමුන්නාන්සේ ටිකක් අහගෙන ඉන්න. මහවැලිය කියන තම කිව්ව පමණින් එහෙම හිතන්න එපා. අතිද්දටත් මේ සම්බන්ධයෙන් මම කථා කරන්නම්.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order please! This is the Lands and Land Development Ministry. What you are saying comes under the Mahaweli Development Ministry.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I am not going to speak about the Mahaweli Development Ministry. I am speaking about the Ministry of Lands and Land Development. I am saying that this Ministry should help the Mahaweli Development Authority.

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

You are speaking about lands that come under the Mahaweli area.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

You are in charge of lands. We want to get some lands released from that area. You cannot understand. You simply want to object on any matter for the sake of objecting.

අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා තිබෙනවා, මේ අය පදිංචි කරවන්න කටයුතු කරන්නය කියා. ඒ ඉඩම් නිදහස් කළ යුත්තේ ජනාධිපතිතුමාගේ මාර්ගයෙන් ඉඩම් අමාත්‍යාංශය විසිනුයි. ඉඩම් ඇමතිතුමාම තමයි, මහවැලි ඇමතිතුමාත්. මේක දෙකක් නොවෙයි. ඒ නිසා ඇමතිතුමාට උදව්වක් වෙන්නයි මට ඕනෑ කරන්නේ. ඒ නිසා ඉඩම් ඇමතිතුමාගේ අවධානය මේ කාරණයට යොමු කරන්න ඕනෑ පළාතේ වැසියන් වෙනුවෙන් දැනට අපට ඕනෑ කරනවා අඩුම ගණනේ ඉඩම් අක්කර අට සියයක් පමණ. ඒ අක්කර අට සියය ඒ අවට ප්‍රදේශවල වතුවලින් ලබා දෙන්නය කියන කාරණයයි. මම ඉඩම් ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නේ. ඉඩම් අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් ඉතා ඉක්මන් පියවර ගන්න ඕනෑ. ඒකට හේතුව මේකයි. කොත්මලේ ප්‍රදේශයේ මේ මැතදී නාය යෑම් ගණනාවක් සිදු වුණා. මහවැලි තියෝජ්‍ය ඇමතිතුමා, මහාමාර්ග තියෝජ්‍ය ඇමතිතුමා, තියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි හතර පස් දෙනෙක් සහ නිලධාරීන්ද ඔහින් මේ ගැන පරීක්ෂා කර බලා පිළිගත්තා, ඒ ප්‍රදේශයේ වැඩි තරමක් ගම් නාය යන බව. විශේෂයෙන් මෙය සිදු වී තිබෙන්නේ, ජලාශ අවට ප්‍රදේශවල පාරවල් කැපීම නිසායි. ඒ පාරවල් කැපීම වැරදි බව අපි එද ප්‍රකාශ කළා. නමුත් ඉංජිනේරු මහත්වරුන් ඒක ඇහුවේ නැහැ. ඉංජිනේරු මහත්වරුන් එක් කෙනෙක් දෙන්නෙක්. හැමෝම නොවෙයි. ඒ අය හිතුවක්කාර විධියට කටයුතු කළා. ඒ නිසා දැන් සෑම ගමක්ම අවදානම් තත්ත්වයට ගිහින් තිබෙනවා. ඒ ගම් මම විශේෂයෙන් කියන්නම්. එකක් කුඹල්ඔළුව. මේ ගමේ දෙදරුම් කෑම් කිසිවක් කවදාවත් තිබුණේ නැහැ. මෙහි පත්වලේ බුදුගේ පිටිපස්සේ බුදු පිළිමය ළඟින්ම දෙදරුම් කා තිබෙනවා, පිළිමයක් කඩාගෙන යන්න. ඒ හාමුදුරුවරුන් ඒ ප්‍රදේශයෙන් ඉවත් කරන්න ඕනෑ. ඒ බුදුගේ වෙනම තැනක හද දෙන්න ඕනෑ. මුළු ගමේම හැම ගෙයක්ම දෙදරුම් කා තිබෙනවා. වොයිසි ජනපදයේ වැඩි තරමක් දෙදරුම් කා තිබෙනවා. කියම්ගම්දෙර මුළු ගමම සම්පූර්ණයෙන් දෙදරුම් කා තිබෙනවා. ගමේ හරහට හැම තැනම අඩි තුනේ හතරේ විවර ඔහින් තිබෙනවා. කලපිටිය ගම සම්පූර්ණයෙන්ම නාය යෑමට සූදානම්න් තිබෙනවා. ගොඩමඩින්තන් රොජසන් ගම ආදී ගම් හා තිස්පතේ කන්දේ කොටසක් නාය යෑමට බර වී තිබෙනවා. වටද්දර, අපේ ඉඩම් ඇමතිතුමාගේ ගම සම්පූර්ණයෙන්ම යට වී තිබෙනවා. ආණ්ඩුවේ ඒජන්තතුමා ඇතුළු අපි කීපදෙනෙක් ගිහින් මේවා පරීක්ෂා කර බලා වාර්තා කර තිබෙනවා. ඒ වාර්තා සියල්ලම මා ළඟ තිබෙනවා. මම ඒ වාර්තා කියවන්න යන්නේ නැහැ. මහවැලි අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී මම ඒවා කතා කරනවා. එදට මම පළමුවෙන්ම කතා කරන්න සූදානම් වෙනවා. මහවැලි අමාත්‍යාංශයටත් ඉඩම් අමාත්‍යාංශයටත් මේක ප්‍රශ්න දෙකක් නොවෙයි. මේවා පරීක්ෂා කර බලා තීරණය කර තිබෙනවා ඒ ගම්වල ජනතාව ඒවායින් සම්පූර්ණයෙන්ම අස් කරන්න. නැත්නම් කදු කඩා වැටී මුළු ගමේම ජනතාව ඒවාට යට වෙන්න පුළුවන්.

ඒ ගම් වලින් මිනිසුන් අස් කිරීමේ ලොකු ප්‍රශ්න ගැටළු තිබෙනවා. ඒ ගැටළු මම අනෙක් දවසට ඉදිරිපත් කරනවා. මේ අය සඳහා ඉඩම් ලබා ගැනීමට ඉඩම් අමාත්‍යාංශය පුළුවන් තරම් මහන්සි වුණා. නමුත් මා කණගාටු වෙනවා, එහිදී රජයට බලකිරීම් ඇති වීම ගැන. ඒ කියන්නේ ඉඩම්වල අයිතිය තිබෙන්නේ වෙනත් අයට. වතුවලට. වතු අයිතිකාරයෝ වෙනයි. ජේ.ඒ.ඩී.බී. එකට හා එස්.පී.සී. එකටයි වතු තිබෙන්නේ. ඒ දෙකෙන් ඉඩම් කැල්ලක් ගන්න එක හරිම අමාරු වැඩක්. කොවිවර මිනිස්සු මැරුණත් මිනිසුන්ට යන්න තැනක් නැති වුණත් ඒ අයට කමක් නැහැ. මේ මිනිසුන්ගේ ඉඩම් අක්කර හාර දහස් පමණ ආණ්ඩුවට අරගෙන තිබෙනවා. ඒ වුණත් මේ වතු අයිතිකාරයෝ කියන්නේ අපට මේ කම්කරුවෙක් එහාට මෙහාට කරන්න බැහැ. ඒ වත්තෙන් අනෙක් වත්තට ට්‍රාක්ස්ෆර් කරන්නවත් බැහැ. ඒ ගොල්ල එහෙමම ඉන්න ඕනෑ කියලයි. හරියට කියනවා නම් ආදී කාලයේ ආත මුත්ත නත්න පකත්න කිත්න කිරිකිත්තගේ බුක්තිය වාගේ ඒ ගොල්ල කියන්නෙ. ඒ ගොල්ල යන්නේ නැහැ.

මෙහෙම තත්ත්වයක් තිබුණාම රටක පාලනය ගෙනයන්නෙ කොහොමද කියන එකයි, මම අහන්නේ. ඒ ඉඩම් ගන්න අපට බැරි කුමක් තියාද ? ඒවා ආණ්ඩුවේ ඉඩම්. ආණ්ඩුවෙ ඉඩම්වල මිනිස්සු පදිංචි කරන්න බැරි ඇයි ? මහජනතාව දහස් ගණනක් අන්තරාවේ වැටී ඉන්දද්දී ඒ අය පදිංචි කරන්න අපට ඒ ප්‍රදේශයෙන් ඉඩම් ගන්න බැහැයි කියනවා නම් මේක පුදුම රටක්. ඒක තමයි, මට තිබෙන ලොකුම කැක්කුම. මහජනතාව දිනපතාම එනවා. ලියුම් එවනවා. මේ බලන්න ලියුම්. මම මේවා කියවන්න යන්නෙ නැහැ. මේ, තෝරා ගත් ලියුම් කීපයක්. ඔක්කෝම නොවෙයි. මේවායේ අසුවල් — අසුවල් ගම්වල මේ තරම් පවුල් ප්‍රමාණයක් අනාථ වී තිබෙනවාය කියා සම්පූර්ණ විස්තර තිබෙනවා.

වැඟි දවස්වලට ඒ ගම්වල උදවිය ගෙවල්වල ඉන්න හයේ, එහාට — මෙහාට දුවනවා. ඒ මොකද කීවොත් දැනටමත් ඒ ප්‍රදේශ දෙදරුම් කා තිබෙන නිසා ඒවා කඩාගෙන වැටිය කියා තිබෙන භය නිසයි. මහතුවර දිසා ඇමතිතුමාගේ ගමත් — කොටකේපිටිය ගම — දෙදරුම් කාලයි තිබෙන්නේ. එක්කෝ ඒ ප්‍රදේශවාසීන් ඒ අවදානම් ප්‍රදේශවලින් ඉවත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් වෙනත් පිළියම් යොදන්න ඕනෑ. ඒ ප්‍රදේශයේ ජීවත් වන එක් කෙනකුටවත් ඒ නාය යෑම්වලට ගොදුරු වන්න, අතුරක් වන්න ඉඩ දෙන්න බැහැ. ඒ හැම දෙනාම බේරා ගන්න ඕනෑ. ඒ ප්‍රදේශවාසීන් ඒ තරම් අවදානම් තත්ත්වයකට වැටී තිබෙද්දී ඒ අය පදිංචි කරවීම සඳහා ඉඩම් කැබැල්ලක් ලබා ගන්න බැරි තම් තමුන්නාන්සේලා ආණ්ඩු කරනවාය කියන එකේ තේරුම මොකක්ද ? මොන විධියේ ආණ්ඩුවක් කරන්නද, තමුන්නාන්සේලා ඉන්නේ ? ඔහොමද, මිනිසුන් පාලනය කරන්නේ ?

ඉඩම් පරිපාලනය කරන්න ගරු ඇමතිතුමාට සම්පූර්ණ බලතල තිබෙනවා නම් ඒ බලතල යොදවා ඒ අවට ප්‍රදේශවලින් ඉඩම් ලබාගෙන ප්‍රදේශවාසීන් පදිංචි කරන්න ඕනෑ. සමහර උදවියට ඕනෑ කර තිබෙන්නේ, ඒ ප්‍රදේශයේ ගම්වල ඉන්නා සිංහල මිනිසුන් ටික ඉවත් කරවන්නයි. මම ඒ අදහසට එදත් විරුද්ධ වුණා, අදත් විරුද්ධ වෙනවා. එක පවුලක්වත්, එක පුද්ගලයෙක්වත් කොත්මලේ ප්‍රදේශයෙන් — විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් — පිටතට යවන්න එපා. ඒ අය නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිටත පදිංචි කරවනවා නම් එය ඒ ජනතාවට, ප්‍රදේශයට පමණක් නොව අනාගතයේදී මුළු රටටම බලපාන අපරාධයක් වීමට ඉඩ තිබෙනවා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහතුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake – District Minister, Kandy)

දැනටමත් යවලා ඉවරයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒක තමයි, මම කියන්නේ. මගේ විරුද්ධත්වය උඩයි, ඒ අය යවා තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන මට කරන්න දෙයක් නැහැ. යම්—යම් වැරදි තීරණ උඩ ඒ අය පිට යවා තිබෙනවා, ඒ ප්‍රදේශයේ ඒ අදාළ වැඩ කරන ඇතැම් නිලධාරීන් විසින්. මේක ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා බලා නොවෙයි, ඒ විධියට වැඩ කර තිබෙන්නේ. ඉවත් කෙරෙන ජනතාවට සෙනෙක් සැලසීමේ අදහසිනුත් නොවෙයි, ඒ දේ කර තිබෙන්නේ.

ඒ ඇතැම් නිලධාරීන් කරන රාජකාරිය මොකක්ද ? ට්‍රැක්ටර් ගෙනෙනවා. කවුද එන්නේ, මෙහෙන් ඉඩම් දෙන්නේ නැහැ, එනවා -එනවා ' කියා බල කරනවා. එහෙම කටයුතු කළ බවට සාක්ෂි තිබෙනවා. ඒ නිලධාරීන්ගේ බල කිරීම නිසා සමහර අය ඒ ට්‍රැක්ටර්වල නැඟලා ගියා. ඒ අය ඒ විධියට නුවර—එළිය දිස්ත්‍රික්කයෙන් පිටතට යැවීම නිසා ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද ?

අද නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිංහල ජනගහණය සියයට 20 ට බැහැලා. සියයට 80 ක් ඉන්නේ සිංහල නොවන අයයි. එහෙම නම් වතුකරයේ සිංහල ජනතාවට දැන් සුළු ජාතියක් බවට පත් වෙලා ඉන්න සිදු වී තිබෙනවා නේද ? දුටුගැමුණු කුමාරයාණන්ගේ පවා පාද ස්පර්ශය ලැබුණු ඒ කොත්මලේ ප්‍රදේශයේ අද තත්ත්වය, ඒකයි. ඒ නිසා මේ ප්‍රශ්නය ඉඩම් අමාත්‍යාංශය අතට ගෙන විසඳන්නයයි මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉඩම් අමාත්‍යාංශය හාර ඇමතිතුමා හැටියට තමුන්නාන්සේගේ බලතල යොදවා මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය විසඳන්න. මොන උදව්ය, මොන සංවිධාන, මොන විධියට විරුද්ධ වුණත් සිංහලයන්ගේ පාරම්පරික ඉඩම් රැක දීමට, ඔවුන්ගේ අයිතිවාසිකම් රැක දීමට ගරු ඇමතිතුමා ක්‍රියා කරන්න ඕනෑ.

ඊළඟට, උඩරට ගැම් පුනරුත්ථාපන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයිද කියාත් මම අහන්න කැමැතියි. මේ ප්‍රදේශවල කොළනි පිහිටුවන්නයයි ඒ කොමිසම නිර්දේශ කර තිබෙනවා. එවකට හිටපු ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා – ඒ. රත්නායක මැතිතුමා – ඒ කොමිසමේදී පෙන්නා දුන්නා, ඉදිරි අනාගතයේදී ඇති විය හැකි යම්කිසි අභාග්‍ය සම්පන්න තත්ත්වයකට මුහුණ දීම සඳහා වතුකරයේ කුඩා කොළනි පිහිටුවන්න ඕනෑය කියා. ඉදිරියේදී ඇති විය හැකි අහිතකර තත්ත්වයන් වැළැක්වීම සඳහා වතුකරයේ ඒ ඒ වතුවලින් සියයට 10–20ක් අරගෙන පොකට් කොළණි තැත්තම් කුඩා කොළණි ඇති කළ යුතුය කියා ඒ කොමිසම නිර්දේශ කර තිබෙනවා. එහිදී කියා නැහැ, කිසිම ජන වර්ගයකට අසාධාරණයක් කරන්නය කියා. එහි කියා තිබෙන්නේ සිංහලයන්ට සියයට 80ක්, දෙමළ අයට සියයට 12ක්, මුස්ලිම් අයට සියයට 8ක් ආදී වශයෙන් ලැබෙන විධියට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නය කියායි. ඒ කියන්නේ ජන වර්ගය අනුව බෙදන්නය කියායි. ඒ මිස කිසිම ජන වර්ගයකට අසාධාරණයක් කරන්න කියා නැහැ.

ප. භා. 11.30

ඒ නිසා මේ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගත යුතුව තිබෙනවා. කොත්මලේ පමණක් නොවෙයි, වලපනේ, හඟුරන්කෙත, තුවරඑළිය, ඌව–පරණගම, වැලිමඩ ආදී හැම ආසනයකටම මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා ඒ හැම ආසනයකම හතර මං හන්දි, තුන් මං හන්දි අවට තිබෙන වතුවලින් සියයට 20ක් පමණ බැගින් ඉඩම් ලබා ගෙන අක්කර 100–150ක විතර ප්‍රදේශයක් කොළණියක් වසයෙන් වෙන් කරන්න ඕනෑ. ඒ විධියට කොළණි හද ජන අනුපාතය අනුව මිනිසුන් පදිංචි කළේ නැත්තම් අනාගතයේදී විශාල කලබගැනියකට මුහුණ පාන්න සිදු වෙනවා. ඒ ගැන වහාම කටයුතු කළ යුතුයි.

ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවට පැමිණීම ගැන මම සතුටු වෙනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ මෙතෙක් අරගෙන තිබෙන පියවරවල් ගැන මම කිසිසේත් අවලාද කියන්නේ නැහැ. අනික් ප්‍රශ්න මොනවා වුණත් කමක් නැහැ. අපට ඕනෑ කරන්නේ ඒ ප්‍රදේශයේ ජනතාව අද මුහුණපා සිටින භයානක තත්ත්වයෙන් ඔවුන් බේරා ගැනීමයි. අපි අද ඉන්නේ ගිනි ගොඩක් මැද්දෙයි. ඉදිරියේදී අපට මොන තර්ජනයක් එයිද දන්නේ නැහැ. මොන විධියේ ත්‍රස්තවාදී ක්‍රියා එයිද දන්නේ නැහැ. එවැනි තත්ත්වයකටයි, පත් වී තිබෙන්නේ. ඉඩම් ඇමති වශයෙන් තමුන්නාන්සේට බලය තිබෙනවා. ඉඩම්වල අධිපතිය තිබෙන්නේ තමුන්නාන්සේටයි. ඒවා පරිහරණය කිරීම සඳහා වැඩ පිළිවෙළ සකස් කිරීමේ කාර්යය භාර වී තිබෙන්නේ තමුන්නාන්සේටයි. ඒ සැලැස්ම සකස් කර ඉඩම් ලබාදීම සම්බන්ධව ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු වන්නේ නැත්තම් එතුමා සමග සාකච්ඡා කිරීමට ඕනෑම වෙලාවක මමත් එන්නම්, තමුන්නාන්සේ සමග තමුන්නාන්සේගේ උදව්වට. මට ඕනෑ මේ ප්‍රශ්නය විසඳන්නටයි. අපට තවත් අක්කර 800ක් පමණ ඕනෑ. ඒ ඉඩම් අක්කර 800 අපි ඉල්ලා තිබෙනවා. ජේ. ඩී. බී. එකක් එස්. පී. සී. එකක් ඒවා නිදහස් කරන්නට තවම කැමැති වී නැහැ. ඒවා ආණ්ඩුවේ ඉඩම්. ඒ අය කියන්නේ මොකක්ද ? කම්කරුවන් 10ක් මේ වත්තෙන් තවත් වත්තකට ට්‍රාන්ස්ෆර් කරන්නට බැරිලු. සිංහල ජනතාව මරුමුව පත්වුණාට කමක් නැහැ ; කඳු කඩා වැටී මැරුණත් කමක් නැහැ ; ඒ අය ඉඩම් නැතිව පාරට බැස්සත් කමක් නැහැ ; අරගොල්ලන්ට අත තබන්නට තම් බැහැ. අත තැබුවොත් ස්ට්‍රයික් කරනවා යයි කියනවා. මේක පුදුම ලංකාවක්. ඒ නිසා ඉක්මණින් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. මේ අයගේ ප්‍රශ්න දවසක්වත් පමා කරන්නට එපා යයි මම අදත් කියනවා. වැස්ස දවස්වල ඉන්නේ ලොකු බයකින්. දෙදරුම්කාලා තිබෙන ඒවා කොයි වෙලාවේ ගලවාගෙන යනවාදැයි කාටවත් කියන්නට බැහැ. කාටවත් දින නියමයක් කරන්න බැහැ. රැද දවල්ද කියන්නත් බැහැ. එවැනි අපරාධයක් වුණොත් විශේෂයෙන්ම මට වෝදනාව එනවා. එමෙන්ම රු ඇමතිතුමාටත් එනවා ; නියෝජ්‍ය ඇමතිතුමාටත් එනවා ; ඉඩම් අමාත්‍යාංශයටත් එනවා ; මහවැලි අමාත්‍යාංශයටත් එනවා.

ඉතින් එක්කෙනෙක් හරස් කපනවා කියා එයට බියවී ඒ ආධිපත්‍යයම නඩා ගන්නට අපි ඉඩ දෙනවාද ? ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගයකට තමුන්නාන්සේට මම ඕනෑ ධෛර්යයක් දෙනවා. ජනතාවගේ ධෛර්යයත් ඕනෑ නම් එයත් අරගෙන දෙන්න පුළුවන්. බලහත්කාරයෙන් ගොස් පදිංචි වන්නට වුවත් ජනතාව යොමු කරන්නට මට පුළුවන්. කවුරු හෝ මේවා කරනවා නම් බලහත්කාරයෙන් හෝ ඒ ප්‍රදේශයේ ජනතාව පදිංචි කරවන්නට සූදානම්වයි, මම ඉන්නේ. හිරේ ගියාට කමක් නැහැ. මමත් හිරේට යනවා. ඒකට කරන්න දෙයක් නැහැ. එය ජාතික ප්‍රශ්නයක්. මිනිස්සු ජීවිතයක් මරණයත් අතර සටනකයි ඉන්නේ. එයට කවුරු හෝ අවකපනවා නම් ගිහින් ඒ අයගේ ඉඩම්වල පදිංචි වන්නට වුණත් අපි සූදානම්.

මම වැඩි වේලාවක් ගන්නේ නැහැ. මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා වන විට අනික් ප්‍රශ්නය එහිදී මතු කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

May I have ten minutes, Sir, because I have three or four questions to ask the Hon. Minister and I hope he will give me the answers. The first one is, there is this problem of the water tax or the maintenance tax or whatever it is. It has been dealt with, but I want to make a proposal to him. A farmer or a planter grows and I ask, who eats what he grows ? We eat ; the whole nation eats what the planter or the farmer grows. I ask you, instead of compartmentalizing the areas for these taxation purposes, why would you not put your entire maintenance into the budget and let all of us pay ? After all these are big irrigation schemes which we started and we cannot close them down. Let us all pay for them. After all, why should we put the burden only on the farmer or the planter ? That is why we are against it. What I would propse to the Hon. Minister is to include all the maintenance that you may have in Victoria or wherever it is, into the budget.

I read the submission made by the Hon. Minister of Finance to the World Bank. What did he say there ? This is what he said :

"The emphasis in the past has been on the expansion of irrigated agriculture through large scale projects. The neglect of operational and maintenance activities and the expense of new projects has resulted in the progressive deterioration of existing irrigation facilities."

He himself accepts the position that all these years because of these large projects we did not have any money for the older projects. This is what he says –

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினி திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

That may be his view, but the fact is that from 1948 not enough money has been devoted for the maintenance of irrigation systems. The resultant position, for example, Sir, is that by 1977 the Gal Oya irrigation system had been so badly neglected that it costs Rs. 500 million to rehabilitate the system.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

And you have a special project.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

It is such a large expenditure, whereas if every month or two something small was done in the immediate maintenance of this system, it would not have become so bad. This is the experience world wide with regard to irrigation systems particularly in Asian countries. There is also the factor that it takes about Rs. 1 1/2 lakhs to develop an acre of land. So that principle that those who benefit directly by that land improvement should contribute something small, I think, is also accepted. So, those are the constraints under which we are acting.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The important thing is this :

"Hence, while provision will be made for ongoing settlement projects in the investment programmes for 1985-89, emphasis will be laid on operation, maintenance and rehabilitation of the existing irrigation works and effective water control management".

In other words, in his report, he wants to put it into the budget. He is going to the World Bank and asking for aid by putting it into his report. Why are you going to tax the people here ?

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

That is because whatever he gives is not sufficient.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

In that case, put it into the budget. What I say is do not have compartmentalized areas. Do not have one for the North, one for the East, one for the South, one for the West or one for the North-Central. Have everything in your budget. If you do not have it in your budget and do it as you now do, it will be possible for the people at a later stage to say, this is our money, this is our colony and this is our land. There will be various problems coming up subsequently.

Therefore, to solve this problem, include in the budget of Sri Lanka whatever you want to have for maintenance. I hope the Hon. Minister can persuade the Hon. Minister of Finance to do that.

Sir, my second point is that the Hon. Minister complained to us that the Land Commissioner had to look into matters of a parochial nature. I was very worried about it.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

No, some representations that are coming are on matters of day to day relevancy and not long term.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

But there is a big problem as far as the Land Commissioner is concerned. According to the terms of reference.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

This is not to say that they will not go into those matters, but it will be better if there is representation by the public about these matters on practical lines.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Please, you can answer later. I have only ten minutes. Sir, the Land Commissioner also has another problem. He has been given certain terms of reference, but along with the terms of reference there should also be the guided land policy of this Government. Now, take for instance the Mahaweli. That is also land that one day will be settled with people. I want to know this, Sir. Are you going to back Government sugar cane against peasant paddy ? Are you going to have Malayasian palm oil against peasant coconut ? Are you going to have Israeli fruit trees against cashew or mangoes ? Are you going to have Friesian and Ayreshire or Killari cattle against the water buffalo ? This is another problem, and the Land Commissioner is also worried to find out what is the Government policy.

Sir, one Minister in milk production has the company system, you are having the correct co-operative system while another Minister has something else. You have to be very clear in what you are going to do. Are you going to have subsistence agriculture in this country or are you going to have peasant agriculture ? What are you going to have ? Or, are you going to have cash crop agriculture or tree crop agriculture ? Land means agriculture. Therefore, Sir, the Hon. Minister must be very clear in his mind as to what he is going to have and that must be communicated to the Land Commissioner.

Thirdly, Sir, take for instance, village expansion. Are you going to have village expansion or are you going to emphasise re-settlement. Village expansion is something where you do not put the people out. You do not uproot the people from their social life, cultural life and so on. They are there in the village. Their social system is ingrained in the village and it is intact. But re-settlement means you are taking the whole community and planting them in another area which is a very difficult thing to do.

Take, for instance, an urban sector such as London. In a big city like London right round you get a green belt of farm land. What do we have here ? We have either

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

marshy land or we have slums and ghettos and various unclean and uncouth areas. We must have environment that will go along with the city of Colombo. The Hon. Minister is on the correct path in having a Land Commissioner to deal with these things but he must lay down what type of land policy he wants. That is not being done. Very soon you will find urbanization taking place from here to Panadura, from here to Negombo, and from here I would say as far as Yakkala bordering Attanagalla. It will go as far as that. Therefore I think he must give a clean, clear picture of the land policy he wants to follow so that the Land Commissioner will be able to work on those guidelines and also, when it is submitted, we could say whether the policy is good or bad. Therefore I would urge the Hon. Minister to do that.

The other matter is this. We have a major irrigation scheme in Attanagalla. Now, Sir, the "*Samba* bowl" is in Attanagalla, but I am very sorry to say that in the entire area, right from the top of the Attanagalu Oya the trees have been cut down by illicit fellers and it is completely deforested. The danger of that is this. If the forest is there the silting that takes place is less, but today the Attanagalu Oya is silted. When you go to that bridge at Attanagalla and look up-stream you find the whole river silted. Why ? Every year about 90 tons of silt per hectare comes down to the Attanagalu Oya, but if the trees were not cut nothing more than one to two tons will come down. There is also another problem. All the trees have been cut and the bare land is there and all that land gets eroded into the river. Ultimately the level of the river rises and the area gets flooded. The illicit fellers are there. We know who the people are. We have complained to the police but nothing has happend. As I said, owing to the felling of the trees the base land would be eroded more and more, and worse than that, all the anicuts that were built during the time of this Government and during the last government, will be washed away. The entire place will be completely ruined. And what will happen if the Attanagalu Oya is ruined ? The entire "Rice bowl" in the District of Minuwangoda, Gampaha, Katana, Divulapitiya will get wiped out and very soon we will not be able to produce *Samba* rice to feed the people in Colombo. Therefore I think he must immediately start a reforestation programme in the Attanagalu Oya area right along the border with deep-root trees. Do not grow eucalyptus and trees like that. Those are good for areas like yours, but in our areas let there be the normal, traditional tree growing, like *nedun, durian, kumbuk* and so on. You must start growing the various kinds of trees that are good for that area.

Lastly, Sir, I fear that there is a certain amount of salination taking place in Attanagalu Oya. The other day I went towards Attanagalla and I found that a brown film has formed in the paddy fields of that area. Obviously it is iron oxide or something like that. In other words, salination has taken place, and you know how salination can take place. Therefore I would like a complete investigation done into the entire Attanagalu Oya basin so that we can take appropriate measures to save the river from the destruction that will follow.

කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා (මාතලේ දිසා ඇමතිතුමා)
(திரு. கே. டபிள்யு. ஆர். எம். ஏக்கநாயக்க — மாத்தளை மாவட்ட அமைச்சர்)
(Mr. K. W. R. M. Ekanayake – District Minister, Matale)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන අවස්ථාවේ වවන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. පසුගිය වකවානුව ඇතුළත අපි අපක්ෂපාතව කල්පනා කර බැලුවොත් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් මේ රටට ඉමහත් සේවාවක් වෙලා තිබෙන බව අපි අවිවාදයෙන් පිළිගත යුතුයි. විශේෂයෙන් දුප්පත් ජනතාව මෙය ඉතා අග්ගෙකොට සලකනවා. ලබා දී තිබෙන ප්‍රගතිය අපි කවුරුත් අගයනවා. මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරී මහතුන්ටත් ජනතාවගේ ප්‍රශංසාව හිමි වෙනවා.

විශේෂයෙන් ස්වර්ණ භූමි සංකල්පය යටතේ සිත්තක්කර ඔප්පුවක් ලබා දීමට කටයුතු කිරීම, ඒ ඉඩම් ලාභීන්ට කරන ලොකුම සේවාවක් හැටියට අපි පිළිගන්නවා. එද ඔප්පුවක් ලබා දී තිබුණත්, ඒ ඉඩමේ පූර්ණ අයිතිය රජය සතුවයි තිබුණේ. මේ ස්වර්ණ භූමි ඔප්පු පිරිනැමීමෙන් ඒ අයිතිය ඒ ඉඩම් ලාභීන්ට පැවරීමෙන් රජයේ අයිතිය අහෝසි වුණා. එපමණක් නොවෙයි, ඒ ඉඩම් ලාභියාට අවශ්‍ය වන විධියට එය බදු දෙන්නට ඕනෑ තම් බදු දෙන්නටත්, විකුණන්නට ඕනෑ නම් විකුණන්නටත්, උකස් කරන්නට ඕනෑ නම් උකස් කරන්නටත් පුළුවන්. ඒ විධියේ සහනයක් ඉඩම් හිමියාට ලැබී තිබෙනවා.

මහජනතාව ප්‍රශංසා කරන අතික් කරුණ මෙකයි. ඒ තමන්ගේ කියා බිම් අහලක්වත් නැතුව අතවසරයෙන් මේ රටේ ජීවත්වන ජනතාව රජයේ ඉඩම් එළි පෙහෙළි කර තම අඹු දරුවන් සමග ජීවයේ පදිංචිවෙලා ගොවිතැන් කරමින් සිටි යුගයක අතවසර සම්ක්ෂණ ක්‍රමය යටතේ ඒ ඉඩම් ඒ ගොවි ජනතාවටම ලබා දීමට ගෙන තිබෙන පියවර ගැනයි. ඇත්තවශයෙන්ම මන්ත්‍රීවරුන් වශයෙන් පමණක් නොවෙයි, ලාංකික ජනතාව වශයෙනුත් අපි එය ඉතාමත්ම අගය කරනවා. කිසිම පහසුකමක් නැතුව, යාම් ඊම් පහසුකම් නැතුව, සොබ්‍ය පහසුකම් නැතුව, අධ්‍යාපන පහසුකම් නැතුව, වෙන කිසිම පහසුකමක් නැතුව ඉඩමක තිබුණු අවශ්‍යතාවය නිසාම ඒ අය මෙහෙම පදිංචිවෙලා තිබෙනවා. මට මතකයි ඇමතිතුමා පුවත්පත්වලට ප්‍රකාශයක් කර තිබුණා මේ රටේ ජනතාවට, සැම කෙනෙකුටම, මේ රටේ බිම් අහලකවත් අයිතිය තිබිය යුතුයි කියා. නමුත් මේ සම්ක්ෂණ පවත්වා අවුරුදු ගණනක් ගිහින් තිබෙනවා. දැන් අර කලින් වාගේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමක් නැහැ. ඒ නිසා අතවසර සම්ක්ෂණ වලට ගිහින් ඒ ඉඩම්වල අයිතිය පෙන්වා ඒ ඉඩම් කැබැල්ල ලබාගැනීමට සිටින ඉඩම් ලාභියාට නැත්නම් ඒ අතවසර කරුවාට දැන් ප්‍රශ්න රාශියකට මුහුණපාන්න සිද්ධවෙලා තිබෙනවා. බලගතු මිනිස්සු නැවතත් මේ ඉඩම්වලට රිංගා, ඒ අතවසරකරු ලෙස සිටින පුද්ගලයා ඉවත්කොට ඒ ඉඩම ලබාගන්නට උත්සාහ කරනවා. මෙවැනි අවස්ථාවලදී ඒ අය පොලීසි යනවා. පොලීසි ගියාම දෙගොල්ලොම කැඳවනවා. ඒ කැඳවීමාම පොලීසිය කියනවා තමන්ට තිබෙන අයිතිය ඔප්පු කරන්න කියා. එවිට දෙදෙනාම කියනවා, " මම මේක කොටාගත්තෙ අහවල් අවුරුද්දෙ, අහවල් කාලයේ මම හිටියා " කියා. " මමත් සම්ක්ෂණයට ගියා, මේක මට අයිතියි " කියා දෙදෙනාම කියනවා. එවිට පොලීසිය කියනවා, අතවසර සම්ක්ෂණයේදී සිටි පුද්ගලයා වෙනුවෙන් - මේ ඉඩම් දෙන්නට තීරණය ලැබූ පුද්ගලයා වෙනුවෙන් - යම්කිසි උසස් නිලධාරියකුගෙන් ලිපියක් ඉදිරිපත් කරන්න කියා. එවිට ඒ අය උප දිසාපතිතුමා ළඟට යනවා. මන්ත්‍රීවරුන් ළඟට යනවා. දිසාපතිතුමා ළඟට යනවා. ඉඩම් අංශයට යනවා. එම නිසා අර පළමුවෙන් එල්.ඩී.ඕ. ක්‍රමයට සහ ජනපද ක්‍රමයට දී තිබෙන ඉඩම්වලට ස්වර්ණ භූමි ඔප්පු දිගෙන යන ගමන්ම මේ අතවසර සම්ක්ෂණයට ගාජනයවී ඒ ඉඩම් හිමිකම් ලබා තිබෙන අයට, වාර්ෂික බලපත්‍රයකවත් නිකුත් කිරීමට කටයුතු කළොත් මේ අරගලය, මේ ප්‍රශ්නය අපට විසඳාගන්නට පුළුවන්. එහෙම නැත්නම්, ප්‍රබලයා දුබලයා පාගා ගෙන, අපි, තමුන්නාන්සේ, හොඳ හිතකින් කරන්නට යන මේ වැඩෙන් ප්‍රයෝජනය ලැබියයුතු පුද්ගලයාට ඒ ප්‍රයෝජනය නොලැබී යන්න පුළුවන්. ඔහු ගත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. ඩබ්ලිව්. ආර්. එම්. ඒකනායක මහතා]

වෙහෙස මහන්සියත්, ඉඩම එළි පෙහෙළි කරන්න, ගොවිතැන් කරන්න ඔහු යෙදූ ශ්‍රමයත් ඔහුගේ දහදිය මහන්සියත් අපතේ යන්න පුළුවන්. එම නිසා මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පාර්ශ්වයෙන් කථා කරනවා, පරිසරය දූෂණය වෙනවාය, ගස් කපනවාය, එළි පෙහෙළි කරනවාය ආදී වශයෙන්. ඇත්ත. කපන්න ඕනෑ නැත්වල ගස් පමණයි කැපෙන්නේ. විශාල ව්‍යාපාර ආරම්භ කරලා ඒවායේ අයිතිය ජනතාවට පවරන අවස්ථාවේදී ඒවා එළි පෙහෙළි කරලා ඒවායේ අයිතිය ජනතාවට පවරන්න අමාත්‍යාංශයට සිද්ධවෙලා තිබෙනවා. ඒ වාගේම ගොවිතැන් කටයුතුවලට නුසුදුසු උස බිම්වල දැන් කැවෙන වන වගාව ආරම්භ කර තිබෙනවා. මාතලේ පමණක්, අක්කර 15,000ක පමණ නැවෙන වන වගාව ආරම්භ කර එයින් දැන් අක්කර 11,000ක වන වගාව අවසන් කර තිබෙනවා. මේක මාතලේ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, සෑම දිස්ත්‍රික්කයකම, සෑම පළාතකම ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අයත් කැලෑ තිබෙන ප්‍රදේශවලට මේ කටයුත්ත මැනවින් කරගෙන යනවා.

අපේ නියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමා—නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමා (වත්දු කරුණාරත්න මහතා) කිව්වා, දව සංස්ථාව ද්‍රෝහී වැඩ කරනවාය කියා. මම නම් හිතන්නෙ නැහැ එහෙම ද්‍රෝහී වැඩක් කෙරෙනවාය කියා. කරල තිබෙන බවක්වත් අපට පෙනෙන්නේ නැහැ. දව සංස්ථාව ලබා ගන්නේ මේ විධියට සංවර්ධනය වන ප්‍රදේශවල හුම්වලින් ඉවත් කරන දවයි. එහෙම නැත්නම් සුළි සුළඟට වැටිලා කැලෑවල දව තිබෙනවා නම්, ඒ දව වල අයිතිය ලබා ගැනීම පමණයි කෙරෙන්නේ. එසේ නැතිව දව සංස්ථාවට අවශ්‍ය විධියට සෑම කැලෑවක්ම දව සංස්ථාව විසින් කපන්නේ නැති බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සතුටුයි.

ඊළඟට අපිට තිබෙන ප්‍රශ්නය මිණිත්දෝරුවන් ගිහා කමයි. මේ මිනිත්දෝරුවන්ගේ ගිහාකම නිසා යම් යම් පොදු කටයුතුවලදී මහජනතාවට අවශ්‍ය කටයුතුවලදී, ඔප්පු ලබා දීමට මායිම් ගල් දැමීම යනාදී කටයුතුවලදී තරමක ප්‍රමාදයක් ඇතිවෙනවා. මම හිතන විධියට ගරු ඇමතිතුමා දැනට මේ ගැනත් කටයුතු කර තිබෙනවා. අලුතෙන් මිණිත්දෝරුවන් විශාල සංඛ්‍යාවක් බඳවා ගෙන දැනට පුහුණුවෙමින් සිටිනවා. ඒ සමගම පුද්ගලිකව කටයුතු කරන මිණිත්දෝරුවන්ගේ සහාය ලබාගෙන ඒ කටයුතු ඉක්මණින් කර දෙන්නට අවස්ථාවක් සලසා දුන්නොත්—අපට ඒ අවසරය ලැබෙනවා නම්—අපේ ඒ වැඩකටයුතු අපි බලාපොරොත්තුවන විධියටම කරගන්න පුළුවන්. ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය මම යොමු කර වන්නට කැමතියි.

ඒවගේම, අපේ ප්‍රදේශවල මේ ඉඩම් සම්බන්ධව කටයුතු කරන විට, රජයේ ඉඩම් බෙදා දෙන්න යන කොට, එසේ නැත්නම් පොදු කටයුත්තකට යම්කිසි ඉඩමක් ගන්න යන කොට, ඒ ප්‍රදේශවල බොහොම දෙනෙක් කියනවා, "මේ ඉඩම්, ඉඩම් හිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් අපට හිරවුල් කර දුන් ඒවාය" කියා. නමුත් මේ ගැන විමාග කර බලන විට, කරුණු යොයා බලන විට, එවැන්නක් සිදු වී නැති බව පේනවා. මේ ගොවීන් ඉඩම් හිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට සල්ලි බැඳලා තිබෙනවා මේ ඉඩම් හිරවුල් කර දෙන්නය කියා. නමුත් මේ වනතුරු එවැනි හිරවුල් කිරීමක් සිදු වෙලා නැහැ. එම නිසා හිඳුධාරීන්ටත් මන්ත්‍රීවරුන් වන අපටත් මෙය ප්‍රශ්නයක් වී තිබෙනවා. මේ ඉඩම් බෙදා දෙන්නට හෝ වෙන කෙනෙකුට ඒවා පවරා දෙන්නට යනවිට හෝ වැවක් බැඳලා, අමුණක් බැඳලා, ඇලක් කපලා මේ ඉඩම්වල අයිතිය පොදු ජනතාවට බෙදා දෙන්න යන අවස්ථාවලදී සමහර පවුල්වල කීපදෙනෙක් ඉදිරිපත් වෙලා කියනවා, "මේ ඉඩම් අපේ පවුලට, අපේ සහෝදරයින්ට සහෝදරියන්ට ඉඩම් හිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් හිරවුල් කර දුන් ඒවාය" කියා. නමුත් එහෙම හිරවුල් කර දී ඇති බවක් පෙනෙන්නේ නැහැ. මේ විධියේ ප්‍රශ්න අතෙකුත් දිසත්‍රික්කවලත් තිබෙන්නට පුළුවන්. එම නිසා මේ සෑම ඉඩම් ඉඩම් අඟලක්ම ගැන ඉඩම් හිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් සොයා බලා, ඒවායේ යම්කිසි කෙනෙකුට පුද්ගලිකව අයිතියක් තිබෙනවා නම් ඔහුට හෝ ඇයට ඒ අයිතිය ලබා දීමට කටයුතු කර, ඉතිරි ඉඩම් රජයට පවරා ගන්නට කටයුතු සලසා දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් ගැන මතක් කරන්නට තිබෙනවා. මම මීට පෙරත් මේ කාරණය ගැන මතක් කර තිබෙනවා. මගේ කොට්ඨාශයේ දඹුලු පාරේ 40 කණුවේ සිට නැවෙන වන වගාවට තේක්ක වගා කර තිබෙනවා. දැනට මාස 8 කට පමණ මත්තෙන් ඉතාමත් කණගාටුදායක සිද්ධියක් මේ ප්‍රදේශයේ සිදු වුණා. මෙහි නිතරම හොරකම් වෙනවා. රෑට යන වාහන නවත්වා හොරකම් කරනවා. මේ හොරු කණ්ඩායම් හැදිලයි ඉන්නේ. දැනට සුමාන දෙකකට පෙර මම එන කොටත් පාර හරහා ලොකු කොටයක් දලා මට පෙර ආපු මෝටර් සයිකල් පදවාගෙන ආ හතර දෙනෙකුගේ බඩු මළු උදුරාගෙන තිබෙනවා. මම එනකොට මගේ ජීප් එකේ කීප දෙනෙක් ආ නිසා අපි බැහැලා කොට අයිනට දැම්මා. අපිට කරදරයක් වුණේ නැහැ. දැන් අවුරුදු 5 කට පමණ පෙර ජර්මනියට ගිය ලාංකිකයෙකු සුදු තෝතා කෙනෙකුත් එක්ක අවුරුදු පහකට පස්සේ ලංකාවට ඇවිල්ලා, සීගිරිය, පොළොන්නරුව, දඹුල්ල ආදී සිද්ධස්ථාන දැක බලා ගැනීම සඳහා ගොස් ආපසු එන අතරමගදී මෙතැන හොඳ හෙවනක් තිබෙන නිසා, පරිසරය හොඳ නිසා තේ එකක් බොන්න තමන් ආපු වාහනය නැවැත්වුවා. නේ එකක් බීම සඳහා වාහනය නවත්වා, නේ බොන අවස්ථාවේදී අර මා කලින් සඳහන් කළ සුදනම්න් සීට් හොරු කණ්ඩායම එක වරටම කඩා පැන, අර තෝතා මහත්මියගේ ඔර්ලොසු, අත, කණකර බඩු භාණ්ඩ, මුදල් මේ ආදී සියල්ලක්ම පැහැර ගෙන තිබෙනවා. අර කුඩා දරුවාගේ අසතීපයකට ජර්මනියේ සිට ගෙනැවිත් තිබුණ බෙහෙත් වර්ගයක් ඒ අතර තිබිලා තියෙනවා. "හැම දෙයක්ම ගත්තත් කමක් නැහැ, කරුණාකර දරුවාගේ බෙහෙත් විතක දිලා යන්නට" යයි ඒ කාන්තාව කළ ඉල්ලීමවත් නොකා, ඒ සියල්ලම පැහැරගෙන එතැනින් පැන ගොහින් තිබෙනවා.මෙම පිරිසගේ අතවරවලට විශාල පිරිසක් ගොදුරු වී තිබෙනවා. එම නිසා, නැවත වන වගාව සම්පූර්ණයෙන් විනාශ නොවන ආකාරයට, පාර අයිනේ තීරයක් පමණක් වෙන් කර දී, එම තීරයේ ජනතාව පදිංචි කළොත් දැනට සිදු වන හොරමැරකම් නතර කරන්නට පුළුවන් වෙනවායි මා විශ්වාස කරනවා.

ඒ වගේම මේ තේක්ක ගස් හොරෙන් කැපීම කරගෙන යනවා. මෙම වගාව බලා කියා ගන්නට කවුරුවත් නැහැ. පාර අයිනේ පමණක් තේක්ක ගස් ටිකක් තිබෙනවා. ඇතුලේ ගස් හොරෙන් කපාගෙන යනවා. ලොරිය ගන්නවා වගාව තුලට. එම නිසා මා යෝජනා කරන ආකාරයට එම ප්‍රදේශයේ මිනිසුන් පදිංචි කළහොත් මෙවැනි හොරකම් සිදු වීම වළක්වා ගන්නට පුළුවනි. එම නිසා මේ ගැන තමුන්නාන්සේගේ කාරුණික අවධානය යොමු කර මහා මාර්ගයේ මෙවැනි අපරාධ නොවෙන්නට කටයුතු සලස්වන්නය කියා මා ඉල්ලා සිටිනවා. මෙම අදහස් ක්‍රියාත්මක කිරීමට අපේ ගරු ඇමතිතුමාගේ පූර්ණ සහයෝගය ලැබෙනවා ඇතැයි බලාපොරොත්තු වෙමින්, ඔබතුමාටත්, අමාත්‍යාංශයේ හැම දෙනාටත් තැවතත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதிச் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please ! The sitting is suspended till 1.00 p.m.

රැස්වීම ඒට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 1 ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 1 மணி வரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1 p.m. and then resumed, MR. DEPUTY SPEAKER in the Chair.

අමරසිරි දෙඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda – Baddegama)

ගරු සභාපතිතුමනි, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කරන මෙම අවස්ථාවේදී කරුණු කීපයක් පමණක් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මෙම රජය මඟින් ඉදිරිපත් කරන ලද සංශෝධන පනත් නිසා, අනවසරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වූ අය සෑහෙන පිරිසකට බලපා ඇති තත්ත්වයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට මම අදහස් කරනවා. විශේෂයෙන්ම 1983 අවසාන භාගයේදී ඉදිරිපත් කළ මෙම සංශෝධන අනවසරයෙන් පුද්ගලයන් පදිංචිව සිටින රජයේ ඉඩම් ඇති දිස්ත්‍රික්කවලට සෑහෙන අත්දමින් බලපානවා. විශේෂයෙන්ම ඉඩම් පනතට මෙවැනි සංශෝධන ගෙන එන්නට හේතු වුණේ, උඩරට ඇතැම් පිරිස් ජනපද පිහිටුවීම සඳහා රජයේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගෙන යන අවස්ථාවකදීයි. නමුත් මෙම නීති, ඉඩම් නොමැති කම්කරු රජයේ ඉඩම්වල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා විවිධ සිටින දකුණේ අයටත් බලපා ඇති නිසා, දැන් මෙය ලොකු ප්‍රශ්නයක් වී තිබෙනවා. එම නිසා මෙම ප්‍රශ්නයට විසඳුම් සොයා ගත යුතු ආකාරය ගැන මෙයට වඩාව සැලකිලිමත් වෙන්නට ඕනෑ. මොකද ? යම් කෙනෙක් අනවසරයෙන් රජයේ ඉඩමක පදිංචියට පෙළඹෙනවා නම්, එසේ පෙළඹෙන අයගෙන් සියයට හැටක් හෝ හැත්තෑවක්ම ඉඩම් නොමැතිකම නිසා පැමිණෙන අය වීමයි. ඉඩම් තිබෙන තවත් පිරිසක් ඉඩම් අල්ලා ගැනීම සඳහා රජයේ ඉඩම්වලට වදිනවා. කොහොම වුණත් 1979 දී අවසාන සංගණනයෙන් පසුව, ඉඩම්වල අනවසර පදිංචිකරුවන් පිළිබඳව සෑම දිස්ත්‍රික්කයකම වාගේ වාර්තා වී තිබෙනවා. සංගණනයේදී සටහන්වූ අනවසර පදිංචිකරුවන් පිළිබඳවත්, ඉන්පසුව පදිංචි වූ අය පිළිබඳවත් මීට වඩා සානුකම්පිකව සලකා බැලිය යුතු තත්ත්වයක් තිබෙනවා.

අපි දන්නවා, සමහර පිරිස් ඒ අයට ඉඩම් කැබැල්ලක් නැතිකම නිසාම පළාතේ දිසාපතිතුමාට අයිති රජයේ ඉඩම් කොටස්වල පදිංචි වී සිටිනවා. නමුත් 1983 අවසාන භාගයේදී පනතේ ඇති කළ සංශෝධනය අනුව අනවසර පදිංචිකරුවන්ට දවස් 30ක් කල් දිලා ඉන්පසුව ඒ අනවසර ඉඩමෙන් ඒ අයව ඉවත්කරන්න පුළුවන්. ඒ බලය මහේස්ත්‍රාත්වරයාට පවරා දී තිබෙනවා. මේ නිසා ඉඩම් නැති සෑහෙන පිරිසකට මේ අසාධාරණය සිදු වෙනවා. මේ අයට තිබෙන එකම පිළියම රජයේ ගම් පුළුල් කිරීමේ වැඩපිළිවෙළ යටතේ, හෝ ඉඩම් කච්චේරි ක්‍රමය යටතේ හෝ හැකි ඉක්මනින් ඉඩම් බෙදා දීමයි.

අපේ දිස්ත්‍රික්කයේ 1978 දී පැවැත්වූ ඉඩම් කච්චේරියේදී ඉඩම් හාර නොදුන් අය තවමත් ඉන්නවා. එම නිසා අවුරුදු ගතක් නැත්නම් අටක කාලයක් තුළ ගම් පුළුල් කිරීමේ වැඩපිළිවෙළ මගින් ඉඩම් ප්‍රශ්නයට විසඳුම් දීම පමා වීම නිසා තමන්ට ඉඩම් කැබැල්ලක් ලබා ගන්න ඕනෑ වූ විට අනවසරයෙන් පදිංචි වෙන්න බොහෝ පිරිස්වලට සිදු වී තිබෙනවා. එම නිසා අනවසර පදිංචිකරුවන්ට දඩුවම්දීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න කලින් ඒ ප්‍රදේශයේ ඉඩම් කච්චේරි පවත්වලා ඉඩම් ව්‍යාප්ත කිරීමක්, ඉඩම් බෙදදීමක් කළාද කියන එක පිළිබඳව සැලකිලිමත් වුණොත් හොඳයි. මේ නිසා අනවසර ඉඩම් පදිංචිකරුවන්ය කියලා ඉඩම් අංශ මගින් සෑහෙන පිරිසක් හැමදාම උසාවිවලට කැඳවනවා. එසේ කැඳවලා තියෝග තිකුත් කරවනවා. අවුරුදු ගතක් තිස්සේ ඉඩම් කච්චේරි ක්‍රියාත්මක කරවන්නේ නැතිව, අනවසර පදිංචිකරුවන් පිළිබඳව මේ විධියට දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න ගියවිට, ඉන්පසුව පැවැත්වෙන ඉඩම් කච්චේරියකදී වුවත් ඒ නඩුවලින් වැරදිකරුවන් වූ අයට ඉඩම් ඉල්ලන්න බැහැ. පදිංචියට ඉඩම් කැබැල්ලක් නැතිව ජීවත්වන බොහොම පිරිසක් හැම මාසයකම වාගේ උසාවියට කැඳවන බව අපේ දිස්ත්‍රික්කවල අපට පෙනෙන්න තිබෙන දෙයක්. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන්, තියෝජ්‍ය ඇමතිතුමාගෙන් අවධානයට යොමු කරවන්නේ, අනවසර පදිංචිකරුවන් පිළිබඳවත්, 1979 සංගණනයෙන් පසුව පදිංචි වී සිටින අය පිළිබඳවත්, 1983 පනත අනුව උසාවි කැඳවා ඉඩම්වලින් නෙරපන පිරිස පිළිබඳවත් මීට වඩා සානුකම්පික වෙනස් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසයි. මා එයින් අදහස් කරන්නේ අනවසරයෙන් ඉඩම්වල පදිංචියට ඉඩ දෙන්න කියන එක නොවෙයි. මේ නිසා අනවසර පදිංචිකරුවන් ඒ පදිංචිවීමේ හේතුව සොයා බලා—උසාවිවලට ඒ අයව කැඳවා දඩුවම් දීලා, ඉඩම් කච්චේරිවලින් ඉඩම් කැබැල්ලක්වත් ගන්න බැරි තත්ත්වයට පත් නොකර—අනවසර ඉඩම් පදිංචිකරුවන් පිළිබඳව සංගණනයක් නැවතත් අරගෙන, ඉඩම් නැති අයට ඉඩම් ලබා දී මේ ප්‍රශ්නයේ තීරණයක් ඇති කරන්න කටයුතු කරන්නය කියායි මා ඉල්ලා සිටින්නේ.

ඒ වාගේම මා මතක් කරන්න ඕනෑ, ඉඩම් කච්චේරි ක්‍රමයේ සෑහෙන අඩුපාඩු තිබුණා පමණක් නොවෙයි නොයෙක් විධියට දූෂණත් සිදු වුණා කියා. මේ පනතේ, විරෝධතා පිළිබඳව තිබෙන වගන්ති හරිහැටි ක්‍රියාත්මක කරන්න අමාරුයි. විශේෂයෙන් ගම්වල ඒ පිළිබඳව විරෝධතා ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරන්න කවුරුවත් එන්නේ නැහැ. එහෙම පැමිණි සමහර අයට අතවර හිරිහැර පවා කර ඇති අවස්ථාත් තිබෙනවා. එම නිසා ඉඩම් පනතේ ඉඩම් කච්චේරි පිළිබඳව තිබෙන වගන්ති අනුව, ඉඩම් කච්චේරි පවත්වා ඉල්ලුම් පත්‍ර කැඳවීම මගින් ඉඩම් බෙදා දීමේදී තියම සුදුසුකම්වලට ඉඩම් ලැබෙනවාද කියන එක ගැන බලන්න ඕනෑ. අපට දැන ගැනීමට ලැබී තිබෙනවා, බොහෝ ඉඩම් කච්චේරි මගින් ඉඩම් පවරා දීමෙන් මාස 3 ක් පමණ යනවිට සමහර ඉඩම්ලාභීන් ඒ ඉඩම් කොටස් විකුණා තිබෙන අවස්ථා ගැන. ඒ උදවිය ඉඩම් කච්චේරියෙන් ඉඩම් ලබාගන්නේ ඉඩම් සඳහා ඇති අවශ්‍යතා මත නොවෙයි, විකිණීමටයි. ඒ නිසා ඉඩම් කච්චේරිවලින් ඉඩම් බෙදදීමට කලින් ඒ අය සුදුසුකම්ද කියා එක හොයා බැලීමට මීට වඩා විධිමත් ක්‍රමයක් තිබිය යුතුයි. එහෙම නොතිබුණාම සෑහෙන තරම් ඉඩම් තිබෙන අයත් වැරදි වාර්තා සපයා ඒ මගින් ඉඩම් ලබාගෙන ඊට පසුව ඒ ඉඩම් කැබලි විකුණනවා.

ඒ වාගේම තවත් වැදගත් දෙයක් කිව යුතු තිබෙනවා. ජනාකීර්ණ ප්‍රදේශවල ඉඩම් කච්චේරි පැවැත්වීමේදී ඒ ප්‍රදේශයේ රජය සතුව තිබෙන්නේ ඒ ඉඩම පමණක් නම් එවැනි ඉඩම් ඉඩම් බෙදදීමේදී ඉඩම් කැබැල්ලක ප්‍රමාණය අක්කර බාගයක් නොවෙයි. අක්කර කාලක් දක්වා අඩු කිරීමෙන් වැඩි පිරිසකට ඉඩම් බෙද දීමට හැකි පිළිවෙළක් ඒ ප්‍රදේශවල ජනාකීර්ණත්වය අනුව සකස් කළ යුතු වෙනවා. ජනයා අඩු ප්‍රදේශවල නම් අක්කරයක් එහෙම නැත්නම් අක්කර දෙකක් වුණත් දුන්නට කමක් නැහැ. නමුත් වැඩි ජනඝණයක් සිටින ප්‍රදේශයක බෙද දීමට තිබෙන්නේ අක්කර 20ක ඉඩමක් නම් ඒක අක්කර කාල බැගින් බෙද දෙන්නට පුළුවන්. ඒ තත්ත්වය පිළිබඳව අමාත්‍යාංශය විශේෂයෙන්ම වැඩි අවධානයක් යොමු කළ යුතු වෙනවා. මොකද ? සෑහෙන පිරිසක් තමන්ගේ පාවිච්චිය සඳහා ගෙයක් තනා ගන්නට ඉඩම් කැබැල්ලක් නැතිවයි ඉන්නේ. ඒ නිසා ඉඩම් කච්චේරි ක්‍රමයේ තිබෙන අඩුපාඩු පිළිබඳව ගරු ඇමතිතුමාගේත් තියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානය යොමු කළ යුතු වෙනවා.

ඒ වාගේම අනවසර පදිංචිකරුවන්ට ඇති වී තිබෙන ප්‍රශ්න පිළිබඳව මීට වඩා සානුකම්පික මට්ටමකින් සලකන්නට වෙනවා. පනතේ ආකාරයටම කටයුතු කරන්නට ගියොත් මේ ඉඩම් නැති, තමන්ටය කියා ගෙයක් හදාගන්නට ඉඩම් කැබැල්ලක් නැති මිනිසුන් පිළිබඳව බලන්නට ක්‍රමයක් නැති වෙනවා. ඒ නිසා ඒ කරුණු දෙක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් අවධානයට යොමු කරවනවා.

ඊළඟට විශේෂයෙන්ම මේ බදු බලපත්‍ර දී තිබෙන ඉඩම්වලට ඔප්පු ලබාදීම පිළිබඳව විශාල පමාවක් හා ඒ තුළින් දූෂණ රැසක් සිදු වීමක් පිළිබඳව බොහෝ අවස්ථාවල අපට පැමිණිලි ලැබී තිබෙනවා. සමහරවිට මීට ඉහත කාලයකත් ඒ ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට මුදල් අය කර තිබෙනවා. ඒවාගේම මෑත කාලයේත් දැන් නැවතත් මුදල් අය කර තිබෙනවා. ඒ නිසා මේ මිනිසුන්ට ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. ඔප්පු දෙන්නය කියා මොකද මේ දෙපාරක් සල්ලි අය කරන්නේ ?

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)
ගාලු දිස්ත්‍රික්කය ගැනද කියන්නේ ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඔව් ! ගාලු දිස්ත්‍රික්කයේ ඒ විධියට ඔප්පු දෙන බවට කලින් වනාවකත් සල්ලි අරගෙන ඊට පසුව නැවත වනාවක් සල්ලි එකතු කිරීම ඒ මිනිසුන්ට ප්‍රශ්නයක් වී තිබෙනවා. ගුගස් දුරට ඒකට හේතු හැටියට දක්වන්නේ මිනින්දෝරු හිඟයයි. අපේ දිස්ත්‍රික්කයේ ගුගස් අවස්ථාවල මිනින්දෝරු හිඟය සෑහෙන දුරට බලපාන නිසා සංවර්ධන සහාවලට බලය දී තිබුණා තමන්ගේ වියදමින් — [බාධා කිරීමක්]

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)
දෙවනාවක් සල්ලි ගත්තාය කිව්වේ මොකක් පිළිබඳවද කියන එක කරුණාකර පැහැදිලි කර දුන්නොත් හොඳයි.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
බදු බලපත්‍ර යටතේ සිටින ඉඩම්වලට ඊට පසුව ස්වර්ණභූමි ඔප්පු දෙනවාතේ. ඒ ඔප්පු දීම සඳහා කල් තබා රුපියල් 250ක් අය කර තිබුණා. ඒ දැනට අවුරුදු දෙකකට උඩදී. මේ ළඟදී නැවත සැරයක් මුදල් අය කර තිබෙනවා. දැන් සමහරවිට මෙක අමාත්‍යාංශය දන්නේ නැතිව සිදු වුණු දෙයක් වෙන්න පුළුවන්. නමුත් දූෂණයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

අපි එහෙම අය කරන්නේ නැහැ. දෙවතාවක් මුදල් අය කරන්නේ නැහැ. එහෙම අය කර තිබෙනවා නම් ඒ පිළිබඳව ලියවිලි එව්වොත් පරීක්ෂා කර බලන්නට පුළුවන්.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එක මිට ඉහත අවස්ථාවකත් අපි පෙන්නා දුන්නා.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

හැබැයි රිසිවිපත් සමග අපට ලියවිලි එවනවා නම් ඒ ගැන පරීක්ෂණයක් කරන්නට අපට පුළුවන්. ස්වර්ණභූමි ඔප්පු දෙන්න එක වනාවයි මුදල් අය කරන්නේ.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එක කරන්න පුළුවන්. එහෙම ඒවා ලියා එවන්න පුළුවන්. ඒ විධියේ ඒවා කීපයක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම බදු බලපත්‍ර යටතේ ඉඩම් ලබාගෙන තිබි ස්වර්ණභූමි ඔප්පු ලබා ගැනීමට සූදානම් වන ඉඩම්වල පදිංචි කරුවන්ට ඒවා ඉක්මනට ලබා දෙන්න ඕනෑ. ගාලු දිස්ත්‍රික්කයේ ඒවාගේ ඉඩම් කැබලි 84,000ක් පමණ තිබෙනවාය කියා මට දැන ගන්නට ලැබුණා. නමුත් කච්චේරියට සම්බන්ධ රජයේ මිනිත්දෝරුවන් සිටින්නේ තුන් දොනාදු. ඒ නිසා අවුරුදු ගණනාවක් තිස්සේ දැන් මෙය පමා වෙමින් තිබෙනවා. ඒ මිනිසුන්ට නොයෙක් ප්‍රශ්න මතු වී තිබෙනවා. මේ ඔප්පු පමාවීමේ හේතුවෙන් නේ ආධාර ක්‍රමය, නැවත වගා ආධාර ක්‍රම, ලියාපදිංචිවීම් ආදියෙන් ඒ මිනිසුන්ට නොයෙකුත් ප්‍රශ්න මතු වෙනවා. ඒ නිසා මේ ඉඩම්වලට ඔප්පු ලබාදීමට කොයි ආකාරයකින් හෝ කඩිනම් වැඩ පිළිවෙළක් යොදන්න කියා මම විශේෂයෙන් මතක් කරනවා. ඒවාගේම මේ පමාවීම් වන විට ඒගොල්ලන්ට කලින් පෙන්වා දුන් ගල් වැළලූ ඉඩම් කොටස්වල මායිම් හුඟක් දුරට වෙනස් වන බවත්, ඒ මායිම් වෙනස් කරගෙන පාරවල්වල වගා කරන බවත්, මම සඳහන් කරන්න ඕනෑ. මේ බදු ඉඩම් තිබෙන පළාත්වල ඉඩම් ආරාවුල් කියන ඒවායේ සීමාවක් නැහැ. එමනිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර බදු ඉඩම් වශයෙන් දී තිබෙන රජයේ ඉඩම් තිරවුල් කර ඔප්පු ලබාදීමට විශේෂ ක්‍රියාමාර්ගයක් හැකි ඉක්මණින් ගන්න කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා.

ඒ වාගේම මේ ගිං ගඟ ව්‍යාපාරය පිළිබඳවත් මම සඳහන් කරන්න ඕනෑ. ගිං ගඟ ව්‍යාපාරය යටතේ ඉඩම් අහිමි වූවන් අටසියයකට කිට්ටු ප්‍රමාණයක් හිටියා. ඒ ප්‍රශ්නය තවම විසඳී නැහැ. ඒ ප්‍රදේශයේ ඉඩම් තිබෙනවා. ඒ ඉඩම් මේ දක්වා බෙදී නැහැ. සමහර අයට මේ ඉඩම් බෙදීමේදී ඉඩම් අංශය හාවිතා කළේ ඉඩම් කච්චේරි ක්‍රමයයි. කච්චේරි ක්‍රමය යටතේ ඉඩම් බෙදීමේ පතන අනුව අනාථ සහ මේ අනාරක්ෂිත ප්‍රදේශවල අයට ඉඩම් දීම ඒගොල්ලෝ කරගෙන ගියා. එය බොහෝම අසාධාරණයක්. දන් කොත්මලේ ජලාශයට, වික්ටෝරියා ජලාශයට යට වුණු ප්‍රදේශවල මිනිසුන් ගෙන ගොස් පදිංචි කරවීමේදී ඒ අයට ඒ කලාපවල ඉඩම් දුන්නේ ඉඩම් කච්චේරි ක්‍රමය මත නොවෙයි. ජාතික ව්‍යාපාරයකට ඒගොල්ලන්ගේ ගම් බිම් අහිමි වෙලා ඒ අය අනාරක්ෂිත වුණා. නමුත් ගිං ගඟ ව්‍යාපාරය නිසා ඉඩම් අහිමි වූ ඒ පිරිස්වලට පමණක් ඉඩම් දීමේදී — මේ ළඟකදීත් ඉඩම් කච්චේරියක් පැවැත්වූවා—ඉඩම් කච්චේරි පතතේ වගන්ති බලපානවා. ආදයම් තත්ත්වය සලකනවා. නමුත් ආදයම් තත්ත්වය ගැන කිසිම තැකීමක් නැතිව වතුරෙන් රටවන විට ඒ සියලුම ඉඩම් එකට යට වෙනවා. ඒ නිසා අනාරක්ෂිත ප්‍රදේශයේ ඉඩම් යටවූ සියලු දෙනාටම ඉඩම් ලබාදීම පමාවී තිබෙන නිසා ඉඩම් කච්චේරි ක්‍රමය යටතේ භේදයකින් තොරව ඉඩම් ලබාදීමට විශේෂ පියවරක් ගන්න කියා මේ අවස්ථාවේ මම ඉල්ලීමක් කරනවා.

අ.භා. 1.15

ඒ ව්‍යාපාරය යටතේ සෑහෙන පිරිසක් වන්දි බලාපොරොත්තුව සිටින බව ඒ වාගේම සඳහන් කරන්න ඕනෑ. සමහර වේලාවට ඒ වන්දි ගෙවන්න මුදල් ප්‍රමාණයක් නැති වෙන්න පුළුවන්. නමුත් අවුරුදු හතක් අටක් තිස්සේ තමන්ගේ ඉඩම් උඩින් බන්ඩි, වේලි තැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට ඒ ඉඩම් පත්වී තිබෙනවා. ඒවා පවරා ගැනීමේ නියෝග පවා නිකුත් කර සියලුම අවශ්‍ය කටයුතු කර තිබෙනවා. මේගොල්ලෝ ඉඩම් දී තිබෙනවා. නමුත් වන්දි දෙන්න කටයුතු කර නැහැ. මේ ගැන ගාල්ල ඉඩම් අංශයෙන් ප්‍රශ්න කළාම, මේ යටවූ ඉඩම් පිළිබඳ ප්ලෑන්ස් නැත්නම් ඒවායේ මිනිත්දෝරු කටයුතු අවසන් කර එවා නැහැ කියා කියනවා. මේවා මැන්නේ 1976 දියි. දැන් 1985. ගිං ගඟ ව්‍යාපාරයට යට වූ ඉඩම් පිළිබඳ ප්ලෑන්ස් හෙවත් පිඹුරුපත් මේ වනතුරුත් ගාලු ඉඩම් අංශයට යවා නැත්නම් ඒ පිළිබඳව විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න කියා මම මතක් කරනවා. මොකද, මිනිසුන්ට තමන්ගේ ඉඩමත් නැහැ. සමහර වේලාවට තමන්ගේ වගා කළ කුඹුරත් නැහැ. වන්දිත් නැහැ. එම නිසා මේ තත්ත්වය ගැන විශේෂයෙන් අවධානය යොමු කරන්න කියන එක මේ වෙලාවේ මතක් කරනවා.

මෙම ව්‍යාපාරය නිසා ඉඩම් අහිමි වූ අයගෙන් පිරිසක් දුණුගම් වෙහෙර ව්‍යාපාරය යටතේ පදිංචි කරවීමට ගෙන ගිය බව ගරු දිසා ඇමතිතුමා දන්නවා ඇති. ඒ ගෙන ගිය පිරිස එකසිය ගණනක් විතර හිටියා. ඒ අයට දැඩි විධියේ නීති පැනවුවා. ඒ නීතිවලට අනුව පවතින්න බැරුව ඒ පිරිසකට දැන් ඉඩම් අහිමි වී තිබෙනවා. ඒ දැඩි නීතිවල ස්වරූපය වුණේ මෙයයි : දුණුගම් වෙහෙර ව්‍යාපාරයේ ඉඩම් කැබැල්ලක් ලැබුණාට පසුව ඒ ඉඩමේ පදිංචි වී සිටින්න නැතිනම් නැවතී සිටින්න ඕනෑ. නිලධාරීන් ඒ ඉඩම්වලට නිතරම ගිහින් මේ කට්ටිකරුවන් ඒවායේ ඉන්නවාද කියා බලන්න රෙජිස්ටරයක් මාස් කරනවා. මේ අපේ ප්‍රදේශවලින් දුණුගම් වෙහෙරට ගිය පිරිස්වලට වහාම තමන්ගේ රැකියාවල්, දරුවන්ගේ පාසල් වැනි ප්‍රශ්න නිසා ඒ අයගේ පදිංචිය එක වරම මාරු කිරීම අපහසු වුණා. ඒගොල්ලෝ තමන්ගේ තිබුණු ඉඩම් ජාතික ව්‍යාපාරයකට යටකර දුණුගම් වෙහෙරට ගියේ ඒ වෙනුවට තමන්ට ලැබුණු ඉඩම්වල පදිංචිය සඳහායි. නමුත් ඒගොල්ලෝ දිහා බැලුවේ, ඒ ගොල්ලන්ට සලකා තිබෙන්නේ අනිවාර්‍යයෙන්ම ඒගොල්ලන්ගෙන් වරදක් සිදු වූ විධියටයි. මේ සංවර්ධන ව්‍යාපාරවලින් ඉඩම් අහිමි වූ වෙනත් ජනපදවල ඉඩම් සඳහා යන මේ විධියේ පිරිස්වලට විශේෂ සැලකිල්ලක් කළයුතුය කියා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මොකද, ඒගොල්ලෝ ගම්බිම් නැතිවෙලයි යන්නේ. අපේ ප්‍රදේශවලින් දුණුගම් වෙහෙරට ගිය 34 දෙනෙකුගේ ඉඩම් කට්ටි අදත් අවලංගු කර තිබෙනවා. මෙන්න මේ නිසා තැවත පරීක්ෂණයක් කර සංවර්ධන ව්‍යාපාර නිසා ඉඩම් අහිමි වූ ඒ දුණුගම් වෙහෙරට ගිය පිරිස් සම්බන්ධයෙන් මීට වඩා සානුකම්පික ක්‍රියාමාර්ගයක් ගන්න කියා ඉල්ලීමක් කරනවා. ඒ වගේම මම විශේෂයෙන්ම මතක් කරන්න ඕන —

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, දුණුගම්වෙහෙරට පදිංචිය සඳහා කැඳවා ගෙන ගිය පවුල් 100 සම්බන්ධයෙන් ඔබතුමාගේ ඉල්ලීම මොකක්ද ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඒ ඔය පිරිසෙන් සමහරුන්ට දිනපතා රෙජිස්ටරයක් ලකුණු කරනවා, එතන ඉන්නවාද නැද්ද කියා බලන්න.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

ඉල්ලීම, ඒක නවත්වන්න කියාද ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඒක එක වරම ක්‍රියාත්මක කරන්න බැහැ. මේ තත්ත්වය නිසා දැනට 34 දෙනෙකුගේ ඉඩම් අහිමි කර තිබෙනවා. ඉඩම් කැපිලා. ඒ ගොල්ලෝ, ඒ ගොල්ලන්ගේ ඕතැකමට ගිය අය නොවෙයි. ඒ ගොල්ලන්ගේ යැපීම් ව්‍යාපාර තවම තිබෙන්නේ ගිංගඟ ප්‍රදේශයේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
හරි

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
මේ දවස්වල අපේ ප්‍රදේශයට සම්බන්ධිතව යම් ජල සංවර්ධන ව්‍යාපාරයක් යෝජනා කරගෙන යනවා, පොල්අතුගහ ව්‍යාපාරය කියා. පොල්අතුගහ යෝජනා ව්‍යාපාරය කියන්නේ, වැලිගම ආසනයත්, හබරාදුව ආසනයත් හරහා ගමන් කර පොල්අතුමෝදර කියන ස්ථානයෙන් මුහුදට වැටෙන ගඟ පිළිබඳ ව්‍යාපාරයටයි. මේ දවස්වල ඒ පිළිබඳව මැණීම් කරගෙන යනවා. බද්දේගම ආසනයේ යක්කලමුල්ල ප්‍රදේශයේ ඉඳලායි, ඒ මැණීම් කරගෙන යන්නේ. ඒ ව්‍යාපාරය යටතේ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන වැඩ කටයුතුවල ස්වරූපය අපට දැනගන්නට ලැබුණොත් හොඳයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
මම ඒකෙ විස්තර දෙන්නම්.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒවාගේම මම සඳහන් කරන්න ඕනෑ, විශේෂයෙන්ම ඉඩම් සම්බන්ධ ප්‍රශ්නයකට මුහුණපාන තවත් පිරිසක් පිළිබඳව. ඒ නම්, දකුණු පළාතෙන් දෙහිවත්ත, අල්ලේ වැනි ජනපදවල පදිංචි කර, අද ඒවායේ ඉඩම් නැතිව නුවත ගම්වලට ඇවිත් ඉන්න පිරිස් ගැනයි. පවුල් 3,500කට ආසන්න පිරිසක්. මේ අය දකුණු පළාතේ. සමහර අය කඳවුරුවල ඉන්නවා. සමහර අයට නුවතත් තමන්ගේ ජනපදවලට යන්න කිව්වා. මට මතකයි, සේනපුර කඳවුරෙන් ආපසු ජනපදවලට යැවූ අය එහේ ගිය දවසෙම, ත්‍රස්තවාදීන් විසින් තව 11 දෙනෙක් මැරුවා. ඒ නිසා නුවතත් ඒ අය කඳවුරුවලට ආවා.

කඳවුරුවල තිබෙන අපහසුකම් නිසා ඒ ගොල්ලො තමන්ගේ නෑ ගෙවල්වල, දකුණු පළාතේ තැන් තැන්වල නැවතී ඉන්නවා. දැන් ඒ මිනිසුන්ටත් ඒ අයට සැළකිලි කරන්න, නැවතීමට ඉඩ දෙන්න පුළුවන් තත්ත්වයක් නැති වෙලා. ඒ නිසා ඒ මිනිස්සු දැන් මග මගට වැටිලා ඉන්නවා. මට මතකයි ගිය සුමානෙ, දෙවුන්දරදී, විශාල පිරිසක් අදපට මුණගැහුණා. ඒ අයගේ අදහස, ඉඩම් අමාත්‍යාංශයට සම්බන්ධ රජයේ ඉඩමකින් ඒ අයට අක්කරය අක්කරය හරි, අක්කර බාගෙ බාගෙ හරි දුන්නොත්, ඒ ගොල්ලන්ගෙ ප්‍රශ්නයට හුහක් පිළිසරණක් වේවිය කියන එකයි. එහි සිටිනවා, සාමාන්‍යයෙන් පවුල් 1,000 කට කිට්ටු ප්‍රමාණයක්. අද ඉඩම් ප්‍රශ්නය නිසා ඒ ගොල්ලන්ට ජීවත් වෙන්න තැනක් නැතිව ඉන්නවා. මම විශේෂයෙන්ම ඉඩම් ඇමතිතුමාට මතක් කරනවා, උතුරේ ජනපදවල ඉඳලා, ජනපද අහිමි වී, ඔවුන් සතු දේවල් අහිමි වී, දකුණට සංක්‍රමණය වූ ඒ පිරිස් පිළිබඳව, ඒ අයගේ ඉඩම් ප්‍රශ්නය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නය කියා.

ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, මෙන්න මේ ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත ගැන. අපි කිසිසේත්ම එකඟ වන පනතක් නොවෙයි, ඒක. මේ පනත ක්‍රියාත්මක කිරීම ප්‍රකාශ කර තිබෙන්නේ ගිය අවුරුද්දේ අයවැය අවස්ථාවේදීමයි. මේ පනත අපේ ජල පාලන කළමනාකරණය, වාරිමාර්ග කළමනාකරණය පිළිබඳව ජාත්‍යන්තර සම්බන්ධතා ඇති ආයතනවලට බැඳිච්ච ඒ පිළිබඳව සඳහන් වන පනතක්.

ඇත්තවශයෙන්ම මේ පනත යටතේ, විශේෂයෙන්ම ජල පාලනය පිළිබඳව, කෘෂි කර්මාන්තය පිළිබඳව, වාරිමාර්ග පිළිබඳව, විදේශ බල වේගයන් අපේ රටේ බලපෑම් ඇති කරන ස්වරූපයක් පෙනෙනවා. Ford Foundation කියන එක තමයි, මේ පනතේ පදනම වෙලා තිබෙන්නේ. ඒ අයගේ මෙහෙය වීම යටතෙයි—

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
Ford Foundation එකේ අධ්‍යක්ෂ වරයෙක් කුමාර් රූපසිංහ.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
Ford Foundation කියන එක රටක කෘෂිකර්මයට අත ගහන්නේ, ඒ ගොල්ලො බහු ජාතික කෘෂි නිෂ්පාදන සමාගමක්—[බාධා කිරීමක්] ෆෝඩ් ෆවුන්ඩේෂන් කියන එකෙන් කියන්නෙ ෆෝඩ් කොම්පැනිය. ෆෝඩ් කොම්පැනිය කියන්නෙ—

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
මහරගම මන්ත්‍රීතුමා ඔය කාරණය ගැන කියන විට මම එතුමාට උත්තරයක් දුන්නා. මම නමුත්තාන්සේටත් පසුව උත්තරයක් දෙන්නම්.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඇත්තවශයෙන්ම අපි ඒ පිළිබඳව බියක් පළ කරනවා. මොකද ? මේ වගේ රටක කෘෂිකර්මය, වාරිමාර්ග කටයුතු මෙහෙයවීමේ කාර්ය භාරය ජාත්‍යන්තර බහු ජාතික සමාගමක මෙහෙයවීමෙන් ඇති කර තිබෙන පදනමකට යටත් වීම—

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
වික්ටෝරියා ජලාශය උස්සා ගෙන යයි කියලද බය ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ජලාශය උස්සා ගෙන යන්නෙ නැහැ. මේ රටවල්වලට මේ විධියේ පදනම් එන්නේ අපට ආදරේට නොවෙයි. [බාධා කිරීම්] මේ විධියේ පදනම් එන්නේ අපට ආදරේට නොවෙයි කියන එකයි මම කියන්නෙ. රොක්ෆෙලර් පදනම, ෆෝඩ් ෆවුන්ඩේෂන් පදනම කියන මේවා පස්සෙන් ඉන්නෙ කොම්පැනි. ඒ කොම්පැනිවල බඩු විකුණන වෙළඳ පොලවල් ඇති කරගැනීම තමයි, මේ හැම වැඩ පිළිවෙළකින්ම බලාපොරොත්තු වෙන්නෙ. එහෙම නැතිව රටේ මිනිසුන්ගේ ප්‍රශ්න ගැන නොවෙයි ඒ අය සලකන්නෙ. මේ නිසා රටවල් රැසක ඇති වී තිබෙන තත්ත්වයන් ගැන වාර්තා මට ඉදිරිපත් කරන්න පුළුවන්. විදේශ බලපෑම් ඇතිවීම නිසා ඇති වී තිබෙන තත්ත්වයන් මට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව අපි දක්වන විරෝධය ගැන ගරු ඇමතිතුමා පිළිතුරු කථාවේදී අදහස් ප්‍රකාශ කරයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ඊළඟට මම ඉඩම් ක්‍රමය ගැන කියන්න කැමතියි. පොදුවේ මේ රට තුළ අද ඉඩම් ක්‍රමයේ තිබෙන ගැටළු සාමාන්‍ය මිනිසුන්ට වාසිදායක විධියට විසඳෙන ප්‍රමාණය ගැන අපි එකඟ වෙන්නෙ නැහැ. විශේෂයෙන්ම කුඩා ඉඩම් කැබලිවලට හිමිකම් කියන පිරිස් ගැනයි මම කියන්නෙ. මධ්‍යම පංතියේ පිරිසට වැඩි ඉඩම් ප්‍රමාණයක් ලබන පිරිසට ඒ තරම්ම කීකිය බල නොපෑවත්, ඉන්න තැනක් නැතිකම නිසා ගෙයක් අටවා ගැනීමට ඉඩම් කැබැල්ලක් රජයෙන් හෝ වෙනත් තැනකින් බලෙන් අල්ලා ගත් පිරිසට බොහොම දැඩි විධියට කීකිය බලපානවා. ඒ අය හැමදම වාගේ උසාවිවලට කැඳවා ඉඩම් නඩු ඉදිරිපත් කර ඉන්න ඉඩම් කැලිවලින් නෙරපා හරිනවා. මෙන්න මේ ගැන විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ඒ. ඩී. බී. ඒකනායක මහතා (පොළොන්නරුව දිසා ඇමතිතුමා)
(திரு. ஏ. டீ. பி. ஏக்கநாயக்க—பொலன்னறுவை மாவட்ட அமைச்சர்)
(Mr. A. D. B. Ekanayake – District Minister, Polonnaruwa)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ඉතාම වැදගත් කාර්ය භාරයක් උසුලන අමාත්‍යාංශයක් යටතේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ප්‍රකාශ කළා, අනවසර ඉඩම් නීත්‍යානුකූල කිරීමේදී ඇතිවී තිබෙන ප්‍රශ්න පිළිබඳව. 1977ට පෙර කාලයේ විශේෂයෙන් මගේ මැතිවරණ කොට්ඨාශයේ ඇති වුන සිද්ධීන් කිපයක් සම්බන්ධයෙන් මම විශේෂයෙන් එතුමාට මතක් කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජ. ඩී. බී. ජකඤායක මහතා]

එවකට මිත්තේරිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් සිටි රත්න දේශප්‍රිය සේනානායක මහතා මේ අතවසර ඉඩම් නීත්‍යානුකූල කළ හැටි මෙන්ම මෙහෙමයි. ඉඩම් කැලි 923ක් බෙද දුන්නා. එද ඒ ප්‍රදේශයේ අවුරුදු 10ක් 15ක් පමණ කාලයක් තිස්සේ පදිංචිව සිටි කොස් පොල් දෙල් වවා ගෙන සිටි ගොවි මහත්වරුන් අතවසර ඉඩම්වල පදිංචිකරුවන් හැටියට සලකා ඒ ඉඩම්වලින් ඉවත් කළා. ඔවුන් ඒ විධියට ඉවත් කර අන්තනගල්ල, උඩුතුවර, යටිතුවර, ගම්පහ කියන මැතිවරණ කොට්ඨාශවලින් සිය ගණනක් ජනතාව ගෙන ගොස් ඒ ප්‍රදේශවල පදිංචි කෙරෙව්වා. අර කලින් පදිංචිව සිටි අය පාරට එලවා දම්මා. මේ සිද්ධිය වුණේ 1976 දීයි. මේ තත්ත්වය මට මැතිවරණ කටයුතු කිරීමේදී විශාල ප්‍රශ්නයක් වුණා. එපමණක් නොවෙයි, මේ මිතිස්සු අක්කර බාගයයි කියල ඊට වැඩියෙන් ඉඩම් කොටස් වෙන් කර ගත්තා. මෙන්න මේ විධියට තමයි තමුන්නාන්සේලා ඒ කාලයේ අතවසර ඉඩම් නීත්‍යානුකූල කළේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් වචනයක්වත් මේ ගරු සභාවේදී තමුන්නාන්සේලා විසින් ප්‍රකාශ කිරීම නුසුදුසුයි කියා මා මතක් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් කථා කරන්න තමුන්නාන්සේලාට කිසිම අයිතියක් නැහැ.

ඒ වගේම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි අපේ විරුද්ධ ඡාර්ශ්වයේ නායකතුමාගේ පියා 1932දී මේ විධියේ ප්‍රකාශනයක් කර තිබෙනවා: පොළොන්නරුව අනුරාධපුරය වගේ දිස්ත්‍රික්කවල ජනපද පිහිටුවීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත කරන අවස්ථාවේදී මොකක්ද කිව්වේ? සිංහල මහජනතාව පොළොන්නරුව වැනි පලාත්වලට යවන්න එපා. ඒවායේ කපුටන් තරම් විශාල මදුරුවෝ ඉන්නවා. ඒ කථා **හැන්සාඩ්** වාර්තාවල පළවී ඇති. තමුන්නාන්සේලාට බලාගන්න පුළුවන් වෙයි. එද ඒ අය ඒ පැත්තට ජනතාව යවන්න එපා, මෙහේ හිටියාවේ කිව්වා. ඒ ප්‍රදේශවල පදිංචි කරවන්න දකුණු ඉන්දියාවෙන් ද්‍රවිඩ ජනතාව ගේන්න කිව්වා. එද එය ක්‍රියාත්මක වී තිබුණා නම් පොළොන්නරු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට කතා කරන්න පුළුවන් වන්නේ නැහැ. එද ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ දූරදර්ශී කල්පනාව තුළ ආරම්භ කළ ඒ ක්‍රියා දමය නිසා ගොවි ජනපද ව්‍යාපාරයක දරුවෙක් හැටියට අප මේ පාර්ලිමේන්තුවට ඇවිත් අදහස් දක්වන්නට පුළුවන් වීම ගැන මම සන්තෝෂ වෙනවා.

එද එහෙම තත්ත්වයක් තිබියදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිටි ජනගහණ ප්‍රමාණය පන්දහක් පමණයි. ජනපද ව්‍යාපාර පිහිටුවීමෙන් පසු ඒ දිස්ත්‍රික්කයේ ලක්ෂ තුනකට වැඩි ජන සංඛ්‍යාවක් අද ඉන්නවා. මේ ඔක්කෝම සිංහල ජනතාවයි. මම හිතන හැටියට වෙනත් අය සියයට දශම ගණනක්වත් නැහැ. ඒ නිසා අපි විශේෂයෙන් සන්තෝෂ වෙන්න ඕනෑ, ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ දූරදර්ශී කල්පනාව පිළිබඳව.

ඒ වාගේම අපේ වර්තමාන ඉඩම් ඇමතිතුමා ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ අඩිපාරේ ගිහිත් ඉඩම් සංවර්ධන ආඥ පනත ක්‍රියාත්මක කිරීමේ පනස් වැනි සංවත්සරය පොළොන්නරු දිස්ත්‍රික්කයේ පසුගිය ද පැවැත්තුවා. එද, ආරම්භ කළ ඒ ව්‍යාපාරයේ අවුරුදු පනහකට පස්සේ අද ජීවත්ව ඉන්නේ මම හිතන හැටියට දෙවැනි තුන් වැනි පරම්පරාවයි. ඒ ජීවත් වන හැම කෙනෙකුගේම මතකයේ තිබෙනවා, ජනපද ව්‍යාපාරවල වටිනාකම. එද ඒ ජනපද ව්‍යාපාර ආරම්භ කළාට පස්සේ අපේ දිස්ත්‍රික්කයේ තිබෙන්නේ සියයට අනූ පහක් පමණම ගොවි ජනපද ව්‍යාපාරයි. 1977 එහා පැත්තේදී මේ ඉඩම්වල සිටින්නකැර ඔප්පු දෙනවාය කියා ප්‍රකාශයක් කළා. අද අපි ස්වර්ණභූමි නමින් ප්‍රකාශ කරන ඔප්පු දීම සඳහා එද කළ දේ මට මතකයි. පොළොන්නරුව දිසාපතිතුමා ළඟට එද වාර්තා එව්වා, ඔප්පු ලබා ගැනීම සඳහා ඉඩමක වටිනාකම වශයෙන් රුපියල් දහත් දහක් ගෙවන්න ඕනෑය කියා. සමහර ඉඩම්වලට රුපියල් විසි පන්දහක් ගෙවන්න ඕනෑය කිව්වා. එද පල්ලි තිබුණු සමහර ගොවි මහත්වරුන් ඒ ඉඩම් මිලදී ලබා ගත්තා.

අද ගරු ජනාධිපතිතුමාගේ මේ රජයේ ගාම්භීර දිසානායක තරුණ ඇමතිතුමාගේ ක්‍රියා කලාපය යටතේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවීන්ට මේ ඉඩම් සිත්තක්කර ලබා ගැනීම සඳහා ඉඩමක අයිතිය පවරා ගැනීමට ගෙවන්න සිදු වන්නේ රුපියල් දෙසිය පනහක් වැනි සුළු මුදලක් පමණයි. ඒ සුළු ගාස්තුව ගෙවන්න ඕනෑ මුද්දර ගාස්තුව සඳහා පමණයි. ඒ නිසා මේ ජනපද ව්‍යාපාරයෙන් අපේ දිස්ත්‍රික්කයට වටිනා සේවයක් සිදු වුණාය කියා මම කල්පනා කරනවා.

අ. හා. 1.30

අපේ දිස්ත්‍රික්කයේ අතවසර ඉඩම් නියමානුකූල කරන විට මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අපි කිසිම කෙනෙක් එළියට විසි කළේ නැහැ. අද අතවසර පදිංචිකරුවෙක් කියන ගැම පුද්ගලයෙක්ම මේ ඇමතිතුමාගේ දූරදර්ශී වැඩ පිළිවෙළ යටතේ නීත්‍යානුකූල ඉඩම් හිමියකු බවට පත් වී තිබෙනවා. මේ වත විට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ උදගම් ව්‍යාපාරය යටතේ ගෙවල් පහළොස්දහක් පමණ ඉදී වෙනවා. ඒ ඉඩම් අයිති හැම කෙනකුටම දැන් කිසිම බියක් තැතිව තම ඉඩම ඇපයකට තියා ණය මුදල් ලබා ගෙන ගෙයක් හදා ගන්න පුළුවන්කමක් ලැබී තිබෙනවා, මේ අතවසර ඉඩම් නීත්‍යානුකූල කිරීම යටතේ. ඒ නිසා එයින් අපේ දිස්ත්‍රික්කවලට විශාල සේවාවක් සිදු වී තිබෙනවා.

ගරු ඇමතිතුමාට තවත් කරුණක් කියන්න ඕනෑ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළමුවැනි පරම්පරාව දනට අවුරුදු පනහකට ඉස්සෙල්ලා පදිංචි වුණු අය. ඒ අයගේ දෙවැනි තුන්වැනි පරම්පරාවල් දැන් ජීවත් වෙනවා. දැන් ඔබතුමාගේ මහ පෙත්වීම යටතේ, මහවැලි යෝජනා ක්‍රමය යටතේ මාදුරු ඔය ව්‍යාපාරය අපේ දිස්ත්‍රික්කයේ දියත් වී තිබෙනවා. කොත්මලේ, වික්ටෝරියා ආදී ව්‍යාපාර නිසා ඒ ප්‍රදේශවලින් ඉවත් කරන්න සිදු වුණු ජනතාව පදිංචි කරවා තිබෙනවා. එය මූලිකව කළ යුතු දෙයක්. දැන් අපේ ගොවි ජනතාවගේ දරුවනුත් වැඩිදෙනෙක් පුරුදු වී තිබෙනවා, ගොවිතැන් කරන්න. ඒ අයට අක්කර 3, 5 ආදී වශයෙන් ඉඩම් දී තිබුණා. නමුත් ඒ පළමු පරම්පරාවෙන් එහාට අලුතින් ඉඩම් ලැබුණේ නැහැ. ඒ නිසා පළමු පරම්පරාවට ලැබුණු ඒ ඉඩම්වලම දෙවැනි පරම්පරාවත්, තුන්වැනි පරම්පරාවත් ගෙවල් හදගෙන ඉන්නවා. ඒ විධියට එක පවුලක් සඳහා දැන් ඉඩමේ දැන් පවුල් තුන-හතරක් ජීවත් වෙනවා. මේ ප්‍රශ්නය විසඳීම සඳහා තවම හරි පිළියමක් යෙදී නැහැ. පොළොන්නරු දිස්ත්‍රික්කයේ ඉන්න සුදුසුකම් තිබෙන, විවාහකයන්ට පවා අද ඉඩම් ලැබී නැති නිසා ඔවුන් ලොකු අපහසුවකට මුහුණ දී සිටිනවා. පොළොන්නරු දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ 3 ක් තිබෙනවා. ඒ නිසා පොළොන්නරු දිස්ත්‍රික්කයේ පවුල් 6,000කටවත් ඉඩම් බෙද දෙන්න ගරු ඇමතිතුමාට පුළුවන්කම තිබෙනවා නම් එයින් විශාල සේවාවක් සිදු වෙනවා. අපේ පොළොන්නරු දිස්ත්‍රික්කය ආරක්ෂා කර ගත් පිරිස තමයි, මේ ගොවි පරම්පරාව. අදත් ලංකාවේ ජනගහණයෙන් සියයට 10කට කන්න දෙන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවය කියන එක මම සන්තෝෂයෙන් මතක් කරනවා. ඒ හැරෙන්න දනටමත් කන්න කීපයකම ලංකාවේ වැඩිම වී අස්වැන්නක් ලබාගෙන තිබෙන්නේත් පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවයි. ඒ නිසා ඒ ගොවි ජනතාවට කරන උපහාරයක් වශයෙන්වත් ඔවුන්ගේ දරුවන්ට මාදුරු ඔය ව්‍යාපාරය යටතේ ඉඩම් ලබා දෙන හැටියට මම ගරු ඇමතිතුමාගෙත් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

පසුගිය මිත්තේරිය අතුරු මැතිවරණ සමය තමුන්නාන්සේලා කාටත් මතක ඇති. මේ ආණ්ඩුව ජල ගාස්තු අය කරනවාය, ඒක ඉතා භයානක දෙයක්ය කියමින් තමයි, ශ්‍රී ලංකා මහජන පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඒ අතුරු මැතිවරණ ව්‍යාපාරය ගෙන ගියේ. ඒ වුණත් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාට—වර්තමාන මිත්තේරියේ ගරු මන්ත්‍රීතුමාට (එස්. බී. විජේකෝන් මහතා)—වැඩි ජන්ද නවදස් ගණනකින් ඒ ආසනය ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණා, අපේ ගොවි ජනතාවගේ සහයෝගය නිසා. ඒ නිසා ඒ ගොවි ජනතාව ගැන ක්‍රියා කරන්න අපට විශේෂ යුතුකමක් තිබෙනවා.

එපමණකුත් නොවෙයි. අර ජල ගාස්තු ලබා ගැනීම අතින් 1984 වර්ෂයේදී මුළු ලංකාවෙන්ම වැඩිම ප්‍රමාණයක් — මම හිතන හැටියට රු. 54,00,000ක් — එකතු කර දී තිබෙන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයෙනුයි. ඒ මුදල් නැවතත් ඒ ගොවීන්ගේම සේවය සඳහා යොදවන්න අපට පුළුවන්කම ලැබුණා.

මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් තවත් දෙයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි. පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මිත්තේරිය, ගිරිතලේ ආදී වැව්වල අධිකාරීන් හැටියට හොඳ දක්ෂ නිලධාරීන් පිරිසක් අපට ලබා දී තිබුණා. නමුත් ඒ නිලධාරීන්ගෙන් සැහෙන ප්‍රමාණයක් එක්කෝ වෙනත් රැකියා ලබා, එගෙම තැන්තම් උසස්වීම් ලබා ඒ ස්ථානවලින් ගිහින් තිබෙනවා. ඒ නිසා මොකද, වුණේ? මම කලින් කී විධියට ජල ගාස්තු විශාල ප්‍රමාණයක් පොළොන්නරු දිස්ත්‍රික්කයෙන් එකතු වී තබුණා. ඒ නිසා ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් යොදවා ඒ ප්‍රදේශයේ විශාල වැඩ කොටසක් කරවා ගත්ත ගොවි මහතුන් බලාපොරොත්තුවෙන් හිටියා. ඒ මුදල් යොදවා ඒ කටයුතු කර ගත්ත පුළුවන් වුණා නම් ඒ ගොවි මහතුන්ගෙන් පහසුවෙන්ම රුපියල් අවුරුද්දේත් ජල ගාස්තු එකතු කර ගත්ත පුළුවන්කම තිබුණා. නමුත් අර දක්ෂ නිලධාරීන් ඒ ස්ථානවලින් ඉවත් වී ගිහින් තිබෙන නිසා ඒ ගොවීන්ගේ අවශ්‍යතාවත්, ඇළවල් ප්‍රතිසංස්කරණය කර ගැනීම් ඉටු කරවා ගත්ත අපහසු වී තිබෙනවා. ඒ නිසා රුපියල් වාරයේ ගාස්තු අය කර ගැනීමේදී විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. මම දැක්කා ඒ පිළිබඳ වාර්තාවක්. ඒ අනුව 1985 දී පොළොන්නරු දිස්ත්‍රික්කයෙන් රු. 60,00,000ක් අය කර ගන්න බලාපොරොත්තු වී තිබෙනවා. 1986 දී රු. 72,00,000ක් අය කර ගන්න බලාපොරොත්තු වෙනවා. නමුත් මේ ගාස්තු නියම විධියට අය කර ගත්ත පුළුවන් වෙනවා, අර නිලධාරීන් නියම විධියට පත් කොට ඔවුන් ලවා ගොවීන්ගේ අවශ්‍යතාවත් ඉටු කර දී තිබුණා නම්. මෙහෙයුම් හා නඩත්තු ගාස්තුව ඉනාමත් ප්‍රයෝජනවත් වැඩවල යොදවන්න අපට පුළුවන්කම තිබෙනවා. කවුරු මොනවා කීවත් ඒ වැඩ කටයුතු දැන් ගොවීන්ට අවශ්‍ය පරිදි සිදු වෙනවා.

පොළොන්නරු දිස්ත්‍රික්කයේ මහා වාරිමාර්ග සම්බන්ධ පුනරුත්ථාපන කටයුතු පසුගිය කාලයේදී කරන්න බැරි වුණා. විදේශ ආධාර යටතේ 1986 දී ඒ කටයුතු පටන් ගන්නයි, අදහස් කර තිබුණේ. නමුත් මෙතෙක් ඒ සම්බන්ධයෙන් කිසිවක් කෙරී ඇති බවක් මට නම් පෙනෙන්නේ නැහැ. පරාක්‍රම සමුද්‍රය, මිත්තේරිය ආදී වැව් දහට අවුරුදු 50කට අධික කාලයක් තුළ ප්‍රතිසංස්කරණය කර නැහැ. ඒ වාරිමාර්ග නියම විධියට නඩත්තු නොකිරීම නිසා දැන් ඒ වැව්වල විශාල ජල ප්‍රමාණයක් අපතේ යනවා. ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඉතා ඉක්මනින් ඒ කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

පසුගිය ගංවතුර කාලයේදී කවුඩුල්ල වැව විශාල තර්ජනයකට මුහුණ දී ගානියට පත් වුණා. එතෙන්දී ගරු ඇමතිතුමා ඒ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එතුමාගේ පෞද්ගලික අදහස යටතේ රුපියල් ලක්ෂ පණහක් ලබා දුන්නා. මෙතෙන්දී ඒ වැඩ කොටස් හාර දුන් පුද්ගලයන්ට ඒවා හරියාකාරව කරගන්න බැරි වී තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් ඒ අංශ හාර නිලධාරී මහතුන්ගේ දැඩි අවධානය යොමු කරන්න කැමතියි මේ කටයුත්ත ඉක්මනින් අවසන් කරන්නය කියා. එසේ නොකෙරුණොත් ඊට වඩා විශාල තර්ජනයකට කවුඩුල්ල වැවට නැවතත් මුහුණ දෙන්නට සිදුව වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් රජ රට පුත්‍රයෙක් හැටියට ගරු ඇමතිතුමාගේ වැඩ කටයුතුවලට ඉතාම උනන්දුවෙන් උදව් කරනවා. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමාත් අනික් නිලධාරී මහත්වරුන් අමාත්‍යාංශයේ ඉදිරි ගමනට සෑම ධෛර්‍යයක්ම දෙන නිසා ඒ සියලු දෙනාටම මම මේ අවස්ථාවේදී ස්තුති කරන්න කැමතියි.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில் — ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)

ගරු සභාපතිතුමනි, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කරන අවස්ථාවේදී මේ අමාත්‍යාංශය තුළින් හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුළු මුළු මහත් රුහුණටම කෙරීගෙන යන සංවර්ධනය ගැන මම කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම දැන් දවස් කිපයකට කලින් ගරු ඇමතිතුමා නියෝජ්‍ය ඇමතිතුමාගේ සහභාගිත්වයත් ඇතිව විවෘත කළ ලුනුගම් වෙහෙර ව්‍යාපාරය තුළින් මුළු මහත් රුහුණ පුරාම කෙරීගෙන යන විප්ලවීය වෙනස ගැන අපි සිහිපත් නොකරන්නේනම් එය කෘතවේදී මිනිසුන් හැටියට යුතුකම් පැහැර හැරීමක් වෙනවා. මෙහි සම්පූර්ණ ගෞරවය ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් හිමිවන අතර ලේකම්තුමා ඇතුළු වාරිමාර්ග අධ්‍යක්ෂතුමාත්, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ උදවියත් මේ අවස්ථාවේදී සිහිපත් නොකරන්නේනම් මම හිතනවා ඒකත් අපෙන් සිදුවන අඩුපාඩුවක් කියා.

මේ කාලය තුළදී විශාල පරිවර්තනයක් කරගෙන යන ව්‍යාපාරයක් හැටියට ලුනුගම් වෙහෙර ව්‍යාපාරය නම් කරන්න පුළුවන්. ඒ වාගේම ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය තුළින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීම තවත් අතකින් වූ විප්ලවීය වෙනසක්ය කියන්න පුළුවන්. ඒ වාගේම ස්වර්ණභූමි වැඩ පිළිවෙල යටතේත් විශාල වෙනස්කම් රාශියක් කරගෙන යනවා.

මේ සියලු වැඩ සම්බන්ධව ඇති හොඳ අනන්තයි. ඒ හා සමානවම සමහරවිට සුළු සුළු අඩුපාඩු නැත්තේ නොවෙයි. ඒ වැඩවල හොඳත් සුළු අඩුපාඩුකම් ස්වල්පයක් යසඳා බලනවිට අගසට පොලොව හා සමාන වෙන්න පුළුවන්. නමුත් ඒ සුළු අඩුපාඩුවත් යම්පූර්ණ කෙරෙන්නේ නම් එයින් විශාල ප්‍රයෝජනයක් ඇලයෙන අතර එය අමාත්‍යාංශයේ ගෞරවයටද හේතු වෙනවා.

මම විශේෂයෙන් පෙන්වා දෙන්න ඉදන්නේ මෙන්න මේ කාරණයයි. ලුණුගම් වෙහෙර ව්‍යාපාරය යටතේ පදිංචි කරවීම සඳහා නීත්‍යානුකූලව ඉඩම් කච්චේරි ආදිය පවත්වා කටිටිකරුවන් තෝරාගෙන ඉඩම්වල පදිංචි කරවන්න ඉදන විට සුළු හේතුවක් නිසා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරාගත් අයගෙන් සියයට 10ක ප්‍රමාණයක් අත් සිටුවන්න සිද්ධ වුණා. ඒ අනුව මේ තෝරාගත් අය තුළ මහත් ආත්දෝලනයක් ඇති වී ඒ ව්‍යාපාරයේ වැඩ කටයුතු නිසියාකාරව ගෙනයාමට අපහසු වී තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ සියයට 10යේ තනර කිරීම අත් සිටුවා, අවශ්‍ය නම් ලබන අවුරුද්දේ තව මාස හතරකින් පටන් ගන්නා දෙවනි පියවරේදී ඒක කළොත් හොඳයි කියා.

පසුගිය වතාවක සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් සංගණනයක් ගත් අවස්ථාවේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක බිම් අඟලක්වත් නැති පවුල් 32,000ක් ඉන්නවාය කියා ගණන් බලා තිබුණා. එයින් පවුල් 20,000ක්ම තිස්සමහාරාම ජන්ද කොට්ඨාශයෙන්. ඒ 20,000න්ත් පවුල් 500ක් පමණයි තිස්සමහාරාම කොට්ඨාශයෙන් ලුණුගම්වෙහෙර යාම සඳහා තෝරාගත්තෙ. ඒ 500 දෙනාගෙනුත් 108 දෙනෙකු පමණ තනර කිරීම නිසා අපට විශාල විවේචනවලට මුහුණ පාන්න සිද්ධ වී තිබෙනවා. ඒවා සාධාරණ විවේචන නොවෙන්න පුළුවන්. කෙසේ වුණත් දවස් දෙක තුනකට කලින් ඇමතිතුමා ප්‍රකාශයක් කළා ඒ 108 දෙනාත් පදිංචි කරවීමට උපදෙස් දෙනවාය කියලා. ලේකම්තුමාත් ඒ ගැන සඳහන් කළා. ඉඩම් කොමසාරිස්තුමාත් කිව්වා. මගේ යුතුකමක් හැටියට මම එය මතක් කරන්නට කැමතියි. මෙය ලබා දුන්නොත් අතිවිශාල ගරුත්වයක් ඇති වෙනවා. මේක ඓතිහාසික සිද්ධියක්.

එමෙන්ම 1970 සිට 1977 දක්වා කාලයේදී විශාල ධනපතියන්ට එහි ඉඩම් බෙද දීමේ ක්‍රමයක් තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද එක්සත් ජාතික පක්ෂයේ ඉඩම් ප්‍රතිපත්තිය විවේචනය කළත් මම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි, ඒ අයගේ කාලයේදී රජයේ සේවකයින්ට නැත්තම් ධනපතියන්ට අක්කර විසි පහ තිහ ආදී වශයෙන් ලබාදී තිබුණා කියා. ඒවා පිං ඉඩම්. දුප්පත් මිනිස්සු අක්කරය එක හමාර ලබා ගන්නට බැරිව ලත වෙද්දී ලොකු ධනපතීන්ට හා ව්‍යාපාරිකයින්ට අක්කර විස්සේ තිහේ කුඹුරු ඉඩම් ලබා දී තිබුණා. ඒවා ඒ අය ප්‍රයෝජනයට ගත්තෙත් නැහැ. විවිධ ක්‍රමවලට ඒවා කඩලා බෙදලා විකිණීමේ ක්‍රමයක් පවත්වා ගෙන ගියා. ඒ ප්‍රදේශයේ ජල පහසුකම් නැති නිසා ඒ ඉඩම් දෙනු තෙවනු අවස්ථාවලදී මිළයට ගත් අයත් ඒවායින් ප්‍රයෝජන ගත්තේ නැහැ. නමුත් මේ රජය මේ ඇමතිතුමා තුළින් ඒ හැම ප්‍රදේශයකටම ජල පහසුකම් ලබා දෙන විට දැන් ඒ අය කොළඹ ගාල්ල මාතර ආදී ප්‍රදේශවල සිට මධ්‍යම පංති ක්‍රමය නියා ක්‍රමයකට එක්කෙනා අක්කර විසිපහ තිහ ආදී වශයෙන් ඒ ඉඩම් ලබා ගෙන තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් කරන ඉල්ලීම මෙයයි. තිස්සමහාරාමය මැතිවරණ කොට්ඨාශයේ පමණක් පවුල් 20,000ක් බිම් අඟලක්වත් නැති අය සිටිනවා නම්, පිටස්තර ප්‍රදේශවලින් එහෙම නැත්නම් නගරවල සිට පැමිණි ව්‍යාපාරිකයින්ට අක්කර 25, 30 ආදී වශයෙන් බෙද දෙන්නේ ඇයි ? මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් මේ කරන්නේ. මානුෂික හේතූන් උඩ එසේ දී තිබෙන ඉඩම් සම්පූර්ණයෙන්ම කැන්සල් කර නැත්නම් අනෝසි කර ඒ ඉඩම් ඒ ප්‍රදේශයේ දුප්පත් අයට අක්කර 1, අක්කර 1 1/2, අක්කර 2, අක්කර 2 1/2 බැගින්වත් දෙනවා නම් එය යුතුකමකටත් වඩා මහා පුණ්‍ය කර්මයක් බව මම තමුන්නාන්සේට මතක් කර දෙන්නට කැමතියි. ගරු ඇමතිතුමනි, අද තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් සංවර්ධනය නොවන එකම ප්‍රදේශයක්වත් එකම ගමක්වත් එකම වැවක්වත් නැහැ. ඒ වැව්වල හා ගම්මානවල පුදුමාකාර සංවර්ධනයක් කෙරීගෙන යනවා.

අ. හා. 1.45

මේ අවස්ථාවේදී තමුන්නාන්සේට තවත් කරුණක් මතක් කරන්නට ඕනෑ. ලුනුගම්වෙහෙර කිට්ටුවම තවත් විශාල ව්‍යාපාරයක් මැතකදී තමුන්නාන්සේගේ අමාත්‍යාංශය මඟින් ආරම්භ කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය පී. එම්. බී.සිරිල් මහතා]

මහඇලුත්ගම්ආරූ ව්‍යාපාරය කියා. එහි අක්කර 1,200ක් පමණ සරු කුඹුරු බවට පරිවර්තනය වෙනවා. අද ගාල්ල ආදී ප්‍රදේශවලින් පවුල් 150ක් 200ක් පමණ එහි ගොස් අනවසරයෙන් පදිංචි වී සිටිනවා. එයට හේතුව මෙයයි. අනවසරයෙන් පදිංචිවී ගෙවල් හදාගෙන සිටිනවා නම් ඒ අයට ඉඩම් දෙනවා යයි කතාවක් තිබෙනවා. ඒ තුළිනුත් ප්‍රදේශයේ පදිංචිකරුවන්ට විශාල සාධාරණයක් වෙනවා. ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන් 20,000ක් පමණ බිම් අහලක්වත් නැතිව සිටිනවා නම්, මැතක සිට — අවුරුදු දෙකක තුනක සිට — ඒ ප්‍රදේශයේ පදිංචිවී සිටින අය මේ ව්‍යාපාරය නිමවූවිට — ලබන වර්ෂයේ එය නිම වෙනවා — එහි ඉඩම් ලබා ගන්නවා නම්, අර ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන්ට මොන තරම් ආසාධාරණයක් වෙනවාදැයි තමුන්නාන්සේට හිතා ගන්නට පුළුවන්. ඒ අයට ඉඩම් දුන්නත් කමක් නැහැ. නීත්‍යානුකූල විධියට දෙනවා නම්. අනේ හයියට හෝ ගනේ හයියට එහෙම නැත්නම් මුදල්වල හයියට මේ විධියට ඇවිත් බලයෙන් පදිංචිවී සිටින අයට ඉඩම් දීම සාධාරණද ? ඒ අය ඉවත් කරන්නට අද නිලධාරීන්ත් මැළි වෙනවා. විවිධ බලසම්පන්න උදවියයි මහඇලුත්ගම්ආරූ ව්‍යාපාරය යටතේ පදිංචි වී සිටින්නේ. මෙයට දින හත අටකට කලින් අපි එහි ගියා. මුල් සංවර්ධන ප්‍රදේශයේම කුප්පායම් ගසා ගෙන වගේ නැන්නම් කැමප් ගසාගෙන වගේ පවුල් 150ක් පමණ පදිංචි වී සිටිනවා. බෙදා දෙන්නට එක බිම් අහලක්වත් නැති වන තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. ඒ ඔක්කොම අනවසරයෙන් පදිංචිවී සිටින අයයි. පිටස්තර අයට වුණත් දුන්නාට කමක් නැහැ, ඒ අය දුප්පත් අය නම්. නමුත් මේ අය ව්‍යාපාරිකයෝ. මෙය අතේ හයියට ඉඩම් අල්ලා ගැනීමට කරන වැඩක්. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. අද තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් පුදුමාකාර පුණ්‍ය කර්මයක් කෙරෙනවා. නමුත් මෙවැනි සුළු සුළු අඩුපාඩුකම් ඇති වූ විට මිනිස්සු වැඩිපුර කථා කරන්නේ අර හොඳ ගැන නොවෙයි, සුළු සුළු අඩුපාඩු ගැනයි. අන්න ඒ නිසා මම තමුන්නාන්සේට කියන්නේ ඒ සුළු සුළු අඩුපාඩු තැති කර දෙනවා නම් එය විශාල යහපතක්ය කියන එකයි.

මා අවසාන වශයෙන් ගංගා තීරීත සංවර්ධන මණ්ඩලය ගැන මතක් කරන්න ඕනෑ. එය විශාල මෙහෙයක් කළ සංස්ථාවක්. ගංගා තීරීත භූමි සංවර්ධන මණ්ඩලය තුළින් උඩ වලවේ වම් ඉවුරේ ව්‍යාපාරය ඉතාමත්ම හොඳ විදියට එක්සත් ජාතික පක්ෂ කාලය තුළදී කෙරුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1970 සිට 1977 දක්වා ගංගා තීරීත භූමි සංවර්ධන මණ්ඩලය තුළින් උඩ වලවේ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු නොකළ නිසා, ඒ අයගේ සේවය ඒ සඳහා ලබා නොගත් නිසා, ඒ අයට සිද්ධ වුණා පඩි ලබාගෙන නිකම් රැකියාවේ රැඳී සිටින්න. නමුත් තමුන්නාන්සේ ලුණුගම්වෙහෙර ව්‍යාපාරය ආරම්භ කළාට පසුව ඔවුන්ගේ සේවය ලබාගෙන ඉතාමත්ම හොඳ විදියට කටයුතු කරනවා.

තමුන්නාන්සේ පිළිගත්තවා, ඒ වාගේම කවුරුත් පිළිගත්තවා, ගංගා තීරීත භූමි සංවර්ධන මණ්ඩලයට වුවමනා නම්, පාලකයෝ දක්ෂ නම්, පාලකයින්ට පුළුවන්කම තිබෙන බව ඒ උදවියගෙන් හොඳ සේවයක් ලබාගන්න. මම ඉතාමත්ම යත්තෝෂ වෙනවා තමුන්නාන්සේ ලුණුගම්වෙහෙර ව්‍යාපාරය විවෘත කළ අවස්ථාවේදී කළ ඒ ඓතිහාසික කතාව ගැන. ඍතවේදී මනුෂ්‍යත් හැටියට, මේ රජයත්, තමුන්නාන්සේත් ඍතවේදීව ඒ ලුණුගම්වෙහෙර ව්‍යාපාරය යටතේ සේවය කළ හැම කෙනෙක් සම්බන්ධවම ස්තුතිපූර්වකව කථා කළා. ගංගාතීරීත භූමි සංවර්ධන මණ්ඩලයේ සේවක මණ්ඩලය ගැනත් කථා කළා. ඒක ඓතිහාසික සිද්ධියක්. 1977 මැතිවරණ කාලයේදී මැදවච්චිය ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) සූරිය වැව ප්‍රදේශයට ඇවිත්, උඩ වලවේ ව්‍යාපාරයට ඇවිත් කිව්වා, ඒ අය බලයට ආවොත් ගංගා තීරීත භූමි සංවර්ධන මණ්ඩලය සම්පූර්ණයෙන් අහෝසි කරනවා කියා. නමුත් තමුන්නාන්සේගේ මැදිහත්වීම නිසා තමයි අද ගංගාතීරීත භූමි සංවර්ධන මණ්ඩලය මේ තත්ත්වයෙන් තිබෙන්නේ. තමුන්නාන්සේ ප්‍රකාශයක් කළා ලබන වර්ෂයේ සිට ඒ උදවියගේ සේවය අදටත් වඩා හොඳට ප්‍රයෝජනවත් විදියට ගත්තවාය කියා. මම මතක් කරන්නට ඕනෑ, ඒ උදවියගේ සේවය ඉතාමත්ම හොඳයි. ඒ උදවිය කළ දේවල් හොඳයි. අඩුපාඩුකම් තිබෙන උදවියත් ඇති. තමුන්නාන්සේ ප්‍රකාශ කළා යම් විදියකින් එවැනි උදවිය ඉවත් කරන්න සිද්ධ වෙනවා නම් ඒ උදවියට ඉඩම් ලබා දී ඔවුන්ගේ අනාගතය සනාථ වෙන විධියට වැඩ පිළිවෙළක් සකස් කරනවාය කියා. ඒ ගැන හම්බන්තොට දිස්ත්‍රික්කය වෙනුවෙනුත්, විශේෂයෙන්ම තිස්සමහාරාමය මැතිවරණ කොට්ඨාශය වෙනුවෙනුත් අපේ ඍතවේදී භාවය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

එස්. බී. විජේකෝන් මහතා (මින්නේරිය)
(திரு. எஸ். பி. விஜேகோன் — மின்னேரியா)
(Mr. S. B. Wijekoon – Minneriya)

ගරු සභාපතිතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වචන කිහිපයක් කතාකිරීමට අවස්ථාව ලබාදීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අද ලංකාවේ තිබෙන ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශයක් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කෘෂිකර්ම සංවර්ධන විප්ලවයේ පියා වශයෙන් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය අපට හඳුන්වන්නට පුළුවන්. මා එසේ කියන්නේ ශ්‍රී ලංකාවේ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා ඉතාමත්ම ඈත දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශවලට ගිහින් මූලික සැලසුම් හා සම්ක්ෂණ පවත්වා ඒ වනගත ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා මූලිත්ම අවශ්‍යවන ජලය, පාරවල් ආදී හැම එකක්ම ලබා දී මේ සංවර්ධන වැඩ කිරීමට පළමුවෙන්ම උර දීලා, අත හිත දීලා වැඩ කරන්නේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය නිසයි. ඒ නිසයි ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය අද ඉතාමත්ම වැදගත් ස්ථානයක් ලැබෙන්නෙ.

විශේෂයෙන්ම මෙහිදී අපි අතිගරු ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍යතුමාණන්ව සිහිපත් කරන්න ඕනෑ. එයට හේතුව, එතුමා මේ රටේ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා විශේෂ මහත්සියක් අරගෙන තිබෙන නිසයි. ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍යතුමා ඉඩම් ඇමතිව සිටි කාලයේ ඉඩම් සංවර්ධන වැඩ කටයුතු සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත මේ රටේ ඇති කළා. ඒ ආඥ පනත නමයි ශ්‍රී ලංකාවේ ඉඩම් සංවර්ධන විප්ලවයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වුණේ. මේ පනත නිසා ජනතාවගේ ඉඩම් සම්බන්ධ අයිතිය තහවුරු වෙලා තිබෙනවා. ඒ සමඟම මේ තුළින් ඉඩම් සංවර්ධනයක් ඇතිවීමට පැහැදිලි සැලැස්මක් බිහිවුණා. ඒ එක්කම සිංහල ජාතියේ උරුමය රැකගැනීමට මේ ඉඩම් සංවර්ධන ආඥ පනත උපයෝගී වූ බවත් මම මතක් කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම අද සාකච්ඡාවේදී විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු සඳහන් කළ දෙයක් තමයි මේ වාරි මාර්ග තඩත්තු අරමුදල. මේ සම්බන්ධයෙන් මමත් වචන කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු බලාපොරොත්තු වන්නේ ඒ අයට වෙනත් ආයුධයක් නැති නිසා මේ තඩත්තු අරමුදල ගැන කථා කර ගොවි ජනතාව මුලා කිරීමටයි. විශේෂයෙන් තඩත්තු අරමුදලින් බලාපොරොත්තු වන්නේ පැරණි ගොවිජනපදවල තිබෙන වාරිමාර්ග පද්ධතීන් තිසියාකාර අලුත්වැඩියා කර ගෙන ගොවියාට නිසියාකාර ජලය ලබා දීමේ ක්‍රියාමාර්ගයක් ඇති කිරීමයි. මේ වගේ ක්‍රමයකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධ වීම පුදුමයක් නොවෙයි. ඒ පක්ෂයේ පෙර සිටි නායකයන් පවා සෑම විටම ගොවියාගේ යහපත හෝ හොඳ හැටි පැහැදිලිව පේනවා. ඉතිහාසය දෙස බලන විට අපිට පේනවා, අතිගරු ඩී. එස්. සේනානායක මැතිතුමා ඉඩම් ඇමති වශයෙන් සිටි කාලයේදී 1932 අවුරුද්දේදී රාජ්‍ය මන්ත්‍රණ සභාවට පස් අවුරුදු සැලැස්ම ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සිංහල මිනිසුන් ඒ ප්‍රදේශවලට ගෙන යනවාට බණ්ඩාරනායක මහත්මයා විරුද්ධ වී ඒ සඳහා දෙමළ ජනතාව — දෙමළ කම්කරුවන් — ගෙන ඒමට යෝජනා කර තිබෙන බව. මෙයින් අපිට පැහැදිලි වෙනවා, මේ වාගේ වැඩපිළිවෙළවල්වලදී, මේ පක්ෂයේ උදවිය කවදත් විරුද්ධ වී තිබෙන බව. ඒ නිසා මේ අවස්ථාවේදීත් විරුද්ධ වීම එතරම් පුදුමයක් නොවෙයි. තමුන් අපේ ඉල්ලීම, මේ රටේ විශාල සංවර්ධනයක් වන අතර තුරේදී ගොවියන්ගේ යහපත සඳහා ක්‍රියාත්මක කරනු ලබන මෙවැනි යෝජනාවත් උපයෝගී කරගෙන එයින් දේශපාලන වශයෙන් වාසියක් ලබා නොගන්නා ලෙසයි. විරුද්ධ පාර්ශ්වයෙන් ඒ ඉල්ලීම කරන්නට අපට සිද්ධ වී තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කොපමණ කෑ ගැහුවත්, මේ මුදල් ගෙවන්නට ඒ අරමුදලට දායක වෙන්නට ගොවි ජනතාව සැහෙන උනන්දුවක් දක්වනවා. උදාහරණයක් වශයෙන් මගේ ආසනයේ තිබෙන මින්නේරිය ව්‍යාපාරය සහ ගිරිතලේ ව්‍යාපාරය දක්වන්නට පුළුවනි. 1984 වර්ෂයේදී මින්නේරිය ව්‍යාපාරය යටතේ අයවී තිබෙනවා, රු. 5,84,736ක්. 1984 වර්ෂයේ හිඟ වශයෙන් 1985 වර්ෂයේදී ඔවුන් ගෙවා තිබෙනවා, රු. 3,26,403ක්. ඒ අනුව 1984 වර්ෂයේ පමණක් මින්නේරිය ව්‍යාපාරය වෙනුවෙන් ගොවීන් ගෙවා තිබෙන මුදල් රු. 9,11,130ක් වෙනවා. ඒවාගේම ගිරිතලේ ව්‍යාපාරය යටතේ 1984 වර්ෂයේදී ගොවීන් ගෙවා තිබෙනවා, රු. 2,99,800ක්. 1984 වර්ෂයේ හිඟ වශයෙන් 1985 වර්ෂයේදී රු. 1,45,518ක් ගෙවා තිබෙනවා. 1984 වර්ෂයේ මුලු එකතුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රු. 4,45,400යි. මේ විධියට 1985 වර්ෂයේන් කොටස් ප්‍රමාණයක් ගෙවා තිබෙනවා, අර ගෙවීම් වලට අමතරව. මේ අනුව අපිට පැහැදිලිව පේනවා, මේ අරමුදල ගෙවීමට ගොවි ජනතාව විශේෂ උනන්දුවක් දක්වන බව. ඒ සමඟම ලක්ෂ 3 කට ආසන්න මුදලක් වැය කර දැනට ගිරිතලේ ව්‍යාපාරයේ වාරිමාර්ග නඩත්තු වැඩ අවසන් කර තිබෙනවා.

ඒවාගේම මිත්තේරිය ආසනයේ පුනරුත්ථාපන වැඩ සඳහා අමාත්‍යාංශ මඟින් දැනට ඇස්තමේන්තු 61ක් පමණ අනුමත කර තිබෙනවා. ඒවා 1986 වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙනවා. එම නිසා තමන්ගේම යහපතට ගන්නා ක්‍රියාමාර්ගයන්වලට ගොවියා සහභාගි කරවන්නට අපි ගොවියා තව තවත් උනන්දු කරවන්නට ඕනෑ.

ඊළඟට ස්වර්ණභූමි ඔප්පු සම්බන්ධව සඳහන් කරන්නට ඕනෑ. මේ රටේ "කොලනිකාරයින්" හැටියට හැඳින් වූ ගොවි ජනතාවට අද තමන්ගේම සිත්තක්කර උරුමයන් ඇති ඉඩමක් මෙයින් ලබා ගන්නට පුළුවන් කම ලැබී තිබෙනවා.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
Order, please ! විනාඩි දෙකකින් නවත්වන්නට ඕනෑ.

එස්. බී. විජේකෝන් මහතා
(திரு. எஸ். பி. விஜேகோன்)
(Mr. S. B. Wijekoon)

තව විනාඩි දෙකකින් අවසන් කරනවා. ස්වර්ණභූමි ඔප්පු ගැන කථා කරන විට, මේ ඔප්පුවේ වටිනාකම ටිකක් අඩු වී තිබෙන බව මතක් කලයුතුව තිබෙනවා. මේ ඔප්පුවලින් බැංකු ණය ලබා ගනිමට නොහැකි වීම නිසා එහි වටිනාකම ටිකක් අඩු වී තිබෙනවා. ඉඩම් සංවර්ධන ආඥාපනතේ 43 වන වගන්තිය යටතේ ලංකා බැංකුවට සහ මහජන බැංකුවට මෙය උකස් කර ණය මුදලක් ලබා ගන්නට පුළුවන් කම තිබෙනවා. ඒ සමඟම 1981 වර්ෂයේ ඉඩම් සංවර්ධන ආඥාපනතේ අංක 26 දරන සංශෝධනයෙන් රජයේ ආයතන විශාල සංඛ්‍යාවකට මේ බලපත්‍රය උකස් තියා ණය ලබා ගන්නට පුළුවන් කම තිබෙනවා. නමුත් කණගාටුවකට තිබෙන්නේ මේ බැංකු -- මහජන බැංකුව සහ ලංකා බැංකුව -- ණය දීම සඳහා මේවා පිළි නොගැනීමයි. එම නිසා ස්වර්ණ භූමි ඔප්පුවේ තිබෙන වටිනාකම ගොවිජනතාවට ලබා දීම සඳහා, ගොවි ජනතාවට අවශ්‍ය ණය ලබා ගන්නට කටයුතු සැලැස්වීම සඳහා මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

අවසාන වශයෙන් තව එක් කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ රටේ ගොවි ජනතාව මේ රටට විශාල මෙහෙයක් කළ බව මේ රටේ ඉතිහාසය දෙස බැලුවාම හොඳට පේනවා. මෙවර අයවැය යෝජනාවල දැක්වෙනවා, ගොවි ජනතාවට විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමක් ගැන. මේ සඳහා රුපියල් කෝටි 75ක් වෙන් කර තිබෙනවා. නමුත් මේ වෙන් කර ඇති මුදල් ප්‍රමාණය මදි. එම මුදලෙන් මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන විවේචන විරුද්ධ පක්ෂයෙන් එල්ල වුණා. නමුත් රජය මේ සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන බව අපි කවුරුත් දන්නවා. මේ සමඟම ගොවියන් සඳහා අරමුදලක් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඇති කිරීමට පුළුවන් නම්, එය ඉතා වැදගත් වන බව මගේ අදහසයි. විශේෂයෙන්ම නඩත්තු අරමුදලට අමතරව ගොවි අරමුදලක් ඇති කිරීම වැදගත් වෙනවා. එම නිසා ගොවීන් නඩත්තු අරමුදල සඳහා ගෙවන මුදලින් සියයට පහක් හෝ දහයක් අරගෙන මෙම අරමුදල ආරම්භ කරනවා නම්, එයින් වැඩ දෙක - තුනක් සිද්ධ වෙනවා. එකක් තමයි, ගොවියාගේ අරමුදලට කෙලින්ම මේ මුදලත් යොමු කරන්නට පුළුවන් වීම. එම නිසා තමන්ගේ අනාගතයට බලපාන යම්කිසි කාරණයක් සඳහා මේ මුදල් වැය කරන නිසා, නඩත්තු අරමුදලට කිසිම පැකිලීමක් නැතිව මුදල් ගෙවීමට ඒ අය පෙළඹෙනවා. එම නිසා එවැනි අරමුදලක් ආරම්භ කරනවා නම් එය ගොවියාගේ අනාගත සුභ සිද්ධියට හේතු වෙනවා.

අ. භා. 2.00

ගරු සභාපතිතුමනි, කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කරන විට පෙන්වා දුන් කාරණයක් නැවතත් මතක් කරන්න කැමතියි. දැනට අපේ රටේ ලොතරැයි ක්‍රම රාශියක්ම තිබෙනවා. මේ ආකාරයෙන්, "ගොවි සම්පත" නමින් ලොතරැයියක් ඉඩම් අමාත්‍යාංශය මාර්ගයෙන් ආරම්භ කර එමඟින් ලැබෙන මුදලින් ගොවි අරමුදල තර කර ගැනීමට වැඩ පිළිවෙලක් යොදනවා නම්, ගොවි ජනතාවට එයින් විශාල සෙතක් සැලසෙන බව මතක් කරමින්, මේ රටේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා විශාල වැඩ කොටසක් ඉටු කරන ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, නිලධාරී මහතුන් හැම දෙනාටත් මගේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

කේ. ආනන්ද කුලරත්න මහතා (මුල්කිරිගල)
(திரு. கே. ஆனந்த குலரத்ன — முல்கிரிகல)
(Mr. K. Ananda Kularatne – Mulkirigala)

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මෙම අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුති වන්න වෙනවා.

දුණුගම්වෙහෙර සංවර්ධන ව්‍යාපාරය රුහුණු ජනතාව වෙනුවෙන් අපේ ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපට ලැබී ඇති දායාදයක් හැටියට හඳුන්වන්නට පුළුවනි. ඒ තුළින් මුල්කිරිගල ජනතාවටත් යම්කිසි වාසනාවක් ලැබෙන බව මේ අවස්ථාවේදී මම සඳහන් කරන්නට ඕනෑ. හම්බන්තොට ගරු දිසා ඇමතිතුමා දුණුගම්වෙහෙර ව්‍යාපාරය සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් කරන්නට යෙදුණා. ඒ වාගේම ඉඩම් ලබා දීමේදී එතුමා ප්‍රකාශ කළ පරිදි, අපේ ප්‍රදේශයට ලැබිය යුතු ඉඩම් කට්ටි ප්‍රමාණය ලබා දීමට කටයුතු කරනවා ඇතැයි අප විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දෙඩන්ගොඩ මහතා) නොයෙක් අන්දමින් රජයේ ක්‍රියාමාර්ග විවේචනය කරනවා. නමුත් මෙවැනි සංවර්ධන ව්‍යාපාර ආරම්භ කරන උත්සව අවස්ථාවලට එතුමාටත් සහභාගි වෙන්නට පුළුවන් නම් එතුමා කරන මේ විවේචන බොහෝ දුරට අඩු වන්නට පුළුවනි. රුහුණේ දුණුගම්වෙහෙර ව්‍යාපාරය එතුමාගේ ආසනයටත් සම්බන්ධයි. එම නිසා, එවැනි උත්සවවලට සහභාගි වී එම ව්‍යාපාර දැක බලා ගන්නටා නම් හොඳ බව එතුමාට කැවතත් මතක් කෂ්ණත කැමතියි.

මුල්කිරිගල ආසනයේ, තේක්ක සහ අනිකුත් දැව වගා කර ඇති ඉඩම් සැහෙන ප්‍රමාණයක් තිබෙනවා. තෝරාඩි ආයතනය මඟින් වන වගාව සඳහා විශාල මුදලක් ලබා දී තිබෙනවා. මෙම තේක්ක ගස් හොරුන් විසින් කපා ගෙන යාම නිසා විශාල ලෙස අලාභ හානි සිදු වී තිබෙනවා පමණක් නොවෙයි, එය අපටත් ලොකු කරදරයක් වී තිබෙනවා. පොලිසියටත්, අනිකුත් නිලධාරී මහතුන්ටත් අපහසු වී තිබෙනවා, දැව හොරුන්ගෙන් මෙම තේක්ක වගා වගාවට වන විනාශය වළක්වා ගන්නට. එම නිසා තෝරාඩි ආයතනයෙන් ආධාර වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලබාගෙන කරගෙන යන මේ වන වගාව ආරක්ෂා කර ගැනීමට කිසියම් වැඩ පිළිවෙළක් යකස් කර දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. එමපණක් නොවෙයි, දැනට ඉඩම් තිරවුල් කර දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. තොරාඩි ආයතනයෙන් මේ සඳහාද විශාල මුදලක් ලබා දී තිබෙනවා. දැනට එක් ඉඩම් නිලධාරියෙක් පමණයි විරකැටිය උපදිසාපති කාර්යාලයට අනුයුක්ත කර තිබෙන්නේ. එම නිසා මේ කටයුතු කඩිනම්ව කර ගැනීම සඳහා කටුවන උපදිසාපති කාර්යාලයටත් ඉඩම් නිලධාරී මහත්මයෙක් ලබා දෙන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

1983 වර්ෂයේදී මම ඉල්ලීමක් කළා, වැව්වල තිබෙන සැල්විනියා ඉවත් කර ගැනීමට ආධාර උපකාර කරන්නය කියා. දැන් සැල්විනියා උවදුරට අපේ ප්‍රදේශයේ සැම වැවක්ම වාගේ ගොදුරු වී තිබෙනවා. එමඟින් ගොවීන්ට විශාල අපහසුවක් ඇති වී තිබෙනවා. අපේ ප්‍රදේශයේ තිබෙන උඩුකිරිවිල වැව විශාල වැවක්. මේ මාසෙ 25 වැනිද එම වැවේ සැල්විනියා ඉවත් කර ගැනීම ශ්‍රමදාන පදනමක් මත කිරීමට කටයුතු කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙම වැව්වල සැල්විනියා ඉවත් කර ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට විශාල මුදලක් වැය වෙනවා. මේ කටයුතු කිරීම සඳහා යම්කිසි වැඩපිළිවෙලක් ඇති කරනවා නම් එය අපේ ආසනයට සැහෙනවාය කියා මා හිතනවා.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
Order, please. දැන් කථාව නවත්වන්න.

කේ. ආනන්ද කුලරත්න මහතා
(திரு. கே. ஆனந்த குலரத்ன)
(Mr. K. Ananda Kularatne)

මේ අවස්ථාව මට ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. හා. 2.3

ජ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

ගරු සභාපතිතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට ආණ්ඩු පක්ෂයෙන් විරුද්ධ පාර්ශ්වයෙන් මන්ත්‍රීවරු 15 දෙනෙක් පමණ සහභාගී වී තිබෙනවා. මෙම විවාදය අවස්ථාවේදී විශේෂයෙන්ම විරුද්ධ පාර්ශ්වයෙන්, ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීවරු අපේ අමාත්‍යාංශය මගින් කරන ලද වැඩ සමහර අවස්ථාවලදී ප්‍රසංශාවට ලක් කළ අතර, සමහර අවස්ථාවලදී දෝෂ දර්ශනයට ලක් කළා. සෑම වර්ෂයකට වරක් මෙම අමාත්‍යාංශයේ අයවැය කාරක සභා අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයෙන් ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීතුමන්ලා අපේ අමාත්‍යාංශය පිළිබඳව දක්වන විවේචන සහ යෝජනා පිළිබඳව අපි අවධානය යොමු කර වර්ෂයෙන් වර්ෂය අපි ඒවාට පිළියම් යොදා තිබෙනවා. එම නිසා පසුගිය අවුරුදු හත තුළ මෙම අමාත්‍යාංශය කරන ලද වැඩ පිළිබඳ සංඛ්‍යාලේඛන එකින් එක කියන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

"වාර්ෂික සැලැස්ම 1986" කියන පොතක් අපි සභාගත කර තිබෙනවා. මා හිතන්නේ එය සෑම මන්ත්‍රීවරයෙකුටම ලැබී ඇති. විශේෂයෙන්ම අපේ කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) එම පොත පිළිබඳව ප්‍රශංසා කළා. මොකද, ඉතාමත් පැහැදිලිව සංඛ්‍යාලේඛන එම පොතේ අඩංගු වී තිබෙනවා. පසුගිය අවුරුදු හත තුළ කරන ලද වැඩත්, ඉදිරියේදී කරන්න බලාපොරොත්තුවන වැඩත් පිළිබඳ එම පොතේ අඩංගු වී තිබෙන නිසා ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන එකින් එක මේ සභාවට ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් විවාදයට සහභාගී වූ මන්ත්‍රීතුමන්ලා විවේචනය කළ කරුණු කීහිපයක් ගැන පමණක් මේ අවස්ථාවේදී මගේ අදහස් ප්‍රකාශ කරන්න කැමතියි.

වාරිමාර්ග කටයුතු සඳහා නඩත්තු ගාස්තු අය කිරීම විශේෂයෙන් අක්මීමන ගරු මන්ත්‍රීතුමාත් (රිවඩි පතිරණ මහතා) ඒ වාගේම විරුද්ධ පාර්ශ්වයේ තවත් මන්ත්‍රීවරු රාශියක් විවේචනය කළා. අපි විටින් විට මේ සභාවේදී ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කර තිබෙනවා. විශේෂයෙන්ම දැනට මාසයකට පමණ උඩදී පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කර ගන්නා අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු මේ ගැන විවේචනය කළා. ඒ අවස්ථාවේදී මා මේ බද්ද පිළිබඳව මේ සභාවට පැහැදිලි කර දුන්නා. එපමණක් නොව, අද මේ විවාදය ආරම්භ කරමින් කථා කළ අක්මීමන ගරු මන්ත්‍රීතුමා මෙම බද්ද පිළිබඳව කරුණු දැක්වූ අවස්ථාවේදී මගේ ඇමතිතුමා ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළා. නමුත් මේ සභාවේදී පමණක් නොව, සෑම අවස්ථාවකදීම දේශපාලන වාසි තකා ගෙන ගොවීන්ගෙන් අය කරන නඩත්තු සහ මෙහෙයුම් ගාස්තු පිළිබඳව විවේචන කරනවා. දේශපාලන රැස්වීම්වලදී අපි මේක පැහැදිලිව කියා තිබෙනවා. මේක ජල බද්දක් නොවෙයි. රජයේ මහා භාණ්ඩාගාරයට නොවෙයි මේ මුදල් යන්නේ. ඒ දිස්ත්‍රික්කයේම තිබෙන වාරිමාර්ග, ඇලවල් එහෙම නැත්නම් ගොවීන් පාවිච්චි කරන කුඹුරුවල අවශ්‍යතාවන්, අඩුපාඩුකම් සකස් කිරීම සඳහායි මේ මෙහෙයුම් ගාස්තුව එහෙම නැත්නම් නඩත්තු ගාස්තුව අය කරන්නේ. මේක බද්දක් වශයෙන් නොවෙයි අය කරන්නේ. මම හිතන විධියට අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා මීට පසුව මෙය අයවැය ලේඛනයට ඇතුළත් කරන්නය කියා එතුමාගේ කථාවේදී යෝජනාවක් කළා. අයවැය ලේඛනයට ඇතුළත් කර රටේ සිටින අනෙක් බහුතර ජනතාවගෙනුත් මේකට අය වෙන්න සලස්වන්න යයි කිව්වා. එහෙම කළොත් නගරබද්ධව ජීවත්වන ගොවිතැන් නොකරන ජනතාවගෙන් අපට ප්‍රශ්නයක් එනවාය කියා මම හිතනවා. මේ වාගේ මේ ගොවීන්ගෙන් පමණක් ගාස්තු අය කරන්නේ නැතිව ලබන වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුළත් කර මුළු රටේම ජනතාවගෙන් මේ මුදල් අය කර ගන්නය කියලයි එතුමා යෝජනා කළේ. එය කාලෝචිතයයි කියා මම හිතන්නේ නැහැ.

අපි මේ ගොවීන්ගෙන් නඩත්තු ගාස්තුවක් අය කරන්නේ, ජලයට නොවෙයි. ඒ ප්‍රදේශයේ ගොවීන්ගේම ඇලවේලි සකස් කිරීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමටයි අපි ඒ මුදල් යොදවන්නේ. ඒ මුදල් භාණ්ඩාගාරයට එන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ ඒ කොට්ඨාශයේ දිසාපති ළඟයි ඒ මුදල් තිබෙන්නේ. ඒ එකතු කරන මුදලට සමාන මුදලක් රජයෙනුත් යොදවා—සියයට සියයක් යොදවා—ඒ ප්‍රදේශයේ ඇලවේලි නඩත්තු කරන්නටයි අපි බලාපොරොත්තු වන්නේ. මෙය අපි පුන පුනා කියා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ වාද විවාද ඇති වූ කීප අවස්ථාවක කියා තිබෙනවා. නමුත් මේ විරුද්ධ පාර්ශ්වයෙන් මේක විවේචනය කරනවා. මේ ජල බද්ද අරගෙන ඒක අපි රජයේ වෙන කිසිම වැඩකට යොදවන්නේ නැහැ. ඒ ගොවියන්ගේම ඇලවේලි යකස් කිරීම ආදී වැඩවලටයි ඒ මුදල යොදවන්නේ.

විශේෂයෙන් අපේ ආසනවල ගොවි මහත්වරුන්ගෙන් සියයට 90ක් පමණ මෙය අවබෝධ කරගෙන ඒ මුදල් ගෙවනවා. නමුත් අපි දන්නවා විජය කුමාරණතුංග මහත්මයාගේ පින්තූරත් එක්ක පත්තරවල දමනවා. එයා ගැලවුම්කාරයා වගේ ඇවිදින් උසාවිවලට දඩ මුදල් ගෙවන්නට එපාය කියා ගොවීන් පොළඹවනවා. මැතිවරණ කාලයේදීත් මේක කළා. දැන් විටින් විට සුමානයක් ගානේ විජය කුමාරණතුංග මහතාගේ පින්තූරත් එක්ක පත්තරේ වැටෙනවා. මම දක්කා මේ ළඟදී විජය කුමාරණතුංග මහත්මයා මිනිසුන් පිරිවරාගෙන මහව උසාවියෙන්ද කොහෙද එළියට එන පින්තූරයක් පත්තරේ දමා තිබෙනවා. ඒගොල්ලන්ගේ සහචරයන් විසින් මේ ජනතාව පොළඹවා ගන්නවා. මේ මෙහෙයුම් ගාස්තුව ජල බද්දය කියා පරිවර්තනය කරගෙන අතුරු මැතිවරණවලදී මහියංගනයේ සහ මින්නේරියේ ජනතාවට කිව්වා. නමුත් ඒ ජනතාව පිළිගත්තේ නැහැ. ඒ ප්‍රදේශවල සියයට 99ක් ගොවීන් ඉන්නේ. ඒක පිළිගත්තා නම් අපි මින්නේරියෙන් පරදින්න ඕනෑ. ඒක පිළිගත්තා නම් අපි මහියංගනයෙන් පරදින්න ඕනෑ. අපි මුල්කිරිගල අමතක කර දමමු. නමුත් සියයට 95ක් පමණ ගොවි ජනතාව සිටින මින්නේරියේත්, මහියංගනයේත් මේ රෙකෝඩ් එකම ගැහැව්වා. මේකම කිව්වා. මේ ජලබද්ද ගැන පුන පුනා හැම රැස්වීමකදීම කිව්වා. නමුත් ගොවි ජනතාව පිළිගත්තේ නැහැ. ඒ දෙයම තවත් ඇවිදින් කියනවා. ඔක තමයි විවේචනය කරන්නේ. ඒ නිසා අපි මෙය අය කරන්නේ ජල බද්දක් වශයෙන් නොව මෙහෙයුම් ගාස්තුවක් වශයෙන්ය කියන එක මම අදත්, තැවත වරක් විරුද්ධ පාර්ශ්වයට පැහැදිලිව කියන්නට කැමතියි. මේ පනත් සහ පරිපූරක ඇස්තමේන්තු සම්මත කරන හැම අවස්ථාවකදීම විටින් විට අපි මේක තේරුම් කර මේ ගරු සභාවට කිව්වා. ඒ නිසා අපි මේ මුදල් අය කරන්නේ ඒ වාරිමාර්ග ඇලවේලි ආදිය නඩත්තු කිරීම සඳහායි. සමහර උඳවිය දේශපාලන වාසි ලබා ගැනීමේ පරමාර්ථයෙනුයි මෙය වැඩිහරියක් ප්‍රයෝජනයට ගන්නේ.

ඊළඟට අපේ අමාත්‍යාංශයට අයිති නැති වුණත් වී අළෙවි මණ්ඩලය ගැන හා වී මිල ගැන මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) කිව්වා. ඒ පැත්තේ, රජරට ප්‍රදේශයේ සිදු වෙන්නේ මොකක්ද කියන්නට අද එතුමා දන්නේ නැහැ. මැදවච්චිය ප්‍රදේශයට යන්නේ නැහැ හයේ. කොයිතරම් කාලයකින් මැදවච්චියට ගියේ කැද්ද කියා එතුමා දන්න මේ ගරු සභාවේ සිටිනවා නම් මට අහන්නට පුළුවන්. ඒ පැත්තට යන්නේ නැහැ. ඒ පැත්තට ගියා කාලයක් දන්නේ නැහැ, මෙහේ මේ කොළඹ ඉඳගෙන කථා කරනවා. මැදවච්චියට යන්නේ නැහැ, මැදවච්චියට ගිය කාලය මට අහන්නට තිබුණා එතුමා දැන් මේ ගරු සභාවේ සිටියා නම්. උදය වරුවේ කථා කරලා එතුමා යන්න ගියා. අවසාන වරට මැදවච්චියට ගියේ කවදද කියා මට එතුමාගෙන් අහන්නට පුළුවන්. ඒ පැත්තට යන්නේ නැතිව මෙහේ ඉඳගෙන කථා කරනවා. මොකද ? අපි වී වල සහනික මිල වැඩි කළාට ඒකෙන් කිසිම ප්‍රයෝජනයක් නැතිලු. සහනික මිල වැඩි කළාම වැඩක් නැත්තේ නැහැ. ගොවීන්ගේ ගෙවල්වලට ඇවිදින් රුපියල් සියයට, රුපියල් එකසිය පහට වී අරගෙන යනවා. වී වලට සහනික මිලක් රජයෙන් දී තිබෙනවා. නමුත් පෞද්ගලික වෙළඳුන් ගෙදරටම ඇවිදින් ඊට වඩා වැඩි මිලකට වී ගන්නා නිසා වී අළෙවි මණ්ඩලයට වී දෙන්නේ නැහැ. එතුමා කිව්වේ මොකක්ද ? මැදවච්චියේ අයගේ වී විකුණාගන්න බැරුව ගොඩ ගැහිලා තිබෙනවා කිව්වා. වී තිබෙනවා නම් දැන් වී විකුණාගන්න බැරිකමක් නැහැ. සියයට 99ක් ගොවි ජනතාව සිටින මගේ ආසනයේ මහවැලි ප්‍රදේශය, රාජාංගනය වැනි ප්‍රදේශවල ගෙවල්වලට නොයෙක් නොයෙක් විවිධාකාර පලාත්වලින් ලොරිවලින් ඇවිත් වී ගෙන යනවා. දැන් රුපියල් සියයයි. අර මැදිරිගිරිය මන්ත්‍රීතුමා, පොළොන්නරුව දිසා ඇමතිතුමා කියනවා ඒ ප්‍රදේශයේ රුපියල් 105 යි කියා. එතකොට සහනියක මිලට වී ගත්තේ නැහැ, සහනික මිලෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ කියා එතුමා කියනවා. නමුත් වී අළෙවි මණ්ඩලයට වී නැත්තේ පිට මිල වැඩි නිසයි. අන්න ඒ නිසා එතුමා ඒ වාගේ ප්‍රකාශයක් කිරීම ගැන මම ඉතාමත්ම කණගාටු වෙනවා.

ඊළඟට ස්වර්ණ භූමි ඔප්පු ගැන අක්මීමන ගරු මන්ත්‍රීතුමාත් (රිවඩි පතිරණ මහතා) විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කීපදෙනෙකුත් ප්‍රමාදයක් තිබෙනවා කියා විවේචනය කළා. අපි එය පිළිගන්නවා. අපේ සැලැස්මට අනුව වර්ෂයකට ඔප්පු 50,000ක් පමණ දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි නැත්නැහැ බලයට එනකොට මේ රටේ තිබුණා — මගේ ආසනයේ වුණත් නිදර්ශනයකට තිබුණා — අවුරුදු පහළොව, විස්ස ගුන්ති විත්ද අනවසර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් තමන්ගේ අතින් ඉඩම්වල පොල් ටවාගෙන, පොල්වල ඵලදව හුක්ති විඳිනවා, නමුත් ඒ ඉඩම්වලට ඔප්පු නැහැ. අතවසරයි. අපි ඒ අතවසර ඒවා නීත්‍යානුකූල කර මුල රටපුරා ලක්ෂ ගණනකට ඔප්පු බෙද දුන්නා. තමන් ඒ ඉඩම් අවුරුදු පහළොව, විස්ස වටා ගත්තා. නමුත් කිසිම බලපත්‍රයක් නැහැ. ඒවා නීත්‍යානුකූල කිරීමට මේ වතතාක් තිබුණු කිසිම රජයක් කිසිම දෙයක් කළේ නැහැ. දැන් මේ ප්‍රමාදය ගැන කථා කරනවා. අවුරුදු පහළොව, විස්ස ඒ අතවසරයකින් හුක්ති විඳ ගෙන ආ ඉඩම් නීත්‍යානුකූල කළා පමණක් නොවෙයි නවත් එතැනින් එහාට ගිහින් සිත්නක්කරව ඒ ඉඩම් දිමට ස්වර්ණ හුම් ඔප්පු ලබාදීමටත් අපි ක්‍රියා කළා.

අර තාවකාලික වාර්ෂික බලපත්‍ර දෙනවා වාගේ ඉතා වේගයෙන් ස්වර්ණ හුම් ඔප්පු දෙන්න පුළුවන්කමක් නැහැ. නැවත වරක් මායිම් සකස් කරන්න ඕනෑ, අවසානයේ එයට දිසාපතිගේ අත්සන වලංගු නැහැ. තියම විධියට මායිම් සකස් කර ඒ ඔප්පුවලට ගරු ජනාධිපතිතුමාගේ අත්සන ලබාගැනීම සඳහ ජනාධිපති කාර්‍යාලයට ඉදිරිපත් කරනවා. එතුමාගේ අත්සන සහිතවයි ඒ ඔප්පු ලැබෙන්නේ. එතකොට ඉතා සැලකිය යුතු කාලයක් එයට ගත වෙනවා. අන්න ඒ ප්‍රමාදය ගැනයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් විවේචනය කළේ. මීට ඉස්සෙල්ලා — හැන්තැහතට ඉස්සෙල්ලා — ඔය ප්‍රමාදය ගැන විවේචනය කළ අයගේ ආණ්ඩු තිබුණා. අර මුළු රට පුරාම අවුරුදු පහළොව, විස්ස අතවසරයෙන් හුක්ති විඳ ගෙන ආ ඉඩම් — නමත්ගේ අතින් පොල් හදගෙන හුක්ති විඳගෙන ආ ඉඩම් — හදගෙන සිටි අයට ඔප්පු ලබා දෙන්න ඒ ආණ්ඩුව ක්‍රියා කළේ නැහැ. නමුත් අපි කළා. ඒ අතවසර ඒවා නීත්‍යානුකූල කළා පමණක් නොවෙයි, ඊට එහාට ගොස් ස්වර්ණ හුම් ඔප්පු ලබාදීමටත් ක්‍රියා කළා. ඒ ප්‍රමාදය ගැන දැන් විවේචනය කරනවා. ඔන්න ඔකයි තත්ත්වය. ඒ නිසා ඒගොල්ලෝ ඒවා අමතක කරන්න හොඳ නැහැ.

මෙහෙයුම් ගාස්තු ගැන කථා කරනවා. පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයෙන් ඉඩම් විකිණීමේ පනතක් සම්මත කරගෙන රුපියල් විසිපන්දහයි, තිස්දහයි, හතලිස්දහයි කියා ඉඩම් තක්සේරු කර ඒ මුදල් ගෙවිටොත් පමණක් ඔප්පු ලබාදෙන්නේ කියා ජනපදවල ඉන්න ඔක්කෝටම ලියුම් යැව්වා. මම හිතන්නේ, මින්තේරිය ජනපදවල අයටත් ඒවා ගියා. අපි බලයට ආවාට පසුව එය අහෝසි කළා. ඒ අය උත්සව පවත්වා ඒවා කිව්වා. ඒ ආ ලියුම් අපේ ජනපදවල ගොවි මහත්වරුන් ළඟ තිබෙනවා. දිසාපති තක්සේරු කරනවා තිස්පන්දහයි, හතලිස්දහයි, පනස්දහයි කියා. නමුත් ඒ යතායක්වත් නැතිව රුපියල් දෙසිය පනහක් අරගෙන — එයත් මැනුම් ගාස්තුවක් වශයෙනුයි ගන්නේ — අපි සිත්නක්කර ඔප්පුවක් ලබා දෙනවා. එහි වටිනාකම තේරෙන්නේ නැහැ. නමුත් දැන් විවේචනය කරනවා. එද ඒ ඉඩම් තක්සේරු කර තිස්, හතලිස් දහක් ඒ ඔප්පුවලට අය කළා. දැනටත් ඒ ලියුම් තිබෙනවා. අපි විරුද්ධ පක්ෂයේ ඉන්න කොට එය සම්මත කළේ. නමුත් අපි බලයට ආ ගමන් ඒ පනත අහෝසි කර මිනුම් ගාස්තු පමණක් අරගෙන ඔප්පු ලබාදෙන්න ක්‍රියා කළා. නමුත් දැන් මේ නඩත්තු ගාස්තුවක් විවේචනය කරනවා. ඒ ඔක්කොම අතීතය අමතක කරලයි කථා කරන්නේ.

අ. හා. 2.15

එතකොට මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කිව්වා දේශපාලන පක්ෂවලට ඉඩම් බෙදනවා කියා. මම දන්නා තරමින් නැහැ. මගේ ආසනයේ දහස් ගණනකට මහවැලි ඉඩම් විතරක් නොවෙයි, තොයෙක් ව්‍යාපාර යටතේ ඉඩම් බෙද දුන්නේ — දැන් ගිය සුමානයේත් රාජාංගනයේ ඉඩම් දුන්නා — යූ. එන්. පී කාරයින්ට විතරක් ගොවෙයි. ඒ චෝදනාව මහ අමූලික බොරුවක්. එතුමා කිව්වා දේශපාලන පක්ෂ භේදයෙන් තොරව ඉඩම් බෙදන්න කියලා. අපි කවදාවත් මැදිහත් වෙන්නේ නැහැ, දේශපාලන වශයෙන් ඉඩම් බෙද දෙන්න. මන්ත්‍රීවරුන් වශයෙන් අපි මැදිහත් වෙන්නේ නැහැ, නිලධාරීන් ඒ කටයුතු කරන්නේ. ඒවාට ඩී.එල්.ඕලා ඉන්නවා. දිසාපති ඉඩම් කච්චේරි පවත්වා තෝරන්නේ. ඉඩම් දෙන්න අපි ඒ ගොල්ලන්ගේ පාට බලන්නේ නැහැ. දේශපාලන පක්ෂය බලන්නේ නැහැ. ඒක සම්පූර්ණ අසාධාරණයක්.

කලාවැව ආසනයේ දැන් මහවැලි ඉඩම් ලබා දී තිබෙනවා. රාජාංගනයේ මේ ළඟදීත් ගිය සුමානයේ ඉඩම් දුන්නා. අපි දේශපාලන පක්ෂ බලන්නේ නැහැ. අපි දේශපාලන පාට බලන්නේ නැහැ. ඒ අය කොයි පක්ෂයේද කියා අපි බලන්නේ නැහැ.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

දුන්නට පස්සේ ඒ ගොල්ලො පක්ෂයට එනවා.

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

ඔව්. ඒක තමයි. දුන්නාට පස්සේ පක්ෂයට එනවා. නැත්නම් අපි කවදාවත් පක්ෂය බලන්නේ නැහැ. සම්පූර්ණ අහුත චෝදනාවක් මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කළේ. අපි කවදාවත් දේශපාලන පක්ෂය බලා ඉඩම් බෙද දී නැහැ. මේ වෙනකල්. නමුත් ඒ පැත්තේ අයට ඉඩම් දුන්නාට පස්සේ — අපි මැදිහත් නොවී සාධාරණව අපක්ෂපාතීව ඉඩම් දුන්නාට පස්සේ — ඒ අයත් යූ. එන්. පී. එකට එනවා. ඒකයි, ඒ ගොල්ලන්ට තිබෙන හිතේ අමාරුව.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

අද වැඩිය ඉන්නේ යූ. එන්. පී ද, ශ්‍රී ලංකාද කියා බලන්න ජන්දයක් තිබ්බෙ නැහැනේ ?

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

ඔව්. ජන්දෙ තිබ්බා. තමුන්නාන්සේලා හැමදම ජන්දෙ ඉල්ලනවා. කෝ, ජන්දෙ තිබ්බාම පැරදුනානේ. [බාධා කිරීම්]

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

අපි දන්නවා මුල්කිරිගල කොහොමද තිබ්බෙ කියා. ජන්ද පෙට්ටිවල එබුව ගිහිල්ලා.

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

පැය 24ත් ද්‍රවිඩ ප්‍රශ්නය විසඳන්න ජන්දය ඉල්ලන්නෙ. නේද ? 1971දී තමුන්නාන්සේලාට කරදර වෙනකොට, ඒ වෙලාවේ අපි ඉල්ලුවේ නැහැ ජන්දයක්. ලැජ්ජා නැතිව ඉල්ලන්නේ මහ මැතිවරණයක්. මේ ඔක්කොම දෙමළ ප්‍රශ්නය විසඳන්න මහ මැතිවරණයක් ඉල්ලන්නෙ. මහ මැතිවරණයෙන් පුළුවන්ද ඒක විසඳන්න.

වීරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

මහ මැතිවරණයක් ඉල්ලුවාට මහ මැතිවරණයෙන් දිනන්න පුළුවන්ද ? මහ මැතිවරණයක් ඉල්ලනවා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

තිබ්බෙ නැත්තෙ ?

ඒ. එම්. එස්. අධිකාරී මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

ඇයි තමුන්නාන්සේලාගේ මැදවච්චිය ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) අපේ වේදිකාවෙ නැගලා කථා කළේ, අපට තව අවුරුදු හයක් කල් දෙන්න කියා එතුමා කතා කරල තිව්වා. ඒක අමතක වෙලාද කතා කරන්නේ ? [බාධා කිරීම්]

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම ඉල්ලුවේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

එයා වේදිකාවට ගියා. වේදිකාවේ නැගලා කතා කළා.

විරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

මුල්කිරිගල මැතිවරණ ප්‍රතිඵල ගැන කතා කරනවා, තමුත්තාත්සේ දිනුවේ අටසිය ගණනින්. මුල්කිරිගල මන්ත්‍රීතුමා ජන්ද 1,500කින් දිනුවේ. [බාධා කිරීම්]

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම ඊට වඩා වැඩි ගණනින් දිනුවේ. අටසියෙන් හරි දෙසියෙන් හරි මම දිනුවා. තමුත්තාත්සේලා කරන්න තියෙන ඔක්කොම දේවල් කළා.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

මහියංගනය ආසනය තියෝජනය කළ අපේ කම්කරු ඇමතිතුමා තැති වුනා. අපට ඒ සඳහා කෙතෙනක් පත් කරන්න ඉඩ තිබුණා. අපි පත් කළේ නැහැ. තමුත්තාත්සේලාට අපි කිව්වා තරඟ කරන්න එන්න කියා. එහෙම නැතිව අපට තිකම් පත් කරන්න තිබුණාතේ.

විරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

දෙන්නා තුන් දෙනා ඉල්ලනවා, මැතිවරණ කොට්ඨාශයකින්. [බාධා කිරීම්]

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ප්‍රාදේශීය සංවර්ධන ජන්දය ජූනි මාසේ තියනවාද ? එතකත් ඉන්නකෝ කතා කරන්නේ නැතිව.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

කෝ ඉතින් තියෙන ඒවා ඔක්කොම පරදිනවා නේ. ජල බද්ද ගැන කියනවා. රටේ තැති ඔක්කොම කියනවා. තමුත් ජන්දේ තිබ්බාම පරදිනවා. [බාධා කිරීම්]

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

තමුත්තාත්සේට මගේ පෞද්ගලික ගෞරවය තිබෙනවා. තමුත් මම දැන් කියනවා, සංවර්ධන සහ ජන්දය ලබන අවුරුද්දේ කියනවා. තමුත්තාත්සේලා එන්නේ නැහැ, තරඟයට බය නිසා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

අපි ? මම අද කියන්නම් තමුන්නාන්සේලාට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් හැම ආසනයක්ම තරඟ කරනවා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

අපි ලැස්තියි තමුන්නාන්සේලා බාර ගන්න.

විරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

සමහර සංවර්ධන සහා මන්ත්‍රීවරු රැස්වීම්වලට තවම එන්නේ නැහැ. තමුන්නාත්සේලාගේ පක්ෂයේ ප්‍රතිපත්තියක් නැහැ.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

තමුන්නාන්සේලාගේ සමහර මන්ත්‍රීවරු ආසනවලට යන්නෙ නැහැ.

විරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

ආසනයට යන්නෙ නැති එක බලන්න පුලුවන් මැතිවරණයේදී. [බාධා කිරීම්]

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

සමහර මන්ත්‍රීවරු ගුටි කාල තිබෙනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

අවුරුදු පහකට ඔයේ නැහැ, තුවරඑළියේ.

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)

මම තවත් දුරට කෑගා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි 2.45ට නවත්වන්න ඕන. ඇමතිතුමාට කතා කිරීමට පැය බාගයක් ඕනෑය කිව්වා. එමනිසා මම මේ විවාදයට සහභාගි වූ ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පක්ෂයේත් සැම මන්ත්‍රීවරයෙකුටම ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගාමිණී දිසානායක මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධන ඇමතිතුමා)
(திரு. காமினீ திஸாநாயக்க — காணி, காணி அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி அமைச்சரும்)
(Mr. Gamini Dissanayake – Minister of Lands & Land Development and Minister of Mahaweli Development)

ගරු සභාපතිතුමනි, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු සහ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සැගෙන සංඛ්‍යාවක් අදහස් ප්‍රකාශ කළා. ඒ හැම අදහසක් ගැනම ඉදිරිපත් කළ කරුණු විග්‍රහ කර, ජනවාරි මාසයේම, මම පෞද්ගලිකව පිළිතුරු යවන්නට බලාපොරොත්තු වෙනවා.

නමුත් ඒ ප්‍රකාශ වූ අදහස් පොදු වශයෙන් කල්පනාවට හාජනය කොට, අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මම කැමතියි. මන්ද බොහෝ මන්ත්‍රීවරු එකම දේ ගැන වරින්වර කතා කරපු නිසා. උදාහරණයක් හැටියට, වාරිමාර්ග නඩත්තු මුදල් සම්බන්ධයෙන් අක්මීමන ගරු මන්ත්‍රීතුමාත් (රිවඩ් පතිරණ මහතා) බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (අමරසිරි දොඩන්ගොඩ මහතා), අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා), මහරගම ගරු මන්ත්‍රීතුමාත්, (දිනේෂ් ගුණවර්ධන මහතා), මැදවච්චිය ගරු මන්ත්‍රීතුමාත් (මෛත්‍රීපාල සේනානායක මහතා), එකම අදහස් ප්‍රකාශ කළා. එමනිසා වෙන් වෙන්ව ඒ අදහස් විග්‍රහ කරන්නේ නැතිව, මම උත්සාහ කරනවා, පොදු වශයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට.

මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මහතා ඉදිරිපත් කළ අභියෝගය ගැන, එතුම් ලබන අවුරුද්දේ සංවර්ධන සහා මැතිවරණ තරඟ කරනවාය, තරඟ කරන්නේ නැත, එවැනි අදහස් ගැන මම කියිම අදහසක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මක්නිසාද, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට ඒ කරුණු අනවශ්‍ය නිසා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක කරුණක් මේ සාකච්ඡාවේදී මතු වුණා. විශේෂයෙන් මතුගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී රටේ පොදු සම්පත්, එනම් ඉඩම්, මහා පොළව, වන රක්ෂණය ආදිය දේශපාලනයට යොමු කරගෙන නොව දේශපාලනයට ඉහළ මට්ටමකින් කල්පනා කොට විග්‍රහ කොට ශාස්ත්‍රානුකූලව විසඳිය යුතුය කියන අදහස මතුවුණා. මේ අදහස ගැඹුරු විධියට හැම මන්ත්‍රීවරයෙකුගේම කථාවේදී ප්‍රකාශ වුණා.

මට මතකයි එක් අවස්ථාවක හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු කොබ්බෑකඩුව ඇමතිතුමා—අනුගමනය කළ ප්‍රතිපත්ති මම එදා පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ ඉඳගෙන හූඟක් දුරට විවේචනය කළා. විශේෂයෙන් ප්‍රතිපත්තිවලට වඩා ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ අන්දම ගැන. නමුත් ආණ්ඩුවේ මන්ත්‍රීවරයකුගේම කථාවකට පිළිතුරු දෙමින් එතුමා කිව්වා ඉංග්‍රීසි භාෂාවෙන් මෙන්න මෙහෙම :

"There are no UNP agricultural policies; there are no SLFP agricultural policies; there are no LSSP agricultural policies. There is only one type of policy which I respect, that is, scientific agricultural policy."

දැන් අපේ රට ගැන කල්පනා කර බලනවිට, ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කලයේ සිට ඩඩ්ලි සේනානායක මැතිතුමා, සී. පී. ද සිල්වා මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා යන ඒ හැම ඇමතිවරයෙක්ම ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය පාලනය කිරීමේදී මට පේනවා සියයට 80ක් පමණ විද්‍යාත්මක ප්‍රතිපත්ති අනුගමනය කර තිබෙන බව. මම හිතන්නේ ඒ අමාත්‍යාංශවල සේවය කළාවූත් දැනට සේවය කරන්නාවූත් හැම සේවකයකු ගැනම ප්‍රශංසනීය අන්දමට අද අපට ඒ කරුණ තිසා සතුටු වෙන්න පුළුවනි. අනාගතයේදීත් අපි මේ අංශය සම්බන්ධව එවැනි මානසික ආකල්පයක් ඇති කරගත යුතුයි. අන්න ඒ පද්ධතිය උඩ මම කියන්න කැමතියි මේ විරුද්ධ පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට මේ විධියේ බොළඳ කථා කරන්න එපාය කියලා.

අද බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (අමරසිරි දෙඩන්ගොඩ මහතා) මහරගම ගරු මන්ත්‍රීතුමාත් (දිනේෂ් ගුණවර්ධන මහතා) මොනවද කිව්වේ ? මහරගම ගරු මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන සිටියාම මට පුදුම හිතුණා, මෙයා කොහෙන්ද මේ විශ්ව විද්‍යාල උපාධිය ලබාගත්තෙ කියා. විස්කන්සින් විශ්ව විද්‍යාලය කියා කිව්වා. ඒ මන්ත්‍රී දෙපළම උත්සාහ කළා ජාත්‍යන්තර වාරිමාර්ග පර්යේෂණ ආයතනය —International Irrigation Management Institute—විවේචනයට ලක් කරන්න. මට මතකයි, පසුගිය අයවැය ලේඛනය සම්මත කරන දිනයේම මේ පාර්ලිමේන්තුවේදී විවාදයක් නැතිව එය ඒකච්ඡන්දයෙන් සම්මත වුණු බව.

එතුමා Ford Foundation එක ගැන කථා කළා. මොකක්ද Ford Foundation එක කියන්නෙ ? Ford Foundation කියන්නේ Ford මෝටර් සමාගමද ? Ford Foundation කියන්නේ බහු ජාතික ආයතනයක්ද ? ඇයි Ford Foundation එක ගැන පමණක් එතුමා සඳහන්කෙළේ ? මේ ජාත්‍යන්තර වාරිමාර්ග පර්යේෂණ මධ්‍යස්ථානයට ලෝක බැංකුවෙන් උදව් ලැබෙනවා. ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ලැබෙනවා. "International Association for Food and Agriculture" කියන ආයතනයෙන්—IFAD කියන ආයතනයෙන්—ආධාර මුදල් ලැබෙනවා. ප්‍රංශයෙන්, යුරෝපීය රටවලින් ඒකට අධාර ලැබෙනවා. මේ වාරිමාර්ග පර්යේෂණ ඒකකය තමයි, ලංකාවේ තිබෙන එකම ජාත්‍යන්තර සංවිධානය. ලංකාවේ ඒ පිළිබඳ වෙන එකම ජාත්‍යන්තර ආයතනයක් නැහැ. මේ මධ්‍යස්ථානය තමාගේ රටට ගෙන්වා ගන්නට ඉන්දියාවත් උත්සාහ කළා. පකිස්තානයත් උත්සාහ කළා.

මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කියනවා ඉන්දියාව ගැන කථා කරන්න එපාලු. ඉන්දියාවට මේක ගැන කිසිම බලයක් නැතිලු. ඒකෙ බලය තිබෙනවාද නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. ජාත්‍යන්තර විශේෂඥයින්ගෙන් සමන්විත ජාත්‍යන්තර දානුම අපට සම්පා කර ගත් පුළුවන් පර්යේෂණ මධ්‍යස්ථානයක වටිනාකම ඒ මන්ත්‍රීවරුන් දෙපොල අගය කරනවාද නැද්ද කියන එකයි, ප්‍රශ්නය. දැන් ඒ අදහස් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීවරුන් දෙන්නගෙන් එක් කෙනෙක් මෙතැන ඉන්නවා. මම එතුමාගෙන් අහන්න කැමතියි, අපේ රට අද වාරිමාර්ග දියුණුවෙන් උපරිම තත්ත්වයට පත්වී තිබෙනවාද කියා. තමුන්නාන්සේ ඒ ගැන කල්පනා කර බලන්න. වාලුකා කාන්තාරය අද ක්ෂේම භූමියක් බවට පරිවර්තනය කරගෙන යනවා. මුහුදු වතුර කෘෂිකර්මයට පාවිච්චි කරන්න පුළුවන් වතුර හැටියට පරිවර්තනය කරනවා. Desalination ඒ වතුර සැතැප්ම ගණන් තල පයිප්පවලින් අරගෙන ගොස් කාන්තාරයේ ගොවිතැන් කරනවා. හිතන්වත් බැරි විධියට ඒ කටයුතු කෙරෙනවා, " Sprinkler irrigation " ක්‍රමය අනුව " Sprinkler irrigation " ක්‍රමය කියන්නේ ඉතාම දියුණු වාරිමාර්ග ක්‍රමයක්. අද ලෝකයේ තොයෙකුත් රටවල එය පාවිච්චි කරනවා.

ඉන්දියාව, පාකිස්තානය යන දෙරටම කෘෂිකර්මයෙන් අති විශාල සංවර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාරිමාර්ග දියුණුව නිසයි. නමුත් ලංකාව වාරිමාර්ග දියුණුවේ, කෘෂිකර්ම දියුණුවේ අතරමං වුණා. අර අදහස් පල කළ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනා හිටපු දේශපාලන පක්ෂ මේ රට පාලනය කරන විට කෘෂිකර්මයේ දියුණුව කෙසේ වෙතත් කමතේ සිට ගෙදරට වී ටික අරගෙන යාමත් තහනම් කළා. පාර හරහට හාල් පොලු දැම්මා. අද පෙළොක්රැව දිසා ඇමතිතුමා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා. 1970 - 77 කාලයේදී හදපු වැවක නමක් කියන්න පුළුවන්ද කියා එතුමා විරුද්ධ පාර්ශ්වයෙන් ප්‍රශ්න කළා. පුළුවන් නම් නැගිටල එක වැවක නමක් කියන්නයි කියා එතුමා කිව්වා. කපාපු ඇලක් හරි හදපු වැවක් හරි තිබෙනවා නම් කියන්න.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

වලවල් නම් කැපුවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

උඩවලවේ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

උඩවලවේ ? කොයි කාලයේදද ? තමුන්නාන්සේලාගේ පප්පගෙ කාලයේදි වෙන් ඇති. එගෙම බලන විට තමුන්නාන්සේලාගේ වාර්තාව බංකොලොත්. ඉන්දියාවට, පකිස්තානයට අත්පත් කර ගන්න පුළුවන් වුණ කෘෂිකර්ම දියුණුව. වාරිමාර්ග දියුණුව ලංකාවට අත්පත් කර ගන්න බැරි වුණා නම් බැරි වුණේ අවුරුදු 20 ක් මේ රට පාලනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාලයක්හි ආණ්ඩුව තිසා බව මම කනගාටුවෙන් මතක් කරන්න කැමතියි.

ආනන්ද දස්නායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එය ඉල්ලා අස් කර ගන්න.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

සඳුදටයි අහගරුවාදටයි අල බතල කන්න කිව්වා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

ඉල්ලා අස් කරගත්තෙ මොකටද ?

ආනන්ද දස්නායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඔය අවුරුදු 20 ඇතුළත එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු දෙකක් තිබුණා. එහෙම නම් ඒ සම්බන්ධයෙන් ඒ ආණ්ඩු දෙකමත් වගකියන්න ඕනෑ.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)

අවුරුදු 20 ක් තුළ තමුන්නාන්සේලාගේ කෘෂිකර්ම ප්‍රගතිය කොයි තරම්ද කිව්වොත් මේ පාර්ලිමේන්තුවේ ආපන ශාලාවේ සඳුදට මංඟඤාක්කා, අහගරුවාදට බතල, බදාදට කිරිඅල, ඒක තමයි, තමුන්නාන්සේලා අත්පත්කර ගත් දියුණුව. මේ රටේ හැම දෙමව්පියන්ටම තමුන්නාන්සේලා නියම කලා [බාධාකිරීම්].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒක තමයි, සාමාන්‍ය මිනිසුන්ගෙ කැම.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
සාමාන්‍ය මිනිසුන් තමුන්නාන්සේලා දන්න කැම ඒ තරම් අගය කළ නිසා තමයි, තමුන්නාන්සේලා අටට බැස්සුවේ. ඒවා ජනතාවට තවම මතක තිබෙන නිසා තමයි හැම අතුරු මැතිවරණයෙන්ම ජනතාව තමුන්නාන්සේලාට හොඳ පිළිතුරු දෙන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
අටට බැස්සුවේ ඇට අටක් දෙනවාය කියා පොරොන්දු වුණු නිසා. පොරොන්දුවල වැරැද්ද. බොරු පොරොන්දු දුන්නා. [බාධා කිරීම්]

ඒ. එම්. එස්. අධිකාරි මහතා
(திரு. ஏ. எம். எஸ். அதிகாரி)
(Mr. A. M. S. Adikari)
ඇට අටක් ඕනෑ නැහැ. මාකව් එකේ ඇට ඕනෑ තරම් තියෙනවා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
තමුන්නාන්සේලාගේ තත්ත්වය ඔය තරම් හොඳ නම් ඇයි පාර්ලිමේන්තු ජන්දය කල් දන්නේ. [බාධා කිරීම්]

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ගරු සභාපතිතුමනි, මේක ජාත්‍යන්තර වාරිමාර්ග පරයේෂණ මධ්‍යස්ථානයක්. මෙය ලංකාව විදේශිකයන්ට පාවා දෙන්න යනවාය කියනවා. මම එක ප්‍රශ්නයක් අහන්න කැමතියි. තමුන්නාන්සෙලාගේ නායකයොත් සහභාගි වුණු ආණ්ඩු තිබුණා. ලෝක බැංකුවෙන් සල්ලි ණයට ගත්තා. ආසියානු සංවර්ධන බැංකුවෙන් මුදල් ලබා ගත්තා. එක්සත් ජනපදයෙන් මුදල් ලබා ගත්තා. මේ මධ්‍යස්ථානය පාලනය කිරීමටත් අපට උදවු දෙන්නේ එනි ආයතනමයි. අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඒ පාලන මණ්ඩලයේ සාමාජිකයෙක්. ඒකට ඉංජිනේරුවරුන් තෝරා ගන්නේ ලෝකයේ හැම තැනින්ම ඉල්ලුම්පත් කැඳවලා. ඉතාම දියුණු, ඉතාම දක්ෂ අත්දමේ වාරිමාර්ග ක්‍රම අපේ රටට පමණක් නොව මුළු ආසියාකරයටම, මුළු ලෝකයටම ගැළපෙන අන්දමේ වාරිමාර්ග ක්‍රම පිළිබඳ ප්‍රශ්නවලට සුදුසු විසඳුම් සෙවීමටයි අපි මේ මධ්‍යස්ථානය ඇති කළේ.

වාරිමාර්ග යනු විද්‍යාත්මක දෙයක්. ඇළක් කැපීම පමණක් නොවෙයි. වතුර පාලනය අමාරු කර්තව්‍යයක්. මොකද ? එය ස්වභාව ධර්මය වෙනස් කිරීමක් නිසා. ඒ කරුණු අවබෝධ කරගෙන මෙවැනි මධ්‍යස්ථානයක වටිකාකම අපි වටහා ගත් නිසායි ආසියානු රටවල් මෙය ලබා ගැනීමට උත්සාහ කරද්දීමේ මධ්‍යස්ථානය ලංකාවේ ඇති කිරීමට අපි අවසර දුන්නේ.

ඒ ගිවිසුම සභාගත කරන ලෙස මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ ගුණවර්ධන මහතා) ඉල්ලීමක් කළා. මා කොහෝ සතුටුයි එය සභාගත කරන්න. ඒකේ ගංගන්න දෙයක් නැහැ. ඒකේ රහසක් නැහැ. සභාගත කරන්නත් පෙර ඒකේ පිටපතක් එතුමාට යවන්න මම බලාපොරොත්තු වෙනවා. වෙලාව තිබෙනවා නම් බද්දේගම මන්ත්‍රීතුමාත් (අමරසිරි දෙඩන්ගොඩ මහතා) එය කියවා බලන්න.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
මේ පනතේ මේ විධියට පදහන් වෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
කියවන්න බලන්න.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
වාරිමාර්ගවල නිර්මාණය, ක්‍රියාකාරිත්වය, ජලය ගලා යෑම සහ බෙදා හැරීම විධිමත් කිරීම ජලය සඳහා මිල කියම කිරීම . . . .

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
මිල කියම කිරීමේ බලයක් ඒ ගොල්ලන්ට නැහැ.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
මේ වගන්ති අනුව ඒ ගොල්ලන්ට ඒ බලය තිබෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
ඔක පර්යේෂණ මධ්‍යස්ථානයක්. විධායක මධ්‍යස්ථානයක් නොවෙයි. ඔකට විධායක බලතල කිසිම දෙයක් නැහැ.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඒක ඒ ගොල්ලන්ගේ කාර්ය සහ කර්තව්‍යය හැටියට මෙහි දමා තිබෙනවා.

ගාමිණී දිසානායක මහතා
(திரு. காமினீ திஸாநாயக்க)
(Mr. Gamini Dissanayake)
විධායක බලතල ඔකට නැහැ නේ. ඔක පර්යේෂණ මධ්‍යස්ථානයක්. තමුන්නාන්සේ එය වටහා ගත්ත ඕනෑ. ඒ වාගේ මධ්‍යස්ථානයක් අපි ලංකාවේ ඇති කළා. ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් වශයෙන් තිබෙන එකම සංවිධානය මෙයයි. වාරිමාර්ග පර්යේෂණ සඳහා හොයා ගත යුතු රටක් තිබෙනවා නම් ඒ රටත් අපේ ලංකාවමයි. මක්නිසාද ? අවුරුදු දෙදහස් පන්සියයකට පෙරත් වාරිමාර්ග ව්‍යාපෘති මේ රටේ තිබුණු නිසා; 1930 ගණන්වල සිටම, මහාමාත්‍ය ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේ සිටම ලංකාවේ අතිවිශාල වාරි සංවර්ධනයක් ඇති වී තිබෙන නිසා ; වර්තමාන තත්ත්වය ගැන කල්පනා කරන විට අග්නිදිග ආසියාවේ විශාලතම වාරිමාර්ග ක්‍රම මේ වත්මන් යුගයේ මේ රටේ බිහිවන නිසා. මහවැලි, ලුණුගම්වෙහෙර, නිල්වලා, ගිංගඟ, ඉහිනිම්විය, කිරමඔය සහ වෙනත් මධ්‍යම පරිමාණ හා ඉහළ පරිමාණයේ වාරි ව්‍යාපෘති වැවී, ඇළ දෙළවල් තුන් දහස් පන්සියයකට අධික සංඛ්‍යාවක් ගිය අවුරුදු හත තුළ ඉදිකරන්න අපට පුළුවන් වුණා. ඒ නිසා ඒ ගැන කිසිම සැකයක් තබා ගන්න අවශ්‍ය නැහැ. තමුන් කියන්න දෙයක් තැතිව ඒ වගේ තර්ක ඉදිරිපත් කිරීම දැන් මේ ගරු සභාවේ පුරුද්දක් වී තිබෙන බව කණගාටුවෙන් වුණත් මතක් කරන්න සිදු වී තිබෙනවා.

අභියෝගය එය නොවෙයි. ඒවා ප්‍රශ්නත් නොවෙයි. පොළොන්නරුවේ දිසා ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි ජනගහණ ව්‍යාප්තිය ගැන කල්පනා කර බලන්න. එද පොළොන්නරුවේ සිට ජනගහණය 5,000ක් පමණයි එතුමා පෙන්වා දුන්නා. නමුත් අද ජනගහණය ලක්ෂ 3 යි. 1948 මේ රටේ ජනගහණය දශ ලක්ෂ 6 යි. අද එය මිලියන 15.9 යි. ඒ කියන්නේ දශලක්ෂ 16කට ආසන්නයි. මේ අයගේ ජීවත රටාව මොකක්ද ? මේ අයගේ ජීවනෝපාය මොකක්ද ? නිදහස් වෙළෙඳ කලාපයක් විවෘත කොට එතැන රැකියා සපයන්නත් එපාලු. ඒකයි, විරුද්ධ පාර්ශ්වයේ අනෙක් තර්කය. එහෙම නම් මේ අයට කියන්නේ ගස් උඩ නැගලා ඉන්න කියාද ? මේ විශාල උගත් තරුණ පරම්පරාවේ ජීවනෝපාය විය යුත්තේ මොකක්ද ? ඒ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය දෙන විසඳුම මොකක්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෘෂිකර්මය සහ ස්වභාවික සම්පත් — මහ පොළොව, ජලය — පාලනය කිරීමෙන් මේ ඔක්කෝටම රැකියා සපයන්න බැහැ. නමුත් පොළොව හා ජලය යන දෙකත්, මනුෂ්‍යයාත් අතර හරියාකාර සම්බන්ධයක් ඇති කිරීමෙන් මේ ප්‍රශ්නයට සෑහෙන විසඳුමක් දෙන්න අපට පුළුවනි. ඒ ගැන මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මහතා) සඳහන් කිරීම ගැන මම සන්තෝෂ වෙනවා. එතුමාගෙන් හැර විරුද්ධ පාර්ශ්වයේ වෙනත් කිසි මන්ත්‍රීවරයකුගෙන් ඒ ගැන ප්‍රකාශ වුණේ නැහැ. නමුත් මේ නඩත්තු බද්ද ගැන නම් ඒ අය කෑ ගැහුවා, හරියට ඒ අයට හෙට බලයට ඇවිත් ඒක අහෝසි කරනවා වාගේ. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) 'Land Bettement Tax' එක ගැන මතක් කළා. අපි දන්නවා, ඒ ඉතිහාසය. තමන් 1970 මහා මැතිවරණයෙන් බලයට ආවොත් ජල බද්ද අහෝසි කරනවායයි එතුමන්ලා එදා කිව්වා. නමුත් බලයට ඇවිත් මොකක්ද කළේ කියා අපි දන්නවා.

ඒ අය බලයට ඇවිත් අවුරුදු දෙකක් අපතේ යැව්වා. ඒ අයගේ ආණ්ඩුවට ලෝක බැංකුව කීවේ මොකක්ද ? "අපි ඔය කියන දේවලට ලෑස්ති නැහැ, අපිත් එක්ක එකඟ වුණු විධියට වැඩ කරනවා නම් මහවැලි ව්‍යාපාරය ක්‍රියාත්මක කරමු. එහෙම නැත්නම් නිකම් ඉඳිමු" කියායි. ඊළඟට පසුගිය ආණ්ඩුව ඉඩම් ප්‍රවර්ධන බද්ද කියා ජල බද්දේ නම වෙනස් කොට ජල බද්දටත් වැඩිය මුදලක් අය කළා. ඒකයි, ඒ අයගේ ගිවිසුම. හැම දෙනාගෙන්ම ඒ බද්ද අය කළා. එතුමන්ලා වචනත් එක්ක සෙල්ලම් කරන්න හදනවා නම් උසාවි ගිහින් පුරුදු අපටත් සෑහෙන සෙල්ලම් කරන්න පුළුවන් බව මතක් කරන්න කැමැතියි. නමුත් අපි වචනවල ජීවත් වෙලා වැඩක් නැහැ. අදහස්වල ජීවත් වෙලත් වැඩක් නැහැ. වචනයයි, අදහසයි අවසාන වන විට අපි ක්‍රියාවට බහින්න ඕනෑ.

අපේ ජනාධිපතිතුමා ලෝක බැංකු සභාපතිවරයකුගෙන් ඇහූ දෙයක් මම කියන්නම්. "මේ අවුරුදු හය—හතේ කාලය තුළ මහවැලි ව්‍යාපාරය සහ වෙනත් ව්‍යාපාර කරන්නේ කෙසේද කියා ලස්සනට වාර්තාවක් යකස් කොට, "මෙන්න මම කළ වැඩය බොහොම ලස්සන වාර්තාවක් හැදුවා කියා ජනතාවට කියන්නද, මට කියන්නේ ?" කියා එතුමා ඇහුවා.

He asked, "Do you want the elected President of this country at the end of six years to go and show the people a big Feasibility Report and say, 'This is what I have done.'" ?

ඒ ප්‍රශ්නය අහලා එතුමා කීවා, " ඔක තමි විසඳුම, කරුණාකරලා කොටෙ—මේවට අතුළාගෙන යන්න. මම පුළුවන් විධියට කරන්නම් " කියා. ජනාධිපතිතුමාට ඕනෑ කර තිබුණේ වික්ටෝරියා ජලාශය, රත්දෙණිගල ජලාශය, කොත්මලේ ජලාශය, දකුණු ඉවුරේ යෝධ ඇළ ව්‍යාපෘතිය ආදී වශයෙන් ඒ සියල්ලේම වැඩ ඉවර කර අඩු ගණනේ ඉඩම් අක්කර තුන්—හාර ලක්ෂයක්වත් සංවර්ධනය කොට ජනතාව පදිංචි කරවන්නයි. ඒ සංවර්ධන වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරන්න අපි උත්සාහ කළේ යම්කිසි, ශාස්ත්‍රානුකූල, විද්‍යාත්මක පදනමක් මතයි. ඒ සඳහා, ලෝකයේ ඉන්න උගත්ම විශේෂඥයන් අපි ලංකාවට ගෙන්වා ගත්තා. ඔවුන් එසේ ලංකාවට ගෙන්වාගෙන ඉඩම් අමාත්‍යාංශයේත්, මහවැලි අමාත්‍යාංශයේත් ඒ ව්‍යාපෘති අපි ආරම්භ කළා. නමුත් අපට මතුවන සමහර ප්‍රශ්න තිබෙනවා. එක ප්‍රශ්නයක් තමයි, මේ ඉදි කරන්නා වූ ව්‍යාපෘති අපි නඩත්තු කරන්නේ කෙසේද කියන එක.

ගල්ඔය ව්‍යාපෘතිය ඉදි කිරීමට 1952 දී දශ ලක්ෂ 90 ක් වැය වුණා. 1983 සිට 1985 දක්වා වූ අවුරුදු දෙක තුළ එය ප්‍රතිසංස්කරණය කරන්නට පමණක් දශ ලක්ෂ 500 ක් වියදම් වෙනවා. එයට හේතුව සම්පූර්ණ වාරිමාර්ග ක්‍රම ගරා වැටී තිබීමයි. එවෙලෙට කරන්නට තිබුණු වැඩ වුණත් කරලා නැහැ. අපේ රටේ පමණක් නොවෙයි ; හැම ආණ්ඩුවකම දුර්වලකමක් තිබෙනවා. නඩත්තුවට වුවමනා කරන මුදල් වෙන් නොකිරීමයි, ඒ. මේ රටේ වාරිමාර්ග ක්‍රම අතීතයේදී නඩත්තු වුණේ කොහොමද ? වෙල්විදනේ මහත්වරු සමඟ ඒ වාරිමාර්ග ක්‍රම ඇළ දොළවල් නඩත්තු කිරීමට එහි හැම ගොවියෙක්ම සහභාගී වී ඒවායේ සංවර්ධන වැඩ කටයුතු කළා. ඒ ක්‍රමය අහෝසි කළෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. ඒද කටයුතු කළේ යම්කිසි ක්‍රියා පද්ධතියක් උඩයි. ඒ ක්‍රමයත් අහෝසි කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යයි කියන්නට මම කණගාටු වෙනවා. නමුත් ගොවි මහජනතාවගේ කැමැත්ත හා සහභාගීත්වය ඇතිව අපි ඒ නඩත්තු කටයුතු කිරීමටත් වැඩ පිළිවෙළත් ආරම්භ කර තිබෙනවා. එහි අඩුපාඩුවලට මම ඇහුම්කන් දුන්නා. එය ප්‍රතිසංවිධානය කර එකතු කරන මුදලට වඩා ගොවි මහත්වරුන්ගේ සහභාගීත්වය උඩ මේවා අනාගත වස්තුව ගැටියට පවත්වා ගෙන යෑමට පියවරක් ආරම්භ කරන්නට මම කැමතියි.

ගරු සභාපතිතුමනි, මම දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඉඩම් කොමිසම සම්බන්ධවත් අදහස් ප්‍රකාශ කළා. ඉඩම් කොමිසමේ අදහස් ආණ්ඩුවට සහ මේ රටේ ජනතාවට දැනගැනීමට ලඟදීම අතුරු වාර්තාවක් මුද්‍රණය කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ සමඟම අපේ මුල්කිරිගල මන්ත්‍රීතුමා (ආනන්ද කුලරත්න මහතා) සැල්විනියා ගැන මතක් කළා. අපි 1986 වර්ෂයේ උත්සාහ කරනවා සැල්විනියා මර්දනය සම්බන්ධව වැඩි උනන්දුවක් අරගෙන — මෙය දැන් ලෝක ප්‍රශ්නයක් වී තිබෙනවා — ඕස්ට්‍රේලියානු ආණ්ඩුවේ උදව් ඇතිව එය මර්දනය කරන මාර්ග සොයා ගන්නට.

වන රක්ෂණය ගැනත් අදහස් ප්‍රකාශ කළා. එය ඉතාම අත්‍යාවශ්‍ය ක්‍රියා පටිපාටියක්. වන රක්ෂණය සම්බන්ධව උසස් සංවිධාන ඇති කරන්නට ඕනෑ. නමුත් අපේ වන රක්ෂණ කටයුතු තිබෙන්නේ බොහොම දරුණු තත්ත්වයකයි, අපි කොහොම උත්සාහ කළත්. පොඩි ළමයෙක් ගොස් වනයට ගිහ්දර ටිකක් තැබුවොත් එක වරටම අක්කර 75 ක්, 100 ක් පිච්චෙනවා. අලුත් විධියේ ගිනි නිවන උපකරණ —fine fighting equipments —හා ක්‍රම ලෝකයේ හැම රටකම පාවිච්චි කරනවා. අපේ රටේ තවම ඒවා පාවිච්චි කරන්නේ නැහැ. එමෙන්ම මේ සම්බන්ධ ජනතාවගේ අවබෝධය වැඩියෙන් මුවහත් කරන්නත් ඕනෑ. ඒ කටයුතුත් ගරු දිසා ඇමතිවරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් ඇති කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

අ. භා. 2.45

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය බොහෝ දුරට බාරව සිටින්නේ ජනතාවට ඉතාමත්ම අත්‍යාවශ්‍ය වූ ජලය සහ ඉඩම් ප්‍රශ්නයි. අපේ දෙපාර්තමේන්තුව බොහොම පරණ දෙපාර්තමේන්තුවක්. එම නිසා ඒ දෙපාර්තමේන්තුව එක වරටම වෙනස් කරන්නට බැහැ. විප්ලවීය විධියට වෙනස් කරන්නත් බැහැ. නමුත් ඒ දෙපාර්තමේන්තුවල ඉතාම උසස් සම්ප්‍රදායයන් තිබෙනවා. ඒ සම්ප්‍රදායයන් අනුව මම කියන්නට කැමතියි, තොයෙකුත් දුර්වලකම් හා අමාරුකම් මැද අපේ අමාත්‍යාංශයෙන් සහ දෙපාර්තමේන්තුවලින් සෑහෙන සේවයක් සිදු වී තිබෙනවා යයි මට නම් සතුටු වන්නට පුළුවන් බව. එය හාර ඇමතිවරයා හැටියට ඒ හැම කෙනෙකුටම මගේ අවංක ස්තුතිය පුද කරන්නට මම කැමතියි.

මන්ත්‍රීවරුන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ තොයෙකුත් අඩුපාඩුකම් ගැන කරුණු සොයා බලා ඒ ඒ කරුණු සම්බන්ධව ජනවාරි මාසයේදී ඒ ඒ මන්ත්‍රීතුමන්ලාට ලිඛිතව දැනුම් දෙන්නට පොරොන්දු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

"51 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන. පුනරාවර්තන වියදම් සඳහා රු. 74,45,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

51 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 51, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 74,45,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 51, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுருஞ் செலவு ரூபா 74,45,000 அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 7,445,000, for Head 51, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 51, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම්, රු. 6,94,55,000

නිකුත්ච්‍රිත් තිට්ටම් 1.—පොදු නිරුවාකරුම් පදවියිනිර් සේවෛකළුම් — ආක්කප් පොරුට් සෙලවු, රූපා 6,94,55,000

Programme 1.—General Administration and Staff Services – Capital Expenditure Rs. 69,455,000.

" 51 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 6,94,55,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

51 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරණය 51, නිකුත්ච්‍රිත් තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවුක්කාන රූපා 6,94,55,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ට ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තීරණය 51, නිකුත්ච්‍රිත් තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවු අට්ටවණෙයින් භාගමාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 69,455,000, for Head 51, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 51, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන.—ඉඩම්, ජලය හා වන සම්පත් සංවර්ධනය හා කළමනාකරණය—පුනරාවර්තන වියදම්, රු. 39,27,000

නිකුත්ච්‍රිත් තිට්ටම් 2.— කාණි, නීර්, කාට්ටුවළංකළ් ආකියවට්ට්රින් අභිවිරුත්තියුම් මුකාමෙයුම් — මීණ්ටුවරුඤ් සෙලවු, රූපා 39,27,000

Programme 2.—Development and Management of Land, Water and Forest Resources – Recurrent Expenditure, Rs. 3,927,000

" 51 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 39,27,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

51 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරණය 51, නිකුත්ච්‍රිත් තිට්ටම් 2, මීණ්ටුවරුඤ් සෙලවුක්කාන රූපා 39,27,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තීරණය 51, නිකුත්ච්‍රිත් තිට්ටම් 2, මීණ්ටුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 3,927,000 for Head 51, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 51, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන.—ඉඩම්, ජලය හා වන සම්පත් සංවර්ධනය හා කළමනාකරණය—මූලධන වියදම්, රු. 40,54,06,000

නිකුත්ච්‍රිත් තිට්ටම් 2.— කාණි, නීර්, කාට්ටුවළංකළ් ආකියවට්ට්රින් අභිවිරුත්තියුම් මුකාමෙයුම් — ආක්කප්පොරුට් සෙලවු, රූපා 40,54,06,000

Programme 2.—Development and Management of Land, Water and Forest Resources – Capital Expenditure, Rs. 405,406,000

" 51 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 40,54,06,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

51 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරණය 51, නිකුත්ච්‍රිත් තිට්ටම් 2, ආක්කප්පොරුට් සෙලවුක්කාන රූපා 40,54,06,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තීරණය 51, නිකුත්ච්‍රිත් තිට්ටම් 2, ආක්කප්පොරුට් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 405,406,000, for Head 51, Programme 2, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 51, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule.

52 වන ශීර්ෂය.—වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—පුනරාවර්තන වියදම්, රු. 2,68,01,000

තලෛප්පු 52.—නීර්ප්පාසනත් තිණෛක්කළම්

නිකුත්ච්‍රිත් තිට්ටම් 1.— පොදු නිරුවාකරුම් පදවියිනිර් සේවෛකළුම් — මීණ්ටු වරුඤ් සෙලවු, රූපා 2,68,01,000

HEAD 52.—IRRIGATION DEPARTMENT

Programme 1.—General Administration and Staff Services – Recurrent Expenditure, Rs. 26,801,000

" 52 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 2,68,01,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

52 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෛප්පු 52, නිකුත්ච්‍රිත් තිට්ටම් 1, මීණ්ටුවරුඤ් සෙලවුක්කාන රූපා 2,68,01,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෛප්පු 52, නිකුත්ච්‍රිත් තිට්ටම් 1, මීණ්ටුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 26,801,000, for Head 52, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 52, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම්, රු. 67,90,000

නිකුත්ච්‍රිත් තිට්ටම් 1.— පොදු නිරුවාකරුම් පදවියිනිර් සේවෛකළුම් — ආක්කප් පොරුට් සෙලවු, රූපා 67,90,000

Programme 1.—General Administration and Staff Services – Capital Expenditure, Rs. 6,790,000

" 52 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 67,90,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

52 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෛප්පු 52, නිකුත්ච්‍රිත් තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවුක්කාන රූපා 67,90,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෛප්පු 52, නිකුත්ච්‍රිත් තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 6,790,000, for Head 52, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 52, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන.—වාරිමාර්ග හා ජලාපවහන වැඩ නිර්මාණය හා සංවර්ධනය—පුනරාවර්තන වියදම්, රු. 5,14,44,000

නිකුත්ච්‍රිත් තිට්ටම් 2.— නීර්ප්පාසන නිර්මාණමුම්, අභිවිරුත්තියුම්, වඩිකාල් වේලෛකළුම් — මීණ්ටුවරුඤ් සෙලවු, රූපා 5,14,44,000

Programme 2.—Construction and Development of Irrigation and Drainage Works – Recurrent Expenditure, Rs. 51,444,000

" 52 වන ශීර්ෂයෙහි 2 වන් වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 5,14,44,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

52 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලෛප්පු 52, නිකුත්ච්‍රිත් තිට්ටම් 2, මීණ්ටුවරුඤ් සෙලවුක්කාන රූපා 5,14,44,000 අට්ටවණෙයිර් සේර්ක්කප්පටුමාක" එනුම් විණ්ණ විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.

තලෛප්පු 52, නිකුත්ච්‍රිත් තිට්ටම් 2, මීණ්ටුවරුඤ් සෙලවු අට්ටවණෙයාළ පකුතියාක ඉරුක්කක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 51,444,000, for Head 2, Programme 52, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 52, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2 වන වැඩ සටහන.–වාරිමාර්ග හා ජලාපවහන වැඩ තිර්මාණය හා සංවර්ධනය–මූලධන වියදම්, රු. 66,38,73,000

නිකුත්සිත් තිට්ටම් 2.— නීර්ප්පාසන නිර්මාණමුම්, අපිවිරුත්තියුම්, වඩිකාල් වේලෙ කණුම් — ආක්ප්පොරුට් සෙලවු, රූපා 66,38,73,000

Programme 2.– Construction and Development of Irrigation and Drainage Works – Capital Expenditure Rs. 663,873,000

" 52 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 66,38,73,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

52 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි තියෝග කරන ලදී.

"තීරුප්පු 52, නිකුත්සිත් තිට්ටම් 2, ආක්ප්පොරුට් සෙලවුක්කාන රූපා 66,38,73,000 අට්ටවණෙයිල් සේර්ක්ප්පට්ටුමාක" එණුම් විණා විටුක්ප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

තීරුප්පු 52, නිකුත්සිත් තිට්ටම් 2, ආක්ප්පොරුට් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්ක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 663,873,000, for Head 52, Programme 2, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 52, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule.

53 වන ශීර්ෂය.–ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.–පරිපාලනය හා පරිසර සංවර්ධනය–පුනරාවර්තන වියදම්, රු. 34,32,000

තීරුප්පු 53.—කාණි අපිවිරුත්තිත් තිණෙක්කළම්

නිකුත්සිත් තිට්ටම් 1.— නිරුවාකමුම් සුත්‍රුටල් අපිවිරුත්තියුම් — මීණ්ටුවරුඤ් සෙලවු, රූපා 34,32,000

HEAD 53 – LAND DEVELOPMENT DEPARTMENT

Programme 1.– Administraton and Environmental Development – Recurrent Expentditure, Rs. 3,432,000

" 53 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 34,32,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

53 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි තියෝග කරන ලදී.

"තීරුප්පු 53, නිකුත්සිත් තිට්ටම් 1, මීණ්ටුවරුඤ් සෙලවුක්කාන රූපා 34,32,000 අට්ටවණෙයිල් සේර්ක්ප්පට්ටුමාක" එණුම් විණා විටුක්ප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

තීරුප්පු 53, නිකුත්සිත් තිට්ටම් 1, මීණ්ටුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්ක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 3,432,000, for Head 53, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 53, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.–පරිපාලනය හා පරිසර සංවර්ධනය–මූලධන වියදම්, රු. 53,23,000

නිකුත්සිත් තිට්ටම් 1.— නිරුවාකමුම් සුත්‍රුටල් අපිවිරුත්තියුම් — ආක්ප්පොරුට් සෙලවු, රූපා 53,23,000

Programme 1.– Administraton and Environmental Development – Capital Expentditure, Rs. 5,323,000

" 53 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 53,23,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය." යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

53 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි තියෝග කරන ලදී.

"තීරුප්පු 53, නිකුත්සිත් තිට්ටම් 1, ආක්ප්පොරුට් සෙලවුක්කාන රූපා 53,23,000 අට්ටවණෙයිල් සේර්ක්ප්පට්ටුමාක" එණුම් විණා විටුක්ප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

තීරුප්පු 53, නිකුත්සිත් තිට්ටම් 1, ආක්ප්පොරුට් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්ක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 5,323,000, for Head 53, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 53, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

54 වන ශීර්ෂය.–ඉඩම් කොමසාරිස්

1 වන වැඩ සටහන.–රජයේ ඉඩම් පරිපාලනය, ඉඩම් සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනය හා ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් බෙදීම් හා දීමනා පත්‍ර නිකුත් කිරීම–පුනරාවර්තන වියදම්, රු. 5,75,27,000

තීරුප්පු 54.—කාණි ආණෙයාළර්

නිකුත්සිත් තිට්ටම් 1.— නිරුවාකමුම්, කාණි අපිවිරුත්ති, කමත්තොළිල් අපිවිරුත්ති, අරස කාණිකළින් විත්පණෙයුම්, කාණි අපිවිරුත්තික් කට්ටළෙච් චට්ටත්තින්කීழ් කොටෙකළ වළංකලුම් — මීණ්ටුවරුඤ් සෙලවු, රූපා 5,75,27,000

HEAD 54.– LAND COMMISSIONER

Programme 1.– Administration, Land Development, Agricultural Development and Alienation of Land and, the Issue of Grants under the Land Development Ordinance – Recurrent Expenditure, Rs. 57,527,000

54 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 5,75,27,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

54 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි තියෝග කරන ලදී.

"තීරුප්පු 54, නිකුත්සිත් තිට්ටම් 1, මීණ්ටුවරුඤ් සෙලවුක්කාන රූපා 5,75,27,000 අට්ටවණෙයිල් සේර්ක්ප්පට්ටුමාක" එණුම් විණා විටුක්ප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

තීරුප්පු 54, නිකුත්සිත් තිට්ටම් 1, මීණ්ටුවරුඤ් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්ක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 57,527,000, for Head 54, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 54, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.–රජයේ ඉඩම් පරිපාලනය, ඉඩම් සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනය හා ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් බෙදීම් හා දීමනා පත්‍ර නිකුත් කිරීම–මූලධන වියදම්, රු. 6,80,80,000

නිකුත්සිත් තිට්ටම් 1.— නිරුවාකමුම්, කාණි අපිවිරුත්ති, කමත්තොළිල් අපිවිරුත්ති, අරස කාණිකළින් විත්පණෙයුම්, කාණි අපිවිරුත්තික් කට්ටළෙච් චට්ටත්තින්කීழ් කොටෙකළ වළංකලුම් — ආක්ප්පොරුට් සෙලවු, රූපා 6,80,80,000

Programme 1.– Administration, Land Development, Agricultural Development and Alienation of Land and, the Issue of Grants under the Land Development Ordinance – Capital Expenditure, Rs. 68,080,000

" 54 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 6,80,80,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය " යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

54 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි තියෝග කරන ලදී.

"තීරුප්පු 54, නිකුත්සිත් තිට්ටම් 1, ආක්ප්පොරුට් සෙලවුක්කාන රූපා 6,80,80,000 අට්ටවණෙයිල් සේර්ක්ප්පට්ටුමාක" එණුම් විණා විටුක්ප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

තීරුප්පු 54, නිකුත්සිත් තිට්ටම් 1, ආක්ප්පොරුට් සෙලවු අට්ටවණෙයින් පකුතියාක ඉරුක්ක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, "That the sum of Rs. 68,080,000, for Head 54, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 54, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

55 වන ශීර්ෂය.—ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත ක්‍රියාත්මක කිරීම—පුනරාවර්තන වියදම්, රු. 19,93,000

தலைப்பு 55.— காணி நிர்ணயத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— காணி நிர்ணயக் கட்டளைச் சட்டத்தினைச் செயற்படுத்தல் — மீண்டுவருஞ் செலவு, ரூபா 19,93,000

HEAD 55.– LAND SETTLEMENT DEPARTMENT

Programme 1.– Implementation of the Land Settlement Ordinance – Recurrent Expenditure, Rs. 1,993,000

"55 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 19,93,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

55 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 55, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 19,93,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 55, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,993,000, for Head 55, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 55, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත ක්‍රියාත්මක කිරීම—මූලධන වියදම්, රු. 3,00,000

நிகழ்ச்சித் திட்டம் 1.— காணி நிர்ணயக் கட்டளைச் சட்டத்தினைச் செயற்படுத்தல் — ஆக்கப்பொருட் செலவு, ரூபா 3,00,000

Programme 1.– Implementation of the Land Settlement Ordinance – Capital Expenditure, Rs. 300,000

"55 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 3,00,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

55 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 55, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 3,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 55, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 300,000, for Head 55, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 55, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

56 වන ශීර්ෂය.—රජයේ කර්මාන්ත ශාලාව

1 වන වැඩ සටහන.—කාර්මික ඉංජිනේරු වැඩ සහ අළුත්වැඩියා සේවාවන්—පුනරාවර්තන වියදම්, රු. 70,44,000

தலைப்பு 56.— அரசாங்கத் தொழிற்சாலை

நிகழ்ச்சித் திட்டம் 1.— எந்திர, பொறியியற் வேலைகளும் பழுதுபார்த்தல் சேவைகளும் — மீண்டுவருஞ் செலவு, ரூபா 70,44,000

HEAD 56 – GOVERNMENT FACTORY

Programme 1.– Mechanical Engineering Work and Repair Services – Recurrent Expentditure, Rs. 7,044,000

"56 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 70,44,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 56, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 70,44,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 56, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 7,044,000, for Head 56, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 56, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—කාර්මික ඉංජිනේරු වැඩ සහ අළුත්වැඩියා සේවාවන්—මූලධන වියදම්, රු. 30,00,000

நிகழ்ச்சித் திட்டம் 1.— எந்திர, பொறியியல் வேலைகளும் பழுதுபார்த்தல் சேவைகளும் — ஆக்கப்பொருட் செலவு, ரூபா 30,00,000

Programme 1.– Mechanical Engineering Work and Repairs Services – Capital Expenditure Rs. 3,000,000

"56 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 30,00,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 56, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 30,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 56, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,000,000 for Head 50, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 56, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule

57 වන ශීර්ෂය.—මිතිස්දෝරු දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—මැනුම් කටයුතු.—පුනරාවර්තන වියදම්, රු. 17,17,09,000

தலைப்பு 57.—அளவைத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— அளவைத் தொழிற்பாடுகள் — மீண்டுவருஞ் செலவு, ரூபா 17,17,09,000

HEAD 57. – SURVEY DEPARTMENT

Programme 1. – Survey Operations – Recurrent Expenditure Rs. 171,709,000

"57 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 17,17,09,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

57 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 57, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 17,17,09,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 57, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 171,709,000 for Head 57, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 57, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule

1 වන වැඩ සටහන.—මැනුම් කටයුතු.—මූලධන වියදම්, රු. 1,63,34,000

நிகழ்ச்சித் திட்டம் 1.— அளவைத் தொழிற்பாடுகள் — ஆக்கப்பொருட் செலவு, ரூபா 1,63,34,000

Programme 1. – Survey Operations –Capital Expenditure, Rs. 16,334,000

"57 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 1,63,34,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

57 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 57, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,63,34,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 57, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 16,334,000 for Head 57, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 57, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

58 වන ශීර්ෂය.—වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා වන සම්පත් සංවර්ධනය—පුනරාවර්තන වියදම්, රු. 2,73,40,000

தலைப்பு 58.— காட்டுத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும காடடுவளங்களின் அபிவிருத்தியும் — மீண்டுவருஞ் செலவு, ரூபா 2,73,40,000

HEAD 58. – FOREST DEPARTMENT

Programme 1. – General Administration and Development of Forest Resources – Recurrent Expenditure, Rs. 27,340,000

"58 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 2,73,40,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

58 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 58, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 2,73,40,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் விஞ்ஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 58, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 27,340,000 for Head 58, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 58, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා වන සම්පත් සංවර්ධනය—මූලධන වියදම්, රු. 13,73,72,000

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும் காட்டுவளங்களின் அபிவிருத்தியும் — ஆக்கப்பொருட் செலவு, ரூபா 13,73,72,000

Progreamme 1. – General Administration and Development of Forest Resources – Capital Expenditure, Rs. 137,372,000

"58 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 13,73,72,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

58 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 58, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 13,73,72,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் விஞ்ஞ விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 58, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 137,372,000 for Head 58, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 58, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule

81 වන ශීර්ෂය.—කම්කරු අමාත්‍යවරයා

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය සහ කාර්ය මණ්ඩල සේවා—පුනරාවර්තන වියදම්, 30,21,000

தலைப்பு 81.— தொழில் அமைச்சர்

நிகழ்ச்சித் திட்டம் 1.— பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — மீண்டுவருஞ் செலவு, ரூபா 30,21,000

HEAD 81. – MINISTER OF LABOUR

Programme 1. – General Administration and Staff Services – Recurrent Expenditure, Rs. 3,021,000

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

We shall not take up Heads 81 and 82 – Minister of Labour. The vote on these Heads will be taken up at 6 p.m.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

I move,

"That the Programme be reduced by Rs. 10."

ගරු සභාපතිතුමනි, අද අළුත් ඇමතිතුමෙක් මේ අමාත්‍යාංශයේ වැඩ කරගෙන යනවා. ඒ නිසා අපට අත්දැකීමකුත් ලබාගන්නට පුළුවනි මේ අමාත්‍යාංශයේ අළුත් නායකත්වය යටතේ සහ පරණ නියෝජ්‍ය නායකත්වය යටතේ වැඩ කෙරෙන ආකාරය ගැන.

පසුගිය කාලයේදී මේ අමාත්‍යාංශය සාමාන්‍යයෙන් අප අතර භේදයකට තුඩු නොදෙන ප්‍රශ්න ගැන අපිට වාර්තාවක් දී තිබෙනවා. විශේෂයෙන් කම්කරුවන්ට පුහුණුවක් දීම ගැන, අළුත් "ෆෝර්මත් ට්‍රේනිං" විද්‍යාලය ගැන, නොයෙක් නොයෙක් ශ්‍රේණිවලට අයත් උදවියට පුහුණුව දීම ගැන, අපට විස්තර සහිතව වාර්තා දී තිබෙනවා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. නමුත් තවම අපට ප්‍රශ්නයක් තිබෙනවා, මූලික ප්‍රශ්නයක් තිබෙනවා, මේ අමාත්‍යාංශයෙන් රටේ වෘත්තීය සමිතිවලට නියමිත විධියට සලකනවාද කියන එක ගැන ; විශේෂයෙන්ම ආණ්ඩුවේ – එක්සත් ජාතික පක්ෂයේ – වෘත්තීය සමිතිවලට හැර අනෙක් ඒවාට නියමිත විධියට සලකනවාද කියන එක ගැන. ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද ? පසුගිය කාලවලදී නම් අපට පෙනෙන්නට තිබුණා ආණ්ඩුවේ වෘත්තීය සමිතිවලට ලොකු පක්ෂපාතිත්වයක්. අපි බලාපොරොත්තු වෙනවා ඉදිරි කාලයේදී ඒ ප්‍රතිපත්තිය වෙනස් කර සර්ව සාධාරණව හැම වෘත්තීය සමිතියකටම සලකනවා ඇත කියා. ඔබතුමන්ලාගේ බලපෑම උඩ නොයෙක් අමාත්‍යාංශවල දැන් ගෙනයන ක්‍රියා දමයන් වෙනස් කොට ඒ ඒ වෘත්තීය සමිතිවලට යලින් තැනක් දෙනවා කියා අපි බලාපොරොත්තු වෙනවා.

1980 වැඩ වර්ජනය ඇතිවුණාට පසුව, බොහෝ දුරට මේ රටේ තිබුණු වෘත්තීය සමිතිවලට, ආණ්ඩුවට අයිති නොවන වෘත්තීය සමිතිවලට සැගෙන පහරවල් වැදුණා. ඒ වෘත්තීය සමිතිවලට අයිති කාර්යාල ආපසු ගත්තා. සමහර විට ආණ්ඩුවෙන් දී තිබුණ කාර්යාල ආපසු ගත්තා. මට මතකයි මම ඇමතිවරයකු වශයෙන් වැඩ කරන කාලයේදී දුම්රිය සේවකයන්ගේ වෘත්තීය සමිතිවලට දුන් කාර්යාල ගැන. දැන් ඒවා ආපසු අරගෙන තිබෙනවා. ඒ වෘත්තීය සමිතිවලට දැන් කාර්යාල නැහැ. වරායේ එහෙමයි. ඒ වාගේ ආණ්ඩුවේ නොවන සමිතිවලට නොයෙකුත් තැන්වල දී තිබුණු වරප්‍රසාද කපා තිබෙනවා. තවම ඒවා යලිත් දී නැහැ. දැන් වැඩ වර්ජනය වෙලත් සැගෙන කාලයක් ගත වී තිබෙනවා. තවම සිටිනවා වැඩ වර්ජනයට සහභාගි වූ උදවිය රැකියාව නැතුව. අමාත්‍යාංශ කිහිපයක හැරෙන්නට, අනික් හැම අමාත්‍යාංශයකම වාගේ එවැනි අය සිටිනවා. ඒ අයට තවම රැකියා දී නැහැ. ඒ ලේඛන ගත්තොත් මම හිතනවා එය ඉතාමත්ම වැදගත් වෙනවා පළමුවැනි වරට මේ රටේ වැඩ වර්ජනයක් කර බොහෝ උදවිය දිවි තසාගත් බව පෙන්වීමට. මේ රටේ වැඩ වර්ජන ගැන බෙහෙම ලොකු ඉතිහාසයක් තිබෙනවා. මම හිතන්නේ මහතුවර ගරු දිසා ඇමතිතුමාත් වැඩ වර්ජනය කර තිබෙනවා. ඒ පැත්තේ නොයෙක් උදවිය කායකත්වය දී තිබෙනවා වැඩ වර්ජන වලට. ඒ හැම කෙනෙක්ම දන්නවා වැඩ වර්ජනයක් කිරීම අද මනුෂ්‍ය අයිතිවාසිකමක් කියා. ඒ මනුෂ්‍ය අයිතිවාසිකම ක්‍රියාත්මක කරන්න ගොස් බොහෝ දෙනකුට රක්ෂාවල් අහිමි වුණා. ජීවත් වීම අමාරු වුණා ; බැරිවුණා. බොහෝ දෙනෙක් ඉතාමත්ම කණගාටුදායක තත්ත්වයකට වැටුණා. අද මේ අමාත්‍යාංශයට නව අමාත්‍යවරයෙක් ඇවිත් ඉන්නවා. කරුණාකර අදවත් ප්‍රකාශනයක් කරන්න, රැකියා අහිමි වූ සියලුදෙනාටම නව මාස දෙක තුනකින් ආපසු රක්ෂා ලබා දෙන්න මේ කම්කරු අමාත්‍යාංශය සියලුම වැයම් ගන්නවාය කියා. අතිගරු ජනාධිපතිතුමා හමුවුණ වෙලාවේත් අපිට කිව්වා, මේ රැකියා අහිමි වුණු අයට නැවත රැකියා ලබා දෙනවාය කියා.

ගරු සභාපතිතුමනි, මේ අවැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී ප්‍රවාහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කළ අවස්ථාවේ මම ප්‍රකාශනයක් කළා. එය 1985 දෙසැම්බර් 9 වනද හැන්සාඩ් වාර්තාවේ 1271 වන පිටුවේ එය මේ විධියට සඳහන් වෙනවා :

"Finally, I would like the Hon. Minister to allow the free activity of trade unions in the Ceylon Transport Board and in the CGR so that once again we will come back to normal conditions. The strike is long

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මූණසිංහ මහතා]

since over. I want to say here, Sir, that I did not agree with that strike, because I thought that if you have a strike you must consult the members and you must have the majority of the workers on your side before you start a strike. I have always done that as a trade union leader. This was a strike pulled out by some extremist at Ratmalana and everybody had more or less been forced to join in".

මේ ප්‍රකාශනය මම මෙහිදී කළාය කියා පසුගිය සතිය තුළ හැමදම යම් යම් පත්‍රවලින් මට පහර පිට පහර ගසා තිබුණා. මම ද්‍රෝහියෙක්ය, මම අතෙක් පැත්තට ගිහිල්ලා ඉන්න පුද්ගලයෙක්ය යනාදී දේවල් ලියමින් මට පහර ගසා තිබුණා. මම එකක් කියන්නම්, මම මේ සභාවේ කථා කරන විට හැමදම මම වැයම් කරන්නේ අද කථා කරන දේ අපි බලයට ආ විට ක්‍රියාත්මක කරන්න පුළුවන් වන හැටියටයි. මෙතැන එකක් කථා කරලා බලයට ආවාට පස්සේ වෙන එකක් කරන්න මම නම් කවදාවත් යතුටු නැහැ. මන්ද කවුරු හරි මේවා බලල කියන්න පුළුවන්, තමුන්නාන්සේ පසුගිය කාලයේදී මේ වගේ කථාවක් කළා, අද ක්‍රියාව කොහොමද කියල. මම ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති වශයෙන් පත් වන්නට ඉස්සර වෙලා දවස් කීපයක් ඒ ගැන කල්පනා කළා. ඒ තනතුරට මා යා යුතු ද නැද්ද කියා. මොකද මම එතැනට යන්නේ වෘත්තීය සම්මති නායකයෙක් වශයෙන් කොවෙයි. වෘත්තීය සම්මති නායකයෙක් වශයෙන් ඉඳලා සේවකයින්ගේ නාමිපුතෙකු වශයෙනුයි යන්නේ. රජය වෙනුවෙන් වෙන්නට පුළුවන්. මම කල්පනා කළා. මම මෙතැනට ගියොත් මගේ තිබෙන තමත් නැති වෙයිද කියා. නමුත් මට ආඩම්බරයෙන් කියන්නට පුළුවනි. මම එහි වැඩ කළාට පස්සේ අද ඕතැම ඩිපෝ එකකට ගිහිල්ලා, ඕතැම කම්කරුවෙන් එක්ක මට කථා කරන්න පුළුවන් බව. ඔවුන් මට විරුද්ධ වෙන්නේ නැහැ. එහෙම වෙලා තිබෙන්නේ මම ඒ කම්කරුවන්ට යම්කිසි සේවාවක් කළ නිසයි කියලයි මම කල්පනා කරන්නේ. මේ ලංකා ඉතිහාසයේ පළමුවන වරට සේවකයාට ගෙවන අර්ථ ශාධක අරමුදල් සියයට 25ක් කළේ මමය කියලා මට ආඩම්බරයෙන් කියන්න පුළුවන්. එ වාගේම මේ රටේ කම්කරුවන්ට පාලන බලය දීමට ලංකා ඉතිහාසයේ පළමුවන වරට පියවර ගත්තේ මමය කියා මට ආඩම්බරයෙන් කියන්න පුළුවන්. එම නිසාමට මේ පහරවල් ගහන විට ටිකක් කල්පනාවෙන් ඒක කළයුතුය කියා හිතන්න ඕනෑ. මමත් වැඩ වර්ජන කීපයක් ගෙන ගොස් තිබෙනවා. මම වෘත්තීය සම්මති කීපයක් හදලා තිබෙනවා. මම එක වෘත්තීය සම්මතියක් හදල අවුරුදු දෙකකින් එහි සාමාජිකත්වය පණස් දහට නැග්ගුවා. ඔය කථා කරන එක්කෙනෙක්වත් එහෙම ක්‍රියාවක් කර නැහැ. ඔවුන්ට එහෙම ක්‍රියාවක් කරන්න ශක්තියකුත් නැහැ කියලා මම කියන්න ඕනෑ.

වෛද්‍ය වාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

තමුන්නාන්සේ වෙනුවෙන් අපිත් දුක් වෙනවා. මොන පත්තරයේද ඒක තිබුනෙ ?

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

අයියෝ ! ඒක දක්තෝ දනිති. මට කියන්න තියෙන්නෙ එච්චරයි.

මේ අවස්ථාවේදී මම විශේෂ ඉල්ලීමක් කරනවා, අපේ පුවත්පත් වාර්තාකාර මහත්වරුන්ගෙන්, මට පහර ගැහුවා වාගේම මම කියන මේ කථාවත් ඒ විධියටම ලියන්නය කියා. මම ඒවාට උත්තර දෙනවා. මන්ද, මමත් වැඩ වර්ජන කීපයක් ගෙන ගොස් තිබෙනවා. එකක්වත් වැරදුණේ නැහැ හැම එකක්ම ජය ගත්තා. මන්ද, වැඩ වර්ජනයක් කරන්න ප්‍රථම ඒ කම්කරුවන්ගේ සිතුම් පැතුම් දැන ගන්න ඕනෑ. ඒ අය වැඩ වර්ජනයක් ගෙන යන්න එකඟද නැද්ද කියා දැන ගන්න ඕනෑ. වැඩ වර්ජනයක් කරනවා නම් අඩු ගණනේ ඒ වැඩ වර්ජනයට පක්ෂව කම්කරුවන්ගෙන් සියයට 75 ක් ඉන්න ඕනෑ. මොකද ? වර්ජනය පටන් ගන්නා විට 75% ක් සිටියත්, භාගයක් දුර යන විට, මේ සංඛ්‍යාව සියයට හැට පහ—පණස් පහ දක්වා පහත වැටෙනවා. මේ තත්ත්වය දැනගන්නට ඕනෑ නායකයන වුණාම. මොකද ? යම් විධියකින් වැඩ වර්ජනය නිසා ඒ කම්කරුවන්ට රක්ෂා අහිමි වුණොත් ඒක වගකීම වර්ජනය මෙහෙයවන නායකයන් භාරගන්නට ඕනෑ. ඇත්තවශයෙන්ම මම එද යම් යම්ාජ පක්ෂයේ ඉන්න විට, මෙම වැඩ වර්ජනය කිරීමේ අදහසට මම විරුද්ධ වුණා. නමුත් වැඩ වර්ජනයට සහභාගී වෙන්නටය කියා පක්ෂයෙන් තියම කළාම මම එයට සහභාගී වුණා. වැඩ වර්ජනය කිරීම සම්බන්ධයෙන් මගේ විරෝධය එද ප්‍රකාශ කර විරුද්ධව ජන්දය දුන්නටත් පසුව වැඩ වර්ජනයට සම්බන්ධ වෙන්න මට සිද්ධ වුණා. එපමණක් නොවෙයි, අවුරුද්දක් ගත වුණාට පස්සේ එම රක්ෂාව අහිමි වුණු අයත් සමග සත්‍යග්‍රහ පවත්වන්න නොයෙක් ස්ථාන නම් කර තිබුණා. අපේ කලවානේ මන්ත්‍රීතුමාත් (සරත් මුත්තෙට්ටුවේගම මහතා) දන්නවා ඇති අපට කොටුවෙ නොයෙක් ස්ථාන දී තිබුණු බව ඒ අත්දමට සත්‍යග්‍රහ පවත්වන්නට. මට තියම කර තිබුණේ හදිසි නීතියට විරුද්ධව වයි. එම්. සී. ඒ. ගාලාව ඉදිරිපිට කථාවත් පවත්වන ලෙසටයි. මම ඒ කථාව කළා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මාව දවස් හයක් තිස්සේ මරදන පොලිසියේ " පෙල් " එකේ දමා එද, තව සමසමාජ පක්ෂයේ වික්‍රමාහු කරුණාරත්න යන අයත් මා සමග අතීක් " පෙල් " එකේ දමා තිබුණා. නමුත් අද මට විරුද්ධව කථා කරන ඒ එක නායකයෙක්වත් එද, හිරහාරයට ගෙන නොතිබුණු බව මේ අවස්ථාවේදී මම කියන්නට ඕනෑ.

I next come to the process of the creation of employment opportunities. Here, there are two areas we have to consider. Here again – if I may be forgiven for repeating a phrase which the hon. Member for Kalawana (Mr. Sarath Muttetuwegama) used – with the growth of experience we have to consider certain remedies in the field of foreign employment and even in the area of investment in our country. For instance in the field of foreign employment there are cases where unregistered foreign employment agencies operate. We would suggest to the Hon. Minister – the numbers of these unregistered employment agencies are dwindling – that more close monitoring be done to do away with unregistered foreign employment agencies.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

May I assure the hon. Member that many of these unregistered and illegal agency houses have been closed down for exploiting the poor. Necessary action is being taken in court.

ඊ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரோ)
(Mr. E. P. Paul Perera)

Thank you, Sir. We are very happy that the hon. Minister is a very active person and is one who is very progressive in his ideas. He takes a very enlightened view of these matters.

The other aspect I would refer to is in the area where I once worked, and that is the area of authority of the GCEC. There are two sectors in the GCEC area of authority. They are, the area outside the Katunayake Investment Promotion Zone and the area within the Katunayake Investment Promotion Zone. I must state to this House that one finds that in the area outside the KIPZ there are a large nubmer of factories which I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජ. පී. පෝල් පෙරේරා මහතා]

think are not being fair by the workers – at least a few of them are not being very fair by their workers. This may be for some reason or other. I do not think that they are on their own trying to be cruel to their employees but it may be that economic reasons compel them not to confirm to labour legislation.

Similarly, even in the sectors within the KIPZ one hears – now one begins to hear in this House – allegations that there is a certain degree of hardship caused to the workers in some factories.

අ. භා. 4

There was a time when, in these matters, both the GCEC and the Labour Department worked very closely. There was a time, I remember, when the Manager in Charge of the Industrial Relations Department was accredited as Deputy Commissioner of Labour under the Industrial Disputes Act by order made by His Excellency the President. I think that officer had retired and the office remains vacant. And I would suggest to the Hon. Minister that more close scrutiny is necessary to see that labour legislation is strictly enforced both inside and ouside the zone, because today it is a growing sector, a growing sector where there are over 70 factories and 35,000 workers facing housing problems and so on, I think the industrial relations department of the Commission alone would not be able to deal with this aspect, I would, therefore, very strongly recommend that in the interest of our workers the labour department presents itself now as an enforcement unit, in addition to the Zone's own administration because one must ensure that the purpose of our policy is to make our workers happy. They must be satisfied, particularly at a time when there is economic recession or loss of business or loss of market, sometimes it is in the nature of things for businessmen to start first cutting the welfare facilities that are enjoyed by the workers. This I believe is a human reaction. I think it happens even in places like Soviet Russia but it is the duty of the third party, the Government, who is the umpire or the abritrator between the employer and the employee to ensure that labour legislation is strictly enforced, so that workers' interests are assured.

I would while complimenting the Hon. Minister and his staff for the excellent work that is being done in the field of labour, unprecedented prior to 1977 by those people who described themselves as socialists, still in order to consolidate what we have gained and achieved I would recommend that this little regard be paid to the conditions of labour in the area of authority of the GCEC.

Thank you.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා කරන මේ අවස්ථාවේ කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. පසුගිය වාරයේ අයවැය විවාදයේදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශයක් කළා, නිදහස් වෙළඳ කලාපයේ කම්හල්වලට කම්කරු නීති බලපෑම පිළිබඳව අවධානය යොමු කරනවාය කියා. අපි ඒ පිළිබඳව ටිකක් සැලකිලිමත්ව බැලුවොත් හොඳයි. එයට හේතුව දැනට නිදහස් වෙළඳ කලාපයේ කම්හල 11ක් ඒ අයගේ නිෂ්පාදන නවත්වා ඒවා වසා දමා තිබීමයි. ඒවායේ සේවය කළ අයගේ තත්ත්වය පිළිබඳව කිසිම පැහැදිලිකමක් නැහැ. මේ රටේ අසිකුත් ආයතනවල සේවය කරන අය පිළිබඳව සලකා බලන විට ඒ අයගේ අයිතිවාසිකම් වගයක් තිබෙන බව අපි දන්නවා. එහෙත් මේ කම්හල්වල සේවය කළ අයට කිසිම වන්දි මුදලක් හෝ දීමනාවක් නොදී හදිසියේයි, ඒවා වසා දමා තිබෙන්නේ. මේ ගැන කම්කරු අමාත්‍යාංශය නීතිමය පැත්තෙන් හෝ යම්කිසි පිළියමක් ගැන සොයා බැලුවොත් හොඳයි කියා මම හිතනවා.

මේ නිදහස් වෙළඳ කලාපය තුළ කටයුතුවලට කම්කරු නීති බලපාන්නේ නැහැයි බොහෝ අවස්ථාවල ඒ අය කරන චෝදනාවක් තිබෙනවා. සමහරවිට මෙය විදේශීය සමාගම් පැමිණීම ධෛර්යමත් කරන්නට කළ දෙයක් වෙන්නට පුළුවන්.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

අපේ කම්කරු නීති සියල්ලක්ම ලංකාවේ සෑම තැනකම බලපානවා. නිදහස් වෙළඳ කලාපයටත් ඒවා බලපානවා.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එහෙම නම් මේ වසා දැමූ කම්හල් පිළිබඳව යම් පියවරක් ගන්නට පුළුවන් වෙයි කියා මම හිතනවා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (නියෝජ්‍ය කම්කරු ඇමතිතුමා)
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா — தொழிற் பிரதி அமைச்சர்)
(Mr. M. Joseph Michael Perera – Deputy Minister of Labour)

අපි අවශ්‍ය පියවරවල් අරගෙන තිබෙනවා. මොන මොන තැන්දැයි කිව්වොත් අපි දැන් විස්තර දෙන්නම්.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඇත්ත වශයෙන්ම දැනට මේ නිදහස් වෙළඳ කලාපයේ ඇති සේවක දුක්ගැනවිලි අනුව ඒ කම්කරු නීති එහාට බලපානවාද කියා ටිකක් සොයා බැලුවොත් හොඳයි. ඒ අයට තිබෙන්නේ පැය 8 සේවා කාලයද නැත්නම් ඉදිරිපත් කළයුතු හාණ්ඩ සංඛ්‍යාවද කියා සොයා බැලුවොත් හොඳයි. තමන් සේවය කරන පැය 8 තුළ නිම කළ යුතු යම්කිසි හාණ්ඩ සංඛ්‍යාවක් තියම කිරීම වෙනත් තැන්වල ක්‍රියාත්මක වන්නේ නැහැ. සමහර ආයතනවල පැය 8 ඉක්මවා හෝ දවසට දිය යුතු යම් නිෂ්පාදන එකක ප්‍රමාණයක් එයා දෙන්නට ඕනෑ. රෑ වන තුරු වැඩ කර හෝ එයා ඒක කරන්නට ඕනෑ. එවැනි නීතියක් රටේ වෙනත් fපැක්ටරිවල ඇත්තේ නැහැ. ඒ නිසයි, මම විශේෂයෙන් මෙය සඳහන් කළේ.

උදාහරණයක් හැටියට ගත්තොත් මේවා සාකච්ඡා කරන්නට ඒ අයට සංවිධානයක්වත් තබන්නට පුළුවන්කමක් නැහැ. එහි පවතින නීතිරීති අනුව ඒ ආයතනවල ප්‍රශ්න මොනවාද කියා කථා කරන්නටවත් කිසිම ක්‍රමයක් නැහැ.

ඒ අය " ඩාබිදු " කියා පත්‍රයක් මුද්‍රණය කරනවා. ඒ පත්‍රයේ බොහොම ලස්සනට විස්තර කර තිබෙනවා, ඒ අයට තිබෙන අපහසුකම්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. මේ නිදහස් වෙළඳ කලාපයේ කර්මාන්ත ශාලාවල සිටින සේවකයින් ඉන්නා අපහසු තත්ත්වයක සිටින සේවකයින් හැටියට මෙහි විස්තර වෙනවා. එක fපැක්ටරියක සේවකයින් වැසිකිළියට යෑම සටහන් කරන්නට වෙනම කෙනෙක් සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
May I know what the paper he was reading from ? He referred to a paper.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
"Daabindu".

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
Is that a legalized paper or a phapmlet ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
It is not a phamplet.

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
Who has published it ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
By a publisher.

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
Who is the publisher ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
" රාජගිරියේ යූ. ඒ. පෙරේරා මාවතේ පිහිටි අංක 296 පදිංචි, චිත්‍රංගනී හේවගේ විසින් රත්තනපිටියේ විශ්ව විද්‍යාල පාරේ 119, C RC මුද්‍රණාලයේ මුද්‍රාපිතයි ? "

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
එහෙම එකක් මගේ කඩුවෙල ආසනයේ නැහැ. රාජගිරිය කෝට්ටේ ආසනයේ [බාධාකිරීමක්]

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
තමුන්නාන්සේට කිදහස් වෙලඳ කලාපය ගැන ටිකක් කැක්කුමක් තියෙනවා නේ.

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
ඇයි තමුන්නාන්සේට කැක්කුමක් නැද්ද ? තමුන්නාන්සේගේ සේවකයන් එතැන නැද්ද ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
තමුන්නාන්සේට විශේෂ කැක්කුමක් තිබෙනවා. ඒකයි මම කියන්නෙ.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
තමුන්නාන්සේලාට කැක්කුමක් තියෙන්නෙ හාම්පුතුන් ගැන. අපට කැක්කුම තියෙන්නෙ සේවකයන් වෙනුවෙන්.

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)
තමුන්නාන්සේලා කොහොමද සේවකයන් ගැන කථා කරන්නෙ. අපි නේ ඒ අයට රක්ෂාවල් ලබා දුන්නේ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)
තමුන්නාන්සේලා කවුරුත් මූලාසනයට කථා කරන්න.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක් ආයතනයක් තිබෙනවා. ඒ ආයතනයේ සේවකයන් වැසිකිළියට යන විටත් පොතක ලකුණු කර යන්න ඕනෑ. වෙලාව දෙන්නෙ විනාඩි 3 යි. විනාඩි තුනට වැඩියෙන් ගත්තොත් ඒ ටික හවසට වැඩ කරන්න ඕනෑ.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
ඒ ආයතනයේ නම කියන්න.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
නම කියන්න මට පුළුවන්. ඒ ලකුණු කරන මහත්මයාගේ නම ප්‍රේමතාත්. fපැක්ටරිය ඇතුළේ එයාට කියන්නෙ " ටොයිලට් ප්‍රේමතාත් " කියලයි.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
අපට ඒ ආයතනයේ ඇඩ්‍රස් එක දෙන්න.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
අර ලකුණු කරන පොතටත් තමක් තියෙනවා. විතයේ උසස් රාජ්‍ය නායකයෙන් සිටියා. එතුමාගේ නමේ මුල අකුරු ඒ පොතට මුලින් දමල තියෙනවා. ඒ රාජ්‍ය නායකයා දන් නම් නැහැ. එතුමාගේ නමේ මුල අකුරු ඒ පොතේ ලියා තිබෙනවා. ඒ නිසා මේ වගේ නීති කම්කරු නීතිවලට අදාළද කියා මා අසන්න කැමතියි. මෙන්න මේ වගේ පරිසරයකයි මේ වගේ fපැක්ටරිවලයි ඔය 35,000 ක් පමණ සේවකයන් වැඩ කරනවා කියන්නේ. එයින් විශාල සංඛ්‍යාවක් සියයට 85 ක් පමණ කාන්තා සේවිකාවන්. ඒ අයගේ වැඩ මුර, රාත්‍රී සේවය ආදිය ගැන සලකන විට මේ කාරණා ගැන තමුන්නාන්සේලා විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ.

ඊළඟට මම තවත් කාරණයක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. ආයතනය වසා දැමීමත් අද බොහොම අවස්ථාවල දකින්න ලැබෙනවා. ආයතන වසා දමා සේවකයන්ට වන්දියක් දෙනවා. ඔය වන්දිය රු. 20,000 ක් කියල කියනවා. ඒ අය සේවකයන්ට රු. 20,000 ක වන්දි මුදලක් දී යවනවා. ගරු ඇමතිතුමා එක් අවස්ථාවකදී කියා තිබෙන දෙයක් මම දැක්කා. ඒ රු. 20,000 වන්දි මුදල අරගෙන අස්ව ගිය සේවකයෙක් එතුමාට අතරමගදී මුණගැසී ඒ කළ උදව්ව ගැන සතුට ප්‍රකාශ කළාලු. මොකද ? ඒ පුද්ගලයා ඒ රු. 20,000 අරගෙන ගොස් ව්‍යාපාරයක් ආරම්භ කර දැන් දියුණු තත්ත්වයකට පත්ව සිටිනවා. ඒ අනුව බලන විට නම් සියලුම සේවකයන් අස්කර රු. 20,000 බැගින් දීම හොඳයි කියා හිතන්න පුළුවන්. හැම දෙනාටම ඔහොම් ඒ විධියට ව්‍යාපාරයක් කර ගන්න පුළුවන් නම් හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දෙඩන්ගොඩ මහතා]

තමුත් මේ රු. 20,000 තමයි උපරිමය. මෙහි අවමය ගැන සඳහන් කර නැහැ. ඒ නිසා මේ ගෙවන වන්දි මුදලේ අවමය සඳහන් කළ යුතුය කියා මම ගරු ඇමතිතුමාට මතක් කර සිටින්න කැමතියි. මේ රෙගුලාසි අනුව රු. 20,000 සීමාවේ ඉඳගෙන ඊට පහළට ඇවිත් රු. 5,000, රු. 10,000, රු. 15,000 වගේ ඕනෑම මුදලක් ගෙවන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මම හිතනවා මෙහි අවමයත් සඳහන් කළොත් හොඳයි කියා.

මැතකදී මාර්ග කම්කරුවන් පිළිබඳ ප්‍රශ්නයේදී සැහෙන ප්‍රශ්න මතු වුණ බව අපි දන්නවා. එතැනදී රු. 20,000 සිට පහළට ගෙව්වා. එතැනදී තවත් ප්‍රශ්නයක් මතු වුණා. 1970 සිට වැඩ කළ සේවකයන් 1983 සිට 1984 දක්වා කාලය තුළදී කියමින දින ගණනක් වැඩ කර තිබුණේ නැත්නම් නිකම්ම නෙරපා දමමා. අර 1970 සිට කළ කාලය ගැන කිසිම සැලකිල්ලක් දක්වුවේ නැහැ. අන්න ඒ වගේ නීතියක් එතැන හාවිතා කර තිබෙනවා. ඒ කාරණය ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතුය කියා මා හිතනවා. කම්කරු අයිතිවාසිකම්වල හැටියට අවුරුදු 15ක් 20ක් සේවය කළ අයගේ අන්තිම වර්ෂයක් තම් කර ඒ වර්ෂයේ දවස් ගණනක් පමණක් සේවයට නොපැමිණීම නිසා වන්දි නෙගෙවා සිටීම කෙතොම අසාධාරණයක්. මොකද ? මහාමාර්ග කම්කරුවන් කියන්නේ ඉතාම දුක්ඛිත, පහත් අඩියක වැටුප් මට්ටමක් ලබන අඩු ජීවන තත්ත්වයක් තිබෙන පිරිසක්. ඒ නිසා විශේෂයෙන්ම ඒ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට සඳහන් කළයුතු තවත් කාරණයක් තිබෙනවා. සාප්පු සහ කාර්යල සේවක පනත යටතේ විශේෂ පහසුකමක්, ගෙවීමක් ඒ සේවකයන් ලබනවා. ඒ අය පැය 28ක් දිගටම වැඩ කළොත්, අතිකාල හැර දිගටම සුමානයකට පැය 28ක් වැඩ කළොත් සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ඒ අයට සති අන්ත නිවාඩුව වැටුප් සහිතව ලැබෙනවා. එය සාප්පු හා කාර්යල සේවක පනත යටතේ සිදු කර තිබෙන පහසුකමක්. නමුත් ඒ පහසුකම පඩි පාලක සභා පනත යටතේ වැටුප් ලබන අයට නැහැ. සාප්පු හා කාර්යාල සේවකයන්ට වඩා ශ්‍රමිකයන් හැටියට වෙහෙසිලා වැඩ කරන්නේ පඩි පාලක සභා යටතේ වැඩ කරන සේවකයනුයි. ඒ නිසා ඒ පඩි පාලක සභා යටතේ පාලනය වන සේවකයින්ටත් මේ සති අන්ත නිවාඩුවට වැටුප් ගෙවීම පිළිබඳව ගරු ඇමතිතුමා උපදෙස් දෙන්නේ නම් එය මේ අවස්ථාවේදී සැහෙන දුරට වැදගත් වෙනවා.

අපේ දිස්ත්‍රික්කවල හැටියට අපට නිතරම පැමිණිලි ලැබෙන අංශයක් තමයි වතු කම්කරු පිරිස. වතු කම්කරු පිරිස් සඳහා ඉඩම් ප්‍රමාණය අනුව නියම කරන ආකාරයේ විවිධාකර ගෙවීම් වැටුප් ගෙවීම් නියමිතව තිබෙනවා. ඒ නිසා සමහර වතු හිමියන් ඉඩම් කැබලි කර කීපදෙනකුගේ නමවලට ලියා පොඩි වතු හැටියට අඩු අක්කර ප්‍රමාණයක් පෙන්නුම් කරන්න උත්සාහ කරනවා. මතුගම මන්ත්‍රීතුමාත් (අනිල් මුණසිංහ මහතා) මේ කාරණය ඉදිරිපත් කළා. ඉඩම් ප්‍රමාණය අනුව වැටුප් නියම කිරීමක් තිබෙනවා. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ අක්කර සීයයේ පතහේ වතුවල වුණත් කම්කරු නීති අනුව වැටුප් නොගෙවන බවට පැමිණිලි විශාල සංඛ්‍යාවක් අපට ලැබෙනවා. අර්ථ සාධක සඳහා කැපීම් කරන්නේ නැහැ. ඒ පිළිබඳව තවු පවරනවා. තවු පැවරීමේ ක්‍රමය සකස් වී තිබෙන්නේත් වාර තුනක් දැන්වීම් කරලා ඊට පසුව තවු පවරන ආකාරයටයි. ඒකත් කල් යනවා. කම්කරු උසාවියට වතු හිමියෙක් කැඳවා ගන්න අවුරුදු එක හමාරක් පමණ කල් යනවා. සමහර විට ඊට පසුවත් කල් යනවා. මේ විධියේ කල් යෑම් වැළැක්වීමට ක්‍රමයක් යොදන්න ඕනෑ. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ වතුවල සේවය කරන කම්කරුවන්ගේ අයිතිවාසිකම් රැකදීම සඳහා.

මම තවත් කරුණක් විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. විදේශීය සේවා නියුක්ති කටයුතු අංශය ගැන සඳහන් කළ ඇමතිතුමා තවම එය පවතින්නේ ඒ පිළිබඳ මූලික අවස්ථාවේ බව කිව්වා. නමුත් සැහෙන දුරට ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය විසින් මෙහෙය විය යුතු කොටසක් රටින් බැහැරව සිටිනවා. විදේශවල සේවය කරන හතළිස් දහසට ආසන්න අපේ ශ්‍රමිකයන්ගේ ප්‍රශ්නයක් මේක. බෙහෝ අවස්ථාවල මේ ප්‍රශ්නයේ බැරෑරුම්කම තැත්තම් වගකීම පවරා තිබෙන්නේ ඒ රටේ සිටින අපේ කොන්සල්ට, එසේ නැත්නම් අපේ නියෝජිතයාට. ඒත් නැත්නම් තානාපති කාර්යාලයේ අදළ අංශයට. නමුත් මේ අංශවලින් මේ අයගේ අයිතිවාසිකම් හා වැටුප් ප්‍රශ්නය පිළිබඳව ක්‍රියාත්මක වීමට යොදා තිබෙන වැඩ පිළිවෙල කම්කරුවන්ගේ හෙවත් වැඩ කරන මිනිසුන්ගේ පැත්තෙන් බැලුවාම එතරම් සාර්ථක හෝ විධිමත් හෝ නැහැ.

අ. හා. 4.15

අපට තොයෙක් අවස්ථාවල මේ ගැන අනන්ත පැමිණිලි ලැබී තිබෙනවා. මෙහේ ඒජන්සි හවුස්වලින් කියන මුදල් නොවෙයි එහේ ගියාම මේ අයට ගෙවන්නේ. එතැනට ගියාම මෙහේදී කිව්ව වැඩපල නොවෙයි මේ අයට දෙන්නේ. ගිවිසුම අනුව තැවත ආපහු එන්න බැහැ. ඒ ගොල්ලන් පාස්පෝට් එක බාර ගත්තාට පස්සේ ආයෙත් දෙන්නේ නැහැ. මම එක ශාඛ සේවිකාවක් සම්බන්ධයෙන් මෙවැනි සිදුධියක් මේ සභාවේදීම ඉදිරිපත් කළා. මට මතකයි. එයාගේ ස්වාමි පුරුෂයා ඒ ලියවිල්ල ඉදිරිපත් කර තිබුණේ. පස් වතාවක් එයාගේ සේවය නිම කරලා තැත්තම් ඒ සේවා ස්ථානයේ ඉන්න බැරිව ආපසු එන්න හැදුවාම තව හතර වතාවක් තානාපති කාර්යාලය එයා සේවයට යෙදුවා. සමහර විට වෙන තැනක සේවයට යොදනවා. එතැනින් ආවාම වෙනත් තැනක සේවයට යොදනවා. ගෙදර එන්න ඉල්ලුවාම ඉඩ දෙන්නේ නැහැ. ඒ විධියේ අකටයුතු සැහෙන්න සිදු වෙනවා. එයින් ඒ අය කරන්නේ ව්‍යාපාරයක්. ඒ කාර්යාලවල සිටින පිරිස් ආපසු එන්න ඕනෑය කියන සේවකයන් ගෙන ගොස් යම් තැනකට දී කොමිෂන් එකක් ලබා ගන්නවා. මෙන්න මේ නිසා සැහෙන පිරිසක් අතරමං වීමකට හා තමන්ගේ අයිතිවාසිකම් අහිමිවීමකට ගොදුරු වෙලා සමහර විට ඒ අයගේ තත්ත්වයටත් අපේ රටටත් තරක තමක් ඇති වන විධියට පවතින්නටත් සිදු වෙනවා.

ඒ නිසා විදේශ සේවාවන්හි නියුක්ත පිරිස පිළිබඳව මම විශේෂ ඉල්ලීමක් කරනවා. කම්කරු අමාත්‍යාංශය හැටියට ඒ රටවල දූතට යොදා තිබෙන වැඩ පිළිවෙළවල් තව දුරටත් පරීක්ෂා කරලා ඒ සේවකයන්ට සිදු වන අසාධාරණය ඉවත් කරන්න වැඩ පිළිවෙලක් යොදන්න කියන එකයි ඒ ඉල්ලීම.

අපේ ආසනවලට බලපාන ප්‍රශ්නයක් පිළිබඳවත් මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාට මේ පිළිබඳව දන්වන්න මට පුළුවන් වුණේ ලිපි මඟින් විතරයි. මෙය විශේෂයෙන්ම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පැවැත්වීම ගැනයි. එක් එක් ආසනයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන දෙකක් එක්කෝ තුනක් පවත්වනවා. මේසත් පුහුණු වඩු පුහුණු නැත්නම් වෙනත් පුහුණු මධ්‍යස්ථාන පවත්වනවා.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
ඒ ආසනයේ එකක්වත් නැද්ද ?

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
එහේ දන් නවත්වලා. මේකයි හේතුව. ඒ මධ්‍යස්ථාන පිහිටුවීමේදී ඒ සඳහා ලැයිස්තු පිළියෙළ කිරීම පිළිබඳ ප්‍රශ්නයක් මතයි එය තැවතී තිබෙන්නේ. ඒ වක්‍රලේඛය අනුව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු නියෝජිතය කරන ආසනයක ලැයිස්තු පිළියෙළ කළ යුත්තේ පලාතේ මන්ත්‍රීවරයාද, එහෙම නැත්නම් දිසා ඇමතිතුමාද කියන දෙපාර්ශ්වීය ප්‍රශ්නය මතයි, ඒක තැවතී තිබෙන්නේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட். பத்திரன)
(Mr. Richard Pathirana)
නිවුපු ඇමතිතුමාගේ කාලයේදී ඒ ප්‍රශ්නය අපි නිරාකරණය කර ගත්තා.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඔව්. ඒ කාලයේදී එය නිරාකරණය කරගෙන තිබුණා.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
නිරාකරණය කර ගත්තේ කොහොමද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
චක්‍රලේඛයේ සඳහන් විධියටම පළාතේ මන්ත්‍රීවරයා හැටියට ඉන්න කෙනාගේ නිර්දේශය අනුව කටයුතු කිරීමෙනුයි. ඒ නිසා ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
ඔනෑම ප්‍රශ්නයක් ලියුමකින් ඉදිරිපත් කළොත් ඇති.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
ඇත්ත වශයෙන්ම මේ වත විටත් ලියලයි, තිබෙන්නේ. විශේෂයෙන් නිදහස් වෙළෙඳ කලාපයේ සේවය කරන පිරිස්වලට, මේ රටේ අනෙකුත් සේවක කොටස්වලට තිබෙන අයිතිවාසිකම් ලබා දීම පිළිබඳව නැවත වතාවක් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවමින් මම නිහඬ වෙනවා.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේදී කරුණු කීපයක් ගරු ඇමතිතුමාගේත්, තියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානයට ලක් කරන්න මම අදහස් කරනවා. පළමුවෙන්ම, වර්තමාන කම්කරු ඇමතිතුමා ඒ ඇමති ධූරයට පත් වන්නත් කලින් සිටම මේ ගරු සභාවේදී වරින්වර ඉදිරිපත් කර තිබෙන ඉල්ලීමක් නැවත ඉදිරිපත් කරන්න කැමතියි.

ඒ, 1980 ජූලි වැඩ වර්ජකයන් පිළිබඳ ප්‍රශ්නයයි. මේ ප්‍රශ්නයට දැන් සෑහෙන කාලයක් ගත වී තිබෙනවා. තවමත් නැවත සේවයට කැඳවූයේ නැති වැඩ වර්ජකයන් රාශියක් ඉන්නවා, සමහර අමාත්‍යාංශවල. මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්ය භාරය පැවරී තිබෙන්නේ කම්කරු අමාත්‍යාංශයටයි. මම මේ ගරු සභාවේදී කියන්න ඕනෑ, ඒ වැඩ වර්ජනය ඉතා සාධාරණ වැඩ වර්ජනයක්ය කියා. ඒ කාලය වන විටත් වැඩි වී තිබුණු ජීවන වියදම් බර ඉසිලීමට ආධාරයක් වශයෙන් දවසකට රු. 10 ක අතිරේක ජීවන වියදම් දීමනාවක් හෙවත් මාසයකට රු. 300 ක පඩි වැඩිවීමක් ඉල්ලමිනුයි, ඒ වැඩ වර්ජනය ගෙන ගියේ.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)
තමුන්නාන්සේගේ පක්ෂය මේ සම්බන්ධයෙන් අදහස් දෙකක් දරනවා. ඒ දෙකෙන් මොකක්ද, හරි ?

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
කවුරු මොන අදහස් දැරුවත් මම මේ ගරු සභාවේදී පැහැදිලිව කියනවා, ඒ වැඩ වර්ජනය ඉතා සාධාරණ අයිතිවාසිකම් සඳහා කරන ලද වැඩ වර්ජනයක්ය කියා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)
ප්‍රශ්නයක් පැහැදිලි කර ගැනීමට පමණයි, මම කථා කරන්නේ. මතුගම ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංග මහතා) කියනවා, ඒ වැඩ වර්ජනය වැරදිය කියා.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
එතුමාට එතුමාගේ අදහස් පළ කරන්න පුළුවන්. ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ මගේ අදහස්. ඒ වැඩ වර්ජනය ඉතාමත් සාධාරණ එකක්ය කියන්න මට කාගේවත් අවසරයක් අවශ්‍ය වන්නේ නැහැ.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)
තමුන්නාන්සේ කියන්නේ තමුන්නාන්සේලාගේ පක්ෂයේ සාමූහික හැඟීමක් නොවෙයි ?

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
මම කියන්නේ ඒ වැඩ වර්ජනය ඉතාමත් සාධාරණ, මානුෂික අයිතිවාසිකම් සඳහා කරන ලද වැඩ වර්ජනයක්ය කියායි. ඒ නිසා කම්කරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මෙතෙක් සේවයට කැඳවා නොමැති සියලුම සේවකයන්ට නැවත රැකියාව ලබා දීම සඳහා කාරුණික වන්නය කියා.

ඊ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரோ)
(Mr. E. P. Paul Perera)
අපි දැන ඕන්න කැමැතියි, එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදහසද කියා.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
තමුන්නාන්සේ ඒ ගැන කලබල වන්න ඕනෑ නැහැ. පක්ෂයේ අදහසත් ඒකයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේත් ඒක සාධාරණ වැඩ වර්ජනයක්ය කියායි.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)
මතුගම ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේලාගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නොවෙයිද ?

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத්திரன)
(Mr. Richard Pathirana)
කරුණාකර මගේ කථාවට බාධා නොකර නිශ්ශබ්දව ඉන්න.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)
අපි අහන ප්‍රශ්නයට උත්තර දෙන්න.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
ඒ වැඩ වර්ජනයට සහභාගි වීම නිසා රැකියාව අහිමි වූ 1,000කට ආසන්න සංඛ්‍යාවක් මගේ ආසනයේ ඉන්නවා. ඒ නිසා කාරුණිකව ඒ අයට සාධාරණය ඉෂ්ට කර දෙන මෙත් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සමහර අමාත්‍යාංශ බොහොම කාරුණික මට්ටමින් මේ ප්‍රශ්නය විසඳා තිබෙනවා. ඒ ගැන ඒ අමාත්‍යාංශ භාර ගරු ඇමතිතුමන්ලාට අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් සමහර අමාත්‍යාංශ ඒ විධියට, වැඩ වර්ජකයන් නැවත සේවයට කැඳවා නැහැ.

උදාහරණයක් වශයෙන්, ගිංතොට තුඩ් ලැලි කර්මාන්තශාලාව පෙන්වන්න පුළුවනි. එහි සේවය කළ වැඩ වර්ජකයන් දෙසිය හැට ගණනක් ඉන්නවා. අද ඒ අයට ජීවත් වන්න ක්‍රමයක් නැහැ. සමහරු හැමදම උදේට බයිසිකලයෙන් හෝ පයින් හෝ ටවුමට එනවා. ඒ විධියට ටවුමට ඇවිත් හිඟාකෑමේ යෙදෙන අයත් ඉන්නවා. ඒ නිසා මෙය කාරුණික හදවතක් ඇතිව විසඳන්න තිබෙන ප්‍රශ්නයක් බව තේරුම් ගන්න ඕනෑ. තමුන්නාන්සේලා කියනවා, ඒ වැඩ වර්ජනය වැරදියි කියා. ඒක රජයේ අදහසයි. කවුරු ගෝ කියනවා නම් ඒ වැඩ වර්ජනය වැරදිය කියා, ඒක රජයේ අදහසක් අපි—ශ්‍රී ලංකා නිදහස් පක්ෂය—කියන්නේ නැහැ, ඒක වැරදි වැඩ වර්ජනයක්ය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)

Sir, I rise to a point of Order. The hon. Member is giving wrong information to this House. He says that the hon. Member for Matugama is a member of the Government Group. It is a wrong statement. I want to correct the record. He is misleading the House.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake – District Minister, Kandy)

Sir, I rise to a point of Order. All hon. Members of this House are expected to speak the truth and not misdirect this House.

ඒ. පී. පෝල් පෙරේරා මහතා
(திரு. ஈ. பீ. போல் பெரேரா)
(Mr. E. P. Paul Perera)

With great respect may I say this ? The hon. Member for Matugama is a respected Member of this House. Now the hon. Member for Akmeemana is saying that he is a member of the Government Group. That is a wrong statement.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
I did not say that.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

You continue with your speech. If the hon. Member for Matugama wants to come to the Government side, he is most welcome.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කඩුවෙල ගරු මන්ත්‍රීතුමා සමඟර කරුණු මේ සභාවේ ඇවිල්ලා බොහොම විකෘති කරන්න හදනවා. මම කිව්වේ රජය කියන්නේ මේ වැඩ වර්ජනය වැරදිය කියලයි. රජයේ මතය ඒක. අපි ඒ මතය අනුමත කරන්නේ නැහැ. නමුත් අපි කාරුණිකව ඉල්ලා සිටිනවා වැඩ වර්ජනයට සහභාගී වූ අයගේ රැකියා නැවත ලබා දෙන්න කියා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (නියෝජ්‍ය කම්කරු ඇමතිතුමා)
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா — தொழிற் பிரதி அமைச்சர்)
(Mr. M. Joseph Michael Perera – Deputy Minister of Labour)
මතුගම මන්ත්‍රීතුමා කියන්නෙත් අපි කියනදේම නේ ?

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒක එතුමාගේ මතයක්. මට ඒ ගැන කථා කරන්න දෙයක් නැහැ. ගරු සභාපතිතුමනි, අර්ථ සාධක අරමුදල් ලබා ගැනීමේදී සේවකයින්ට ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදුව වෙලා තිබෙනවා. මන්ද, කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් මහ බැංකුවට ලියුම් යවනවා, ඒවා ගෙවන්නටය කියා. අර්ථ සාධක අරමුදල් අධිකාරිතුමෙක් සිටිනවා, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් අංශයේ. එතැනින් තමයි, ගෙවීම් කරන්නෙ. මේ අංශයේ විශාල ප්‍රමාදයක් තිබෙනවා, මම පොද්ගලිකව දන්නවා, ඒ ගැන.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි, කම්කරු කොමසාරිස්තුමා මහ බැංකුවට යවා සති දෙකක් ඇතුළත මහ බැංකුවෙන් ගෙවනවා. එහි ප්‍රමාදයක් තිබෙනවා නම් තමුන්නාන්සේ අපිට දැනුම් දෙන්න අහවල් එක ප්‍රමාද වුණා කියා.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මම ඔබතුමාට කියන්න කැමතියි අර්ථ සාධක අරමුදලට රජය යටතේ පාලනය වන සමහර ආයතනත් ගෙවා නැහැ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

ඒක කොවෙයි නෙ කිව්වෙ. බැංකුවේ ප්‍රමාද වෙනවා කියා නේ.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ කියන නිසා මම ඒක පිළිගන්නවා. සුමාන දෙකෙන් ගෙවනවා කියා. රජය යටතේ පාලනය වන සමහර ආයතනත් අර්ථ සාධක අරමුදල් ගෙවන්නේ නැහැ, කම්කරුවන්ගෙන් කපා ගෙන. සිලෝන් සිල්ක්ස් ආයතනයේ අර්ථ සාධක අරමුදල් කපාගෙන ගෙවා තිබෙනවාද කියා තමුන්නාන්සේලා සොයා බලන්න.

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene – Maharagama)
ඒකත් හොරා කාලා ඉවරයි.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ පාලනය වන ඉඩම්වල ලක්ෂ 50, 60 තිබෙනවා අසරණ දුප්පත් කම්කරුවන්ගෙන් අර්ථ සාධක අරමුදල් කපාගෙන. ඒවා තවම ගෙවා නැහැ, මහ බැංකුවට. ඒ වාගේම රජය යටතේ පාලනය වන වතු අද තිබෙනවා, අර්ථ සාධක අරමුදල් කපාගෙන ඒ බවට කිසිම ලියවිල්ලක් කම්කරුවන්ට දී නැති. කම්කරු නීති බලපාන්න ඕනෑ ඒවාටත්. මේ පුද්ගලික අංශයේ තුන් හතර දෙනෙක්, හතර පස් දෙනෙක්, සේවය කරන අංශවලට පමණක් නොවෙයි, දහස් ගණන් අසරණ දුප්පත් කම්කරුවෝ වැඩ කරන රාජ්‍ය අංශයේ ඒවාටත් බලපාත්තට ඕනෑ කම්කරු නීති. ඒ ගොල්ලො වෙනත් වැඩ වලට මේ මුදල් යොදනවා.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
පසුගිය ආණ්ඩුව කාලයේ හැම වත්තකම එහෙම කළා.

රිවඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒ ආණ්ඩුව වේවා, මේ ආණ්ඩුව වේවා, කවුරු කළත්, වැරැද්ද වැරැද්දමයි. දුප්පත් කම්කරුවන්ගේ මුදල් අය කර ගෙන අරමුදලට ඒවා එව්වේ නැත්තම් ඒක වැරදියි. මම කලිනුත් කියා තිබෙනවා පසුගිය ආණ්ඩුව පරාජයට පත්වුණා. මහජනතාව කිව්වා අපට හොඳ එක්සත් ජාතික පක්ෂයයි කියා. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාජයට පත් කළා. තමුන්නාන්සේලාත් ඒ වැරැද්දම කරනවා නම් වැඩක් නැහැ නේ ?

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)
දැනුත් මහජනතා කියන්නේ ඒකයි. දැනුත් මහජනතාගේ තීරණය ඒකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

එහෙම හිතාගෙන ඉන්නවා තමුන්නාන්සේලා. ඒ 'මහජනයා නොවෙයි, මහා ජනයා

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

මේ රටේ මහජනතාව ඒකයි කියන්නෙ. මින්නේරියේ තීරණය ඒකයි. මුල්කිරිගල තීරණය ඒකයි, කුණ්ඩසාලේ තීරණය ඒකයි. සංවර්ධන සභා ජන්දයේ තීරණය ඒකයි. මේ රටේ පැවැත්වූ හැම ජන්දයකම තීරණය ඒකයි. තමුන්නාන්සේලා දෙදෙනාට පමණක් පොඩි චාන්ස් එකක් දී තිබෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

ලඟදී තමුන්නාන්සේටත් ඇමතිකමක් හම්බවෙයි. [බාධා කිරීම්]

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க)
(Mr. W. P. B. Dissanayake)

මට ඇමති කමක් හම්බවෙලා තිබෙන්නෙ. මම මේ රජයේ ඇමතිවරයෙක්. මට ආයෙත් දෙන්න ඇමතිකමක් නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ කැගහන්නෙ ලඟදී ඇමතිකම් කිහිපයක් දෙනවා කියා ආරංචියක් තිබෙන නිසයි.

ඊළඟට අර්ථසාධක අරමුදල් ගැන මම කථා කරන්න ඕනෑ. තුනී ලෑලි සංස්ථාවේ වැඩ වර්ජනය කළ සේවකයන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. කලින් තිබුණු ක්‍රමය අනුව, පොද්ගලික වෛද්‍යවරයෙකුගේ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළාම ඒ අයට අර්ථසාධක අරමුදල් නැවත ලබා දුන්නා. දැන් ඒක නතර කර තිබෙනවා. ඒක නතර කරලා සේවය කරන්න බැහැ කියලා රජයේ වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන්නය කියා තිබෙනවා. එහෙම නැත්නම් අර්ථ සාධක අරමුදල දෙන්නේ නැහැ. අර මිතිසුන්ට එක පැත්තකින් ගෙදර යන්නටය කියා රක්ෂා දෙන්නේ නැහැ. අනෙක් පැත්තෙන් කියනවා රජයේ වෛද්‍යවරයෙක් ගාවට ගිහිල්ලා සේවය කරන්න බැහැ කියා වෛද්‍ය සහතියක් අරගෙන එන්න කියා. ඒ අයගෙන් කපා ගන්න මුදල ඒ අයට ජීවත් වෙන්න ක්‍රමයක් නැතිව එන්න කියා. ඒ අයගෙන් කපා ගත්ත මුදල ඒ අයට ජීවත් වෙන්න ක්‍රමයක් නැතිව ඉල්ලන විට මෙහෙම කියන එක සාධාරණද කියා තමුන්නාන්සේ කල්පනා කර බලන්න. එක්කෝ ඒ අය රක්ෂාවට කැඳවන්න ඕනෑ. එහෙම නැත්නම් මේ මිතිසුන්ට අර්ථසාධක අරමුදල් ගෙවන්න ඕනෑ. තීති රීති පැත්තකට දමමු. මානුෂික ප්‍රශ්නයක් වශයෙන් ගනිමු. මේ සේවකයන් දෙසිය ගණනක් අස් කර ඉන්නවා. අර්ථසාධක අරමුදල් ඒ අයට ගෙවන්නේ නැහැ. මේක සාධාරණ නැහැ. එක්කෝ රක්ෂාව දෙන්න ඕනෑ. එහෙම නැත්නම් අර්ථසාධක අරමුදල් දෙන්න ඕනෑ.

නිදහස් වෙළඳ කලාපය ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) කරුණු කීපයක් සඳහන් කළා. නිදහස් වෙළඳ කලාපයට කම්කරු නීති සියල්ලම බලපාතවාය කියා ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. මම ඒ ගැන දැනගන්නට සතුටුයි. නමුත් ලැබෙන ආරංචි අනුව, සිදුවන දේ ගැන කල්පනා කර බැලුවාම මේ නීති නිදහස් වෙළඳ කලාපය තුළ ආරක්ෂා වෙනවාද කියන ප්‍රශ්නය ඇති වෙනවා. මම කියන්නම් නිදහස් වෙළඳ කලාපයට පමණක් නොවෙයි, රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ තිබෙන වතුවලත් මේ ප්‍රශ්න තිබෙනවා. මගේ ආසනයේ තිබෙන වතු ගැන පැහැදිලිවම මම දන්නවා. අත්තම් දෙකක් වැඩ කරන්න ඕනෑ, එක අත්තමක් ද ගන්න. වෙක් රෝලේ එක අත්තමක් දන්නේ අත්තම් දෙකක් වැඩ කළාමයි. සමහර තැන්වල කොටයක් වෙන් කර දෙනවා. මෙන්න මේ කොටය තෙළවායින් පස්සේ තමයි අත්තම දන්නේ කියනවා. සමහර කොටස්වල මොකද කරන්නේ ? දවස් දෙකක් වැඩ කළාමයි එක අත්තමක් දන්නේ. මම ඔප්පු කරන්නම්, මේක සාධාරණද ? මේක කම්කරු නීතිවලට අදාළද ?

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

ඒවා අපිට පැමිණිලි වශයෙන් ලැබුණාම ක්‍රියා කරනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

එම නිසා මේ තත්ත්වය නැති කරන්න ක්‍රියා කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

ඊළඟට මම සඳහන් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. වන්දි ගෙවන්නය කියා කම්කරු වන්දි විනිශ්චය සභාවල තීරණ දුන්නාම ඒ තීරණ ක්‍රියාත්මක කරන්නේ නැහැ. අවස්ථා ගණනාවකදී ඒක වෙලා තියෙනවා. මුදල්, සහකාර කම්කරු කොමසාරිස්වරයා ළඟට එවන්න ඕනෑ. රාජ්‍ය අංශයේ සිදුවන දේවල් ගැනයි මම මේ කියන්නේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විරුද්ධව සමහර කම්කරුවෝ නඩු දම්මා. කම්කරු වන්දි විනිශ්චය සභාව තීරණයක් දුන්නා, වන්දි ගෙවන්නය කියා. තමුත් වන්දි මුදල් ගෙවන්නේ නැහැ. තීන්දුවේ තිබෙනවා අසවල් දිනට කලින්, ඒ කියන්නේ යම් දිනක් තියමකොට එදිනට හෝ ඊට පෙර වන්දි මුදල් ගෙවන්නය කියා. ඒ මුදල් ගෙවන්නේ නැහැ. අන්න එවැනි ප්‍රමාදයන් තිබෙනවා. එම නිසා ඒවා කරුණාකර තීරණ කරන හැටියට මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 4.30

තවත් කාරණයක් ගැන තමුන්නාන්සේට සඳහන් කළයුතුව තිබෙනවා. තමුන්නාන්සේ දන්නවා, අපේ ආසනවල පුහුණු මධ්‍යස්ථාන තිබෙනවා. මේවායේ පුහුණුවන අයට ගෙවන්නේ දවසකට රු. 5යි. ඒක රු. 10ය කරන්නටය කියා අපි ගිය අවුරුද්දේත් ඉල්ලීමක් කළා. මේ රු. 5 ප්‍රමාණවත් වන්නේ නැහැ. ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් පුහුණුවන අයට රු. 10 ගෙවනවා.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

මම කීප වතාවක්ම බැලුවා, මේ මුදල රු. 15 කරන්න. නමුත් මුදල් හිඟය නිසා රු. 15 කරන්න බැහැ කියා අපිට දන්වා තිබෙනවා. රු. 10 ගෙවන එක පමණක්, ටවුම් බදව රු. 15 කරන ලෙස කියා තිබෙනවා. ඔය තත්ත්වයයි, තිබෙන්නේ. අපි බොහොම දුකින් මේක ගෙනියන්නේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

ඒක මම පිළිගන්නවා. තමුන්නාන්සෙගේ අමාත්‍යාංශයට මුදල් නැති බව මම පිළි ගන්නවා. ඔබතුමා කල්පනා කර බලන්න, ජාතික ආධුනිකත්ව මණ්ඩලය යටතේ නොයෙක් තැන්වල, ගරාජ ආදියෙහි පුහුණුවට අය අරගෙන තිබෙනවා. මොකක්ද මේ කම්හල් කාරයෝ කරන්නේ ? ඒ අයගෙන් වැඩ ගන්නවා. රු. 300ක් දෙනවා, ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්. කම්කරු අමාත්‍යාංශය යටතේ පුහුණු මධ්‍යස්ථානවලට රු. 10ක් දෙන්නට බැහැ කියා භාණ්ඩාගාරය කියනවා නම් ඒක විහිළුවක්.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

මේසන් වැඩ, වඩුවැඩ පුහුණු කරන මධ්‍යස්ථාන ගම්වල තිබෙනවා. ඒවායේ පුහුණු වන අය ගැනයි කියන්නේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

ගම්වල තිබෙනවා, ඇදුම් මැසීම, වඩු වැඩ, මේසන් වැඩ ආදී දේවල් පුහුණු කරන මධ්‍යස්ථාන. එක මධ්‍යස්ථානයක විසි දෙනෙක් පමණ පුහුණු කරනවා. එක් අයෙකුට දවසකට ගෙවන්නේ රුපියල් පහක් පමණයි. නමුත් ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ මාර්ගයෙන් නොයෙක් ආයතනවල පුහුණුව ලබන අය ගැන මම දන්නවා. එසේ පුහුණුව ලබන අයට ජාතික ආධුනිකත්ව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිවඩ් පතිරණ මහතා]

මණ්ඩලයෙන් දවසකට රුපියල් දහය ගණනේ ගෙවන්වා. එම නිසා කම්කරු අමාත්‍යාංශයේ මාර්ගයෙන් පුහුණුව ලබන අයට රුපියල් පහක මුදලක් ගෙවීම අසාධාරණයක්. සමහර කම්හල් හිමියන් වයස අවුරුදු 18 ටත් 22 ටත් අතර වයසැති ළමයින් බඳවා ගෙන තමන්ගේ කම්හල්වල වැඩ කටයුතු කරවා ගන්නවා. නමුත් මේ අයට පඩි ගෙවන්නේ ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්. එම නිසා ගම්වල පුහුණුව ලබන ඒ අයටත් ගෙවන මුදල වැඩි කරන ලෙස මම ඉල්ලා සිටිනවා. පසුගිය වතාවේත්, දිවංගත හිටපු කම්කරු ඇමතිතුමාගෙන්ද ඉල්ලා සිටියා මේ මුදල වැඩි කර දෙන ලෙසට. නමුත් ඒ ඉල්ලීම මෙතෙක් ක්‍රියාත්මක වුණේ නැහැ.

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කළ කම්කරුවන්ට වන්දි ගෙවීමේ ප්‍රශ්නය ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා කථා කළා. මහා මාර්ග අධ්‍යක්ෂතුමා විසින් යවන ලද වක්‍රලේඛය මොන තරම් අසාධාරණද කියා තමුන්නාන්සේ විකක් යොයා බලන්න.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

ඒක අපේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නොවෙයි. ගරු අගමැතිතුමා යටතේ ඇති මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන වේලාවේ ඒ ගැන කථා කරන්නට තිබුණා

රිවඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒ වැය ශීර්ෂය යටතේත් මම කථා කළා. නමුත් මූලික වශයෙන් මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට ක්‍රියා කරන්නට ඕනෑ කම්කරු අමාත්‍යාංශයයි. මා කලින් සඳහන් කළ වක්‍රලේඛයේ හැටියට බොහෝ දෙනෙකුට වන්දි මුදල් ලැබෙන්නේ නැහැ. එම නිසා යවා ඇති එම වක්‍රලේඛය කම්කරු නීතිවලට එකඟද කියා කරුණාකර සොයා බලන්න. කලක් තිස්සේ වැඩ කළ කෙනෙක් සේවයෙන් ඉවත් කරන විට, කිසිම මුදලක් නොදී නිකම්ම දෙවට දමන්නට පුළුවන්ද ? රජයේ ආයතනයක් වුණත් ඒ අන්දමට ක්‍රියා කරන්නට පුළුවන්ද ? එම නිසා මේ කාරණය ගැනත් සොයා බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි.

විදේශ සේවා නියුක්තිය පිළිබඳ පනතක් මේ සභාවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා. එමගින් විදේශ රැකියා නියෝජිත කාර්යාලවල වැඩ කටයුතු නීති මගින් පාලනය කරන්නට ඇමතිතුමා පියවර ගන්නා. එය සම්මත කරවා ගන්නට අපේ සහයෝගයත් දුන්නා. ඒ අතර යම් යම් දුර්වලතා ගැනත් අප සඳහන් කළා. මෙහිදී එක් කාරණයක් මතක් කරන්නට කැමතියි. විදේශ රැකියාවලට යැවීමට කැමැති අයවලුන්ගේ නම් ලැයිස්තුවක් සකස් කර එවන ලෙස කම්කරු අමාත්‍යාංශයෙන් මන්ත්‍රීවරුන්ට දන්වා තිබුණා. ඒ අනුව ඉල්ලුම්පත් ගෙනැවිත් හාර දුන් අය දැන් අපව සම්බන්ධ කරගන්නට ඇවිත් ඒ අයට පිටරට යන්නට ලැබෙන්නේ කවදද කියා අපෙන් විමසනවා. දැන් මේක අපටත් ලොකු ප්‍රශ්නයක් වී තිබෙනවා. ඒ අය දැන් සූට්කේස් ආදිය සූදානම් කරගෙන ලැහැස්ති වී සිටින්නේ පිටරට රැකියා සඳහා යන්නටයි. එහෙම නම් මේ සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය මොකක්ද කියා මම දැනගන්නට කැමතියි. ඇත්තෙන්ම එම ඉල්ලීම කරන විට මා ඉතාම සතුටට පත් වුණා. මොකද ? අපේ ආසනවල ඉන්නවා –

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

ඒ ගැන කරුණු පැහැදිලි කර දෙන්නට කැමතියි. සමහර අවස්ථාවලදී හදිසියෙන්ම වාගේ අපේ නියෝජිතයන් වන තාතාපතිවරුන්ගේ දෙවැනියා හෝ තුන්වැනියා හෝ අපට දන්වා එවනවා, මෙන්න මේ වාගේ පුරප්පාඩු මෙපමණ සංඛ්‍යාවක් තිබෙනවාය, ඒ රටවල රජය මේවාට සම්බන්ධකමක් නැත, එම නිසා පුළුවන්කමක් තිබෙනවා නම් නියෝජිත මහතුන් කැඳවා සාකච්ඡා කර, මෙම පිරිස වහාම එවීමට කටයුතු කරන්නය කියා හදිසියෙන්ම වාගේ මෙවැනි ඉල්ලීම් දෙක තුනක් ලැබී තිබුණා. මෙහිදී මම සිතුවා, එක් ආසනයකට හෝ දෙකකට සීමා නොකර මේක මන්ත්‍රීවරුන් අතර ආසන මට්ටමෙන් බෙදා දෙන්නට ඕනෑය කියා. ඒ අනුව මේසන් හෝ මොන කර්මාන්තයක් හෝ පුහුණුව ලැබූ අය ඉන්නවා නම් ඒ අයගේ සුදුසුකම් ඇතුළත් කර එවිවාම, එක් ආසනයකින් කීප දෙනෙකු හෝ යවන්නට හැකි වුණොත් එය මන්ත්‍රීවරුන්ට කරන සේවයක් හැටියට මම කල්පනා කළා. මම ඒ අතරම මන්ත්‍රීතුමන්ලාට දැනුම් දුන්නා, තම් සඳහන් කර ඇති උදවියට ඒ ගැන දන්වන්නට එපාය, කිසිම අන්දමක පොරොන්දුවක් දෙන්නට එපාය කියා. මෙවැනි තත්ත්වයක් තිබෙද්දී අපේ ගාල්ලේ මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා) 1,700 දෙනෙකුගේ නම් ඇතුළත් ලැයිස්තුවක් සකස් කළ බවක් ගැන ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබෙනවා. ඒකට මම මොනවා කරන්නටද ? සුළු උදව්වක් කරන්නට හදන විට ඒකෙන් වැරදි ප්‍රයෝජන ලබන්නට උත්සාහ කරනවා නම් ඒකට මම මොනවා කරන්නද ? ඒක වදින්න ගිය දෙවොලය ඔළුව උඩට කඩා වැටුණා වාගේ වැඩක්.

රිවඩ් පතිරණ මහතා
(திரு. நிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

එම ප්‍රතිපත්තිය ගැන ගරු ඇමතිතුමාට මම ස්තුති වන්න වෙනවා. මේ රටේ තිබෙන තත්ත්වය හැටියට විදේශ රටවල රැකියාවන්ට මෙරටින් පුද්ගලයන් යවන නියෝජිතයන් කරන්නේ පිටරටවලට තම නියෝජිතයන් යවා පුරප්පාඩු මොනවාදැයි සොයා බැලීමයි. පිටරටවල් සමඟ සම්බන්ධකම් ඇති කර ගන්නා එම නියෝජිතයෝ එරට ඇති පුරප්පාඩු සොය බලනවා. මේ අතර වංචනික ක්‍රියාවල යෙදෙන අයත් සිටිනවා. රුපියල් විසි අට දහසක් පිටරට රැකියාවක් ලබා ගැනීම සඳහා අය කර ගෙන, බොම්බාය දක්වා කැදවාගෙන ගිහින්, සති දෙකක් බොම්බායේ තනර කරගෙන සිට ආපසු මේ රටට ගෙනැවිත් ඇරලූ තරුණයන් කීප දෙනෙක්ම අපේ ආසනවල ඉන්නවා. මේ අය තමන්ගේ දෙමව්පියන් සතු ඉඩම් පවා උකස් තියලයි ගිහින් තිබෙන්නේ. මේ ක්‍රමය සහමුලින්ම පාලනය කරන්න ඕනෑ. අපි එද කිව්වෙත් එයයි. විදේශ රටවලට රැකියා සඳහා යවන්නය කියලා පුදුමාකාර මුදලක් මේ නියෝජිත ආයතන උපයනවා. ඒ අය රැකියාවල් සොයා දෙනවා නම් කමක් නැහැ. නමුත් සමහර අයව මහට යවනවා. බොම්බායට යවලා, බොම්බායෙන් දවස් ගණනක් නිකරුණේ රස්තියාදු කරවලා, ඉන් පසුව ලංකාවට ගෙන්වලා, මිගමුවේ හෝටලයක තවත් සුමානයක් නියාගෙන ඉඳලා ඉන්පසුව ගෙදර ඇරියා. එකසිය ගණනකට පමණ මෙවැනි තත්ත්වයක් ඇති වුණා. මෙය කම්කරු අමාත්‍යාංශය මඟින් පාලනය කරන්න ඕනෑ.

මේ විධියට නියෝජිත ආයතන අසාධාරණ විධියට මුදල් අරගෙන මේ රටේ තරුණ තරුණියන් මංමුලා කර තිබෙනවා. අද සමහර අයට යන්න එන්න තැනක් පවා නැහැ. එම නිසා මේ කටයුතු පිළිබඳව දැඩි පාලනයක් කරන්නය කියා ඉල්ලා සිටින අතර, හැකි තරම් දුරට කම්කරු අමාත්‍යාංශය මඟින් විදේශ සේවා නියුක්තියට තරුණ තරුණියන් යවන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

අ. භා. 4.38

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ අර්ථසාධක අරමුදල් වැඩපිළිවෙල පිළිබඳවයි. අපි කවුරුත් දන්නවා. මේ රටේ පෞද්ගලික අංශයේ සහ සංස්ථා අංශයේ සේවකයන් පිළිබඳව තියම සාමාජයීය සුරක්ෂිතභාවයක් නැති බව. අපි කොයි තරම් දුරට අර්ථසාධක අරමුදල් වැඩපිළිවෙල ඇති කළත් අවුරුදු 55 අවසන් වන විට, එහෙම නැත්නම් වෛද්‍ය හේතූන් මත මේ සේවකයන් බොහොමයක් ඒ අයගේ අර්ථසාධක අරමුදල් ලබා ගන්න බව අපි කවුරුත් දන්නවා. සේවකයාගේ අවුරුදු 55 අවසන් වෙලා අර්ථසාධක අරමුදල් ලබා ගන්නා අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම ඒ මුදලේ වටිනාකම අතිවිශාල ලෙස අඩු වී තිබෙන බව රහසක් නොවෙයි. ඒ අවස්ථාවේදී ඒ මුදල්වලින් කරන්න පුළුවන් වැඩ ප්‍රමාණය අඩුයි. ඒවාගේම අවුරුදු 55 අවසන් වූ පසුව ඒ සේවක මහත්මයා තමන්ගේ අර්ථසාධක අරමුදල් අතට ගත් පසුව ටික කලකින් ඒ මුදල් සියල්ලම ඔහුට වියදම් වෙනවා. ඉන්පසුව ඒ සේවක මහත්මයා ජීවත් වෙන්න ක්‍රමයක් නැතිව බොහොම දුක් විඳිනවා. මේ තත්ත්වයට පත්වූ සේවකයින් අතිවිශාල ප්‍රමාණයක් සිටිනවා. මේ තත්ත්වය වැළැක්වීම සඳහා දැන් තිබෙන අර්ථසාධක අරමුදල් ක්‍රමය වෙනස් කර මේ රටේ ලක්ෂ 35 ක පමණ අර්ථසාධක අරමුදලේ දායකත්වයක් තිබෙන සේවක මහතුන් පිළිබඳව තියම සාමාජයීය සුරක්ෂිත භාවය ඇති කිරීමේ වැඩපිළිවෙලක් යෙදීම සුදුසුයි කියලයි මගේ හැඟීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ අනුව ගරු ඇමතිතුමාත්, මමත් වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ වැඩපිළිවෙල ලබන වර්ෂයේදී ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ අර්ථසාධක අරමුදල් යම්කිසි ඇපයකට තබන්න පුළුවන්නම්, එහෙම නැත්නම් ඒ මුදල් ණයක් වශයෙන් ඒ සේවකයාට පාවිච්චි කරන්න පුළුවන් නම් අද සැහෙන වැඩ කොටසක් ඒ සේවක මහත්මයාට කරගන්න පුළුවන් බව තමුන්නාන්සේලා, කවුරුත් දන්නවා. මම එක උදාහරණයක් තමුන්නාන්සේලාට දෙන්න කැමතියි. අපි හිතමු, රුපියල් දහදහක සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයක් තිබෙන සේවක මහත්මයෙක් ඉන්නවාය කියලා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා රද්දොළුවේ නිවාස යෝජනා ක්‍රමයක් ඇති කළා. රුපියල් දහදහක් පළමුවෙන්ම ගෙවලා ඉන්පසුව මාස්පතා රුපියල් සියය බැගින් කුලී වශයෙන් ගෙවීමේ පදනම පිට ගන්න පුළුවන් ගෙවලුත් එම යෝජනා ක්‍රමයේ තිබුණා. අපට පුළුවන්කමක් තිබුණා නම් මේ අර්ථසාධක අරමුදලේ දායකත්වය තිබෙන ඒ සේවකයන්ට රුපියල් දහදාහක් මේ මුදලින් ගෙවා ඒ ගෙවල් ලබා ගන්න අවස්ථාවක් දෙන්න. ඒ ගෙවල් දෙදහස් ගණනක මේ අරමුදලේ දායකත්වය තිබෙන කම්කරුවන්ට ලබා ගන්නට තිබුණා. අපි ඊටත් වඩා ටිකක් එහා පැන්නට ගිහිත් බැලුවොත් අපේ ගම් ප්‍රදේශවල, අර්ධ නාගරික ප්‍රදේශවල රජයේ ඉඩමක්, පොදුගලික ඉඩමක්, පර්චස් 10 ක පමණ ඉඩමක් රුපියල් දහදාහකට පමණ අද ගන්න පුළුවන්. මෙයින් ටිකක් අපට දෙන්න පුළුවන් නම් ඒ මුදල් ටික යොදවා ඉඩමක් ගත්තොත් මේ සේවකයාගේ අද වයස අවුරුදු 30 නම් අවුරුදු 55 ක් වන විට — තව අවුරුදු 25 කට පසුව — ඒ ඉඩමේ වටිනාකම කීයක් වෙයිද ? එදට වුවමනා නම් විකුණන්න පුළුවන්. එහෙම නැත්නම් විශාල වටිනාකමක් ඇති වස්තුවකට උරුමක්කාරයෙක් බවට ඔහු පත් වෙනවා, මෙයින් ඔහුට ණය මුදලක් දෙන්නට කටයුතු සූදානම් කරන්නට අපට පුළුවන් නම්.

අතික් පැත්තෙන් මේ සේවක අර්ථසාධක අරමුදලට යමෙක් අවුරුදු 5ක් දායක වී තිබෙනවාය කියා අපි හිතමු, ඊට පසුව ඔහු හදිසියේම මිය යනවා. ගෙවූ දායක මුදලත් පොළියත් ඔහුට ලැබෙනවා. එයින් එහාට ඔහුගේ දරු පවුලට ජීවත් වෙන්න මාස්පතා යමක් හෝ වෙනයම් වත්දි මුදලක් හෝ ලැබෙන්නේ නැහැ. අද රුපියල්100 ක්උපයන කෙනෙක් ස්ථිර වශයෙන්ම මේ අර්ථසාධක අරමුදලට දායක වන කෙනෙක් රුපියල් 20 ක්—සියයට 20ක්— ඉන්සූරි කරන බව අපි දන්නවා. රුපියල් 500 ක් ලැබෙන කෙනෙක් නම් ඒවාගේ පස් ගුණයක් ඉන්සූරි කරනවා. ඒ මුදල මාස්පතා රක්ෂණ ක්‍රමයකට යොදවන්න පුළුවන් නම් ඔහුට හදිසි අනතුරක් සිදු වුණොත් ඔහුට විශාල මුදලක් ලබා ගන්නට පුළුවන් වෙනවා. අපි වෙනම රක්ෂණ සංස්ථාවට යවන්නෙත් නැතිව එවැනි රක්ෂණ ක්‍රමයක් මේ අර්ථ සාධක අරමුදල් මණ්ඩලය මඟින් ඇති කරන්න පුළුවන් නම් මේ රටේ ජනතාවට විශාල සහනයක් ඇති වෙනවාය කියා මම හිතනවා.

අද මේ වැඩපිළිවෙල යටතේ සමහරවිට සේවක අර්ථසාධක අරමුදල් ලබන එක පවුලේ දෙතුන් දෙනා ඉන්නවා. ඔවුන්ගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු කර ගන්නට යම්කිසි වැඩපිළිවෙලක් සකස් කර ගන්නට ඔවුන්ට මුදලක් වුවමනා වී බැංකුවට ගියාම එකපාරටම අහන්නේ ඇපය ගැනයි. ඇපය මෙතැන තිබෙනවා. ඔහුගේ නමින්, ඔහුගේ පවුල නමින් අර්ථසාධක අරමුදල් මණ්ඩලයෙන් ඇපය තබනවා. වෙන කිසිම ඇපයක් නැතිව යම්කිසි ව්‍යාපාරයක් කරන්න ගමේ බැංකුවකින් ණය මුදලක් ලබා ගන්නට ඔහුට අවසර දුන්නොත් ඒ ණය මුදල ලබාගෙන අර ව්‍යාපාරය දියුණුකරගන්නට ඔහුට පුළුවන්. [බාධා කිරීමක්]

වෛද්‍යවාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில் — ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)

තමුන්නාන්සේ අවසර නොදෙන්නේ ඇයි ඉතින් ?

අ. හා. 4.45

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මම හිතන විධියට ගරු දිසා ඇමතිතුමා ටිකක් පරක්කුවෙලයි ඇවිත් තිබෙන්නේ. මුල ඉඳලාම කථාවට ඇහුම්කන් දුන්නා නම් වඩා වැදගත්ය කියා මම හිතනවා.

මම විශේෂයෙන් තමුන්නාන්සේලා සියලු දෙනාගේම අවධානය යොමු කරවන්නේ මෙන්න මේ කාරණයටයි. මේ රටේ ජනතාවගෙන් ලක්ෂ 35 ක් වූ කම්කරුවන්ට අයිති රුපියල් දස ලක්ෂ 16,000 ක පමණ අරමුදල් මේ මණ්ඩලයේ තිබෙනවා. අතිවිශාල මුදල් සම්භාරයක්. ඒ මුදල් කම්කරු ජනතාවගේ ප්‍රයෝජනයට ගැනීමේදී අද ඒ පිළිබඳව කම්කරු ජනතාවගේ විශ්වාසය අඩු වී තිබෙනවා. එය අපි කියන්නට ඕනෑ. ඒ විශ්වාසය තහවුරු කරන්නට මේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කළොත් වැරදී විධියට මේ අරමුදලින් මුදල් ලබා ගැනීමෙන් වැළකෙන අතර මීට දායකත්වය වැඩි කර ගන්නට උනන්දු වීමට කම්කරුවන් අභිවාර්යයෙන්ම ඉදිරිපත් වෙනවා. මේ අරමුණු ඉෂ්ට කරගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කළ බව මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන් හම්බන්තොට ගරු දිසා ඇමතිතුමාටත් ඒ බව මතක් කරන්නට ඕනෑ. පළමුවෙන්ම තමන්ගේ අරමුදල පිළිබඳව ඔවුන්ට සහතිකයක් තිකුත් කිරීම ඒ වැඩපිළිවෙළයි. සේවකයාගේ ගිණුමේ තිබෙන මුදල් පිළිබඳව, පොළිය පිළිබඳව මේ සහතිකය අද යන්නේ කාටද ? මේ සහතිකය යන්නේ ස්වාමියාටයි. ස්වාමියා හරියට දායකත්වය කරන්නේ නැත්නම් ඔහු මේ රහස තබාගෙන ඉන්නවා, සේවකයාට දෙන්නේ නැහැ. දැන් අපි මේ පොත තිකුත් කරන්නේ කාටද ? සේවකයාටයි. දැනට අපි මේ පොත් එක්ලක්ෂ තිස්දහක් තිකුත් කර තිබෙනවා. 1986 අවසාන වන විට මේ ලක්ෂ තිස්පහටම පොත් තිකුත් කර අවසාන කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙය ඉතා වැදගත් දෙයක්. මේ වැඩ කටයුතු අපි කරන්නේ කොම්පියුටර් එකකින් නොවන බව මතක් කරන්න ඕනෑ. අපේ තිබෙන වාර්තා අනුව අපේම ලිපිකරු මහත්වරු මේ පොත්පත් සකස් කර ඒ සේවකයන්ට බාර දෙනවා.

මේ පොතේ රහස් කීපයක් සඳහන් වී තිබෙනවා. ඒවා අපි මුලින් සඳහන් කළා නම් නොයෙක් තැන්වලින් අපිට විරුද්ධවාදිකම් එනවා. මොනවාද මේ රහස් කීපය ? සේවකයාට යම්කිසි අවස්ථාවක තමන්ගේ වැටුප පිළිබඳ ප්‍රශ්නයක් ආවොත් "සහතික හොයන්න බැහැ, පොත් පුච්චලා" කියන අවස්ථා තිබෙනවා. පොත් පුච්චලා තිබෙන නිසා 1977ට කලින් වතුවල සේවය කළ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල් පිළිබඳව සොයන්නට බැහැ කියා කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) අද මතක් කළා. නමුත් අවුරුදු පහා ඔහුට ලැබෙන අර්ථසාධක අරමුදල් පිළිබඳව මහ බැංකුවේ වාර්තා අනුව මෙපමණ මුදලක් තිබෙනවාය කියා මේ පොතේ සඳහන් වෙනවා නම් — අපි හිතමු මාසයකට රුපියල් විස්සක් අරමුදලේ තැන්පත් වුණාය කියා. එවිට පඩිය රුපියල් සියයයි කියා අපි දන්නවා — ඔහුගේ වැටුප පිළිබඳ විස්තරයක් එයින් ලැබෙනවා. මේ සහතිකය ඕනෑම තැනකට පාවිච්චි කරන්න පුළුවන්. අර්ථසාධක අරමුදල් පිළිබඳව මහ බැංකුවෙන් මේ පොතට ඇතුළත් කරන සහතිකය ඔහුගේ පඩිය පිළිබඳව සහතිකයක් වෙනවා. ඔහුගේ ඉපැයුම් පිළිබඳව සහතිකයක් වෙනවා. සේවකයෙක් තැන් කීපයක වැඩ කරන්න පුළුවන්. නමුත් පළමුවැනි වරට ඔහු සේවයට බැඳුණු දිනය මේ පොතේ සඳහන් වෙනවා. වෙන කිසිම සාක්ෂියක් නැතත්, මේක සාක්ෂියක් හැටියට ඕනෑම තැනකට ඉදිරිපත් කරන්න පුළුවන්.

මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු "මට මෙපමණ මුදලක් — වත්කමක් — තිබෙනවා" කියා බැංකුවකට වුවත් යාක්ෂියක් හැටියට මේ පොත පෙන්වීමට ඒ සේවකයාට පුළුවන් වෙනවා. මෙන්න මේ වැඩ කටයුත්ත අපි සම්පූර්ණ කරන තෙක් මුළු රටෙම ඉන්න ජනතාව මෙයට සම්බන්ධ කරගන්න අපිට අමාරුයි. මේ පොත් දී අවසාන වුණාම රටේ ඉන්න හැම සේවකයාටම අර්ථසාධක අරමුදල් ලැබෙනවාය කියා යහතික වෙන්න පුළුවන්ය කියා අපි කියන්නේ නැහැ. අපේ තිබෙන සංඛ්‍යා ලේඛන අනුව අර්ථසාධක අරමුදල් පොත් බෙදී අවසන් කර ඒ පොත් නොලැබූ කෙනෙක් ඉන්නවා නම් ඒ පිළිබඳව අපට වාර්තා කරන්න කියා දිස්ත්‍රික් මට්ටමින් හැකි පමණ ප්‍රචාරයක් දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා. අද අපිට මොකක්ද කරන්නට සිදුවී තිබෙන්නේ ? ඒ පිළිබඳව සෝදිසි කරන්න නම් අපේ කම්කරු නිලධාරීන් එවැනි ආයතන විශාල සංඛ්‍යාවකට යවන්නට වෙනවා. සභාපතිතුමනි, ඒ සඳහා ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් අපිට නැහැ. හාණ්ඩාගාරයෙන් දෙන්නෙත් නැහැ. දැන් මේ පොත ගැන ප්‍රචාරයක් කළාම මේ පොත තොලැබුණු හැම කෙනෙක්ම මේ පොත ඉල්ලා අපේ කාර්යාලවලට එන්නට පටන් ගන්නවා. මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන විට, "මේක ගෙයක් ගන්නට, ඉඩමක් ගන්නට, රක්ෂණ ක්‍රමයක් ඇති කර ගන්නට, බැංකුවකින් ණයක් ගන්නට හැකි ක්‍රමයක්, මේ වාසිය අපට නැහැනේද ?" කියා මේ රටේ කම්කරු ජනතාව මේ පොත් නොලත් කම්කරු ජනතාව —ඇස් අර බලනවා ; විශාල උද්ඝෝෂණයක් කරන්න පටන් ගන්නවා. මේ වැඩ පිළිවෙළ සාර්ථක කරගත්තාම නිවාස සැදීම සඳහා, රක්ෂණ ක්‍රමයක් සඳහා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

බැංකුවකින් ණය ගැනීම වැනි කාර්යයක් සඳහාත් මෙය පිරිසිදු වැඩ පිළිවෙලක් හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්. මේ පිළිබඳව මම හිතන්නේ අපේ මහනුවර ගරු දිස්ත්‍රික් ඇමතිතුමාට වැටහී යන්නට ඇති අපේ බලාපොරොත්තු. අපි එය පටන් අරන් තිබෙනවා. ඒවා ක්‍රමානුකූලව ගෙන යන්නට ඕනෑ. ඒවා ලබන අවුරුද්දේ ක්‍රියාත්මක කරන්නට අප බලාපොරොත්තු වෙනවා.

සේවක අර්ථසාධක අරමුදල ගැන තමුත්තාන්සේලාට විස්තර සපයා තිබෙනවා. ඒක ඉතා වැදගත්. කඩුවෙල මන්ත්‍රීතුමාත් (ඊ. පී. පෝල් පෙරේරා මහතා) තමුත්තාන්සේලාට ඒ ගැන ප්‍රකාශ කළා, සේවක අර්ථසාධක අරමුදලට 1977 දී අපට ලැබුණේ දශලක්ෂ 305.82යි. 1985 ඔක්තෝබර් මාසය වෙන තෙක් අපට ලැබුණු සම්පූර්ණ මුද් ප්‍රමාණය දශලක්ෂ 1,591.78යි. මේකට හේතු කිහිපයක් තිබෙනවා. ඒ හේතු තුළ සේවකයින්ගේ පඩි වැඩිවීම එකක්. නොයෙක් ආකාරයට පඩි වැඩි වුණා. ඒ වාගේම පඩි ඒකාබද්ධ කළා. ඒ වැඩිවීම් මේකට හේතුවක් වුණා. ඒ වගේම රැකියා අවස්ථාවත් වැඩි වුණා. මෙම මුදල වැඩි වීමට එයත් හේතුවක් වුණා. ඊළඟට වැදගත්ම දේ, අපේ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරු අමාරුකම් මධ්‍යයේ විශේෂ උත්සාහයක් ගත්තා කම්කරුවන් වෙතුවෙන් අර්ථ සාධක මුදල් නොගෙවන ආයතන සොයා, ඒවා අය කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කරන්න. ඒ ගැන අපි ඒ අයට ස්තුති කරන්න ඕන. ඒ හේතු නිසා ක්‍රමක්‍රමයෙන් මේ වැඩ පිළිවෙල අද දියුණු වී තිබෙනවා.

ඒ වගේම මම මතක් කරන්නට සතුටුයි, 1977 වර්ෂයේදී මේ අරමුදලට ලැබුණු පොලිය 7 1/2%යි. 1984 සිට 12 1/2%ක පොලියක් මේ සඳහා ලැබෙනවා. මම හිතන්නේ ඒකත් වැදගත් ප්‍රතිපත්තියක්ය යන්නයි. මම නැවතත් මතක් කරන්න සතුටුයි, මෙම අරමුදලේ දැන් කම්කරුවන්ගේ මුදල් රුපියල් දශ ලක්ෂ 16,000කට ආසන්න ප්‍රමාණයක් තැන්පත් වී තිබෙන බව. එමනිසා මේක ඉතාමත්ම වැදගත් වැඩ පිළිවෙලක්.

අපි දන්නවා සමහර තැන්වල ප්‍රශ්න තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීවරු ප්‍රශ්න මතු කළා, අර්ථ සාධක අර මුදල් නොගෙවන තැන් පිළිබඳව. අපි එය දන්නවා. අපි තමුත්තාන්සේලා සියලු දෙනාගේම උදවු උපකාර බලාපොරොත්තු වෙනවා. එහෙම ස්ථාන තිබෙනවා නම් අපට දන්වන්න. එහෙම දැනුම් දුන්නොත් වහාම අපට ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙන්න පුළුවන්.

අර්ථ සාධක අරමුදල් ලබාගැනීමේ ප්‍රමාදයත් ගැන අපේ සමහර මන්ත්‍රීවරු සඳහන් කළා. අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක සාධාරණ වෙන්න පුලුවන් ; අසාධාරණ වෙන්නත් පුලුවන්. මම ඒක මතින්නට යන්නේ නැහැ. නමුත් වැරදි මාර්ග වලින් මේ මුදල් ආපසු ලබාගන්නට උත්සාහ කරනවා. අර්ථ සාධක අරමුදල් පනත අනුව, මේ මුදල් ලබාගන්නට පුළුවන් වන්නේ ස්ථිර දුබලතාවයක් තිබෙනවා නම් පමණයි. එම දුබලතාවය ඔප්පු කිරීම සඳහා වෛද්‍ය සහතික ලබාගන්න බව අපි දන්නවා. සමහරු ඒකට මුදල් ඉල්ලන බවත් එම එම මුදලෙන් දියයට ගණනක් ඉල්ලන බවත් අපි දන්නවා. ඒ අත්දමට අති විශාල මුදලක් ආපසු දෙන්නට සිද්ධ වෙලා තිබෙනවා. මේ පිළිබඳව කම්කරු ඇමතිතුමා දැඩි පියවරක් අරන් තිබෙනවා. මම ඒක සියයට සියයක්ම අනුමත කරන්නේ නැහැ. මොකද, ඒ දැඩි පියවර නිසා කම්කරුවෝ අනවශ්‍ය පිළිවෙලට තව තවත් වැඩිපුර මුදල් දීල මේ වෛද්‍ය සහතික ලබාගන්න යොමු වෙන්න පුලුවන් නිසයි. කෙසේ වෙතත් අනවශ්‍ය විධියට මුදල් ආපසු ලබා ගැනීම නම්, මම හිතන්නේ අපේ මේ ඉදිරි වැඩපිළිවෙලට බාධාවක් වෙන්න ඉඩ තිබෙනවා කියායි.

තමුත්තාන්සේලාගේ අදහසක් තිබෙනවා නම් මේ මුදල් ආපසු ඉල්ලන සියලුම අයදුම්කරුවන් වෛද්‍ය මණ්ඩලයකට යොමු කරනවා කියා ඒක වැරදියි. වෛද්‍යවරුන් විසින් ඉදිරිපත් කර ඇති සැක සිතෙන වෛද්‍ය සහතික තිබෙන ඉල්ලුම් පත්‍ර පමණක් වෛද්‍ය මණ්ඩලවලට යොමු කරන්නට අපි වැඩ පිළිවෙලක් සකස්කර තිබෙනවා. නමුත් "අපි දන්නවා මේ අසතීපකරුගේ අමාරු තත්ත්වය ගැන, ඒක නිසා මේ අයදුම්පත සළකාබලන්න" කියා, තමුත්තාන්සේලා විශේෂ ඉල්ලීමක් කළ අවස්ථාවක අපට ඒ ගැන වහාම ක්‍රියා කරන්න පුලුවන්.

ඒ වාගේම තමුත්තාන්සේලාට මතක් කරන්න ඕනෑ, ආපසු අයකර ගැනීම්වලදී, නඩු පැවරීම්වලදී අපි විශාල ප්‍රගතියක් ලබා තිබෙන බව. දැනට, අවුරුද්දකට වැඩි කාලසීමාවක් ඒ මුදල් ප්‍රමාද කළොත් සියයට 50ක අය කිරීමක් කරන්න මේ අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කර තිබෙනවා.

ඒ වාගේම තමුත්තාන්සේලා දන්නවා මීට කලින් අවුරුදු 55ට වැඩි කෙනෙක් සේවයට බැඳුණොත් අර්ථසාධක අරමුදලට දායකවීමක් කෙරුනේ නැති බව. නමුත් දැන් අවුරුදු 55ට වැඩි කෙනෙක් සේවයට බැඳුණත් ඔහුට එම අරමුදලේ දායකත්වය ලබාගැනීමට හැකිවනයේ අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කර තිබෙනවා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

මේ සම්බන්ධයෙන් මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ මුදල තැන්පත් කර තිබෙන්නේ කම්කරුවායි. ඒ කම්කරුවන්ට ආබාධයක් වී තිබෙනවානම්, නැවත වරක් රැකියාව කරන්න බැරිනම් අවුරුදු 55 වනතුරු ඉන්නෙ නැතිව ඒ මුදල ආපසු දීමෙන් සිදුවන හානිය මොකක්ද ? අවුරුදු 55වන විට ඒ මිනිහ සමහර විට මැරෙන්නත් පුළුවන්. එතකොට කොහොමද ඒ මුදල ඔහු ලබාගන්නෙ ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

ස්ථිර දුබලතාවක් තිබෙනවා නම් අවුරුදු 55 වන්න කලින් දෙනවා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ඔව්, ඒක ගන්න ටිකක් අපහසුකම් තිබෙනවා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

නැහැ. ස්ථිර දුබලතාවක් තිබෙන බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර එය ලබාගන්න පුළුවනි.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

වෛද්‍ය සහතිකයක් දී තිබෙනවා. රජයේ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළාම අපහසුවකින් තොරව ලබාගන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මම පැහැදිලි කළේ වැරැදි විධියට මුදල් ගන්න වෛද්‍ය සහතික ඉදිරිපත් කළ අවස්ථා ඕනෑ තරම් තිබෙන බවයි.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ඒ වුණත් ඒ කම්කරුවාගේ මුදල් කම්කරුවාගේ අවශ්‍යතාවටයි ඒ මුදල කම්කරුවා විසින් ලබාගත්තේ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

එහෙම තම් මේ පනත සම්පූර්ණයෙන් වෙනස් කරන්න ඕනෑ. ඕනෑ වෙලාවක ඉල්ලුවාම ඒ මුදල දෙන්න කියලා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

අවශ්‍ය නම් එහෙම වෙනස් කර හෝ දීම සුදුසුයි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

මම කිව්වෙ මෙන්න මෙහෙම ප්‍රමාදයක් ගැනයි. ලබ්බූවෙ රජයේ ගොවිපලේ සේවකයො මුලින් අර්ථසාධක අරමුදලේ දායකත්වය යටතේ සිට ඉන් පසු ඔවුන් විශ්‍රාම වැටුප් තත්ත්වයට පත් කළා. ඉන් පසු ඔවුන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අර්ථසාධක අරමුදලේ මුදල් ආපසු ලබාගත්ත පුළුවන්. නමුත් ඒ මුදල් ලබා ගැනීමට නොහැකි වූ සැහෙන පිරිසක් ඒ ගොවිපලේ ඉන්නවා. මිට හේතුව වී තිබෙන්නේ පෙරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (වැටුප්) මේ මුදල් අය කර ගෙන ඇති නමුත් නම් වැරදීම් ආදී හේතු නිසා මේ මුදල් නියම තැනට යවා නැහැ. දැන් අවුරුදු දෙක තුනක්ම පසු වී තිබෙනවා. නවම මුදල් ගන්න පිළිවෙලක් සැලසී නැහැ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

නමුත්නාත්සේ ඒ විස්තර ටික මට ඉදිරිපත් කරන්න. මාසයක් ඇතුළත මම එය වියදා දෙන්නම්.

දැන් නමුත්නාත්සේලාට තේරෙනවා ඇති මේ වැඩ පිළිවෙල යටතේ විශාල ප්‍රගතියක් මේ කාල පරිච්ඡේදය තුළ එනම්, 1977 සිට 1985 දක්වා කාල පරිච්ඡේදය තුළ ඇති වී තිබෙන බව.

මම නමුත්නාත්සේලාගේ අවධානය විශේෂයෙන්ම යොමු කළේ මේ රටේ කම්කරු ජනතාවට තියම සමාජ සුභ සාධනයක් වශයෙන් තිබෙන්නේ මේ අර්ථසාධක අරමුදල් වැඩ පිළිවෙල පමණක් බව පැහැදිලි කිරීමටයි. අද කාටද පුළුවන් වැඩ කරන කම්කරුවකුගේ ශරීර සෞඛ්‍යය ගැන හරියට සහතිකයක් දෙන්න? තමන් ළඟ වැඩ කරන කම්කරුවා හොඳ ශරීර සෞඛ්‍යයෙන් ඉන්නවාය කියලා සහතිකයක් දෙන්න පුළුවන් කාටද? කිසිම කෙනෙකුට බැහැ. නමුත් ඒ කම්කරු ජනතාව වෙනුවෙන් අද මේ අරමුදලේ රුපියල් දස ලක්ෂ 16,000ක් තිබෙනවා. අපට මේ මුදල මේ සඳහා පාවිච්චි කරන්න බැරිද?

අවුරුදු 55කට පස්සේ මුදලේ වටිනාකමකුත් නැතිව දෙන එක, එහෙම නැත්නම් ස්ථිර දුබලතාවක් වෙනුවෙන් දෙන එක විතරක් නම් මේකෙ පරමාර්ථය මම හිතනවා වගම අපි මේ අර්ථසාධක අරමුදල් වැඩ පිළිවෙල වෙනස් කරන්න ඕනෑය කියා. ඒ වෙනස් කිරීම සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වී තිබෙනවා. මම ප්‍රාර්ථනා කරනවා ලබන වර්ෂයේදී මේ වැඩ පිළිවෙල සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කර මේ පාර්ලිමේන්තුවට ඇවිත් අපට සතුට ප්‍රකාශ කරන්න පුළුවන් වේවි කියා.

අ. හා. 5

මේ අංශ ගැන මම මීට වඩා කථා කිරීමට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. කම්කරු අමාත්‍යාංශයේ වෙනත් අංශ ගැන කරන ලද විවේචන පිළිබඳව ගරු ඇමතිතුමා පිළිතුරු දෙනවා ඇති.

තව එක කාරණයක් මම මතක් කරන්න කැමතියි. නිදහස් වෙළඳ කලාපයේ අඩුපාඩු රාශියක් තිබෙනවාය කිව්වා. අඩුපාඩු තිබෙනවා, නැත්තෙ නැහැ. අපි ඒක පිළිගන්න ඕනෑ. මට මතකයි 1976 දී මම මන්ත්‍රී වුණ හැටියෙම — නමුත්නාත්සේලාගේ ආණ්ඩු කාලයේදී — මගේ ආසනයේ විදුරු කර්මාන්ත ශාලාවක් බලන්න මම ගියා. එද එතැන තිබුණ තත්ත්වය අද නමුත්නාත්සේලා ඔතැන ඉදගෙන කථා කරද්දි මට මැවිල පෙනුනා. කම්කරුවන්ගේ ජීවත තත්ත්වය, එතන තිබුණ සමාජයීය තත්ත්වය, එතැන තිබුණ වැසිකිළිවල තත්ත්වය අදත් මට මැවිලා පෙනුනා.

නිදහස් වෙළඳ කලාපයේ අයට ප්‍රශ්න තිබෙනවා. වැඩ කරන කාල සීමාවන් ගැන කොන්ත්‍රාත් ක්‍රමය ගැන අපට ප්‍රශ්න තිබෙනවා. අපි නැහැ කියන්නේ නැහැ. නමුත් අපි එකක් මතක තියා ගන්න ඕනෑ. 1976 මේ රටේ කම්කරු ජනතාවගේ වැඩ කිරීමේ යම්කිසි වාතාවරණයක් කර්මාන්තශාලා තුළ තිබුණාද ඊට වඩා විශාල සහන සහිත වාතාවරණයක් අද ඒ කර්මාන්තශාලා තුළ තිබෙනවා. වැසිකිලි තිබෙනවා. සමහර විට ශීත කළ වැඩපොලවල්. සෞඛ්‍ය තත්ත්වය හොඳයි. ඒ සහන අද මේ කම්කරුවන්ට තිබෙනවා.

සමහර ආයතනවල සේවකයන් වැසිකිලියට යන විටත් ඒ බව පොතක සටහන් කර යන්න ඕනෑ බව බදේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) සඳහන් කළා. ඇත්ත. මොකද? අති විශාල සංඛ්‍යාවක් වැඩ කරන තැන්වල සමහරවිට නමුත්නාත්සේලාගේ ආයතනයකින් ගිය කෙනෙක්, වෙනත් දේශපාලන පක්ෂවල අය මේ වැඩපිළිවෙළ කඩාකප්පල් කිරීම සඳහාම වැසිකිලියට ගොස් දොර වසාගෙන යැගෙන වෙලාවක් ඉන්න අවස්ථා, ආපසු නොපැමිණෙන අවස්ථා තිබෙන්න පුළුවන්. අපි එවැනි අවස්ථා ගැනත් අසා තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ තැන්වල ඉන්නෙ යූ. එන්. පී. පක්ෂයේ අය පමණයි නේ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

නමුත්නාත්සේ ඔහොම කියන එක වැරදියි. නමුත්නාත්සේ ගිහින් බලන්න, යූ. එන්. පී., ශ්‍රී ලංකා කියල දෙයක් එහි නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

විනාඩි තුනකින් වැසිකිළියට ගොස් එන්න ඕනෑ කියන තීතිය සාධාරණයි කියලද නමුත්නාත්සේ කියන්නෙ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

නැහැ, මම එහෙම කියන්නෙ නැහැ. ඒ කාරණයට කොයි තරම් වෙලාවක් වුවමනා වෙනවාද කියා නමුත්නාත්සේ කියන්න, බලන්න.

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரண)
(Mr. Richard Pathirana)

ඒක කාටවත් කියන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත්නාත්සේ බොහොම හොඳ කථාවක් කරගෙන ගොස් අත්තිමට කිරි කලයට ගොම ටිකක් මිශ්‍ර කරනවා වගේ වැඩක් කර ගත්තා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

නමුත්නාත්සේලා ඔක්කෝම කථා කරමින් වැසිකිළියට යන්නට ගත කරන විනාඩි 3ක කාලය සටහන් කරනවාය කියන කාරණය මෙතැනදී සඳහන් කළේ පිරිසිදු චේතනාවකින් නොවෙයි. නේ. නමුත්නාත්සේලා ඒ කාරණය සඳහන් කළේ දේශපාලන වශයෙන් කල්පනා කරලයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

සේවක පක්ෂය කරන දේ ගරිය කියමින් සේව්‍ය පක්ෂයට පක්ෂවයි නමුත්නාත්සේ කථා කරන්නෙ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

නැහැ. එහෙම නොවෙයි. ඒ නමුත්නාත්සේට වැටහෙන විධිය වෙන්න ඇති. අපි මේ රටේ කම්කරු ජනතාවත් ඒ වගේම 'වාම පක්ෂයත් අධ්‍යාපනික වශයෙන් පුළුවන් තරම් වැඩිදියුණු කරන්න ඕනෑ. එය ඉතාම වැදගත්. ස්වාමි පක්ෂයත් සේවක පක්ෂයත් අතර සම්බන්ධතාවය, සුහදතාවය වැඩි කරන්න ඕනෑ. නමුත්නාත්සේලාගේ කාලයේ මොකක්ද සිද්ධ වුණේ, " වැසිකිලියට යන්න දෙන්නෙ විනාඩි 3 යි. වැඩ වර්ජනය කරපන් " අන්න ඒ තත්ත්වය තමයි එද තිබුණේ. අපි කරන්නෙ එහෙම නොවෙයි. මේ තත්ත්වය මහනුවරත්තට අපේ කඩුවෙල ගරු මන්ත්‍රීතුමා අධ්‍යක්ෂ ජෙනරාල් හැටියට සිටි කාලයේදී නිදහස් වෙළඳ කලාපය තුළ සේවක යහා ඇති කළා. කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස්වරයෙක් මහී කොළඹ ආර්ථික කොමිෂන් සභාවට අපි අතුගුක්ත කළා, ඒ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කරන්න. ඒ සම්බන්ධය ඇති කරන්න. ස්වාමියාත් සේවකයන්ගේ නිදහස් ජන්දයෙන් තෝරා ගත් පිරිසකුත් එකට වාඩි වී සේවක ප්‍රශ්න ගැන කථා කරන්නට අවස්ථාවක් අපි ඇති කර දුන්නා. මේ රටේ මේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ රටේ කම්කරුවන් ඇත් කිරීම නොවෙයි, කම්කරුවන් සමග එකට ඉදගෙන තීරණ ගැනීමේ වැඩපිළිවෙළක් මේ රටේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ නිසා ඇති කළ සේවක මණ්ඩල ගැන මගේ ගරු ඇමතිතුමා විස්තර කරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

බොහෝ පාලක පක්ෂ යූ. එන්. පී.ශ්‍රී ලංකා කියල තොවෙයි මනුෂ්‍යයන් හැටියට, පාලකයන් හැටියට සේවකයන් සමග එකට ඉදගන්න බැහැ කියා ඒකට විරුද්ධ වුණා. සේවකයන් සමග එකට ඉද ගත්විට දූෂණ කරන තැන්වල ඒව කරන්න බැරි වෙනවා. ඒ නිසා බොහෝ අය විරුද්ධ වුණා. කඩාකප්පල් කළා. අසාර්ථක වුණා. ඒ නිසා තමුන්නාන්සේලා වැරදි වැටහීමක් ගන්න එපා. මම මේ කාරණය මතු කළේ මෙන්න මේ නිසයි. කම්කරුවන්ට තිබෙන ප්‍රශ්න තේරුම් ගන්න පුළුවන් ස්වාමි පක්ෂයකුත් ස්වාමි පක්ෂයේ වෙළඳ ව්‍යාපාර පිළිබඳව හැඟීමක් ඇති කර ගන්න පුළුවන් සේවක පක්ෂයකුත් මේ රටේ ඇති වෙන්නට අපි මේ සම්බන්ධතාවය වැඩිදියුණු කරන්නට ඕනෑ. තවත තවත් වැඩි දියුණු කරන්නට ඕනෑ. [බාධා කිරීම්]

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

වෘත්තීය සමිති විනාශ කිරීමේ වැඩපිළිවෙළක් යොදවනවා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

ඉතින් තමුන්නාන්සේගේ වෘත්තීය සමිතියෙන් තමුන්නාන්සේව ඵලවලා විජය කුමාරතුංග හාර ගන්නට මම මොකද කරන්නෙ ? එයට තමුන්නාන්සේ වගකියන්න ඕනෑ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ කඩාකප්පල් කිරීමට නියෝජ්‍ය ඇමතිතුමා සම්පූර්ණයෙන්ම වගකියන්න ඕනෑ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මා මීටත් වඩා වේලාවක් කථා කරමින් කාලය තාස්ති කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. විශේෂයෙන්ම ගරු ඇමතිතුමා එතුමාගේ අදහස් ප්‍රකාශ කරයි. අපේ හිටපු ගරු ඇමතිතුමාගේ කාල පරිච්ඡේදයේදී වගේම තව ඇමතිතුමාගේ කාලයේදීත් විශාල සේවයක් කරන්නට එතුමාට හැකියාව ලැබෙවා, එයට තමුන්නාන්සේලාගේ සහයෝගය ලැබෙවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් සේවක අර්ථ සාධක අරමුදල ගැන බොහොම හොඳ විග්‍රහයක් කළා. මම ඒ ගැන ප්‍රශ්න කරන්න යන්නෙ නැහැ. නමුත් මම හිතන්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කළේ කම්කරුවන්ගේ අරගලයන් පිළිබඳ ඉතිහාසය අමතක කරලයි. මෙතැන තිබෙන්නේ වැසිකිළියට යෑමට විතාඩි තුනක් තියම කිරීමේ ප්‍රශ්නය විතරක් නොවෙයි. ඒවාගේ දේ තුළින් අවුලක් ඇති කර ඒ පිළිබඳව සටන් ඇතිකිරීම මගින් ආර්ථිකය අවුල් කිරීමේ න්‍යායයක් මෙතැන තිබෙනවා. අවුරුදු තිහ හතළිහකට ඉස්සෙල්ලා මේ රටේ වැඩ කරන ජනතාව විඳපු අයිතිවාසිකම් දිහා බලන විට එවැනි සටන් නොවුණා නම් අද ඒ ජනතාව බුක්ති විඳින අයිතිවාසිකම් බොහොමයක් අද ඇති වත්තේ නැහැ.

පැය අටේ සේවය සඳහා වූ අරගලය සහ වෙනත් අයිතිවාසිකම් සඳහා වූ අරගල තුළින් තමයි අද බුක්ති විඳින අයිතිවාසිකම්. ස්වාමි පක්ෂයෙන් ලබා ගන්න අවස්ථාව ලැබුණේ. එසේ නැතිව ලෝකයේ කොහේවත් හාම්පුත්තු කිසිම අයිතිවාසිකමක් රත්තරං බත්දේසියක තබා සේවක පිරිසට දීලා නැහැ. ඒ නිසා අපි ඒවා අමතක කරන්න හොඳ නැහැ.

කාලයෙන් කාලයට ආර්ථික සම්බන්ධතාවන් වෙනස් වනවිට ඒ අනුව අළුතෙන් දිය යුතු අයිතිවාසිකම් පිළිබඳව ඇති මාර්ගයන් තුළින් තීරණ ගන්න ඉදිරිපත්කිරීම් කරන්නට කම්කරු අමාත්‍යාංශයට මැදිහත් වෙන්න පුළුවන්. මම හිතන හැටියට කම්කරු අමාත්‍යාංශයේ විශාලම වැඩ කොටස විය යුත්තේ එයයි. අද ආර්ථික සම්බන්ධතාවල තත්ත්වයන් වෙනස් වෙමින් පවතිනවා. ඒ නිසා ඒ තුළ අප බුක්ති විඳින අයිතිවාසිකම්වලට තර්ජන ඇති වී තිබෙනවා. විශේෂයෙන් අද අප ජීවත් වන්නේ ශ්‍රම අතිරික්තයක් පවතින ආර්ථිකයක් තුළ. ශ්‍රමිකයනගේ අතිරික්තයක් පවතින ආර්ථිකයක් තුළ ශ්‍රමිකයා බුක්ති විඳින අයිතිවාසිකම් අඩු කිරීම සඳහා ඇති වන විවිධ බලපෑම්වලට ඔහු ගොදුරු වෙනවා. කම්කරු අමාත්‍යාංශයේ වැදගත්ම වගකීම වෙන්න ඕනෑ මේ ගැන කටයුතු කිරීමයි. ශ්‍රමිකයන්ගේ අතිරික්තයක් තිබෙන වෙළඳ පොළක ශ්‍රමිකයන්ගේ ශ්‍රමය පාවිච්චි කරන හාම්පුතුන්ගෙන් ශ්‍රමිකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වැඩ කිරීමයි ඒ වගකීම.

මීට සම්බන්ධිත කරුණු රාශියක් කියැවුණා. විශේෂයෙන් පසුගිය කාලයේ 1980 මහා වැඩ වර්ජනය නිසා ඇති වුණු අස්කිරීම් පිළිබඳව අනෙක් මන්ත්‍රීවරුන් කිව්වා වාගේම මමත් ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ඒ සේවකයන්ට වැඩ දෙන්න මේ ආණ්ඩුව එකඟ වී තිබෙනවා. ඒ එකඟ වීම ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු ඇමතිවරයා හැටියට ඒ බලපෑම සියලුම ක්ෂේත්‍රවල ඇති කරන ලෙසයි මම විශේෂයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ. රුපියල් තුන්සියයේ දීමනාව සඳහා වූ ඒ සටන සාධාරණ සටනක්. ජීවත් වීම සඳහා වූ ඒ ආදයම ලබා ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ වූ සටනක්. පසු කාලවල ජීවන වියදම පිළිබඳව ඇති කළ වැඩිවීම් දිහා බලන විට රජය ඒ වර්ජනයෙන් පසු ඒ මූලික ඉල්ලීම් කිපයක සාධාරණත්වය පිළිගෙන තිබෙන බව පෙනෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය විශේෂයෙන් ඇමතිතුමාගේ අවධානයට ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

මම තව එක ප්‍රශ්නයක් නගන්න බලාපොරොත්තු වෙනවා. එය වෘත්තීය සමිති සහ සේවක අයිතිවාසිකම් පිළිබඳ බාධාවන් පවතින ක්ෂේත්‍රයක් ගැනයි. එනම් හෝටල් කර්මාන්තයයි. ගරු ඇමතිතුමනි, හෝටල් කර්මාන්තය තුළ සිටින සේවකයන් ඔවුන්ගේ අයිතිවාසිකම් අතින් අද සිටින්නේ වාල් කඳවුරක් තුළ පවතින තත්ත්වයකයි. බොහෝ හෝටල්වල අද ඔවුන්ට තම අයිතිවාසිකම් සඳහා සංවිධාන වන්නට හෝ ඒ සඳහා ඉල්ලීම් කරන්නට හෝ අවස්ථාවක් නොදෙන තත්ත්වයක් පවතිනවා. ඒවා කම්කරු දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නාම ඒ දෙපාර්තමේන්තුවත් නිහඬතාව පළ කරනවා. උදාහරණයක් වශයෙන් ගාල්ලේ කම්කරු කාර්යාලය හා කළුතර කම්කරු කාර්යාලය දක්වන්න පුළුවන්. මුහුදුකරයේ පවතින මේ හෝටල් ක්ෂේත්‍රයේ සේවක අයිතිවාසිකම් පිළිබඳ තත්ත්වය කොයි ආකාරද කියනවා නම් ඒ අයතනවල ඔවුන්ගේ අතිකාල දීමනා පවා අහෝසි කර තිබෙනවා. ඊට අතිරේකව ඔවුන්ගේ නිවාඩු පිළිබඳව රජයෙන් අනුමත ප්‍රතිපත්ති උල්ලංඝණය කරනවා. වෙනත් දීමනා පිළිබඳ ප්‍රශ්නවලට මත්තෙන් මා මේ ඉදිරිපත් කළේ මූලික අයිතිවාසිකම් දෙකක් පිළිබඳ තත්ත්වයයි. මේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම පිළිබඳව අද වන විට විවිධ අවස්ථාවල හෝටල් සේවකයෝ විවිධ වෘත්තීය සමිති මගින් මේ ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ඒවා විසඳා ගන්න බැරි වී තිබෙනවා.

හාම්පුතුන්ගේ සම්මේලනයට ඇති සම්බන්ධතාව තුළින් විවිධ ආකාරයෙන් මේ අයිතිවාසිකම් යටපත් කරගෙන යනවා. මම ඒ සඳහා එක උදාහරණයක් පෙන්වා දෙන්නම්. " රොබින්සන් ක්ලබ් " කියන්නේ විදේශීය ආයෝජන ඇති හෝටලයකටයි, ඒ හෝටලය රජයේ ආයතනවලට සම්බන්ධ ආයෝජනයන් තිබෙන හෝටලයක්. මේ රටේ ආදර්ශවත් හාම්පුතා වශයෙන් ගණන් ගැනෙන්නේ රජයයි. මම සිතන හැටියට ඒ ආයතනයේ එක අධ්‍යක්ෂවරයෙක් තමුන්නාන්සේගේ සේවා නියුක්තයින්ගේ හාර අරමුදලෙත් අධ්‍යක්ෂවරයෙක්.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)
රක්ෂණ සංස්ථාවේත් කොටස් තිබෙනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඔව්, රක්ෂණ සංස්ථාවේත් කොටස් තිබෙනවා.

වෘත්තීය සමිති හැටියට සංවිධානය වන්න, තමන්ගේ වැටුප් සහිත නිවාඩු ලබා ගන්න, අතිකාල දීමනා ලබා ගන්න කිසිම අයිතියක් නැහැ. ඒ ආයතනයේ සේවකයන්ට. මේ වාගේ ආයතන ගණනාවක් මුහුදුකරයේ තිබෙනවා. ඒවායේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවකයන්ට ලැබිය යුතු දීමනා ගණනාවක්ම ලැබෙන්නේ නැහැ. උදාහරණයක් වශයෙන් " සර්විස් චාජ් " එක පෙන්වා දෙන්න පුළුවනි. එවැනි දීමනා සම්බන්ධයෙන් ඒ ආයතනය අනුගමනය කරන්නේ පුදුම ප්‍රතිපත්තියක්. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, හෝටල් ක්ෂේත්‍රය සඳහා අලුත් පඩි පාලක සභාවක් ඇති කොට ඒ සේවකයන්ට ස්ථිර වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගන්නය කියා. ඒ ක්ෂේත්‍රයේ සේවකයන්ට ඒ ආයතනවල වැඩ කිරීම සඳහා තිබෙන අවස්ථාවනුත් අඩුයි.

ඊළඟට කියන්න තිබෙන්නේ, ඒ ක්ෂේත්‍රයටම සම්බන්ධ සංචාරක කුලී මෝටර් රථ පිළිබඳ ප්‍රශ්නය ගැනයි. සංචාරක කුලී මෝටර් රථ විශාල සංඛ්‍යාවක් ලංකාවේ තිබෙනවා. ඒවායේ සේවය කරන රියැදුරන්ට රියැදුරන් හැටියටවත්, ඒ ව්‍යාපාරයේ කොටස්කාරයන් හැටියටවත් වැටුප් හෝ ගෙවීම් කෙරෙන්නේ නැහැ. ඒ හැරෙන්න, ඒ රියැදුරන් දිවීන්ව රැකියාවකුයි කරන්නේ. රියැදුරුකමට අමතර වශයෙන් ඒ අය ' ගයිඩ්ස් ' ලා හැටියටත් ක්‍රියා කරනවා. නමුත් මේ ගණන සම්බන්ධයෙන් පැහැදිලි පඩි පාලක සභා ක්‍රමයක් ඇති කරන්න අද වන තුරු පියවර ගෙන නැහැ. ඒ නිසා සංචාරක රථ පදවන්නන්ගේ ක්ෂේත්‍රය සඳහා වෙනම වැටුප් පද්ධතියක් ඇති කොට ඒ ක්ෂේත්‍රයට යම්කිසි සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ආරම්භ කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා විස්තර අවශ්‍ය නම් ඒ විස්තර ලබා දෙන්නත් මම ලෑස්තියි. ලංකාවේ තිබෙන ප්‍රධාන ප්‍රචාරක කුලී මෝටර් රථ සමාගම් සියල්ලක්ම රියැදුරන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරමිනුයි, කටයුතු කරන්නේ. මෙය ඒ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ඉතා කණගාටුදායක තත්ත්වයක්. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. හා. 5.15

ඊළඟට ගරු ඇමතිතුමාගේ අවධානය, තවත් කාරණයක් කෙරෙහි යොමු කරවන්න සිදු වී තිබෙනවා. ඇතැම් සේවායක් කම්කරු දෙපාර්තමේන්තුවෙන් අවසර අරගෙන, මහා භාණ්ඩාගාරයෙන් මුදල් අනුමත කරගෙන සේවකයන්ට වන්දි ගෙවා සිය ආයතන වසා දමනවා. ඒ විධියට සේවකයන් අස් කරන්න අවසර දෙන්නේ, ඒ ආයතනය තවදුරටත් පවත්වාගෙන යන්න බැරි නිසාම ඒ සේවකයන් අස් කරනවාය කියන පදනම මතයි. නමුත් බොහොමයක් ආයතන කම්කරු නීති උල්ලංඝනය කරමින්, වන්දි අරගෙන ගිය අර සේවකයන් නැවත සේවයට බදවා ගන්නවා. එගෙම නම් ඒ සේවායන් ඒ සේවකයන් අස් කිරීම සඳහා කලින් ඉදිරිපත් කර තිබෙන ඉල්ලුම් පත්‍ර සාධාරණත්වයෙන් තොරව ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍ර බව ඔප්පු වෙනවා. ඒ නිසා කම්කරු දෙපාර්තමේන්තුව මේ ප්‍රශ්නය ගැනත් විශේෂයෙන් සොයා බලන්න ඕනෑ. අද බොහොමයක් පෞද්ගලික ආයතනවල මෙන්ම සංස්ථාවලත් මේ කටයුත්ත කෙරෙන්න පටන්ගෙන තිබෙනවා.

1979 ජනවාරියේ සිට 1984 අප්‍රේල් දක්වා සේවක අර්ථසාධක අරමුදලට බැර විය යුතු රුපියල් ලක්ෂ 50ක පමණ මුදලක් ඊට බැර කරන හැටියට කම්කරු කොමසාරිස් කළ නියෝගයක්, එසේ කරන බවට දක්වූ එකඟතාවෙත් පසුවටත් වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කර නැහැ. කම්කරු දෙපාර්තමේන්තුවේ තිබෙනවා, නීතිය ක්‍රියාවේ යෙදවීමේ අංශයක්. ඒ අංශය මෙවැනි කටයුතු සම්බන්ධයෙන් මීට වඩා අවදියෙන් ඉන්න ඕනෑ. කම්කරු කොමසාරිස් දුන් යම්කිසි නියෝගයක් යම් ආයතනයක සේවායන් විසින් ක්‍රියාත්මක කරනු නොලබන්නේ නම් ඒ නියෝගය ක්‍රියාත්මක කරවීම සඳහා උසාවිවලට ඇති බලය, නීතිය ක්‍රියාවේ යෙදවීමේ ඒ අංශයටත් තිබෙනවා. ඒ නිසා එවැනි උසාවි බලයක් ඇති ඒ අංශය, අර ගෙවීම් ක්‍රියාත්මක කරවීම සඳහා යොදවන්නය කියන විකත් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න කැමතියි.

ඊළඟට කියන්න තිබෙන්නේ විශ්‍රාමිකයන් පිළිබඳ ප්‍රශ්නයක්. සේවකයන් විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිපත්තියේ අසාධාරණත්වයක්, විෂමතාවක් තිබෙනවා. වරාය කොමිෂන් සභාව විසින් විශ්‍රාම ගන්වනු ලබන්නේ අවුරුදු 10ක සේවා කාලයක් ඇති අයයි. නමුත් ගුවන් තොටුපොල අධිකාරිය අවුරුදු 8න් විශ්‍රාම ගන්වනවා. මම හිතන හැටියට මේ ආයතන දෙකම ඒ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ අවසරය, ආවරණය ලබා ගත්තවා. රජයේ එක් ආයතනයකට සිය සේවකයන් අවුරුදු 10න් විශ්‍රාමිකයන් බවට පත් කරන්නත්, තවත් ආයතනයකට අවුරුදු 8න් විශ්‍රාමිකයන් බවට පත් කරන්නත් දී තිබෙන ඒ අවසරය තුළ ප්‍රතිපත්තිමය වෙනසක් පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. ඒක එකක් කරන්න. අවුරුදු 8න් විශ්‍රාම යෑමට සුදුසුකම් තිබෙනවා යයි රජය පිළිගෙන තිබෙනවා නම් සැම සේවකයෙකුටම අවුරුදු 8න් විශ්‍රාම ලබා ගැනීමේ අයිතිය ලබා දෙන්නය කියා මම ඉල්ලනවා.

තිදහස් වෙළඳ කලාපය ගැන මම මේ වෙලාවේ කථා කරන්නට යන්නේ නැහැ. මන්ත්‍රීවරු රාශියක් ඒ ගැන කථා කළා. තිදහස් වෙළඳ කලාපයේ පවතින තත්ත්වය පිළිබඳව මේ "ඩාබිදු" කියන පත්‍රයෙන් බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දෙඩන්ගොඩ මහතා) කියෙව්වා. එහෙත් එතුමා එහි සිරස්තලය කියෙව්වේ නැහැ. ඒ ගැන විකක් අවධානය යොමු කරන්නය කියන එකයි, මම කියන්නේ. එහි සිරස්තලය තිබෙන්නේ "වෙළඳ කලාපයෙන් සල්ලාලයින්ට තවත් බිල්ලක්" කියලයි. මෙය ඉතා භයානක ලෙස අද කෙරී ගෙන යනවා. මෙය කෙලින්ම කම්කරු දෙපාර්තමේන්තුවට බලපාන දෙයක් නොවන්නට පුළුවන්. නමුත් රාත්‍රී සේවයට අවසර පැතුවේ, තමුන්නාන්සේලා විසින් කරන ලද තීනි සංශෝධනයක් මතයි. රාත්‍රී සේවයට අවසරය දුන්නේ ඒ තීනි සංශෝධනය තුළිනුයි. ඒ නිසා රාත්‍රී සේවයේ යෙදී වැඩ ඇරී යන අයගේ ආරක්ෂාව සඳහා යම්කිසි වගන්ති කීපයක් ඇතුලත් කිරීම හාම්පුතුන්ගේ වගකීමක් ලෙසවත් සලකන්නට ඕනෑ. මුදල් පසුම්බිය සොරා ගත්තවා වැනි කොයෙකුත් දේවල් සෑම වැඩපොළක් අවටම සිදු වෙනවා. මහරගම ආසනයේ හයිඩ්‍රාමනි කම්හල අවට විශාල සේවක ප්‍රමාණයක් වැඩ කරනවා. ඒ අයටත් රාත්‍රී කාලයේ මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා, මේ රාත්‍රී සේවයට අවසර දීමෙන් පසුවයි. මෙය විශාල ප්‍රශ්නයක් වෙන්නට කලින් මේ පිළිබඳව අවශ්‍ය පියවරවල් ගන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

ඊට අතිරේකව සේවා හාරකාර අරමුදල් පිළිබඳව සඳහන් කරන්නට කැමැතියි. සේවා හාරකාර අරමුදලට මේ වන විට දායක වී තිබෙන මුදල් ප්‍රමාණය අතිවිශාලයි. සේවා හාරකාර අරමුදලේ ඒ මුදල් ප්‍රමාණය ආයෝජනය වන්නේ සැබැවින්ම කම්කරුවන්ගේ යෙහෙ සඳහාද කියන ප්‍රශ්නය මතු වෙනවා. සේවා හාරකාර අරමුදල ආරම්භ වුණේ සැබැවින්ම ඒ අරමුණ ඇතිවයි. කමුත් අද එය වෙන මාර්ගයක ගමන් කරන බවයි, පෙනෙන්නේ. අද සේවා හාරකාර අරමුදල මහා පරිමාණ බැංකුවක් වැනි ආයතනයක්. එහි ආයෝජනය කර තිබෙන්නේ බහුතරය හෝටල් කර්මාන්තයේ සහ එවැනි වෙනත් කර්මාන්ත ශාලාවලයි. එමෙන්ම තවලෝක රෝහලට " secomdary mortgage එකක් යටතේ — පළමුවන උගස තොවෙයි, දෙවන උගස ඇතිව — සේවා හාරකාර අරමුදල මුදල් දුන්නේ කොහොමද කියා මම අහනවා.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

මුදල් ටිකක් දීලා තිබුණා. එය අපි සම්පූර්ණයෙන්ම ආපසු ගත්තා, පොළියත් සමග.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

එක හොඳයි. පදනම හොඳයි. ඒ කියන්නේ මීට පසුව ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සේවා හාරකාර අරමුදලට තමුන්නාන්සේ තහනම් කර තිබෙනවාද ? එහි අදහස මීට පසුව ඒ ආකාරයට ක්‍රියා කිරීම නවත්වනවා කියන එකද ?

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

සමහර විට අපි ඒ අත්දමට රජයේ ආයතනවලට ආධාර කරනවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

The Hon. Minister is investing in hotels, which does not bring in anything.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

I do not know whether we have invested in any such thing. Let me have the details. I will look into that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ ගැන සොයා බලන්නැයි මම ගරු ඇමතිතුමාට කියනවා. මූලික උගසක්වත් නැතිව දෙවැනි උගසකට මුදල් දෙන තත්ත්වයකට මේ හාරකාර අරමුදල වැටෙනවා නම් එය යන්තේ ඉතාම භයානක මුදල් ප්‍රතිපත්තියකට යයි මම හිතනවා. ලොකු බංකුවක තරම් අරමුදලක් මෙහි තිබෙනවා. මෙය සේවකයින්ගේත් ඔවුන්ගේ පවුල් හා දරුවන්ගේත් යහපත සඳහා වූ ක්ෂේත්‍රයකට ආයෝජනය කිරීමේ වැඩ පිළිවෙළක් තිර්මාණය වන්නට ඕනෑ. අන්න ඒකයි මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ. සේවා හාරකාර අරමුදලින් අන්න එවැනි ක්ෂේත්‍රයක් පිළිබඳව ඉදිරි සැලැස්මක් හදන්න. මෙයට වාර්ෂිකව එන මුදල අද බැංකු ක්‍රමයක් හෝ ඇති කරන්නත් ප්‍රමාණවත්. ඒ නිසා මේ ක්ෂේත්‍රය ගැන ඇමතිතුමා විශේෂ අවධානයක් යොමු කරන්නය කියා මම ඉල්ලනවා.

එමෙන්ම ලංකා ගමනාගමන මණ්ඩලය සේවකයින් විශ්‍රාම යන විට වන්දි ගෙවීම පිළිබඳව පදනම් දෙකකින් ක්‍රියා කරනවා. වර්ජකයින්ට වන්දි ගෙවීමේදී ඔවුන් දඩුවමකට ලක්කර තිබෙනවා. මම කම්කරු කොමසාරිවරයාගෙන් හා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලනවා, මේ ගැන සොයා බලන්නය කියා.

එමෙන්ම අද කේවල් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින අංශය මීට වඩා ක්‍රියාත්මක වුණොත් සේවක ස්වාමි දෙපක්ෂය අතර ඇතිවී තිබෙන නොයෙක් මතභේදයන් ඒ අංශය මඟින් විසඳන්නට පුළුවන් යයි මම හිතනවා. කම්කරු උසාවියකට නඩුවක් ගියාම කාලයක් ගත වෙනවා. සමහර අවස්ථාවල ඒවා විසඳා ගන්නට පුළුවන් අංශයන් කම්කරු දෙපාර්තමේන්තුවේ පවතිනවා. නමුත් ඒ අංශයන්ට ස්වාමි පක්ෂය දක්වන ප්‍රතික්‍රියාව බොහොම අඩුයි. ඒ නිසා ඒ අංශ මීට වඩා නීතිමය වශයෙන් බලවත් කර ස්වාමි පක්ෂ කැඳවන්නට පුළුවන් අන්දමට — නියෝගයක් දුන් විට පැමිණෙන අන්දමට — ඒ අංශ පරිවර්තනය කරන්නය කියා මම ඉල්ලනවා.

පුවත්පත් කලාවේදීන්ගේ පඩි පාලක සභාවක් ඇති කරනවා කියා තිබුණා. ඒකට මොකක්ද වුණේ කියන එක මම ඇමතිතුමාගෙන් දැනගන්නට කැමතියි. ඒ ගැන සොයා බලා ඒ පුවත්පත් කලාවේදීන්ගේ පඩි පාලක සභාව ක්‍රියා විරහිත වෙලා තිබෙනවා නම් එසේ වුණේ මොකද කියා සොයා බලා එය ප්‍රතිෂ්ඨාපනය කරන්න වැඩ කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Hon. Member for Kotmale. The Hon. Minister has to reply at 5.40 p.m.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I will finish before that.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය යටතේ විශේෂයෙන්ම කම්කරුවන්ගේ ශුභසිද්ධිය සඳහා නොයෙක් පියවරවල් පසුගිය කාලයේ ගත්තා. ඒවා අපි කැපයි කියන්නෙ නැහැ. නමුත් ඇතැම් අය තවත් නීතියට හංගිලා, නීතියෙන් බේරිලා කම්කරුවන්ට නොයෙක් විදියේ දුෂ්කරතා ඇති කරනවා. ඒවා වළක්වාලන්නට අපට පුළුවන්ද කියන එකයි, අපි බලන්නෙ. මට පසුගිය මාසයේ පැමිණිලි කිහිපයක් ආවා. ඒවායින් එකක් තමයි, වතු පාලකයා තමන්ට ඕනෑ කරන සේවකයා අස් කිරීම සඳහා ඒ සේවකයාට දුන් පත්වීම් ලිපිය ඔවුන් අතට ගැනීම සමහරවිට මේ ලිපිය පමණක් නොවෙයි, සේවකයා ළඟ තිබෙන අනිකුත් ලිපි ලේඛනත් තමන් අතට අරගෙන තියනවා, පසුවදට රැකියාවට එන්න එපා කියා. මම ඒවාට විරුද්ධව කටයුතු කර තිබෙනවා.

තිස්පතේ එක වත්තක එහෙම සිද්ධියක් වුණා. හොඳ වෙලාවට ඒ සේවකයා මා ළඟට ඇවිත්, "සර්, මගේ මේ පත්වීම් ලිපියයි මෙතෙක් ලියුම් ගනුදෙනු කළ කඩදාසි ටිකයි ඉල්ලනවා රාජකාරියක් සඳහා" කියා කිව්වා. මේ ඔහු වත්තේ පේවයෙන් අස් වීම සඳහා පාලකයා හිතාමතාම කරන දෙයක් බව, ඒ සම්බන්ධයෙන් විස්තර සොයාගෙන යනවිට මට දැනගන්නට ලැබුණා. තමන් ළඟ තිබෙන ඔරිජිනල්ස් වතු පාලකයා ඉල්ලුවාට දෙන්න එපා, අවශ්‍ය නම් ඡායා පිටපත් ටිකක් ගිහින් දෙන්න කියා මම ඔහුට කිව්වා. නමුත් මේ පාලකයා කැවත ඉල්ලා තිබෙනවා, ඒ මූලික ලිපි. මම කැවතත් කිව්වා, ඒවා දෙන්න එපා කියා. දැන් අර පාලකයාට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, ඒ කැකැත්තා අස් කිරීම.

මේ විධියේ සිද්ධීන් අපි හැම දෙනාටම හොරෙන් කෙරෙනවා. අපට හොරෙන් හැංගිමුත්තන් කරනවා, ඒ සමහර පාලකයෝ. තවත් කැනක අර්ථ සාධක අරමුදල ලබාගැනීම සඳහා කන්තෝරුවට ගිහිල්ලා තමන්ගේ ලිපි ලේඛන ටික හාර දුන්නාම, විස්තර වශයෙන් කියනවා නම් අවුරුදු තිස් ගණනක් වැඩ කළ වතිතාවක් තමන්ගේ ලිපි ලේඛන ටික හාර දුන්නාම, ඒවා හාරගත්තා කියා ලියවිල්ලක් දී කැහැ, කන්තෝරුවෙන්. මෙන්න මේවා තමයි, දුර්වලකම්. ඒ ලිපි ලේඛන හාරගත්තා කියා ලියවිල්ලක් දුන්නා නම් ඒ අනුව එයාගෙන් ප්‍රශ්න කරන්න පුළුවනි, කම්කරු දෙපාර්තමේන්තුවට හෝ උසාවියට හෝ ගිහින්. නමුත් දැන් මේ ලිපි ලේඛන අරගෙන ඔහු කරන්නේ ඒවා පැත්තකට දැමීමයි. එහෙම කැත්තම් ඒවා විනාශ කිරීමයි. මේ කැනැත්තිය මාස තුනක් බලාගෙන සිටියා. නමුත් කිසිවක් සිදු නොවුණු නිසා ඇය ගියා, ඒ ගැන බලන්නට. මේක සිදුවෙලා තිබෙන්නේ දුම්මලගස්තලාව ඩිවිෂන් එකේ. දැන් ඇයට අර්ථ සාධක අරමුදල ගන්න බැහැ. ලියුම්වලට මොකවා වුණාද කියා දන්නේ කැහැ. සමහර වෙලාවට එකැන සිටින ක්ලාක් ඒවා අරගෙන කියකවා, වැඩේ කරන්නම් කියා. නමුත් කරන්නෙ කැහැ. මෙහෙම අවස්ථාවලින් ඔවුන් බේරා ගන්නට අපි නීතියක් සකස් කරන්නට ඕනෑ. හොර වාටු අදහස් තිබෙන පාලකයින්ට හෝ නිලධාරීන්ට ඒ සේවකයින්ට හිමි වරප්‍රසාද කැති කරන්න බැරිවෙන විදියට අපි නීති සකස් කරන්නට ඕනෑ. එහෙම කරනවා නම්, ඒ ලිපි ද්‍රව්‍ය හාරගත්තා කැකැත්තා අසවල් ලිපිය අසවල් දවසේ හාරගත්තා කියා රිසිට එකක් දෙන්න ඕනෑ. එහෙම දුන්නොත් පමණයි, ඒ සේවකයාගේ හෝ සේවිකාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නෙ. එහෙම නොවුනොත් ඔහුට කරන්නට දෙයක් නැහැ. ඒවා හාරගත් කැකැත්තාට කියන්න පුළුවන් මට දුන්නෙත් නැහැ, මම දන්නෙත් නැහැ කියා. මේ කැනැත්තිය කියකවා, ඔහුට දුන්නා කියා. ඉතින් අන්තිමේට ඒ අර්ථ සාධක අරමුදල් ගන්න වෙනත් විධියක ඔප්පු කිරීමක් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමාටත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් වෙනත් කෙනෙකුටවත් කම්කරු දෙපාර්තමේන්තුවටත් පුළුවන් කමක් නැහැ, ඒ කැනැත්තියට අර්ථසාධක අරමුදල් ගෙවන්න. මේ විධියේ සිද්ධීන් රාශියක් සිද්ධ වෙනවා. මන්ද, කම්කරුවෝ තලා පෙලා ඒ අයගෙන් පළිගන්නා අදහසින් ක්‍රියා කරන පාලකයින් ඉන්නා නිසයි. එය සමහර විට කෙරෙන්නේ දේශපාලන වශයෙන්ම නොවෙයි. සමහර අයගේ පුද්ගලික විරෝධතා තිබෙනවා. පාලකයන්ගේ විරෝධතා ඇති වෙනවා. ඇති වෙලා, සේවකයන්ට කරන්න යන හිරිහැර ගැනයි, මා සඳහන් කෙළේ. එවැනි එක්කෙනෙකු ගැනයි මුලින් සඳහන් කළේ. දෙවෙනි එක්කෙනාගෙන් ඒ ලියුම් කියුම් හාර ගත් එක්කෙනා කවුද යනවග සාක්ෂි සහිතව ඔප්පු කරන්න, පුළුවන්කම තිබෙනවා නම් ඒ සම්බන්ධව ලියුම් කියුම් ගෙනෙන්නය කියා මම කිව්වා. මෙවැනි කරුණු රාශියක් අපිට එනවා. තමන්ගෙන් කපා ගත් අර්ථ සාධක අරමුදල් ගන්න ගියාම ඒක වළක්වන්න නොයෙක් විධියේ උපක්‍රම යොදනවා. නීතියට හැංගිලා. නීතියට විරුද්ධයි, මේවා කරන්නේ. එම නිසා මේ අයගෙන් ලියවිලි ගන්න කොට පාලකයෝ රිසිට පතක් දිය යුතුමයි කියා මම කියනවා. ඒ සඳහා නීතිරීති අපි සකස් කරන්න ඕනෑ. ඒ සඳහා නීති රීති සකස් කළේ නැත්නම් මේ අර්ථසාධක අරමුදල් වැඩි දෙනෙකුට ගන්න බැරි වෙනවා, ඔවුන් මිය යනතුරු. බොහොම දෙනෙකුට වෙන්නේ ඒකයි. අවුරුදු ගණනාවක් මේ ගැන උත්සාහ කරනවා.

ඊළඟට අපි " කන්සල්ටේටිව් කොමිටි " එකේදී යෝජනා කළ පරිදි වැඩ කටයුතු ක්‍රියාත්මක කර තිබෙනවාය කිව්වා. ඒක බොහොම හොඳයි. එක් ලක්ෂ තිස් දහකට විතර පොත් දුන්නාය කියනවා. ඒක බොහොම හොඳයි. ඒ ගැන මම පැහැදීමක් ඇති කර ගන්නවා. ඒ පොත් යවන්නේ පාලකයාටද කියා මම දැනගන්නට සතුටුයි.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
පුද්ගලයාට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ පුද්ගලයාට යවනවා නම් හොඳයි. සමහරවිට වතු සුපිරින්ටැන්ඩන්ට් මාර්ගයෙන් ගියොත් ඒක ලැබෙන්නේ නැහැ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. මේ පොත් දිලා අවුරුද්දකට වතාවක් සෙත්ට්‍රල් බැන්ක් එකට එවනවා. එතිදී ඔවුන්ට අයිති ගිණුමේ තිබෙන මුදල් හා පොලිය සටහන් කර ආපසු ඒ පොත් ඒ පුද්ගලයාගේ දිලා තිබෙන ලිපිනයන්ටම ආපසු යවනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

සමහර වෙලාවට දරදඬු පාලකයන් ඒවා ලැබීම වළක්වන්නට උත්සාහ කරනවා. ඒ නිසයි, මම ඒ සම්බන්ධව ඇහුවේ.

තිස් පන් ලක්ෂයක් පමණ පිරිසගේ ප්‍රශ්නය ලබන අවුරුද්දේ විසඳන්න බලනවාය කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. මේක "කම්පියුටරයිස්" කළොත් බැරිද අවසාන කර ගන්න.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

අපි කරන්න යන්නේ අතින්. අතින් කරලයි, අපූ හයේදි අවසාන කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඒකට මම විරුද්ධ නැහැ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

අතින් කරන්නට පුළුවන් නම් "කම්පියුටරයිස්" කරන්න ඕනෑ නැහැ. වෙන දෙවල්වලට "කම්පියුටරයිස්" කරන්න අදහස තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

සේවකයො ඉන්නවා නම්, ඒ අයට කරන්න පුළුවන් නම්, "කම්පියුටරයිස්" කරන එක ලොකු දෙයක් හැටියට අපිට හිතන්න බැහැ. ඉක්මණින් කරන්න සේවකයෝ ඉන්නවා නම්, ඒ අයගෙන් වැඩ ගන්න ඕනෑය කියන එක මම පිළිගන්නවා.

ඊළඟට විශේෂයෙන්ම වතු පාරිනෝෂික දීමනා සම්බන්ධව කිව යුතුයි. සමහර පාලකයන් නොයෙක් විධියේ ක්‍රමවලටයි, ඒවා ගණන් හදන්නේ. සමහර අහිංසක සේවකයෝ දන්නේ නැහැ, ලියන්න කියන්න. ලියන්න කියන්න දන්නේ කැති සේවකයෝ ඉන්නවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
අත්සන් කරන්නේ කොහොමද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඇහිලි සලකුණු තමයි තියන්නේ. [බාධාකිරීම්] ඒක තමයි මම අහන්නේ. ඒ අය පඩිය දැන ගන්න [බාධාකිරීම්]

I have to reply him. How can an illiterate person – (*Interruption*).

ඩී. විත්සන්ට් ඩයස් මහතා (නියෝජ්‍ය ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමා)
(திரு. டீ. வின்சன்ற் டயஸ் — பிரதேச அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(Mr. D. Vincent Dias – Deputy Minister of Regional Development)

මන්ත්‍රීතුමා, තමුන්නාන්සේට විරුද්ධව වැල්ලවත්ත පොලිසියේ එන්ට්‍රියක් තිබෙනවා, තමුන්නාන්සේගේ ගෙදර වැඩ කරපු සේවකයාට පඩි ගෙවීවේ නැහැ කියලා. [බාධාකිරීම්]

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඔය තරම් පහත් විධියට මට විරුද්ධව බොරු චෝදනා නඟනවා නම්, තමුන්නාන්සේට විරුද්ධව ඇත්ත චෝදනා රාශියක් නඟන්නට මට සිද්ධ වෙනවා. එම නිසා ඒ වචන ඉල්ලා අස් කර ගන්නා ලෙස මම එතුමාට මතක් කරනවා.

ඩී. විත්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)
තවමත් පොලිසියේ තියෙනවා, ඒ සම්බන්ධයෙන් එන්ට්‍රියක්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
තමුන්නාන්සේ ඔය වචන ඉල්ලා අස් කර ගන්නවාද නැද්ද ?

රේනුකා හේරත් මහත්මිය (නුවරඑළිය දිසා ඇමතිතුමිය)
(திருமதி ரேணுகா ஹேரத் — நுவரெலிய மாவட்ட அமைச்சர்)
(Mrs. Renuka Herath – District Minister, Nuwara Eliya)
ඉල්ලා අස් කර ගන්න ඕනෑද ? ඇත්ත කථාවක්.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! That is a personal matter.–(*Interruption*)

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
He has to withdraw that statement. If not, he has to prove it. It is very bad of him to make that statement. He has forgotten that he is a Deputy Minister of a Ministry.

ඩී. විත්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)
That has no relevance. You ring up the Wellawatta police !

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)
Order, Please !

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
Are you prepared to take the responsibility to prove that statement ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, Please! I will deal with him. You leave it to me. Hon. Deputy Minister, you have to withdraw that statement. You cannot refer to the conduct of an hon. Member of this House unless–

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

එතුමා සේවකයන්ගේ පඩි ගැන කථා කළ නිසයි මම එහෙම කිව්වේ. අවුරුදු ගණනාවකට ඉස්සර මම ඒ ප්‍රවෘත්තිය පත්‍රයක පළ වී තිබුණා දැක්කා. එම නිසයි එතුමාට ඒ ගැන මතක් කර දුන්නේ. ඒක එතුමා යටතේ වැඩ කළ සුළු සේවකයකුට සම්බන්ධ ප්‍රශ්නයක්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඔය කථා හරි යන්නේ නැහැ. මේ පුතත් එක්ක ඔය වනලා ගැහිලි හරි යන්නේ නැහැ. ගහනවා නම් හරියට කෙලින් ගහන්න. වනලා ගහන්න මම ඉඩ දෙන්නේ නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

නියෝජ්‍ය ඇමතිතුමා ඒ වචන ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

වචන ඉල්ලා අස් කර ගන්නා තුරු මම කථා කරන්නෙත් නැහැ; වාඩි වෙන්නෙත් නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

මූලාසනයට ගරු කර ඒ වචන අස් කර ගන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

කොද නියෝජ්‍ය ඇමතිවරයෙක් වාගේ ඒ වචන ඉල්ලා අස් කර ගන්න.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

පුවත්පතකින් දැක්ක දෙයක් ගැනයි, මම කිව්වේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මට ඔය එක්ස්ප්ලනේෂන් වලින් වැඩක් නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! You leave it to me. Hon. Deputy Minister, please withdraw that statement!

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

මොන පතුයේද තිබුණේ?

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

එතුමාට ඕනෑ නම්, මම වෙනත් වෙලාවක ඒ පත්‍රය විතරක් නොවෙයි, පොලිස් එන්ට්‍රියේ එක්ස්ට්‍රැක් එකත් ගෙනැවිත් පෙන්වන්නම්.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

දැන් ඔය කියන දේවල් හාර ගන්න බැහැ. අර වචන ඉල්ලා අස් කර ගන්න.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

එම ප්‍රකාශයෙන් එතුමාට ලැජ්ජාවක් ඇති වුණා නම් –

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

බොරු ප්‍රකාශයක් නිසයි. නියෝජ්‍ය ඇමතිවරයකු වුණත් මූලාසනයට ගරුකර ඒ වචන ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ற் டயஸ்)
(Mr. D. Vincent Dias)

I withdraw that statement.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම බොහොම සන්තෝෂ වෙනවා, මගේ මිත්‍ර ඒ නියෝජ්‍ය ඇමතිතුමා–

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, Please! You address the Chair. Why are you creating all these problems in the House? It is high time that you wind up now.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම සන්තෝෂ වන බවයි කිව්වේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් සංස්ථා රාශියක්ම වසා දමා ඇති නිසා ඒවායේ සේවය කළ අයට රැකියා අහිමි වී ගිහින් තිබෙනවා. එම සංස්ථාවල සේවකයන්ගේ රැකියාවට අදාළ අසීතිවාසිකම් පිළිබඳ කාරණා මෙතුමාගේ අමාත්‍යාංශයට හාරව පවතිනවා. මේ අන්දමට සංස්ථා හෝ ආයතන වසා දමුවත් රැකියා අහිමි වීම නිසා ගෙවන වන්දිය කිසියේත් ප්‍රමාණවත් නැහැ. අන්තිම කාලයේදී මාසයකට මෙපමණ දින සංඛ්‍යාවක් වැඩ කර තිබිය යුතුයි කියා තීරණය කර ඒ අනුව ගණන් බලා රැකියා අහිමි වන එම සේවකයන්ට ගෙවන වන්දිය සීමා කරනවා. මහා මාර්ග දෙපාර්තමේන්තුවත් ක්‍රියා කර ඇත්තේ ඒ ආකාරයටයි. මාස දෙකක් ඇතුළතදී දවස් පණස් හතරක් වැඩ කළ යුතුව ඇති බව කියනවා. දවස් පණස් හතරක් වැඩ කර තිබෙන්න ඕනෑය කියා ඒ අවුරුද්දේ පෙබරවාරි මාසයේදී ගණන් නැදුවා. මෙසේ ගණන් බැලීම වැරදියි. එම නිසා කම්කරුවන්ගේ වෘත්තීය ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කරන අමාත්‍යාංශයක් හැටියට මෙවැනි සිදු වීම් ගැන යොයා බලා, අදාළ ආයතන සමග සාකච්ඡා කර මෙම අඩුපාඩුකම් හරිගස්සා දීමට ක්‍රියා කරන්නට ඕනෑ. අපේ ගරු කම්කරු ඇමතිතුමා හොඳ බුද්ධිමතෙක්. වැඩ කිරීමේ දක්ෂතාවත් තිබෙනවා. වැඩ කරන්නට වුටමනාවක් තිබෙනවා. එම නිසා එතුමා මැදිහත් වී වන්දි ගෙවීමේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කර ඒ අයට සාධාරණයක් ඉටු කර දෙන්නට ක්‍රියා කරන්න ඕනෑ. එසේ නැති වුණොත් අවුරුදු විසි පහක් තිහක් සේවය කර අත්තිමේදී හිස් අතින් ඒ සේවකයන්ට ගෙදර යන්නට සිදු වුණොත් ඒක බලවත් අපරාධයක් හැටියටයි මා සලකන්නේ. එම නිසා ඒ ගැන යොයා බලා කටයුතු කරන ලෙස නැවත වරක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉල්ලා සිටින්නට කැමතියි. ගරු ඇමතිතුමා කථා කිරීමට බලාපොරොත්තුවෙන් සිටින නිසා, සදහන් කරන්නට ඇති වෙනත් දෙවල් ගැන මම දන් කථා කිරීමට යන්නේ නැහැ.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මෙම විවාදයට සහභාගී වුණු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට පළමුවෙන්ම මම මගේ ස්තුතිය පුද කරනවා. ආණ්ඩු පක්ෂයෙනුත් ඒවායේ විරුද්ධ පාර්ශ්වයෙනුත්, කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඒ කරුණු සියල්ලටම අපි ඇහුම්කන් දුන්නා. ඒ සමහර කරුණු දනට ඉෂ්ට වෙලත් තිබෙන ඒවායි. පසුගිය දවස්වල සේවයෙන් අස් කළ උදවිය ගැන මේ අය සදහන් කළා. අපේ අමාත්‍යාංශයට අයත් ඒ සේවකයින්ගෙන් 154 දෙනෙකු දනට නැවත සේවයට අරගෙන තිබෙනවා. තමුන්නාන්සේලා හැමදම ගහන බෙර පදයක් තමයි, මේ සේවකයින්ව නැවත සේවයට ගත්තය කියලා කියන එක. අපි මේ අයව පරප්පාඩු තිබෙන හැටියට ගන්නවා. තව ඕනෑ තම් 30ක් 40ක් ඉන්නවා ඇති සේවයට ගන්න. තමුත් මට ඒ ප්‍රමාණය හරියටම කියන්න බැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

සියළු දෙනාවම අරගත්ත නම් ඔය ප්‍රශ්නය නැහැ නේ.?

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

සියළු දෙනාවම ගන්න ඉඩ නැහැ. ඒ අය, " අපට මේ රජය යටතේ වැඩ කරන්න බැහැ " කියලා ගිය විට, රජයට නිකම් බලාගෙන ඉන්න බැහැ. අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා, අනික් ඇමතිවරු මහජනතාවගේ අවශ්‍යතාවයන් වහාම ඉටු කිරීම සදහා ඒ පුරප්පාඩුවලට වෙනත් උදවිය ගත්තා. දන් අපට ඒ ගොල්ලන්ව අයින් කරල මේ ගොල්ලන්ව ගන්න බැහැ. අන්න ඒකයි මම කියන්නේ. අපි මේ ගොල්ලන් ගැනත් අනුකම්පා කරනවා. දන් මේ අය පඹගාලේ පැටලිලයි ඉන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ස්ථයික් එකක් ඇති වුණේ.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

මේ සේවකයින් ඒ අය නොදැනුවත්ව ස්ථයික් කරන්න පටන් ගත්තා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

නැහැ, ආණ්ඩුවට දත්වලයි ස්ථයික් කළේ.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

හැමදම ට්‍රේඩ් යූනියන්, ට්‍රේඩ් යූනියන් කියලා කියනවා. නමුත් ඒ අයගේ ජන්දයවත් විමසන්නේ නැතිවයි, ස්ථයික් කළේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපේ සමිති ජන්දය අරගෙනයි ස්ථයික් කළේ.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එහෙම කරන්නෙ ඇත්තේ ජේ. එස්. එස්. කියන තමුන්නාන්සේලාගේ වෘත්තිය සමිති වෙන්න ඇති. අපේ වෘත්තිය සමිතිවල ජන්දය අරගෙනයි ස්ථයික් කළේ. [බාධා කිරීමක්]

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

අපරාදේ මේ මිනිස්සු අමාරුවේ වැටුණේ. දේශපාලන වාසි ගන්න හුහක් දෙනෙක් මෙය කරනවා. මම නම් කැමති නැහැ ස්ථයික්වලට. අපි ඒ ස්ථයික් කළ අයගෙන් 154 දෙනෙකු අරගෙන තිබෙනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපේ සමිති හරියට ජන්දය අරගෙනයි ස්ථයික් කළේ.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විධියට නම් මට තව විනාඩි 20ක් පමණ ඕනෑ.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! You have exactly 20 minutes. You wanted only 20 minutes and you will have that 20 minutes. Do not disturb the Hon. Minister. Let the Hon. Minister speak now.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

මේ අනුව මා කියන්න බලාපොරොත්තු වූ දෙවල් කියන්න ලැබෙන්නේ නැහැ. එම නිසා මම කෙටියෙන් පිළිතුරු දෙන්න බලාපොරොත්තු වෙනවා. ස්ථයික් කළ අයගෙන් 154 දෙනෙක් දනට අරගෙන ඉන්නවා. තව ටික දෙනෙක් ඉතුරු වී ඉන්නවා. මේ අය ස්ථයික් කරන අවස්ථාවේදි අපි ඒ වෙනුවට ගත් උදවියව අයින් කරල මේ උදවියව ගන්න බැරිකමයි මම කියන්නේ. එම නිසා ඇබෑර්තු තිබෙන හැටියට මේ ඉතුරු වී සිටින උදවියව ගන්න බලාපොරොත්තු වෙනවා.

මහරගම ගරු මන්ත්‍රීතුමා (දිසේෂ් ගුණවර්ධන මහතා) හෝටල් පිළිබඳව සදහන් කළා. බදු අඩු කිරීම මගින් හෝටල් සදහා යම්කිසි සහනයක් අපේ රජයෙන් කර තිබෙනවා. ඒ හෝටල්වල සේවකයින්ගේ පැමිණීලි තිබෙනවා නම් අපට ඒවා එකින් එක විභාග කරන්න පුළුවන්. සියළුම හෝටල් එක මිම්මෙන් මනින්න බැහැ. සේවකයින් අස් නොකළ හොඳ හෝටලුත් තිබෙනවා. අස් කළ හෝටල් සේවකයින්ට යම්කිසි අසාධාරණයක් සිදු වී තිබෙනවා නම් අපට ඒවා විභාග කරන්න පුළුවන්.

The hotel investment so far has been in Intercontinental. It is a very profitable investment.

දහඩිය මහන්සියෙන් හම්බ කරන සේවකයින්ගේ මුදල් හමස් පෙට්ටියේ දමාගෙන ඉන්නවාට වඩා හොඳයි මේ වාගේ ආයතනවල ආයෝජනය කරල පොළියක් ලබා ගන්න එක. සමහර ආයතනවලින් මේ ආයෝජන සදහා සියයට 40 ක පොළියක් ලැබෙනවා. සිංගර් කොම්පැණියේ සියයට 40ක පොළියට මුදල් ආයෝජනය කර තිබෙනවා. පාඩු වන ඒවාට අපි දීලා නැහැ.

Buying and selling of shares also is a legitimate right of the ETF.

ඉතින් මේක කරන්න එපා අරකයි, මේකයි කියා කැගහනවා.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා කාරණා රාශියක් කිව්වා. හැන්සාඩ් වාර්තාව බලා අපි ඒ කාරණා සියල්ලක් ගැනම සොයා බලා ඒ අනුව කටයුතු කරනවා. කාලවේලා නැති නිසයි මම මේ අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හදිසියේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. සී. ඉඹුලාන මහතා]

හමාර කරන්න බලාපොරොත්තු වෙන්නේ. වසා දමන ලද කම්හල්වල සේවකයන් ගැන කතා කළා. ඒවා ලබා ගැනීමත් අවශ්‍ය නම් ඒ පිළිබඳව අපට පැමිණිලි කළාම ඒ එක එකක් ගැන වෙන වෙනම පැමිණිලි කළත් – ඕනෑම වේලාවක අපි ඒ පැමිණිලි භාර ගන්නවා. මගේ නමටම – ඇමතිවරයාගේ නමටම – ඒ ලිපි එවිවොත් ඒ සෑම ලිපියක්ම මම කියවා බලනවා. ජන්දදායකයෙකුගෙන් වුණත් මගේ නමට ලැබෙන ලියුමක් කොයි තරම් වැඩ කටයුතු තිබුණත්, වේලාව නොතිබුණත් මම කියවා බලනවා. ඒ නිසා මේවාට දැන් පහසු ක්‍රම යෙදී තිබෙනවා. එක අතකින් අපට නිලධාරීන් නැහැ. ඒක පිළිගන්න ඕනෑ. මම නම් භාණ්ඩාගාරයෙන් ඉල්ලන්නත් කැමති නැහැ. භාණ්ඩාගාරයේ මුදල් වියදම් කරන්න තිබෙන හැටියට මම නම් හිතකින් කියක්වත් ඉල්ලන්නේ නැහැ. ඒක දැන් මගේ ප්‍රතිපත්තිය. තිබෙන ප්‍රමාණය අනුව කටයුතු කරනවා. වෙන එකක් තබා අපේ විදේශ රැකියා ආයතනය පිහිටුවීමේදී අපි භාණ්ඩාගාරයෙන් රුපියල් ලක්ෂ හතහමාරක් ඉල්ලුවා. ගරු මුදල් ඇමතිතුමා ඒක අපට ණයට දුන්නා. මාස දෙකක් ගතවෙන්න කලින් අපි ඒ මුදල ආපසු දුන්නා. ඉංග්‍රීසියෙන් කියනවා නම් :

We are going on our own steam now. We are just organizing the place. Every member of Parliament may have got those letters. I am just trying to help every Member to send at least one or two people abroad. I am trying to cater to every electorate. If people do not want that, I will be every hapy to withdraw all those letters. Well, anyway, I do not want to go into that question now.

අ. භා. 5.45

The hon, Member for Matugama (Mr. Anil Moonesinghe) spoke about the Foremen Training Institute. The number of trainees already taken in is 85. We are hoping to have about 100 for the year. We have already taken 85 to the Foremen Training Institute. It is a new instittion. The Swedish Government has given us all the funds. I think the Treasury has given us Rs. 35 to Rs. 40 million. I may be corrected if I am wrong.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Rs. 50 million.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

Rs. 60 million or may be Rs. 68 million, I am not sure. I think it is in your electorate.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

Thank you very much. Rs. 85 million budget !

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

We are hoping to do better. – (*Interruption*).

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman)

If you become a Minister also you can given one like that to me.

පී. සී. ඉඹුලාන මහතා
(திரு. பீ. ஸி. இம்புலான)
(Mr. P. C. Imbulana)

The member of applications received was 677. Out of that, 85 people have been trained. So, we are trying to do our level best for the ordinary man who is down and out. We are not concerned about scholarships in big universities. The man who sweats must be given a place in this country, under this Government. We will see to it that he gets a place. The number of trainees already taken in is 85. The revenue collected to date is Rs. 79,970. That is by way of fees. The number of persons who have atteneded the short-term workshops is 330. So, therefore, it is doing a service. We have just started that, as you know, Sir. You were there for the inauguration. You took a very active part on that day and we were quite happy. The Swedish Foreign Minister who came to open it was very happy. Everybody was happy.

Now, with regard to the other matters, I will need so much of time that I do not want to say anything now. I will be reading the HANSARD. I will get all my officers who are in the Officials Box or who may be in the Ministry to read in HANSARD the speeches made by the Members of this House. I will see to that. All these speeches will be taken into consideration. I say that because it might take long time for me to reply here and now. I do not want to miss anybody's comments.

I am very thankful for all the constructive criticism, or may be even destructive, given by all the Members. I think everybody gave constructive criticism as to how we should go on next year. I am very grateful for all the work that is done. We have thought of so many things. My Deputy Minister also has thought of so many things. Officers from our Secretariat, from the Secretary down to the Commissioner of Labour, the new Chairman of the Foremen Training Institute and also the Chairman of the Foreign Employment Bureau are all very active.

I remember the hon. Member for Attanagalla saying that most probably will select an ex-politician as Chairman for the Foreign Employment Bureau. He said that in his speech, if I remember right. We have not done that. We have appointed people from the staff of our Ministry. We have not been a burden on the Treasury at all except for the Rs. 71/2 lakhs which we borrowed for the time being. We have returned that within two months. therefore everybody should be happy – (*Interruption*) No. You repeated that; you said that in your your first statement on Foreign Employment Bureau Bill.

May I once again thank all the officers in my Ministry for working with me. As I mentioned earlier, I wish to think my Deputy Minister and all other

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

members of this House for giving me a patient hearing and taking a great deal of interest in giving all the constructive criticisms. I thank you, Sir, most sincerely for giving me all this time.

"81 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 30,21,000ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

81 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තලේප්පු 81, නිකුළ්චිත් තිට්ටම් 1, මීණ්ඩුවරුඞ් චෙලවුක්කාන රූපා 30,21,000 අට්ටවණෙයිර් චේර්ක්ප්පට්ටුමාග" එණුම් විණ්ණප්පම් විඩුක්ක්ප්පට්ට් ඒර්‍රුක්කොළ්ළප්ප්ට්ටදු.

තලේප්පු 81, නිකුළ්චිත් තිට්ටම් 1, මීණ්ඩුවරුඞ් චෙලවු අට්ටවණෙයින් පකුදියාග ඉරුක්ක් කට්ටළෛයිඩප්පට්ටදු.

Question, "That the sum of Rs. 3,021,000, for Head 81, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule", put, and agreed to.

Head 81, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම්, රු. 5,98,000

නිකුත්චිත් තිට්ටම් 1.—පොදු නිරුවාකමුම් පදවියිනර් චේවෛකළුම් — ආක්ක්ප් පොරුට් චෙලවු, රූපා 5,98,000

